# රක්ෂණය නියාමනයේ
## ගෝලීය ගෙත්තමක්
### මවමින්

IBSL
INSURANCE
BOARD OF SRI LANKA

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය | වාර්ෂික වාර්තාව 2014

# පටුන


වසරේ වැදගත් සිදුවීම් **5** | සභාපතිනියගේ සමාලෝචනය **6** |
අධ්‍යක්ෂ ජනරාල්වරියගේ සමාලෝචනය **10** | මණ්ඩලයේ සාමාජිකයන් **13** |
මණ්ඩල සාමාජිකයන් පිළිබඳව **15** | ජ්‍යේෂ්ඨ කළමනාකරණ කණ්ඩායම **17** |
කාර්ය මණ්ඩලය **18** | පොදු සමාලෝචනය **22** | සංඛ්‍යානමය සමාලෝචනය **27** |
මෙහෙයුම් කටයුතු සමාලෝචනය **70** | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය **94** |
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය **95** | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය **96** |
රක්ෂණ ඔප්පුහිමියන්ගේ ආරක්ෂණ අරමුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශනය **97** |
ගිණුම්කරණ ප්‍රතිපත්ති **98** | මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් **100** | විගණකාධිපති වාර්තාව **108** |
විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම **114** |
පරිශිෂ්ඨය I **123** | පරිශිෂ්ඨය II **124** | පාරිභාෂික ශබ්ද මාලාව **126** |

# රක්ෂණය නියාමනයේ ගෝලීය ගෙත්තමක් මවමින්

සංයුක්ත රක්ෂණ සමාගම්, රක්ෂණ ව්‍යාපාර කර ගෙන යන වෙනස් සමාගම් දෙකකට වෙන් කිරීමේ සාර්ථක හා සුමට මාරුවීම සිදු වූ මෙම වසර රක්ෂණ නියාමන ඉතිහාසයේ තවත් එක් සන්ධිස්ථානයක් සනිටුහන් කරන වසරකි.

සංයුක්ත සමාගම් දොළහ අතුරින් විසංගමන ක්‍රියාවලිය කර ගෙන යාමට පනවන ලද නියාමන අවසන් කළ යුතු කාල සීමාව සම්පූර්ණ කිරීම සඳහා සමාගම් හතකට බලපත්‍ර ලබා දෙන ලදී.

සංයුක්ත සමගම්වල විභේදනයෙන් වැඩි ඉලක්කයක්, පාරදෘශ්‍යභාවයක්, ඔප්පු හිමියන් ආරක්ෂා කිරීමක් සහ ලාභදායකභාවය පිළිබඳ දෘශ්‍යතාවක් ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂා කරයි.

රක්ෂණ කටයුතු ක්ෂේත්‍රයේ ගෝලීය ප්‍රතිසංස්කරණ අනුව යමින් ජීවිත හා ජීවිත-නොවන රක්ෂණ ව්‍යාපාර පැහැදිලිව විභේදනය කිරීම සඳහා වූ නියාමන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක් ක්‍රියාත්මකවීම මෙම මූල්‍ය වර්ෂය තුළ දී දක්නට ලැබුනු අතර ස්ථාවර ප්‍රාග්ධන ක්‍රමයක සිට අවදානම් සංවේදී ප්‍රාග්ධන ක්‍රමයකට මාරුවීමේ තවත් වැදගත් නියාමන විප්ලවයක් මණ්ඩලය විසින් දියත් කරන ලදී.

ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තයේ නියාමන අධිකාරිය ලෙස අපි රක්ෂණ නියාමනය සම්බන්ධයෙන් ගෝලීය ගෙත්තමක් සත්‍යවශයෙන්ම නිර්මාණය කරන්නා වූ රක්ෂණ නියාමනයේ ඉතා වැදගත් සන්ධිස්ථාන වන මෙම වෙනස්කම් සම්බන්ධයෙන් ඉතා ආඩම්බර වෙමු.



# දැක්ම

ආසියාවේ රක්ෂණ නියාමනයේ මිනුම් ලකුණ බවට පත්වීම.

# මෙහෙවර

රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම සහ අභිවෘද්ධිය සඳහා පහසුකම් සැලසීම සිදුකරලමින් රක්ෂණ ඔප්පු හිමියන්ගේ යහපත සුරැකීම.

# වසරේ වැදගත් සිදුවීම්

- රක්ෂණ සමාගම් 21ක්
- රක්ෂණ තැරැව්කාර සමාගම් 58ක්
- රක්ෂණ නියෝජිතයින් 42,958ක්
- ග්‍රාම නිලධාරී කොට්ඨාස 456ක් වෙත ලබා දුන් රක්ෂණ දැනුවත්භාවය
- අවදානම් පාදක ප්‍රාග්ධනය සමාන්තරව ක්‍රියාත්මක කිරීම (RBC Parallel Run Commenced)
- වාණිජ විභේදන ක්‍රියාවලිය

## රක්ෂණ කර්මාන්තයේ කාර්යසාධනය

| | 2014 | 2013 | වෙනස % |
|---|---|---|---|
| දළ ලිඛිත වාරික ආදායම (රු. බිලියන) | 99.87 | 94.99 | 5.14 |
| මුළු වත්කම් (රු. බිලියන්) | 406.83 | 357.47 | 13.81 |
| දළ දේශීය නිෂ්පාදනයේ % ලෙස ව්‍යාප්තිය | 1.02 | 1.10 | (7.27) |
| රක්ෂණ ඝනත්වය (රු.) | 4,830.57 | 4637.34 | 4.17 |

## රක්ෂණ මණ්ඩලයේ කාර්යසාධනය

| | 2014 | 2013 | වෙනස % |
|---|---|---|---|
| ඔප්පුහිමියන්ගේ ආරක්ෂණ අරමුදල | 2.18 | 1.78 | 22.47% |
| සෙස් ආදායම (රු. මිලියන) | 273.91 | 245.74 | 11.46% |
| වාර්ෂික ගාස්තුව (රු. මිලියන) | 73.44 | 70.08 | 4.79% |

**රු. බිලියන 406.83**
රක්ෂණ කර්මාන්තයේ මුළු වත්කම්

**රු. බිලියන 99.87**
රක්ෂණ කර්මාන්තයේ ද.ලි.වා.ආ.



“ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය උපායමාර්ගික පෙරදැක්මක් ඇති, එමෙන්ම කලාපීය වශයෙන් ආදර්ශමත් ස්ථානයක සිටීමට හැකියාවක් ඇති කර්මාන්තයකි.”

# සභාපතිනියගේ සමාලෝචනය

රක්ෂණ කර්මාන්තයෙහි නියාමන අවශ්‍යතාවන්ට අනුකූලවීම තුළ විවිධ අභියෝගයන් හා සාරානුකූල වෙනස්කම් රැසකට මුහුණ දුන් 2014 වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සතුටින් ඉදිරිපත් කරමු.

මෙම වෙනස්කම් තුළින් සියලුම පාර්ශ්වයන්ට වටිනාකමක් ලබාදෙන වඩා ශක්තිමත්, තිරසාර, රක්ෂණ කර්මාන්තයක් නිර්මාණය කෙරෙනු ඇතැයි අපි අපේක්ෂා කරමු.

සමාලෝචිත වර්ෂය තුළදී නව අධ්‍යක්ෂ ජනරාල්වරියක රාජකාරී භාරගැනීමත් සමඟ රක්ෂණ මණ්ඩලය තුළ නායකත්ව වෙනසක් සිදුවිය. මණ්ඩලයේ ප්‍රධාන විධායක ධූරයට අභ්‍යන්තරයෙන්ම නිළධාරියෙකු පත් කරනු ලැබීම සතුටට කරුණකි. දක්ෂතා සපිරි බාහිර පුද්ගලයන් සඳහාද මණ්ඩලයේ දොරටු විවෘත වී ඇති අතර, අභ්‍යන්තර කාර්ය මණ්ඩලයෙහිද නිපුණතා වර්ධනය කිරීමටත්, වෘත්තීය දියුණුව සඳහා ඔවුනට ඉඩප්‍රස්ථා ලබාදීමටත් අඛණ්ඩව කටයුතු කරනු ලැබේ.

රක්ෂණ කර්මාන්තයේ ස්වරූපය වෙනස්වීම්වලට භාජනය වෙමින් පවතී. එම කර්මාන්තයෙහි සංවර්ධනය, නියාමනය, අධීක්ෂණය හා පහසුකම් සැලසීම සමග රක්ෂණ ඔප්පුහිමියන්ගේ සුභසිද්ධිය ආරක්ෂාකිරීම අපගේ මෙහෙවර වේ. එම මෙහෙවර ඉටුකිරීම සඳහා ඇප කැපවී සිටින බව සහතික කරනු පිණිස රක්ෂණ මණ්ඩලය සිය දීර්ඝ කාලීන උපායමාර්ගික පරමාර්ථ ඉටුකිරීම අරමුණු කොට ක්‍රියාත්මක වී සිටී.

## රක්ෂණ කර්මාන්තයේ ප්‍රගතිය

ජාතික ආර්ථිකයෙහි දළ දේශීය නිෂ්පාදිතය (GDP) 2014 වසරේදී 7.4% ක් වූ අතර එය 2013 හි දළ දේශීය නිෂ්පාදිතය (7.2%) හා සැසඳීමේදී සුළු වර්ධනයක් පෙන්නුම් කරයි. ජාතික මූල්‍ය ප්‍රතිපත්තියට අනුව සිදුවූ පොළී අනුපාතිකයන්හි පහත වැටීම හා උද්ධමනයේ පහළ බැසීමද, දේශීය ක්ෂුද්‍ර ආර්ථික තත්ත්වයන්හි සමස්ථ වර්ධනයද මේ සඳහා බලපෑ සාධක විය.

2014 වසර තුළ, ජීවිත හා ජීවිත නොවන රක්ෂණ ව්‍යාපාරවලින් රුපියල් මිලියන 99,872 ක දළ ලිඛිත වාරික ආදායමක් (GWP) රක්ෂණ කර්මාන්තයට උපයාගැනීමට හැකිවී ඇත. මෙය පෙර වසරට වඩා නිරපේක්ෂ නියම වලින් රුපියල් මිලියන 4,885 ක වැඩිවීමක් වන අතර 5.14%ක වර්ධනයක්ද විය. කෙසේ වෙතත් 2013 වසරෙහි වර්ධන ප්‍රතිශතය වූ 8.97% හා සැසඳීමේදී 2014 හි අඩු වර්ධනයක් වාර්තා වී ඇති බව සඳහන් කළ යුතුය.

කෙසේ වෙතත් අදාළ වර්ෂය තුළ රක්ෂණ සමාගම්වල මුළු වත්කම් ප්‍රමාණයෙහි 13.81%ක වර්ධනයක් වාර්තා වී ඇත.

## ජයග්‍රහණ

මණ්ඩලය සැලසුම් කළ පරිදිම, අවදානම් පාදක ප්‍රාග්ධන (Risk Based Capital) ආකෘතිය අදාළ කරගැනීම සම්බන්ධයෙන් පසුගිය වසර 2-3 කාලය තුළ අදියර රාශියක් සාර්ථකව සම්පූර්ණ කිරීමට හැකිවිය. RBC සම්බන්ධයෙන් සිදුකළ පූර්ව පරීක්ෂණයෙහි (Road Tests) ප්‍රතිඵල විශ්ලේෂණය මත සහ රක්ෂණ සමාගම් වල ප්‍රතිචාරද සැලකීමට ගෙන 2013 වසරේ ඔක්තෝබර් මාසයේදී RBC ආකෘතියෙහි අවසාන රාමුව නිම කිරීමට හැකි විය. මෙම නව ආකෘතිය මෙතෙක් පැවති රීති පාදක ආකෘතිය සමග සමාන්තරව ක්‍රියාත්මක කිරීම (Parallel Run) 2014 දී ආරම්භ වූ අතර එය 2015 වසර අවසානය තෙක් අඛණ්ඩව ක්‍රියාත්මක වෙනු ඇත. මෙම සමාන්තර ක්‍රියාවලියෙහි පළමු කාර්තුවේ ප්‍රතිඵල සහ ඉන් මතුවන ලද අභියෝග සාකච්ඡා කිරීමට රක්ෂණ සමාගම්වලට අවස්ථාවක් ලබාදීම සඳහා අප විසින් ලෝක බැංකුවේ සහයෝගය ඇතිව 2014 ජුනි මාසයේදී වැඩමුළුවක් සංවිධානය කරන ලදී. RBC අවසන් රාමුව, 2015 වසර තුළදී RBC අවසාන රීතිය (Final Rule) බවට පරිවර්තනය කිරීමේ කාර්යය නිමවනු ඇත.

අවදානම් පාදක ප්‍රාග්ධන ආකෘතිය (RBC) හඳුන්වාදීමේ දිගු ගමනේදී සියලුම රක්ෂණ සමාගම් විසින් මේ දක්වා ලබා දී ඇති සහයෝගය අපි අගය කරන අතර නව ක්‍රමයට අනුවර්තනය වීමට සමාගම් දැක්වූ නම්‍යශීලීභාවයද අපි ප්‍රශංසා මුඛයෙන් සිහිපත් කරන්නෙමු.

රක්ෂණ ව්‍යාපාර පොදුවේ පවත්වාගෙන යන ලද සංයුක්ත රක්ෂණ සමාගම්, ජීවිත හා ජීවිත නොවන රක්ෂණ ව්‍යාපාර වශයෙන් කොටස් දෙකකට බෙදා වෙන්කිරීමේ කාර්යයද 2014 වසර තුළදී සාර්ථකව ඉටුකිරීමට මණ්ඩලය සමත්විය. යම් යම් හේතුමත සමාගම් සුළු සංඛ්‍යාවකට මෙම කාර්යය නිමකිරීමට නොහැකි වුවත් මණ්ඩලය විසින් එකී සමාගම් සමඟ සමීපව කටයුතු කරන අතර එම ගැටළු කඩිනමින් විසඳාගැනීමට හැකිවනු ඇත.

ඔප්පුහිමියන් ආරක්ෂා කිරීම අපගේ ප්‍රධාන පරමාර්ථයක් වන අතර මෙකී අරමුණින් නියාමන ප්‍රතිසංස්කරණ රාශියක් 2014 වසරේදී හඳුන්වාදෙන ලදී. ආයතනික නියෝජිතයන් විධිමත් කිරීමෙන් සහ සෑම රක්ෂණ සමාගමක්ම ශක්තිමත් මූල්‍ය තත්ත්වයක් සහ නුබුන්වත්භාවයක් පවත්වා ගැනීම සහතික කිරීම තුළින් රක්ෂණ මණ්ඩලය විසින් ඔප්පුහිමියන්ගේ සුභසාධනය ආරක්ෂා කිරීමට පියවර ගන්නා ලදී.

තවද, රක්ෂණ මණ්ඩලයට ලැබෙන පැමිණිලි විමර්ශනය කිරීම සඳහා පැමිණිලි විභාගකිරීමේ ක්‍රියාවලියක් ද ක්‍රියාත්මක කරන ලදී. හැකි සෑම අවස්ථාවකදීම ලැබෙන සියලුම පැමිණිලි සම්බන්ධයෙන් සහන සැලසීමට අපි උත්සාහ කරමු. අපට ලැබෙන නොයෙකුත් පැමිණිලි වලින් පැහැදිලි වන්නේ බොහෝ ඔප්පුහිමියන් ඔප්පු කොන්දේසි නොකියවන බවත්, අවබෝධ කරනොගන්නා බවත් හා හුදෙක් රක්ෂණ නියෝජිතයාගේ අර්ථ නිරූපණය මත කරුණු විශ්වාස කිරීමට පෙළඹෙන බවත්ය. ඔප්පුහිමියන්ගේත්, අනාගත ඔප්පුහිමියන්ගේත් දැනුවත්භාවය වර්ධනය කිරීම සඳහා රක්ෂණ මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරන නොයෙක් ප්‍රවර්ධන වැඩසටහන්වලට අමතරව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් රක්ෂණය පිළිබඳව ප්‍රජාවගේ දැනුවත්භාවය වර්ධනය කිරීමේ වැඩසටහන් පැවැත්වීමද අඛණ්ඩව සිදුකෙරේ.

## ඉදිරි ගමන්මග

රක්ෂණ ව්‍යාප්තිය (Insurance Penetration) පුළුල් කිරීම අප ඉදිරියේ ඇති විශාලතම අභියෝගයන්ගෙන් එකකි. 2014 වසරේදී සමස්ථ රක්ෂණ ව්‍යාප්තිය (දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස) 1.02% කි. මේ තත්ත්වය ජීවිත හා ජීවිත නොවන රක්ෂණ ව්‍යාපාරයන් දෙකෙහිම ඉතා අඩු ව්‍යාප්තියක් පෙන්නුම් කරයි. මෙම තත්ත්වයට හේතුවී ඇති කරුණු ලෙස ආසියාවේ ඇතැම් රටවල් හා

# සභාපතිනියගේ සමාලෝචනය

සැසඳීමේදී සාපේක්ෂ වශයෙන් ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල ආදායම අඩු මට්ටමක පැවතීම, 'රක්ෂණ සංකල්පය' හා එහි ප්‍රතිලාභ පිළිබඳව ජනතාව එතරම් දැනුවත්ව නොසිටීම හා බොහෝ ජන කොට්ඨාසයන්ගේ උපයෝජ්‍ය ආදායම අවම මට්ටමක පැවතීම සඳහන් කළ හැක.

කෙසේ වුවද, රජය විසින් පුරෝකථනය කර ඇති පරිදි ශ්‍රී ලංකාවේ දරිද්‍රතා මට්ටම් අඩුවෙමින් පවතින අතර ජනගහනයේ ආදායම් මට්ටම් වැඩිවෙමින් පවතින හෙයින් එහි ප්‍රතිඵලයක් ලෙස ජන කොට්ඨාසයන්හි මිලදී ගැනීමේ හැකියාව ඉදිරියේදී වැඩිවනු ඇත. මෙබැවින් ජනගහන පිරමීඩයේ මැද කොටසේ සිටින මෙම ජන කොට්ඨාසය කෙරෙහි අවධානය යොමුකරන ලෙසට අප උදක්ම රක්ෂණ සමාගම්වලින් ඉල්ලා සිටිමු.

මෙකී ජන කොට්ඨාසයට වෙනස් ජීවන රටාවක් සහ අභිමතානුසාරී වියදම් රටාවක් ඇත. ඔවුන්ගේ ප්‍රමුඛතා ලැයිස්තුවේ එක් අයිතමයක් ලෙස "රක්ෂණය" ඇතුළත් වීම සිදුවිය යුතුය. අප විසින් ඉලක්ක කරගත යුත්තේ මෙම තත්ත්වයය. මෙබැවින් කර්මාන්තයක් වශයෙන් අප සැමගේ අවධානය ආර්ථික පිරමීඩයේ  මැද කොටසේ හා ඊටත් පහළ කොටසේ සිටින ජන කොට්ඨාසයන් කෙරෙහි යොමුවිය යුතු අතර ඔවුන්ගේ අවශ්‍යතාවන්ට සරිලන පරිදි නව රක්ෂණ ක්‍රම හඳුන්වා දිය යුතුය.

එසේම ජනගහනයෙන් 75%ක් පමණ පිරිසක් වාසය කරන ග්‍රාමීය හා අර්ධ නාගරික ප්‍රදේශවල ජීවත්වන ජනතාව සඳහා ඔවුනට යෝග්‍ය මෙන්ම, දැරියහැකි වටිනාකමකින් යුත් රක්ෂණ ක්‍රමයන් හා වඩා ඵලදායී බෙදාහැරීම් මාර්ග හඳුන්වාදෙමින් රක්ෂණ සමාගම් ඔවුනට සමීප වීම අවශ්‍ය බව සඳහන් කළ යුතුය. රට තුළ  විශාල ඌණ සේවාලත් වෙළඳපොළක් පවතින අතර රක්ෂණ ව්‍යාප්තිය වර්ධනය කිරීමට නම් මෙම කොටස් ග්‍රහණය කර සංවර්ධනය කිරීම අවශ්‍ය කරුණකි. පොදු ජනතාව අතර රක්ෂණය පිළිබඳ වැඩි අවබෝධයක් ඇතිකරමින් දිවයින පුරා දැනුවත්භාවය වර්ධනය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව සිදු කෙරෙමින් පවතී. එමෙන්ම සමස්ථ රක්ෂණ කර්මාන්තයම මෙතෙක් පැවති සාම්ප්‍රදායික ව්‍යාපාර ආකෘතීන් (Models) නැවත විමර්ශනය කර පෙර සඳහන් කළ ප්‍රදේශ කරා තම රක්ෂණ ව්‍යාපාරයන් ව්‍යාප්ත කරනු ඇතැයිද, අදාළ ජන කොට්ඨාශයන් රක්ෂණ කර්මාන්තයට සම්බන්ධ කරගනු ඇතැයිද, අපි අපේක්ෂා කරන්නෙමු. නාගරික ප්‍රදේශවල සිටින තමන්ට පුරුදු එකම පාරිභෝගික පදනම කෙරෙහි අවධානය යොමුකරනු වෙනුවට සමාගම් විසින් ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වන අති විශාල පාරිභෝගික සමූහයන් කෙරෙහි සිය අවධානය යොමුකර ඔවුනට සමීප වනු දැකීමටද අපි කැමැත්තෙන් සිටිමු.

අවදානම් පාදක ප්‍රාග්ධන ආකෘතිය ක්‍රියාත්මක කිරීමට නියමිත ඉදිරි කාලයේ ආයුගණක (Actuarial) නිපුණතාව අඩුවීමද අප ඉදිරියේ ඇති ප්‍රධාන අභියෝගයක් වේ. එබැවින් දේශීය වශයෙන් පරිණත ආයුගණකයින් බිහිකිරීම සඳහා ඒ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන වෘත්තිකයන්ට අවශ්‍ය සහාය ලබාදීමට මණ්ඩලය සූදානම් බව සඳහන් කළ යුතුය.

අප රටෙහි නිරන්තරයෙන් වෙනස්වන සමාජ ආර්ථික පරිසරය සහ ජනගහන රටාවන් තුළ ලාභදායි වර්ධනයක් අත්කරගැනීමට හැකිවන පරිද්දෙන් රක්ෂණ කර්මාන්තයේ දිගු කාලීන අවශ්‍යතා පිළිබඳ අවබෝධයක් සහිතව නවීන රක්ෂණ ක්‍රමයන් හඳුන්වාදීම සඳහා අපි රුකුල් දෙන්නෙමු. නව රක්ෂණ ක්‍රමයන් නිර්මාණය කිරීමේදී රක්ෂණ කර්මාන්තයේ සමස්ථ ගතිකත්වය තක්සේරු කිරීමේ වැදගත්කම, කර්මාන්තයේ නියාමක වශයෙන් අපි අවධාරණය කරන්නෙමු. තවද, ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය උපායමාර්ගික පෙරදැක්මක් ඇති, එමෙන්ම කලාපීය වශයෙන් ආදර්ශමත් ස්ථානයක සිටීමට හැකියාවක් ඇති කර්මාන්තයකි. රක්ෂණ ක්ෂේත්‍රයේ නියාමකයා ලෙස මෙම කර්මාන්තයේ දියුණුව අරභයා ගන්නා සෑම ප්‍රයත්නයකදීම අපගේ පූර්ණ සහයෝගය ලබාදීමට සහතික වන්නෙමු.

**ස්තූතිය**

ප්‍රථමයෙන්, රක්ෂණ මණ්ඩලයේ මාගේ මිත්‍ර සාමාජිකයන්ගෙන් ලැබෙන අප්‍රමාණ සහයෝගය සහ වටිනා දායකත්වය වෙනුවෙන් ඔවුනට මාගේ ස්තූතිය පුදකිරීමට මෙය අවස්ථාවක් කරගනිමි. එමෙන්ම රක්ෂණ ඔම්බුඩ්ස්මන්, ශ්‍රී ලංකා රක්ෂණකරුවන්ගේ ආයතනය, ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමය ඇතුළු කර්මාන්තයේ සියලු පාර්ශ්වකරුවන් අප වෙත ලබාදෙන්නා වූ විශිෂ්ඨ සහයෝගය සහ සුහද සම්බන්ධතාවය වෙනුවෙන්ද මාගේ ස්තූතිය පුදකරමි. එසේම, ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරිය, අධ්‍යක්ෂකවරුන් හා අනෙකුත් සෙසු කාර්ය මණ්ඩලය විසින් මණ්ඩලයේ පරමාර්ථ ඉටුකරගැනීමේ ක්‍රියාවලියේදී දක්වනු ලබන කැපවීම විශේෂයෙන් සිහිපත් කිරීමට කැමැත්තෙමි. රක්ෂණ මණ්ඩලයේ දැක්ම සහ මෙහෙවර අනුව ඒ පරමාර්ථ ඉටුකරගැනීමෙන් ඉදිරි වර්ෂ වලදීද මෙම කාර්ය මණ්ඩලය විසින් මණ්ඩලයේ උපායමාර්ග අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ඇතැයි මම ඉතා සුභවාදීව විශ්වාස කරමි.



**ඉන්ද්‍රාණි සුගතදාස**
*සභාපතිනිය*
*2015 ජුනි 22*



## 2014 වසරේ දී රක්ෂණ මණ්ඩලයේ සේවය කළ සාමාජිකයින්ගේ නම්

ඉන්ද්‍රාණී සුගතදාස මහත්මිය - සභාපතිනිය
එස්. ආර්. ආටිගල මහතා - සාමාජික
බී. ඩී. ඩබ්ලිව්. ඒ. සිල්වා මහතා - සාමාජික
ඩී. එන්. ආර්. සිරිවර්ධන මහතා - සාමාජික
සමන්ත කුමාරසිංහ මහතා - සාමාජික
නලින් ආටිගල මහතා - සාමාජික

# අධ්‍යක්ෂ ජනරාල්වරියගේ සමාලෝචනය

> “අවදානම් සංවේදී ප්‍රාග්ධන ආකෘතිය ක්‍රියාත්මක කිරීමට සමාන්තරව, රක්ෂණ මණ්ඩලය විසින් අධීක්ෂණ කාර්යය ගොඩනැඟීම කෙරෙහි ද අවධානය යොමු කර ඇත. මණ්ඩලය සිය අධීක්ෂණ කාර්යය ශක්තිමත් කිරීමේ පරිමාර්ථය ඇතිව රීති පාදක අධීක්ෂණ රාමුවක සිට අවදානම් පාදක අධීක්ෂණ රාමුවක් දක්වා සංක්‍රමණය වෙනු ඇත.”



ආසියාවේ රක්ෂණ නියාමනයේ මිනුම් ලකුණ කරා ළඟා වීමට අපගේ ගමන්මගේ ශක්තිමත් හා අනවරත කාර්යසාධනය සහිත සාර්ථක වර්ෂයක් මා වාර්තා කරන්නේ ඉතා සතුටිනි.

**නියාමන හා අධීක්ෂණ ප්‍රතිසංස්කරණ**

සංයුක්ත රක්ෂණ සමාගම් විභේදනය කිරීමේ සාර්ථක හා සුමට මාරුවීම, නියාමන ක්ෂේත්‍රයේ සිදු වූ ඉතාම වැදගත් ජයග්‍රහණයක් ලෙසට මම සලකමි. සංයුක්ත සමාගම් දොළහ අතුරින් විභේදන ක්‍රියාවලිය කර ගෙන යාම සඳහා පනවන ලද නියාමන කාලසීමාව ඉටු කර ගැනීම සඳහා සමාගම් හතක් වෙත බලපත්‍ර ප්‍රදානය කිරීමට රක්ෂණ මණ්ඩලයට හැකි විය. අනෙක් සංයුක්ත සමාගම් පහ විභේදනය කිරීමට උත්සුක වුව ද අභියෝග කීපයක් ජයගැනීමට සිදුව ඇත. මෙම භාරදූර කර්තව්‍යයේ දී සීමාකම් හා අභියෝග රාශියකට මුහුණ දෙමින්, ඉතා උත්සුකව කටයුතු කළ රක්ෂණ කර්මාන්තයේ පාර්ශ්වකරුවන් සහ රක්ෂණ මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ස්තුති කිරීමට මම කැමැත්තෙමි. සංයුක්ත සමාගම් විභේදනය තුළින් වැඩි ඉලක්කයත්, පාරදෘශ්‍යභාවයත්, ඔප්පු හිමියන්ගේ ආරක්ෂාවත් සහ වාසිදායකභාවය කෙරෙහි දෘශ්‍යතාවක් ප්‍රවර්ධනය කරනු ඇතැයි අපේක්ෂා කරයි. එමෙන්ම විභේදන ක්‍රියාවලිය පහසු කිරීමට හා ඒ සම්බන්ධව මතු වන කෙටි කාලීන පිරිවැය ඉහළයාම අවම කිරීම සඳහා රක්ෂකයින් අතර ඇතැම් සේවා බෙදා හදා ගැනීමට ද මණ්ඩලය අවසර දී ඇත. රක්ෂණ සමාගම් විභේදනය සිදු කිරීමේදී බලපාන අයබදු සම්බන්ධයෙන් රක්ෂණ මණ්ඩලය කර්මාන්තයට ලබා දුන් නිදහස් කිරීම් සම්බන්ධයෙන් සහතික පිළිබඳව සඳහන් කිරීම ද වැදගත් වේ.

# අධ්‍යක්ෂ ජනරාල්වරියගේ සමාලෝචනය

රක්ෂණ නියාමන ක්ෂේත්‍රයේ සිදු වන ගෝලීය ප්‍රතිසංස්කරණවල වැදගත්කම හඳුනාග නිමින් රක්ෂණ මණ්ඩලය ස්ථාවර ප්‍රාග්ධන ක්‍රමයක සිට අවදානම් සංවේදී ප්‍රාග්ධන ක්‍රමයක් වෙත සංක්‍රමණය වීම තුළින් තවත් වැදගත් නියාමන විප්ලවයක් වෙත ගමන් ආරම්භ කර ඇත. අවදානම් සංවේදී ප්‍රාග්ධන ආකෘතිය මගින් අවශ්‍ය කරන ප්‍රාග්ධන මට්ටම තීරණය කිරීම සඳහා සමාගමක අවදානම් අභිරුචිය සැලකිල්ලට ගන්නා අතර එහි ප්‍රතිඵලයක් ලෙස සමාගමක ශික්ෂිත ආයෝජන කෘත්‍යයක් ඇති කිරීම බලාපොරොත්තුවේ. නව රීති දැනට පවතින නුබුන්වත් සීමා රීති ප්‍රතිස්ථාපනය කරනු ලබන අතර 2016 වසරේ සිට ක්‍රියාත්මකවීම ආරම්භ වෙනු ඇත. මෙම නව ප්‍රාග්ධන ආකෘතිය ලෝක බැංකුවේ සහ First Initiative අනුග්‍රහය ඇතිව 2009 වසරේ දී ආරම්භ කළ ව්‍යාපෘතියක් හරහා ගොඩනගන ලද අතර දේශීය හා විදේශීය වශයෙන් පවත්වන ලද විස්තීරණ පර්යේෂණවලට පසුව ශ්‍රී ලංකා රක්ෂණ කර්මාන්තයටම ආවේණික ප්‍රාග්ධන ආකෘතියක් හඳුන්වා දීම සාර්ථක විය. මෙම රීති ඉතා ක්‍රමානුකූලව ගොඩනගන ලද අතර රක්ෂණ මණ්ඩලයේ ශක්‍යතාවන් හා දැනුම වැඩිදියුණු කිරීමට මෙන්ම කර්මාන්තයේ ද දැනුම ඉහළ නැංවීමට ක්‍රියාමාර්ග ගන්නා ලද බව සඳහන් කිරීම ඉතා වැදගත් වේ. නව රීති හඳුන්වා දීම සඳහා මූලික වශයෙන් මාර්ග පරීක්ෂණයක් (road test) පවත්වා 2014 වසරේ සිට ඉදිරි වසර දෙක තුල සමාන්තර ක්‍රියාත්මක කිරීමක් (Parallel run) සිදු කිරීමට නියමිතය. කර්මාන්තය සඳහා වැඩමුළු හා පුහුණු වැඩසටහන් රාශියක් පවත්වන ලද අතර මෙම සමාන්තර ක්‍රියාත්මක කිරීම අතරතුර දී කර්මාන්තයේ අනුකූලතාව පිළිබඳව සමාගම් දැනුවත් කරනු ලබන අතර අවශ්‍ය අවස්ථාවල දී රක්ෂණ මණ්ඩලය විසින් අනුකූලතා සඳහා උපදෙස් ලබා දෙනු ලැබේ.

අවදානම් සංවේදී ප්‍රාග්ධන ආකෘතිය ක්‍රියාත්මක කිරීමට සමාන්තරව, රක්ෂණ මණ්ඩලය විසින් අධීක්ෂණ කාර්යය ගොඩනැඟීම කෙරෙහි ද අවධානය යොමු කර ඇත. මණ්ඩලය සිය අධීක්ෂණ කාර්යය ශක්තිමත් කිරීමේ පරමාර්ථය ඇතිව රීති පාදක අධීක්ෂණ රාමුවක සිට අවදානම් පාදක අධීක්ෂණ රාමුවක් දක්වා සංක්‍රමණය වෙනු ඇත. ලෝක බැංකුව මගින් මෙම ව්‍යාපෘතිය සඳහා වූ තාක්ෂණික සහාය ලබා දුන් අතර අවදානම් පාදක ප්‍රාග්ධන ව්‍යාපෘතියේ 2 වැනි අදියර ලෙස ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතිය 2013 වසරේ දී ආරම්භ කරන ලද අතර සමාලෝචිත කාලපරිච්ඡේදය ඇතුලත දී ව්‍යාපෘතිය ආශ්‍රිත වැඩකටයුතු රාශියක් සම්පූර්ණ කරන ලදී. රක්ෂණ කර්මාන්තය ආශ්‍රිත අවදානම් සංවේදී ප්‍රාග්ධනය ක්‍රියාවට නැංවීමේදී කර්මාන්තයට ඇති විය හැකි බලපෑම් අවම කිරීම සඳහා ක්ෂණික ප්‍රතිකර්මදායී ක්‍රියාමාර්ග ගැනීම සඳහාත් මණ්ඩලයේ අධීක්ෂණ ශක්‍යතාව වැඩිදියුණු කිරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන පරමාර්ථය වේ. මෙම ක්‍රමය රීති පාදක අධීක්ෂණ ක්‍රමයකට වඩා දියුණු ක්‍රමයකි. ප්‍රතිරක්ෂණය, ප්‍රතිරක්ෂකයින්, අලාභ ගලපන්නන්, ආයෝජන හා ආයෝජවලට සම්බන්ධ නිපැයුම් යන ක්ෂේත්‍රවල අධීක්ෂණ ධාරිතා සංවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතියෙන් ඉලක්ක කරයි.

### කර්මාන්තයේ කාර්යසාධනය

වසර තුළ දී කර්මාන්තය (රු. මිලියන 55,262ක) සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය සහ (රු. මිලියන 44,610ක) දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය යන අංශ දෙකේම සිය වර්ධනය අඛණ්ඩව අත් කර ගත් අතර වර්ෂය තුළ දී 5.14%ක සමස්ත දළ ලිඛිත වාරික ආදායම් වර්ධනයක් වාර්තා කළේය. කෙසේවුව ද, 2013 වසර හා සැසඳීමේ දී සමස්ත වර්ධන අනුපාතය 43%කින් පමණ අඩු වී ඇත (2013: පහළ බැසීම 19%කි). දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරය (7.04%) හා සැසඳීමේ දී සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ (3.66%) වඩාත් අඩු වර්ධනයක් දක්නට ලැබුනි. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ මෙම අඩු වර්ධන රටාව 2012 වසරේ සිටම අඛණ්ඩව පැවතුනි. වසරතුළ දී මුහුදු, විවිධ හා මෝටර් රථ යන රක්ෂණ ව්‍යාපාර මන්දගාමී වර්ධන අනුපාත අත්දැක තිබෙන අතර ගිනි රක්ෂණ ව්‍යාපාරය 2013 වසරේ දී අත්කර ගත් 16.25%ක ධනාත්මක වර්ධනය හා සැසඳීමේ දී 0.97%ක ඍණ වර්ධන අනුපාතයක් අත් කර ගෙන තිබේ. පසුගිය වසර පහේ කාලපරිච්ඡේදය තුළදී 100% ක් ඉක්මවා ගොස් ඇති සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සංයුක්ත අනුපාතිකය 2014 වසරේ දී 109.66%ක ඉහළම අගයක් වාර්තා කර තිබීම තවත් සැලකිය යුතු වැදගත් සාධකයකි. දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරයේ ද වසර ගණනාවක් තිස්සේ සිදු වූ පවරාදීම් (surrenders) ඉහළ යමින් පවතින අතර නිකුත් කරන ලද නව ඔප්පුවල ප්‍රතිශතයක් ලෙස නියත ඉහළ අනුපාතයක අහෝසි වූ ඔප්පු (19%ක් පමණ) ද කර්මාන්තය තුළ දක්නට ලැබේ.

කෙසේවුවද, ආර්ථිකයේ දළ දේශීය ආදායම ශක්තිමත්ව ඉහළ යාමත් දීර්ඝ කාලීන හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර යන අංශ දෙකේම අඩු ව්‍යාප්ති මට්ටම් දක්නට ලැබුනද, මහජන විශ්වාසය ගොඩනැගීම තුලින්, රක්ෂණයේ සංකල්පය හා ප්‍රතිලාභ සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීම තුලින් සහ ඉහල උපයෝජන ආදායමක් තුලින් රක්ෂණ කර්මාන්තයේ දියුණුවක් බලාපොරොත්තු විය හැක.

1.02%ක දළ ලිඛිත වාරික ආදායම්/ දළ දේශීය නිෂ්පාදන අනුපාතිකයක් පවත්වා ගනිමින් ව්‍යාප්ති මට්ටම් අඛණ්ඩව අඩු මට්ටම් වාර්තා කළේය. 2014 වර්ෂය සඳහා වූ සාමාන්‍ය හා දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර සඳහා වූ ව්‍යාප්ති මට්ටම් පිළිවෙලින් 0.56%ක් සහ 0.46%ක් ලෙස වාර්තා විය.

මෙයට ප්‍රතිවිරුද්ධව, දළ ලිඛිත වාරික ආදායම ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස කැපී පෙනෙන වර්ධනය හේතුවෙන් ඒක පුද්ගල දළ ලිඛිත වාරික ආදායම මගින් නිරූපිත රක්ෂණ ඝණත්වය 2013 වසරේ දී වාර්තා වූ රු. 4,637 සිට 2014 වසරේ දී රු. 4,831ක් දක්වා වර්ධනය වී ඇත.

රක්ෂණ සමාගම්වල මුළු වත්කම් 2010 වසරේ සිට සීග්‍රයෙන් වර්ධනය වී ඇති අතර 2013 වසර හා සැසඳීමේ දී 13.81%ක වර්ධන අනුපාතයක් සටහන් කර ඇත. තවද, 2013 වසර හා සැසඳීමේ දී රක්ෂණ සමාගම්වල කොටස්හිමියන්ගේ අරමුදල් 17.96% ක කැපීපෙනෙන වර්ධනයක් පෙන්නුම් කර ඇත.

රක්ෂණ සමාගම්වල බෙදාහැරීමේ මාර්ග සම්බන්ධයෙන් සැලකීමේ දී රක්ෂණ නියෝජිතයින් දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයේ බෙදාහැරීමේ මාර්ගයේ ආධිපත්‍ය පතුරුවා සිටින බවටත් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ බෙදාහැරීමේ මාර්ගය රක්ෂකයින්ගේ සෘජු ව්‍යාපාර මගින් යොමු කරන බවටත් අප දැක තිබේ. තව ද දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය බෙදාහැරීම සඳහා Bancassurance මාර්ගයේ වර්ධනයක් ද 2014 වසරේ දී අපට දැක ගත හැකි වේ.

# අධ්‍යක්ෂ ජනරාල්වරියගේ සමාලෝචනය

2013 වසරේ දී රු. මිලියන 14,380ක් වූ මුළු දළ ලිඛිත වාරික ආදායම සඳහා රක්ෂණ තැරැව්කාර සමාගම්වල දායකත්වය හා සැසඳීමේ දී 2014 වසරේ එම අගය රු. මිලියන 14,716ක් දක්වා ඉහළ ගිය අතර 2.34%ක වර්ධනයක් වාර්තා කර ඇත. පිළිවෙලින් රු. මිලියන 14,558ක් (98.93%) සහ රු. මිලියන 158ක් (1.07%) වන සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය හරහා උත්පාදනය කළ වාරික ආදායම සහ දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය මෙම දායකත්වයට ඇතුලත් වේ.

**මානව සම්පත්**

අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය තුළින් කාර්යය මණ්ඩලයේ කාර්යසාධන මට්ටම වැඩිදියුණු කළ හැකිය යන සංකල්පය පෙරදැරිව සිය මානව ප්‍රාග්ධනය සඳහා ආයෝජනය කිරීමට රක්ෂණ මණ්ඩලය අඛණ්ඩව කටයුතු කරන ලදී. රක්ෂණ මණ්ඩලය පරිණත, වෘත්තීයභාවය අතින් සුදුසුකම්ලත්, මනාව පුහුණුව ලත් කාර්යමණ්ඩලයකින් සංයුක්ත වන අතර රක්ෂණ කර්මාන්තයේ ගතික වෙනස්කම්වලට ගැලපීම සඳහා ඔවුන්ගේ දැනුම වැඩිදියුණු කිරීම පිණිස පුහුණුව ලබාදීමේ දී රක්ෂණ මණ්ඩලය සාර්ථක වී ඇත.

**ඉදිරි දැක්ම**

රක්ෂණ මණ්ඩලය සිය නියාමන රාමුව අන්තර්ජාතික ප්‍රමිතිවලට ගැලපීම සඳහා අන්තර්ජාතික රක්ෂණ නියාමන කරුවන්ගේ සංගමයෙන් නිකුත් කර ඇති රක්ෂණ හර මුලධර්ම (ICP's) සමඟ සසඳා අගය කිරීම ආරම්භ කර ඇත. මෙම කාලය තුළ දී රක්ෂණ මණ්ඩලය රක්ෂණ හර මුලධර්මවල (ICP's) සමාලෝචනවලට සහභාගී වී ඇති අතර වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීමට හැකි වී ඇත. මෙම වැඩිදියුණු කිරීම් ව්‍යවස්ථා සංශෝධන හරහා හෝ අනුනීතිකරණ ප්‍රතිශෝධන මඟින් සිදු කරනු ඇත.

වෙළඳපොළ හැසිරීම පිළිබඳ මුලධර්ම හඳුන්වාදීම ඉදිරි වසරවල දී අවධානය යොමු කරන ක්ෂේත්‍රයකි. මෙය රක්ෂණ හර මුලධර්මවල (ICP's) සමාන්තරව සිදු කරනු ඇත. බොහෝ පොදු වේදිකාවල දැඩි සාකච්ඡාවට භාජනය වූ මාතෘකාවක් වන මෙය සාර්ථකව ක්‍රියාත්මක කිරීමෙන් කර්මාන්තය කෙරෙහි ඇති මහජන විශ්වාසය ඉහළ නැංවීමට සමත් වනු ඇත. පසුගිය වසර කීපය තුළ දී මණ්ඩලය වෙත ඔප්පු හිමියන්ගේ පැමිණිලි සැලකිය යුතු සංඛ්‍යාවක් ඉදිරිපත් කර ඇති බව පෙනේ. රක්ෂණය පිළිබඳව මහජන විශ්වාසය ගොඩනැඟීම සඳහා ඒ සම්බන්ධයෙන් ඉටු කළ යුතු කටයුතු රාශියක් ඇති අතර ඒවා කර්මාන්තයේ දියුණුව සඳහා අත්‍යවශ්‍ය වේ. සමාලෝචිත වර්ෂය අතරතුර දී මණ්ඩලය වෙනත් කරුණු අතර, රක්ෂණයක් තිබීමේ වැදගත්කම පිළිබඳව දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් දැනුවත් කිරීමේ ව්‍යාපාර පැවැත්වීම, විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යය හරහා සහ ප්‍රදර්ශනවලට සහභාගීවීම හරහා දැනුම බෙදා හැරීම වැනි වෙළඳපොළ සංවර්ධන කටයුතු සිදු කරන ලදී.

මණ්ඩලය, "ක්ෂුද්‍රරක්ෂණ" වෙළඳපොළ සංවර්ධන ක්‍රියාකාරකමක් ලෙස සංවර්ධනය කිරීමේ වැදගත්කම හඳුනා ගනිමින්, සහභාගීවන්නන් අතර දැනුම වර්ධනය කිරීමට හා මෙම ක්ෂේත්‍රයේ සංවර්ධනය ගොඩනැගීම සඳහා "ක්ෂුද්‍රරක්ෂණය" පිළිබඳ වැඩමුළුවක් සංවිධානය කරන ලදී. මෙම වැඩමුළුව මණ්ඩලය විසින් ඉදිරියේ දී ඉටු කිරීමට බලාපොරොත්තු වන විශාල ව්‍යාපෘතියක ආරම්භය වේ.

**ස්තුතිය පුද කිරීම**

සභාපතිතුමිය සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුම සාමාජිකයින් මෙම වසර තුළ දී මා සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම වෙත ලබා දුන් මගපෙන්වීම හා අප්‍රතිහත අනුග්‍රහය වෙනුවෙන් මාගේ අවංක කෘතඥතාව පළ කිරීමට කැමැත්තෙමි. සභාපතිතුමිය ඇගේ දැනුම් සම්භාරය ඔස්සේ අභියෝගාත්මක අවස්ථාවල දී අපට මගපෙන්වා ඇති අතර අප සැබවින්ම ඇයට කෘතඥ වෙමු.
එමෙන්ම මා කෙරෙහි විශ්වාසය තබා, ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරිය ලෙස පත් කිරීම පිළිබඳව ද මම සභාපතිතුමියට සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුම සාමාජිකයින්ට මාගේ අවංක ස්තුතිය පුද කිරීමට කැමැත්තෙමි.

IASL, SLIBA සහ SLII යන ආයතනවල සභාපතිතුමන්ලා සහ නිලධාරීන් රක්ෂණ මණ්ඩලය වෙත දක්වන ලද සහයෝගය වෙනුවෙන් ඔවුන්ට ද මාගේ ස්තුතිය පළ කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි. අවසාන වශයෙන්, මෙම වසර සඳහා වූ අපගේ ඉලක්ක අත්කර ගැනීම උදෙසා අධ්‍යක්ෂ කණ්ඩායමේ හා කාර්යමණ්ඩලයේ ඉහළ මට්ටමේ කැපවීම හා දැඩි කාර්යභාරය වෙනුවෙන් ඔවුන්ට ද මාගේ ස්තුතිය හා අගය කිරීම ප්‍රකාශ කරන්නට කැමැත්තෙමි.



**දමයන්ති ප්‍රනාන්දු**
*අධ්‍යක්ෂ ජනරාල්*
*2015 ජූනි 22වැනි දින*

# මණ්ඩලයේ සාමාජිකයින්
















# මණ්ඩලයේ සාමාජිකයින්

1. ඉන්ද්‍රානී සුගතදාස මහත්මිය
   *සභාපතිනි*

2. පුෂ්පා වෙල්ලප්පිලි මෙනෙවිය
   *සාමාජික*

3. පී. සමරසිරි මහතා
   *සාමාජික*

4. ඩී. එන්. ආර්. සිරිවර්ධන මහතා
   *සාමාජික*

5. ජෙරොම් බෝලින් මහතා
   *සාමාජික*

6. ආචාර්ය ඒ. ඒ. ශබීර් ගුලාම්හුසේන් මහතා
   *සාමාජික*

7. අසංග අබේගුණසේකර මහතා
   *සාමාජික*

# මණ්ඩල සාමාජිකයින් පිළිබඳව

### 1) ඉන්ද්‍රානී සුගතදාස මහත්මිය

2010 වසරේ සිට මණ්ඩලයේ සභාපතිනිය ලෙස කටයුතු කරයි. කොළඹ මියුසියස් විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය ලද සුගතදාස මහත්මිය කොළඹ විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධිය ලබා, අනතුරුව ඕස්ට්‍රේලියාවේ මොනෑෂ් සරසවියෙන් ව්‍යාපාර/රාජ්‍ය පරිපාලන ශාස්ත්‍රපති උපාධිය හිමිකරගෙන ඇත. මීට අමතරව, ඇය 1990 වර්ෂයේ එක්සත් ජනපද රාජ්‍යයෙන් පිරිනමන හියුබට් එච්. හම්ප්‍රි අධි ශිෂ්‍යත්වයක් ලැබ, එම වර්ෂය තුළ නිව්යෝර්ක් නුවර සරසවියට අනුබද්ධිතව අධ්‍යාපනය ලබා ඇත.

1977 දී ශ්‍රී ලංකා පරිපාලන සේවයට ඇතුළත් වුනු සුගතදාස මහත්මිය සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යංශයට අනුයුක්තව සිය වෘත්තීය දිවිය ආරම්භ කරන ලදී. ඇයගේ වසර 35 ඉක්මවා ගිය දීර්ඝ කාලීන සේවා කාලය තුළ ඇය දැරූ ජ්‍යෙෂ්ඨ තනතුරු අතර ජාතික තරුණ සේවා සභාවේ අධ්‍යක්ෂිකා, ශ්‍රී ලංකා කාන්තා කාර්යංශයේ අධ්‍යක්ෂිකා, ළමා සංවර්ධන හා වනිතා කටයුතු අමාත්‍යංශයේ ස්ථිර ලේකම්, සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යංශයේ ස්ථිර ලේකම් සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සභාපති යන තනතුරු විය.

සුගතදාස මහත්මිය ශ්‍රී ලංකාව නියෝජනය කරමින්, විදේශ රාජ්‍යයන් විසින් හා ජාත්‍යන්තර ආයතන විසින් සංවිධානය කරන ලද සම්මන්ත්‍රණ සහ වැඩමුළු ගණනාවකට ද සහභාගි වී ඇත.

වර්තමානයේදී සුගතදාස මහත්මිය ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ සභාපති ධූරයට අමතරව ජාතික සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකාවක් ලෙස සහ කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ අධ්‍යක්ෂිකාවක ලෙසද කටයුතු කරයි.

සිය රාජ්‍ය සේවා කාලය තුළ සුගතදාස මහත්මිය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, අපනයන සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය, ජාතික තරුණ සේවා සභාව, මධ්‍යම පරිසර අධිකාරිය, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, ජාතික වැවිලි කළමනාකරණ ආයතනය සහ තේ, පොල්, රබර් යන පර්යේෂණ ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක ලෙස ද කටයුතු කර ඇත.

සුගතදාස මහත්මිය රාජ්‍ය සේවයට කළ දායකත්වය හා විවිධ ක්ෂේත්‍රයන්හි කටයුතු කරමින් ලබාදෙන ලද නායකත්වය අගයමින් ඇය වෙත ප්‍රදානයන් හා සම්මාන කිහිපයක්ම ලැබී ඇති අතර 2013 ඕස්ට්‍රේලියානු ඇලුම්නි විශිෂ්ට සම්මානයෙන්ද ඇය පිදුම් ලැබුවාය.

### (2) පුෂ්පා වෙල්ලප්පිලි මෙනෙවිය

පුෂ්පා වෙල්ලප්පිලි මෙනෙවිය ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරිනියකි. රාජ්‍ය සේවය තුළ වසර 32කට වැඩි සේවා කාලය තුළ දී ඇය ජනාධිපතිතුමාගේ අතිරේක ලේකම්, මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, නිවාස හා නාගරික සංවර්ධනය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂිකා, පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස් යන ආයතනවල තනතුරු දරා ඇත.

කොළඹ විශ්වවිද්‍යාලයේ නීතිය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ද, ශ්‍රී ලංකා විවෘතවිශ්වවිද්‍යාලයේ නීති උපාධියක් ද යාපනය විශ්වවිද්‍යාලයේ ගණිතය හා සංඛ්‍යානය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධියක් ද නෙදර්ලන්තයේ රොටර්ඩෑම්වල පිහිටි නිවාස හා නාගරික සංවර්ධන අධ්‍යයන ආයතනයේ නාගරික සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද ඇය සතුය. ඇය ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරියක් ද වේ.

වෙල්ලප්පිලි මෙනෙවිය වර්තමානයේ දී මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ධූරය ද හොබවයි. මෙයට අමතරව ඇය, ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නිලබලයෙන් පත්වූ අධ්‍යක්ෂිකාවක් ලෙස සේවය කරමින් සිටී.

### (3) පී. සමරසිරි මහතා

පී. සමරසිරි මහතා වර්තමානයේ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපති වේ. නියෝජ්‍ය අධිපති ධූරයට පත් කරනු ලැබීමට පෙර එතුමා සහකාර අධිපති, මුදල් මණ්ඩලයේ ලේකම්, මහ බැංකුවේ අනුකූලතා නිළධාරී සහ බැංකු අධීක්ෂණය පිළිබඳ අධ්‍යක්ෂ ආදී තනතුරු ගණනාවක සේවය කර ඇත. එමෙන්ම ඔහු පසුගිය වසර පහක කාලය තුළ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ උප-සභාපති ධූරය දරන අතර 2015 පෙබරවාරි මාසය තෙක් ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති අධීක්ෂණ මණ්ඩලයේ සභාපති ධූරය ද හොබවන ලදී.

සමරසිරි මහතාට කොළඹ විශ්වවිද්‍යාලයෙන් පිරිනමන ලද ආර්ථික විද්‍යාව පිළිබඳ (ගෞරව) ශාස්ත්‍රවේදී උපාධියක් හා ඇමෙරිකා එක්සත් ජනපදයේ කැන්සාස් විශ්වවිද්‍යාලයෙන් පිරි නමන ලද ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් හිමි වන අතර සංඛ්‍යාලේඛන, ආර්ථික ප්‍රතිපත්ති, බැංකු හා බැංකු නොවන මූල්‍ය ආයතනවල නියාමනය හා අධීක්ෂණය, මූල්‍ය තත්ත්ව ස්ථායීතාව, සංස්ථානික පාලනය, ව්‍යවහාර මුදල් කළමනාකරණය, විදේශ විනිමය ප්‍රතිපත්ති, මූල්‍ය බුද්ධි හා කලාපීය සංවර්ධනය ආදී ක්ෂේත්‍ර සම්බන්ධයෙන් වසර 33ක අත්දැකීම් සහිත නිලධාරියෙකි.

සමරසිරි මහතා මහ බැංකුව මඟින් ප්‍රකාශයට පත් කළ "මුදල් ගනුදෙනු, බැංකු සහ ආර්ථිකය", "මූලික ආර්ථික විද්‍යා මූලධර්ම විග්‍රහය" සහ "ආර්ථික විද්‍යා මූලධර්ම සහ ප්‍රතිපත්ති" යන පොත් රචනා කර ඇත. මෙයට අමතරව එතුමා විවිධ ප්‍රකාශන හා පුවත්පත්වලට ආර්ථික හා මූල්‍ය මාතෘකා පිළිබඳ ලිපි පළ කර ඇත.

### (4) ඩී. එන්. ආර්. සිරිවර්ධන මහතා

ඩී. එන්. ආර්. සිරිවර්ධන මහතා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ භූගෝලීය විද්‍යාව පිළිබඳ (ගෞරව) ශාස්ත්‍රවේදී උපාධියක් ද ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ නීති උපාධියක් ද හිමි කර ගෙන ඇති අතර කොළඹ විශ්වවිද්‍යාලයෙන් පවත්වනු ලබන නීතිපති උපාධි වැඩසටහන සඳහා ලියාපදිංචි ශිෂ්‍යයෙකි. ඔහු වෘත්තියෙන් නීතිඥයෙකි. සිරිවර්ධන මහතා 1988 දී සමාගම් පරීක්ෂකවරයෙක් ලෙස සමාගම්

# මණ්ඩල සාමාජිකයින් පිළිබඳ

ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවට බැඳුණු අතර 2001 වසරේ දී සමාගම් අතිරේක රෙජිස්ට්‍රාර් ධූරයට උසස් කරන ලදී. ඔහු සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (රාජකාරී ආවරණය කිරීම) සඳහා පත් කරන ලදී. සිරිවර්ධන මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ නිල බලයෙන් පත් වූ සාමාජිකයෙක් වන අතර ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ නිල බලයෙන් පත් වූ සාමාජිකයෙක් ද වේ.

### (5) ජෙරොම් බෝලින් මහතා

ලන්ඩනයේ වරලත් රක්ෂණ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙක් වන අතර සිඩ්නි විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳව ශාස්ත්‍රපති උපාධියක් හිමි කර ගත් අයෙකි. රක්ෂණ අංශයේ වසර 20කට වැඩි අත්දැකීම් සහිත ඒ මහතා ශ්‍රී ලංකාව, ඕස්ට්‍රේලියාව සහ මාලදිවයින ආදී රටවල් රාශියක රක්ෂණ සමාගම් හා රක්ෂණ/ප්‍රතිරක්ෂණ තැරැව්කාර සමාගම්වල සේවය කර අත්දැකීම් සහිත ප්‍රවීණයෙකි. වර්තමානයේ දී NHJ අවදානම් කළමනාකරණ සේවා පී/එල්, ඔක්ටැගන් කන්සල්ටන්ට්ස් පී/එල් සහ එන්ඩ්ලස් අවුට්ඩෝර්ස් පී/එල් යන සමාගම්වල අධ්‍යක්ෂකවරයා ලෙස සේවය කරයි.

### (6) ආචාර්ය ඒ. ඒ. ශබීර් ගුලාම්හුසේන් මහතා

දේශබන්දු ආචාර්ය අලි අස්ගර් ශබීර් ගුලාම්හුසේන් මහතා ඇඩම් ඉන්වෙස්ට්මන්ට්ස් පීඑල්සී සමාගමේ සභාපතිවරයා ලෙස සේවය කරයි. ආචාර්ය ගුලාම්හුසේන් මහතා ජපානයේ ටෝකියෝ විශ්වවිද්‍යාලයෙන් ලැබූ දර්ශනශූරී උපාධියක් ද එක්සත් රාජධානියේ ලන්ඩන්වල කින්ග්ස් කොලීජියෙන් ලැබූ උපාධියක් ද හිමි වේ. ආචාර්ය ගුලාම්හුසේන් මහතා "දේශබන්දු, මානවහිතවාදී, ලංකාපුත්‍ර" යන කීර්තිමත් ගෞරව නාමයන්ගෙන් පිදුම් ලැබ ඇති අතර අධිකරණ අමාත්‍යාංශය, සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය, ඵලදායීත්වය ප්‍රවර්ධන අමාත්‍යාංශය යන අමාත්‍යාංශවල උපදේශකයෙක් ලෙස ද (මුළු දිවයිනටම) සාම විනිසුරුවරයෙක් ලෙස ද සේවය කරයි.

ආචාර්ය ගුලාම්හුසේන් සෙලොන් ඇන්ඩ් ෆොරින් ට්‍රේඩ්ස් පීඑල්සී, ඔරියන්ට් ගාමන්ට්ස් පීඑල්සී, පීසීඑච් හෝල්ඩින්ග්ස් පීඑල්සී, ඇඩම්එක්ස්පෝ (පුද්) සමාගම, ස්පයිස් ඔෆ් ලයිෆ් (පුද්) සමාගම, නෙට්වර්ක්ස් කමියුනිකේෂන්ස් (පුද්) සමාගම, ඇඩම් ඇපරල්ස් (පුද්) සමාගම, ඇඩම් මෙටල්ස් (පුද්) සමාගම, පියෝපියෝ මොරන්ඩි (පුද්) සමාගම, සෝනාක්ෂි ඉන්වෙස්ට්මන්ට්ස් (පුද්) සමාගම, සෝනාක්ෂි ජෙම්ස් (පුද්) සමාගම, ඇඩම් එයා කන්ඩිෂනර්ස් (පුද්) සමාගම, ඇඩම් ඔටෝමොබයිල්ස් (පුද්) සමාගම, සීමාසහිත කොළඹ ඇපොතිකර් සමාගම, වාණිජ මණ්ඩලය, හැමිල්ටන් රිසෝට්ස් (පුද්) සමාගම, සෙලෝන් ඇන්ඩ් ෆොරින් ට්‍රේඩ් සර්පි-ටෙක් (පුද්) සමාගම, කොළඹ ගැල්කුලී හා ප්‍රවාහන සමාගම සහ ඩොබ්වෙල් ඇන්ඩ් කම්පැනි ලිමිටඩ් සමාගම යන ආයතනවල අධ්‍යක්ෂවරයා ලෙස ද සේවය කරයි.

### (7) අසංග අබේගුණසේකර මහතා

අසංග අබේගුණසේකර මහතා ලෝක ආර්ථික සංසදය සඳහා තරුණ ගෝලීය නායකයෙක් (YGL) වෙයි. උපායමාර්ග අධ්‍යයනය සඳහා වූ කලාපීය කේන්ද්‍රයේ (RCSS) සාමාජිකයෙකි.

අබේගුණසේකර මහතා හිටපු අග්‍රාමාත්‍යවරයෙක් සහ ජාතික විද්වතෙක් වූ අන්තර්ජාතික සබඳතා සහ ක්‍රමෝපායන අධ්‍යයන සඳහා වූ ලක්ෂ්මන් කදිරගාමර් ආයතනයේ (LKIIRSS) අධ්‍යක්ෂක වන අතර තානාපති සේවා පුහුණු ආයතනයක් වන BIDTI,හි අධ්‍යක්ෂ ජනරාල්වරයා වේ.

රජයේ පරිපාලන අංශයේ වසර දහයකට වැඩි අත්දැකීම් සහිත එම මහතා විදේශ රැකියා නියෝජිතායතනය සහ ලංකා ධීවර වරාය සංස්ථාවේ හිටපු සභාපති වන අතර ශ්‍රී ලංකා ටෙලිකොම් සහ හචිසන් සමාගම වැනි පුද්ගලික අංශයේ ද සේවය කර ඇත. රජයේ සියලුම තනතුරු තුන සඳහා මෙතෙක් කල් පත් කරනු ලැබූ වයසින් අඩුම තැනැත්තා ඔහු වේ. එතුමා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂකවරයෙක් විය. ජාතික විද්‍යා පදනම සඳහා වූ අනු-කමිටුවල සාමාජිකයෙක් ලෙස ද විද්‍යාව තාක්ෂණය හා නවෝත්පාදන සඳහා සම්බන්ධීකරණ මහ ලේකම් කාර්යාලයේ (COSTI) සාමාජිකයෙක් ලෙස ද සේවය කර ඇත.

Global Shapers Colombo Hub යන සංවිධානයේ මූලාරම්භක පාලකයා වන ඔහු Global Dignity (globaldignity.org) යන සංවිධානයේ ශ්‍රී ලාංකික සභාපතිවරයා ද වේ. තව ද ඔහු ශ්‍රී ලංකාවේ ප්‍රජා පාදක රාජ්‍ය-නොවන සංවිධානයක් වන "දිරි සවිය" පදනමේ සභාපති සහ ප්‍රාරම්භකයා වේ. කණිෂ්ඨ ලෝක ව්‍යවසායකත්ව සංසදයේ ශ්‍රී ලංකා අංශයේ මූලාරම්භකයා සහ සභාපති ද වේ.

අබේගුණසේකර මහතාට පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේ දී උපාධියක් ද බටහිර ඔස්ට්‍රේලියානු විශ්වවිද්‍යාලයෙන් පිරි නමන ලද ව්‍යාපාර පරිපාලනවේදය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ද හිමි වන අතර හාවඩ් කෙනඩි විද්‍යාලයෙන්, යේල් විශ්වවිද්‍යාලයේ ගෝලීය කටයුතු පිළිබඳ ජැක්සන් ආයතනය, රාජ්‍ය ප්‍රතිපත්තිය පිළිබඳ LKY පාසැල (සිංගප්පූරුව) සහ (හයිද්‍රබාද්) ISB ආයතනයෙන් විධායක අධ්‍යාපනය සම්පූර්ණ කළේය. අබේගුණවර්ධන මහතා ශාන්ත තෝමස් ප්‍රාථමික පාසැලෙන් සහ කොළඹ ආනන්ද විද්‍යාලයෙන් සිය මූලික අධ්‍යාපනය ලැබීය.

ජිනීවාවල ලෝක ආර්ථික සංසදය සහ ප්‍රංශයේ ලෝක ව්‍යවසායකත්ව සංසදය සඳහා මණ්ඩල සාමාජිකයෙක් ලෙස අබේගුණසේකර මහතාට ආරාධනා ලැබීය. මෙයට අමතරව ඇ.එ.ජ., දකුණු අප්‍රිකාව, දකුණු හා ගිණිකොනදිග ආසියාවේ, චීනය, රුසියාව සහ ඩේවෝස් යන රටවල පැවති අන්තර්ජාතික සම්මන්ත්‍රණවල දී එතුමා මණ්ඩල සාමාජිකයෙක් ලෙස කටයුතු කර ඇත.

අබේගුණසේකර මහතා ඇමෙරිකා එක්සත් ජනපද රාජ්‍ය IVLP දෙපාර්තමේන්තුවේ සහ වොෂින්ටන් නුවර පිහිටි ජාතික ආරක්ෂක විශ්ව විද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙක් වේ. එමෙන්ම එතුමා අන්තර්ජාතික දේශපාලන ආර්ථිකය පිළිබඳ බාහිර කථිකාචාර්යවරයෙක් ලෙස ද සේවය කරයි.














# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම

1. දමයන්ති ප්‍රනාන්දු මහත්මිය
   *(අධ්‍යක්ෂ ජනරාල්වරිය)*
2. නිහාල් රාමනායක මහතා
   *(අධ්‍යක්ෂ - අධීක්ෂණ)*
3. චායා විතානවසම් මහත්මිය
   *(අධ්‍යක්ෂ - මූල්‍ය හා පරිපාලන)*
4. සුධීර සේනාරත්න මහතා
   *(අධ්‍යක්ෂ - විමර්ශන)*
5. චමරී ඒකනායක මහත්මිය
   *(සහකාර අධ්‍යක්ෂ - අධීක්ෂණ)*
6. රාජන් නිරූබසිංහම් මහතා
   *(සහකාර අධ්‍යක්ෂ - නීති)*

# කාර්ය මණ්ඩලය




1. ලක්ෂ්මන් විජේසිංහ මහතා
2. ලසන්ති තොටහේවා මහත්මිය
3. බිම්සර විජේසිංහ මහතා
4. සාරිකා වත්තුහේවා මහත්මිය
5. චතුරි බණ්ඩාර මහත්මිය
6. ප්‍රියංගි ද සිල්වා මහත්මිය
7. තනුජා ඇන්තනී මහත්මිය
8. ඩෙසිකා රත්නායක මහත්මිය
9. එච්. පී. අසංක මහතා
10. ශ්‍යාමලී රත්නායක මහත්මිය
11. උපේන්ද්‍රා සෙනෙවිරත්න මහත්මිය
12. කෞශාලි දයාරත්න මහත්මිය
13. තුෂාරි විජේගුණවර්ධන මහත්මිය
14. කෝකිලා සිරිවර්ධන මහත්මිය
15. චරිත වික්‍රමසිංහ මහතා
16. ලක්මාල් කළුබෝවිල මහතා
17. පවිත්‍රා පුංචිහේවා මහත්මිය
18. තිළිණි වාකිෂ්ඨ මහත්මිය

# කාර්ය මණ්ඩලය































19. උපලක්ෂි රණසිංහ මෙය
20. ෂශිනි ප්‍රේමලාල් මහත්මිය
21. ශානිකා නානායක්කාර මහත්මිය
22. රොෂාන් ද කොස්තා මහතා
23. සුජීවා රණසිංහ මහත්මිය
24. එතිර්රාජ් ශ්‍රීකාන්තන් මහතා
25. ඩී. ඩබ්ලිව්. එස්. එස්. සුපුලී මහත්මිය
26. මෙරීනා ඩයස් මහත්මිය
27. චන්දිමා කඹුරුගමුව මහත්මිය
28. මල්හාරී වික්‍රමසිංහ මහත්මිය
29. රුවිනි ලියනගේ මහත්මිය
30. වීණා දිනේකා මහත්මිය
31. සමන් සේනාධීර මහතා
32. සනත් උදයංග මහතා
33. චමින්ද ලාල් කුමාර මහතා
34. ලක්මාලි අල්ගම මහත්මිය (ඡායාරූපයේ නැත)
35. හසිනි පෙරේරා මහත්මිය (ඡායාරූපයේ නැත)



# සමාලෝචන


**පොදු සමාලෝචනය** **22**

**සංඛ්‍යානමය සමාලෝචනය** **27**

**මෙහෙයුම් කටයුතු සමාලෝචනය**

- අධීක්ෂණ සමලෝචනය 70
- නියාමන සමාලෝචනය 74
- විමර්ශන සමාලෝචනය 81
- වෙළඳපොළ සංවර්ධනය සහ බාහිර සබඳතා සමාලෝචනය 85
- පරිපාලනමය සමාලෝචනය 88
- මූල්‍ය සමාලෝචනය 89

# පොදු සමාලෝචනය

## පනත ක්‍රියාත්මක කිරීම

### නීති සම්පාදනය

රක්ෂිත ඔප්පු හිමියන්ගේ සහ අනාගත රක්ෂණ ඔප්පු හිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ අරමුණ ඇතිව ශ්‍රී ලංකවේ රක්ෂණ කර්මාන්තය සද්භාවයෙන් ද වෘත්තීමය හා විචක්ෂණභාවයෙන් ද යුතුව කරගෙන යනු ලබන බවට සහතික කිරීම (මෙහි මින් මතු මණ්ඩලය යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ පරමාර්ථය හා වගකීම වේ.

රක්ෂණ සමාගම්, රක්ෂණ තැරැව්කරුවන්ගේ සමාගම්, රක්ෂණ නියෝජිතයින් සහ අලාභ ගලපන්නන් නියාමනය හා අධීක්ෂණය සඳහා අවශ්‍ය නෛතික රාමුව 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත (මෙහි මින් මතු "පනත" යනුවෙන් සදහන් කරනු ලබන) මඟින් සලසා ඇත.

මෙම පනත, 2007 අංක 27 සහ 2011 අංක 3 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත්වලින් සංශෝධනය වී ඇත.

රක්ෂණ කර්මාන්තය වඩාත් ශක්තිමත් කිරීම පිණිස ප්‍රධාන පනතටත් ඊට අදාළ උපනීතිවලටත් සංශෝධන කිහිපයක් වරින් වර හඳුන්වා දෙන ලද අතර මෙම වසර තුළ සිදු කළ සංශෝධන මෙකී වාර්තාවේ නියාමන සමාලෝචනයෙහි සවිස්තරාත්මකව දැක්වේ.

### වෙළඳපොළ ව්‍යුහය

### රක්ෂණ සමාගම්

පනතේ 12 වන වගන්තියට අනුව, පනතේ විධිවිධානවලට යටත්ව, යම් තැනැත්තකු ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාර කර ගෙන යාමට මේ පනත යටතේ තත් කාලයේ ලියාපදිංචි වී ඇත්නම් හෝ ලියාපදිංචි කර ඇතැයි සලකනු ලබන්නේ නම් මිස, ඒ තැනැත්තා ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාර කර ගෙන යනු නොලැබිය යුතුය.

පනතේ 13 වන වගන්තියට අනුව ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාරයේ නියැලෙන්නට උනන්දුවක් දක්වන තැනැත්තෙකු 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ පොදු සමාගමක් වශයෙන් සංස්ථාපනය විය යුතු අතර පනතෙන් නිශ්චිතව දක්වා ඇති අනෙකුත් සියලුම ව්‍යවස්ථාපිත අවශ්‍යතා සපුරාලීමෙන් අනුතුරුව පනත යටතේ ලියාපදිංචි වී රක්ෂකයෙක් වශයෙන් බලපත්‍රය ලබා ගත යුතුය.

වසර අවසාන වන විට සමාගම් 21ක් රක්ෂකයින් ලෙස ක්‍රියාකාරීව පැවති අතර සෙලින්කෝ තකාෆුල් ලිමිටඩ් මත පණවන ලද ලියාපදිංචිය අත්හිටුවීම 2009 වසරේ සිට අඛණ්ඩව ක්‍රියාත්මක වේ. රක්ෂණ ව්‍යාපාර සමාගම් මෙහෙයුම් සඳහා ලියාපදිංචි වී ඇති පන්තීන් රූප සටහන 1 මඟින් දැක්වේ. ක්‍රියාකාරීව පවතින සමාගම් 21න් 12ක් දිගු කාලීන හා සාමාන්‍ය යන දෙආකාරයෙන්ම රක්ෂණ කටයුතු කරන සංයුක්ත සමාගම් වන අතර සමාගම් 3ක් දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය ද සමාගම් 6ක් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු ද සිදු කරනු ලබයි.

### වෙන් කිරීම


මණ්ඩලය විසින් රක්ෂණ ව්‍යාපාරයේ සුමට පරිවර්තනයක් සිදු කිරීම සඳහා රක්ෂණ කර්මාන්තයේ නියැලෙන්නන්ගේ අදහස් විමසන ලදුව සංයුක්ත රක්ෂකයින් වෙන් කිරීම පිළිබඳව මාර්ගෝපදේශයක් නිකුත් කර ඇත.

(මෙහි මින් පසු "සංශෝධිත පනත" ලෙස හඳුන්වනු ලබන) 2011 අංක 3 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 53 වන වගන්තිය ප්‍රකාරව සංයුක්ත රක්ෂණ සමාගම් 2015 පෙබරවාරි මාසය වන විට හෝ ඊට පෙර රක්ෂණ ව්‍යාපාර පන්ති දෙක (මෙහි මින් පසු "වෙන් කළ රක්ෂණ සමාගම්/ වෙන් කළ රක්ෂණ සමාගම" ලෙස හඳුන්වනු ලබන) වෙනස් සමාගම් දෙකකට වෙන් කිරීමට අවශ්‍ය වේ.

සමාලෝචිත වර්ෂය තුළ දී සංශෝධිත පනතේ 53 වැනි වගන්තියට අනුකූලවීම සඳහා සංයුක්ත සමාගම් ඉදිරිපත් කරන ලද අතර, වසර අවසානය වන විට මණ්ඩලය විසින් සමාගම් 8කට ලියාපදිංචිය ප්‍රදානය කරන ලදී. කෙසේවුව ද, මණ්ඩලය විසින් එම නව සමාගම් අට අතුරින් සමාගම් 7කට 2015 ජනවාරි 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි බලපත්‍ර නිකුත් කර ඇති අතර, ඉතිරි සමාගමට බලපත්‍ර නිකුත් කිරීම සඳහා අවශ්‍ය ප්‍රාග්ධනයට අනුකූල වන ලෙසට මණ්ඩලය විසින් නියෝග කර ඇත.

**රූප සටහන 1**

*රක්ෂණ සමාගම් විසින් කර ගෙන යනු ලබන රක්ෂණ ව්‍යාපාර පන්තීන්*




### රක්ෂණ තැරැව්කරුවන්


රක්ෂණ තැරැව්කරුවකු යනු 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද හා රක්ෂණ තැරැව්කාර ව්‍යාපාරයෙහි යෙදීම සඳහා පනත යටතේ ලියාපදිංචි කරන ලද සමාගමක් වේ. රක්ෂණ තැරැව්කරුවන් යනු තැරැව්කාර ගාස්තු හෝ කොමිස් මුදල් අපේක්ෂාවෙන් රක්ෂණ සමාගමක් හෝ ප්‍රතිරක්ෂණ සමාගමක් සමඟ හෝ ඔවුන් වෙනුවෙන් රක්ෂණ ව්‍යාපාර ඇතිකිරීම සඳහා රක්ෂණ සමාගම් හෝ රක්ෂණ සහතික දරන්නන් හෝ රක්ෂණය හෝ ප්‍රතිරක්ෂණ සඳහා

# පොදු සමාලෝචනය

යෝජනාකරන්නන් අතර අතරමැදියන් ලෙස කටයුතු කරන්නන් අදහස් කෙරේ. වසර අවසානයේ දී සමාගම් 58ක් රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර ලෙස ලියාපදිංචි වී තිබුණි. එකී සමාගම් අතුරින් සමාගම් 39ක් දිගු කාලීන හා සාමාන්‍ය රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර යන දෙකහිම ලියාපදිංචි වී සිටි අතර සමාගම් 19ක් සාමාන්‍ය රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර කටයුතුවල පමණක් යෙදී සිටියේය. පහත 2 වන රූප සටහන මඟින් රක්ෂණ තැරැව්කාර සමාගම් ව්‍යාපාර මෙහෙයුම් සඳහා ලියාපදිංචි වී ඇති පන්තීන් දැක්වේ.

**රූප සටහන 2**

***රක්ෂණ තැරැව්කාර සමාගම් විසින් කරගෙන යනු ලබන රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර පන්තීන්***




### රක්ෂණ නියෝජිතයින්

පනත යටතේ රක්ෂණ සමාගමක් හෝ රක්ෂණ තැරැව්කාර සමාගමක් සමඟ ලියාපදිංචි වී සිටින සහ එම රක්ෂණ සමාගම් හෝ රක්ෂණ තැරැව්කාර සමාගම් සඳහා රක්ෂණ ව්‍යාපාර සොයා දීම වෙනුවෙන් ප්‍රතිශ්ඨාව ලෙස කොමිස් ලබා ගන්නා පුද්ගලයින් රක්ෂණ නියෝජිතයින් වේ. එලෙස ලියාපදිංචිය ලබා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් මණ්ඩලය විසින් නිශ්චිතව දක්වා ඇත.

පනතේ 34 වන වගන්තිය අනුව රක්ෂණ නියෝජිතයින් රක්ෂණ සමාගම්වලට රක්ෂණ ව්‍යාපාර සොයා දෙනු ලබන වැදගත් ප්‍රවාහයන්ගෙන් එකක් වේ.


රක්ෂණ සමාගම් විසින් සපයා ඇති තොරතුරුවලට අනුව, වසර තුළ දී රක්ෂණ නියෝජිතයින් වශයෙන් බඳවා ගෙන ඇති මුළු තනි පුද්ගලයින් සංඛ්‍යාව 17,018ක් පමණ අතර එය පසුගිය වසරේ (15,606) සිට 9.05%ක ඉහළ යාමකි.

වසර අවසානය වන විට රක්ෂණ සමාගම් නියෝජනය කරමින් සිටි මුළු තනි රක්ෂණ නියෝජිත සංඛ්‍යාව 42,985ක් පමණ වූ අතර එය පසුගිය වසරේ 38,635 සිට 11.19% ක ඉහළයාමකි.

3 වන රූපසටහනෙන් රක්ෂණ සමාගම් සමඟ ලියාපදිංචි වී සිටින රක්ෂණ නියෝජිතයින් සංඛ්‍යාව නිරූපණය වේ.

**රූප සටහන 3**

***රක්ෂණ සමාගම්වල ලියාපදිංචි තනි රක්ෂණ නියෝජිතයින්***





පසුගිය වසර තුළ දී ආසන්න වශයෙන් තනි රක්ෂණ නියෝජිතයින් 395ක් පමණ රක්ෂණ තැරැව්කාර සමාගම් සමඟ ලියාපදිංචි වී ඇත.

### සමාගම්වල තත්ත්වය සහ ප්‍රාග්ධන වෙනස්කම්

රක්ෂණ සමාගම් අතරින් සමාගම් 7ක් කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තු ගත කොට ඇත. නම් වශයෙන් ඒවා සෙලින්කෝ ඉන්ෂුවරන්ස් පීඑල්සී, ඒඅයිඒ ඉන්ෂුවරන්ස් ලංකා පීඑල්සී, යුනියන් ඇෂුවරන්ස් පීඑල්සී,ඒෂියන් එලායන්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී, එච්එන්බී ඇෂුවරන්ස් පීඑල්සී, අමානා තකාෆුල් පීඑල්සී සහ ජනශක්ති ඉන්ෂුවරන්ස් පීඑල්සී වේ. ලැයිස්තුගත සහ ලැයිස්තුගත නොවූ රක්ෂණ සමාගම්වල ප්‍රතිශතය 4 වන රූපසටහනේ දැක්වේ.

**රූප සටහන 4**

***ලැයිස්තුගත කරන ලද/ ලැයිස්තුගත නොකරන ලද රක්ෂණ සමාගම්වල තත්ත්වය***



# පොදු සමාලෝචනය

සංශෝධිත පනතින්, රක්ෂණ සමාගම්, 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍රලාභී කොටස් හුවමාරුවක ලැයිස්තුගතව තිබීම අවශ්‍ය කරයි. සංයුක්ත රක්ෂණ සමාගම් 2015 පෙබරවාරි මාසය වන විට හෝ ඊට පෙර ඒවායේ ව්‍යාපාර කටයුතු වෙන්, වෙන් සමාගම් දෙකකට වෙන් කිරීමට සහ 2016 පෙබරවාරි මාසය වන විට හෝ ඊට පෙර ලැයිස්තුගත කිරීමට ද අවශ්‍ය වේ.

සංශෝධිත පනත බලාත්මක වූවායින් පසුව ලියාපදිංචිය ලැබූ නව රක්ෂණ සමාග මක් මණ්ඩලය මඟින් බලපත්‍රයක් නිකුත් කරනු ලැබීමෙන් වසර තුනක කාලයක් ඇතුලත දී 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍රලාභී කොටස් හුවමාරුවක ලැයිස්තුගත විය යුතු බවට දක්වා ඇත.

2011 ජුනි මාසයට පෙරාතුව ලියාපදිංචිය ලද රක්ෂණ සමාගම්, 2015 පෙබරවාරි මස වන විට හෝ එදිනට පෙර එක් ව්‍යාපාර පන්තියක් සඳහා තමන්ගේ ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනය රුපියල් මිලියන 500 අවමයක් දක්වා වැඩි කළ යුතු බවට මණ්ඩලය නියම කර ඇත.

2011 ජුනි මාසයට පසුව ලියාපදිංචි වූ රක්ෂණ සමාගම්වලට රුපියල් මිලියන 500කට නොඅඩු ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනයක් ඇත.

එමෙන්ම මණ්ඩලය රක්ෂණ සමාගම් සඳහා අවදානම් පාදක ප්‍රාග්ධන රීති හඳුන්වාදීමේ ක්‍රියාවලියක නිරතව සිටී. මෙම රීතිවලින් වර්තමානයේ ඇති නුබුන්වත් සීමා රීති ප්‍රතිස්ථාපනය කරනු ලබන අතර 2016 වසරේ සිට ඉදිරියට ඒවා පිළිපැදීම අනිවාර්ය වනු ඇත.

රක්ෂණ තැරැව්කාර සමාගම් සඳහා මෙකී තත්ත්වය වන්නේ, එකී සමාගමේ 2014 දෙසැම්බර් 31 වන දින හෝ එදිනට පෙර රුපියල් මිලියන 2.5කට නොඅඩු ගෙවී නිමි කොටස් ප්‍රාග්ධනයක් තිබිය යුතු වීමයි.

### රක්ෂණ සමාගම්වලින් සෙස් බද්දක් අය කිරීම

පනතේ 7 වන වගන්තිය යටතේ ගරු මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා විසින් රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලක් පිහිටුවීම සඳහා සෙස් බද්දක් අය කිරීමේ නියෝගයක් පනවන ලදී. 2002 ජූලි 9 වන දින අංක 1244/5 දරන ගැසට් නිවේදනය මඟින් දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයක සමස්ථ ශුද්ධ වාරිකයෙන් 0.2%ක් ද සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයක සමස්ත ශුද්ධ වාරිකයෙන් 0.4%ක් ද වශයෙන් රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට බැර කළ යුතු බවට පැහැදිලි කොට ඇත. රක්ෂකයන්ගෙන් සෙස් බදු එකතු කිරීම 2003 ජනවාරියේ සිට ක්‍රියාත්මක වූ අතර 2014 වසරේ එසේ එකතු කරන ලද මුදල රුපියල් මිලියන 274කි. වගුව 1 මඟින් සෙස් බද්ද හා ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල ගැන දැක්වේ.

### ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල

පනතේ 103 වන වගන්තිය ප්‍රකාර ස්ථාපනය කෙරුණු ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට රක්ෂකයන්ගෙන් එකතු කළ සෙස් බද්ද තැන්පත් කරනු ලැබේ. වර්තමාන මෙන්ම අනාගත ඔප්පු හිමියන්ගේ ද යහපත උදෙසා මෙම අරමුදල පහත දැක්වෙන කාර්යයන් සඳහා යොදා ගනු ලැබේ.


අ) රක්ෂණ කර්මාන්තය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ දීත්, රක්ෂණ කර්මාන්තය සංවර්ධනය කිරීම් කටයුතුවලදීත් සිදුවන වියදම් පියවාලීම සහ

ආ) මණ්ඩලය එහි බලතල, වගකීම් හා මෙහෙයුම් ක්‍රියාවට නැංවීමේ දී දරනු ලබන වියදම් පියවා ගැනීම.

ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ ඇති වත්කම් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කෙරේ. 2014 දෙසැම්බර් 31 වන දිනට එම අරමුදලේ සංචිතය රුපියල් මිලියන 2,185ක් විය. මෙය පසුගිය වසරට වඩා (රුපියල් මිලියන 1,778) 22.89% ක වර්ධනයකි.

**වගුව 1**

*සෙස් බද්ද හා ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල*



# පොදු සමාලෝචනය

**රක්ෂණ බදු**

සාමාන්‍ය රක්ෂණ කටයුතුවල කිසිදු පන්තියක් සඳහා වන බදු කිසිවක් දැනට ක්‍රියාත්මක නැත. 2002, 2005 හා 2007 යන වර්ෂවල ජනවාරි 1 වැනි දින සිට අනුපිළිවෙලින් ක්‍රියාත්මක වන පරිදි මෝටර් රථ රක්ෂණය, ගිනි රක්ෂණය සහ කම්කරු වන්දි රක්ෂණය මත ක්‍රියාත්මක වූ බදු අහෝසි කරන ලදී.

**පනතේ බලපෑමෙන් නිදහස්වීම**

1999 අංක 20 දරන කෘෂි හා වගා රක්ෂණ පනත මඟින් ස්ථාපනය කරන ලද කෘෂි හා වගා රක්ෂණ මණ්ඩලය, 1978 අංක 15 දරන ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථා පනත මඟින් ස්ථාපිත ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව, 1996 අංක 17 දරන සමාජ රක්ෂණ මණ්ඩලය පනත යටතේ ස්ථාපිත සමාජ රක්ෂණ මණ්ඩලය ආදියට පනතේ 12(3) වන වගන්තිය ප්‍රකාරව පනතෙන් පැණවෙන නීති රීති අදාළ නොවේ.

**ජාතික රක්ෂණ භාර අරමුදල (NITF)**

2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනත මඟින් ස්ථාපනය කරන ලද ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය, පනතට කරන ලද සංශෝධනයක් මඟින් මණ්ඩලයේ විෂය පථය තුළට ග්‍රහණය කරනු ලැබ ඇත.

ජාතික රක්ෂණ භාර අරමුදල් පනත ප්‍රකාරව මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යනු ලැබූ වර්ජන, කැරලි, සිවිල් කැළඹීම් හා ත්‍රස්ත අරමුදල ජාතික රක්ෂණ භාර අරමුදලට පවරන ලදී. ජාතික රක්ෂණ භාර අරමුදල වෙනුවෙන් වර්ජන, කැරලි, සිවිල් කැළඹීම් හා ත්‍රස්ත අවදානම් ආවරණය කෙරෙන රක්ෂණ කටයුතු කරන සමාගම්, අයකර ගන්නා වාරික ජාතික රක්ෂණ භාර අරමුදලට බැර කළ යුතුය.

2007 අංක 27 දරන සංශෝධන පනත අනුව සියළු ලියාපදංචි රක්ෂණ සමාගම් සාමාන්‍ය රක්ෂණ කටයුතු සඳහා වන ප්‍රතිරක්ෂණ වගකීමෙන 50%ක් නොඉක්මවන ප්‍රතිශතයක් ජාතික රක්ෂණ භාර අරමුදලට ලබා දිය යුතුය. මේ සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් සියලු රක්ෂණ සමාගම් වෙත නියෝග යක් පනවමින් 2013 ජනවාරි මස 1 වැනි දින සිට සියළුම වර්ගයේ ප්‍රතිරක්ෂණ සම්මුතීන් සහ වෛකල්පිත ප්‍රතිරක්ෂණ සැලසුම් සඳහා 30%ක් ජාතික රක්ෂණ භාර අරමුදලට දායක කළ යුතු බවට දක්වා ඇත. මීට පෙර මෙම ප්‍රතිශතය 20%ක් විය.

**අනෙකුත් අදාළ කරුණු**

**මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව (NCRS)**

මෝටර් රථවාහන පනත යටතේ ස්ථාපනය කරනු ලැබූ මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව නම් වූ ආයතනය ප්‍රවාහන අමාත්‍යාංශයේ විෂය පථය යටතේ පවතී. මෝටර් රථවාහන රක්ෂණ ආවරණ ලබා දෙන රක්ෂකයින් සෑම කෙනෙකුම තෙවන පාර්ශ්වික රක්ෂණ ආවරණයකින් 1%ක් මාර්ග ආරක්ෂක අරමුදලට දායක කළ යුතුය. මෙම ජාතික සභාවේ පාලක සභාවෙහි ද රක්ෂණ මණ්ඩලයට නියෝජනයක් ඇත.

**අන්තර් නියාමන ආයතන සභාව (IRIC)**

අන්තර් නියාමන ආයතන සභාව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිහිටුවන ලද්දකි. ඉහළ මට්ටමෙ කමිටුවක් වන මෙහි ප්‍රධානත්වය ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා විසින් උසුලනු ලබන අතර මෙය පිහිටුවීමේ අරමුණ වූයේ මූල්‍ය වෙළඳපොළෙහි ක්‍රමානුකූල වර්ධනය සඳහා අවශ්‍ය නිසි ප්‍රතිපත්ති සම්පාදනය හා සමස්ථ මූල්‍ය පද්ධතියේම අභිවෘද්ධිය උදෙසා සියලු නියාමන නියෝජිතයින් සම්බන්ධීකරණය කරමින් තොරතුරු හුවමාරු කර ගැනීමයි. රක්ෂණ මණ්ඩලය අන්තර් නියාමන සභාවේ ද නියෝජනය වෙයි.

**ශ්‍රී ලංකා රක්ෂණ සංගමය (IASL)**

1989 දී ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා රක්ෂණ සංගමයේ සාමාජිකත්වය පනත යටතේ ලියාපදිංචිය ලබා ඇති සෑම රක්ෂණ සමාගමකටම ලබා ගත හැකිය. ජාතික රක්ෂණ භාර අරමුදල් හැර අනෙක් සියලු රක්ෂණ සමාගම් මෙම සංගමයේ සාමාජිකයෝය.

සියළුම රක්ෂණ සමාගම්හි ප්‍රධාන විධායක නිලධාරීන්ගෙන් සමන්විත විධායක කමිටුව සමස්ථ කළමනාකරණය පිළිබඳ වගකීම දරයි.

- ජීවිත රක්ෂණ සංසදය
- සාමාන්‍ය රක්ෂණ සංසදය
- මූල්‍ය තාක්ෂණ අනුකමිටුව
- නීති උපදේශන සංසදය
- මානව සම්පත් අනුකමිටුව
- තොරතුරු තාක්ෂණය පිළිබඳ අනු කමිටුව
- අලෙවිකරණය හා විකිණුම් සංසදය

යන කමිටු විසින් විධායක කමිටුවට සහය වෙමින් ස්වකීය වගකීම් හා අදාල වන්නාවූ විෂය ක්ෂේත්‍ර පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කෙරේ.

**ශ්‍රී ලංකා රක්ෂණ සංගමයේ ප්‍රධාන අරමුණුඃ-**

1. රක්ෂණය වන ජනතාව හා රක්ෂකයන්ගේ පොදු යහපත හා සුබසාධනය උදෙසා උපදෙස් සැපයීමටත්, සහයෝගීතාවටත් අවස්ථාව සලසනු වස් ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාරයේ නිරතව සිටින සියළු රක්ෂකයින් එකමුතු කිරීම.
2. රක්ෂණ ව්‍යාපාරය තුළ ඒකාකාරී යහපත් ක්‍රියා පිළිවෙළිවෙතක් හා උසස් සදාචාරාත්මක මට්ටමක් පවත්වා ගැනීම මා ප්‍රවර්ධනය කිරීම මඟින් රක්ෂණ ව්‍යාපාරය පිළිබඳ රක්ෂණය වන ජනතාවගේ විශ්වාසය වර්ධනය කිරීම.

# පොදු සමාලෝචනය

3. සාමාන්‍ය ජනතාව අතර රක්ෂණයේ අවශ්‍යතා හා වටිනාකම් පිළිබඳ දැනුවත්භාවය ගොඩනැගීම.
4. ව්‍යවස්ථාදායක හා නියාමන අවශ්‍යතා නිරීක්ෂණය තුළින් රක්ෂණ කර්මාන්තයේ ස්ථායීතාවය හා වර්ධනය සඳහා අදාළ බලධාරීන් වෙත කරුණු ඉදිරිපත් කිරීම.
5. වෙනත් රටවල රක්ෂණ ක්‍රමවේද හා තාක්ෂණික උපක්‍රම පරීක්ෂා කිරීම හා පුනරීක්ෂණය කිරීම මඟින් වඩාත් සුදුසු ක්‍රමවේදය ශ්‍රී ලංක වෙළඳපොළට යොදා ගැනීම.
6. අධ්‍යාපන හා පුහුණු වැඩමුළු ඔස්සේ රක්ෂණ ක්ෂේත්‍රයේ වෘත්තීයභාවය ප්‍රවර්ධනය දිරිගැන්වීම හා ඊට සක්‍රියව සහායවීම, ඒ සඳහා පන්ති, සම්මන්ත්‍රණ, වැඩමුළු, සංවාද, උපදේශන, රැස්වීම් පැවැත්වීම.

### ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමය (SLIBA)

මණ්ඩලය විසින් අනුමත කරන ලද එකම රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමය වන්නේ ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමයයි. පනතේ 79 වන වගන්තිය අනුව රක්ෂණ තැරැව්කාර සමාගමක් ලෙස ක්‍රියාකිරීමට අපේක්ෂා කරන සෑම සමාග මක්ම මණ්ඩලයේ ලියාපදිංචිය ලබා ගැනීමට පෙර මෙම සංගමයේ සාමාජිකත්වය ලබා ගැනීමට අවශ්‍ය වේ. සංගමය විසින් සකස් කරනු ලැබූ එහි කටයුතු සඳහා අදාළ නීති මාලාව සාමාජික සමාගම් විසින් පිළිපදිනු ලැබිය යුතු වන්නේය.

### ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමයේ ප්‍රධාන අරමුණු:

රක්ෂණ තැරැව්කරුවන්ගේ කාර්යභාරය පිළිබඳ මහජනතාව තුළ දැනුවත්භාවයක් ඇති කිරීම.

සාමාජිකයින් අතර තාක්ෂණික දැනුම වැඩි කිරීම හා ඉහළ මට්ටමක නිපුණතාවක් සහ වෘත්තීය භාවයක් ගොඩනැගීම.

රක්ෂණ පාඨමාලාවන් හැදෑරීම සහ වෘත්තීය සුදුසුකම් ලබා ගැනීමට සාමාජිකයින්ව දිරිමත් කිරීම හා සහයෝගය ලබා දීම.

නියාමකයින්, රක්ෂකයින් සහ මහජනතාව සමඟින් හොඳ හිත සහ හිතකර සබඳතාවන් පවත්වා ගැනීම.

### ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය (SLII)

1982 වසරේ දී ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය ලාභ නොලබන සංවිධානයක් වන අතර එහි ප්‍රධාන අරමුණ වන්නේ රක්ෂණ ව්‍යාපාරයෙහි නියුක්තවන්නන්ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීමයි. ආයතනය අරමුදල් සපයා ගන්නේ රක්ෂණ සමාගම්වලින් පිරිනමන දායකත්වය තුළින් හා සාමාජිකයන්ගේ වාර්ෂික සාමාජික මුදල්වලිනි.

### ශ්‍රී ලංකා රක්ෂණ ආයතනයේ ප්‍රධාන අරමුණු:

රක්ෂණ ක්ෂේත්‍රයේ නියුතු අයගේ පොදු සංවර්ධනය, ප්‍රගතිය හා කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය මධ්‍යම සංවිධානයක් ලෙස කටයුතු කිරීම හා ඔවුන්ගේ යහපත පිණිස මෙන්ම රක්ෂණ ව්‍යාපාරය වඩාත් කාර්යක්ෂම කිරීම හා කර්මාන්තය පිළිබඳව වෘත්තීකත්වය ලබා දීම.

රක්ෂණය පිළිබඳ වෘත්තීය සුදුසුකම් වර්ධනය කරවීමට ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර පාඨමාලා පැවැත්වීම තුළින් රක්ෂණය පිළිබඳ දැනුම වර්ධනය කිරීම. ඕනෑම පිළිගත් අධ්‍යාපන ආයතනයක් හරහා රක්ෂණ ක්ෂේත්‍රයේ ඕනෑම අංශයක විෂයයන් වෘත්තීය මට්ටමින් හැදෑරීම සඳහා සහාය දැක්වීමටත්, උනන්දු කිරීමටත් විභාග පැවැත්වීම.

වෘත්තීය කරුණු පිළිබඳව සාකච්ඡා, සම්මන්ත්‍රණ හෝ රැස්වීම් පැවැත්වීමටත්, පර්යේෂණ පත්‍රිකා, දේශන ආදිය ඉදිරිපත් කිරීමටත්, සාමාජිකයන්ට වැදගත් වන්නා වූ සිදුවීම්, වාර්තා හෝ ලැයිස්තු වැනි දේ සංස්කරණයටත් ඉඩ සැලසීම.

ශ්‍රී ලංකා රක්ෂණ ආයතනයේ සාමාජිකයන්ගේ අයිතිවාසිකම් සහ සුභසාධනය ආරක්ෂා කිරීමටත් ඔවුන්ගේ ප්‍රවර්ධනය පුළුල් කිරීමට මෙන්ම පොදුවේ ගත් කළ රක්ෂණ නිලධාරීන්ගේත්, ආයතනික සාමාජිකයින්ගේත් තත්ත්වයන් ඉහළ නැංවීම උදෙසා අවශ්‍ය වෘත්තීමය අධීක්ෂණය හා පාලනය ඇති කිරීම.

මෙම ආයතනය ලන්ඩනයේ වරලත් රක්ෂණ ආයතනයට අනුබද්ධව ඇති අතර ලන්ඩනයේ වරලත් රක්ෂණ ආයතනය, ඉන්දියාවේ රක්ෂණ ආයතනය සහ ඉන්දියාවේ ජීවගණක සංගමය වැනි වෘත්තීය ආයතනවල විභාග ද මෙහෙයවනු ලබයි. රක්ෂණ කර්මාන්තයෙහි නියැලෙන්නන් සඳහා සංගමය විසින් කෙටි කාලීන රක්ෂණ ඩිප්ලෝමා පාඨමාලා ද පවත්වනු ලැබේ.

රක්ෂණ නියෝජිතයින් ලෙස කටයුතු කිරීමට කැමැත්තක් දක්වන අය සඳහා පූර්ව බඳවා ගැනීම් පරීක්ෂණ සිදු කිරීමේ වගකීම මණ්ඩලය විසින් මෙම ආයතනයට පවරා ඇත. රක්ෂණ ක්ෂේත්‍රයෙහි සාමාන්‍ය හා දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර පන්ති දෙවර්ගය සඳහාම ආයතනය විසින් පූර්ව බඳවා ගැනීමේ පරීක්ෂණ පවත්වනු ලැබේ.

### රක්ෂණ අධීක්ෂකයන්ගේ ජාත්‍යන්තර සංගමය (IAIS)

රක්ෂණ අධීක්ෂකයන්ගේ ජාත්‍යන්තර සංගමයේ සාමාජිකයෙක් වශයෙන් ඔවුන් විසින් ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රකාශන මෙන්ම ප්‍රධාන රක්ෂණ ක්‍රියාපිළිවෙත් සහ සංගමයේ ක්‍රියාකාරකම් ආදිය පිළිබඳ තොරතුරු ද නිතිපතා මණ්ඩලයට ලැබේ. එම සංගමය විසින් නිර්දේශ කරනු ලබන සමහර ප්‍රධාන රක්ෂණ ක්‍රමපිළිවෙත් ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය ඵලදායී ලෙස අධීක්ෂණය කරනු හා මෙහෙයවනු පිණිස මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.

# සංඛ්‍යානමය සමාලෝචනය

**රක්ෂණ කර්මාන්තය පිළිබඳ දළ විශ්ලේෂණය**

2014 වසරේ දී ශ්‍රී ලංකා රක්ෂණ කර්මාන්තය රු. මිලියන 99,872ක් වූ දළ ලිඛිත වාරික ආදායමක් (ද.ලි.වා.ආ) උත්පාදනය කරමින් 5.14% ක වර්ධනයක් වාර්තා කළේය. 2013 වසරේ 8.97% ක් වූ එම අගය හා සසඳා බැලීමේ දී මෙය සාපේක්ෂව අඩු වර්ධන අනුපාතයකි. 2013 වසරේ දී සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ වාර්තා කළ 7.28% ක වර්ධන අනුපාතය හා සැසඳීමේ දී මෙම වසරේ එම අගය වූ 3.66% ක අඩු වර්ධන අනුපාතයක් ලෙස පෙනේ. දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරවල දළ ලිඛිත වාරික ආදායම ද 2014 වසරේ දී අඩු වර්ධනයක් අත්දැක තිබෙන අතර 2013 වසරේ දී වාර්තා කළ 11.20% හා සැසඳීමේ දී එය වර්ධනය වී ඇත්තේ 7.04% කින් පමණි.

2014 වසරේ දී ශ්‍රී ලංකා ආර්ථිකයේ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන අනුපාතය 2013 වසරේ දී වාර්තා කළ 7.20% හා සැසඳීමේ දී 7.40% කින් ස්ථාවරව වර්ධනය වූ අතර කාර්මික හා සේවා අංශවල සිදු වූ කැපී පෙනෙන වර්ධනය මේ සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. ශ්‍රී ලංකා මහ බැංකුව ක්‍රියාත්මක කළ මූල්‍ය ප්‍රතිපත්ති හේතුවෙන් පොළී අනුපාතිකයේ සහ උද්ධමනයේ අඩු වීමක් හා සාර්වආර්ථික සාධකවල සමස්ත ප්‍රගතියක් ප්‍රධාන වශයෙන්ම 1 වන වගුවේ නිරූපණය වන ආකාරයට ආර්ථිකයේ දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.) 2013 වසරේ දී වාර්තා කළ රු. බිලියන 8,674 හා සැසඳීමේ දී 2014 වසරේ දී රු. බිලියන 9,785 ක් දක්වා වර්ධනය වී ඇත. තව ද, 2008-2009 වසරවල මූල්‍ය අර්බුදයෙන් පසුව සිදු වූ ගෝලීය ආර්ථිකයේ ක්‍රමානුකූල වර්ධනය, 2014 වසර අවසාන භාගයේ දී සිදු වූ තෙල් මිල පහළයාම ආදිය ශ්‍රී ලංකා ආර්ථිකයට වාසිදායක ලෙස බලපා ඇත.

1 වන වගුවෙන් නිරූපණය වන පරිදි 2014 වසරේ දී දීර්ඝ කාලීන හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරවලින් උත්පාදන කළ ද.ලි.වා.ආ. රු. මිලියන 99,872 කි (2013: රු. මිලියන 94,987). 2014 වසරේ දී දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරවලින් උත්පාදනය කළ ද.ලි.වා.ආ. රු. මිලියන 44,610 ක් (2013: රු. මිලියන 41,676)වූ අතර සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරවලින් උපයන ලද එම අගය රු. මිලියන 55,262 (2013: රු. මිලියන 53,311) ක් වූ අතර පසුගිය වසර හා සැසඳීමේ දී මෙම පන්ති දෙකේම වර්ධන අනුපාතයේ පහළයාමක් වාර්තා කෙරිනි.

2014 වසරේ දී සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට සම්බන්ධ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය (SRCC & T) සඳහා වූ වාරික ආදායම රු. මිලියන 3,491 ක් (2013: රු. මිලියන 2,957) වූ අතර වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය (SRCC & T) සඳහා වූ වාරික ආදායම ඇතුළු සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ද.ලි.වා.ආ. 2014 වසරේ දී රු. මිලියන 58,753 ක් (2013: රු. මිලියන 56,268) විය.

මුළු රක්ෂණ වාරික ආදායම ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස නිරූපණය කරනු ලබන රක්ෂණ ව්‍යාප්තිය 2014 වසරේ දී 1.02%ක් ලෙස වාර්තා වූ අතර 2013 වසරේ දී 1.10% හා සැසඳීමේ දී පසු බෑමක් පෙන්නුම් කළේය. දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයේ ව්‍යාප්තිය 2014 වසරේ දී 0.46% ක් (2013: 0.48%) වූ අතර සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ව්‍යාප්තිය 2014 වසරේ දී 0.56% ක් (2013: 0.61%) ක් වූයේ පන්ති දෙකේම ව්‍යාප්ති මට්ටම්වල පහළ යාමක් වාර්තා කරමිනි. දීර්ඝ කාලීන සහ සාමාන්‍ය රක්ෂණ යන ව්‍යාපාර දෙක සඳහාම වාර්තා කළ අඩු වර්ධන අනුපාතික සහ අඩු ව්‍යාප්ති මට්ටම්වලින් සමාජයේ සියලුම කොට්ඨාස අතර රක්ෂණයේ ප්‍රතිලාභ පිළිබඳව ප්‍රවර්ධනය කිරීමේ දැඩි අවශ්‍යතාව සහ ගනුදෙනුකරුවන්ගේ විවිධාකාර අවශ්‍යතා සපුරා ලන රක්ෂණ නිපැයුම් ගොඩනැඟීමේ සහ පිරිනැමීමේ අවශ්‍යතාව නිරූපණය කරයි.

ජනගහනයේ එක පුද්ගල රක්ෂණ වාරික ආදායම නිරූපණය කරනු ලබන රක්ෂණ ඝනත්වය 2013 වසරේ දී වාර්තා වූ රු. 4,637 සිට 2014 වසරේ දී රු. 4,831 ක් දක්වා වැඩි වී ඇති අතර ජනගහනයේ සුළු වර්ධනය අනුව සලකා බලන කළ ඉහළ ගිය වාරික ආදායම හේතුවෙන් ප්‍රධාන වශයෙන් 4.18% කින් වර්ධනය වී ඇත.

# සංඛ්‍යානමය සමාලෝචනය

**වගුව 1**

***වාරික ආදායම සහ ව්‍යාප්තිය***

| | 2010 | 2011 | 2012 | 2013 (අ) | 2014 (ආ) |
|---|---|---|---|---|---|
| දීර්ඝ කාලීන රක්ෂණය (රු. මිලියන) | 31,152 | 35,162 | 37,477 | 41,676 | 44,610 |
| සාමාන්‍ය රක්ෂණය (රු. මිලියන) | 35,101 | 43,329 | 49,694 | 53,311 | 55,262 |
| මුළු වාරික ආදායම (රු. මිලියන) | 66,253 | 78,491 | 87,171 | 94,987 | 99,872 |
| මුළු වාරික ආදායම් වර්ධන අනුපාතය (%) | 15.12 | 18.47 | 11.06 | 8.97 | 5.14 |
| දළ දේශීය නිෂ්පාදිතය (රු. බිලියන)* | 5,604 | 6,544 | 7,579 | 8,674 | 9,785 |
| දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන අනුපාතය (%)* | 8.0 | 8.2 | 6.3 | 7.2 | 7.4 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ව්‍යාප්තිය - මුළු වාරික ආදායම | 1.18 | 1.20 | 1.15 | 1.10 | 1.02 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ව්‍යාප්තිය - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය | 0.56 | 0.54 | 0.49 | 0.48 | 0.46 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ව්‍යාප්තිය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය | 0.63 | 0.66 | 0.66 | 0.61 | 0.56 |
| රක්ෂණ ඝනත්වය - (මුළු වාරික ආදායම / ජනගහනය) (රුපියල්) | 3,208 | 3,761 | 4,288 | 4,637 | 4,831 |
| ජනගහනය '000 (මධ්‍ය වාර්ෂික) | 20,653 | 20,869 | 20,328 | 20,483 | 20,675 |

** මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව සහ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

*(අ) ප්‍රතිශ්ඨාපිත විගණන සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යා*

*සටහන්:*

1. *2010 වර්ෂයේ සිට රක්ෂණ සමාගම්වල සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ද.ලි.වා. ආදායම ගණනය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය වාරික ආදායම සලකා බලා නොමැත.*
2. *අවශ්‍ය කරන ලද සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුලත් නොවේ.*

# සංඛ්‍යානමය සමාලෝචනය

### රක්ෂණ සමාගම්වල මුළු වත්කම්

2 වන වගුවෙන් නිරූපණය කර ඇති පරිදි අන්තර් ව්‍යාපාර අංශ අතර වත්කම් ඉවත් කළ පසු 2014 දෙසැම්බර් 31වැනි දින වන විට රක්ෂණ සමාගම්වල මුළු වත්කම් රු. මිලියන 406,827 ක් (2013: රු. මිලියන 357, 465) වූ අතර 2013 වසර හා සැසඳීමේ දී 13.81% ක වර්ධන අනුපාතයක් පෙන්නුම් කළේය. 2 වන වගුවේ දක්වා ඇති අන්දමට රක්ෂණ සමාගම් සතු මුළු වත්කම් 2010 වසරේ සිට 2014 වසර දක්වා ප්‍රසස්ථ වර්ධනයක් දක්නට ඇත.

දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයේ වත්කම් 2014 දෙසැම්බර් මස 31 වන විට රු. මිලියන 249,850ක් වූ අතර (2013: රු. මිලියන 216,275) 2013 වසර හා සැසඳීමේ දී 2014 වසරේ දී 15.52% කින් වර්ධනය වී ඇත. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය සහ කොටස්හිමියන්ට අයත් වත්කම් 2014 දෙසැම්බර් මස 31 වන විට රු. මිලියන 163,834 ක් වූ අතර 2013 දෙසැම්බර් මස 31වන විට රු. මිලියන 148,410 ක් වූ වත්කම් වටිනාකම් හා සැසඳීමේ දී 2014 වසරේ දී 10.39%කින් වර්ධනය වී ඇත.

පලමුවන රූපසටහන මඟින් 2010 සිට 2014 දක්වා රක්ෂණ සමාගම්වල මුළු වත්කම්, වත්කම්වල වර්ධන අනුපාතය සහ අන්තර් ව්‍යාපාර වත්කම්වල වටිනාකම දක්වයි.

### වගුව 2

*රක්ෂණ සමාගම් සතු වත්කම්*

| | 2010 | 2011 | 2012 | 2013 (අ) | 2014 (ආ) |
|---|---|---|---|---|---|
| දීර්ඝ කාලීන රක්ෂණය (රුපියල් මිලියන) | 139,647 | 165,519 | 190,642 | 216,275 | 249,850 |
| සාමාන්‍ය රක්ෂණය සහ කොටස්හිමියන් (රුපියල් මිලියන) | 82,450 | 100,192 | 131,202 | 148,410 | 163,834 |
| **එකතුව** | ***219,102** | ***261,412** | ***315,817** | ***357,465** | ***406,827** |

** 3වන වගුවට අනුකූලව සංයුක්ත රක්ෂණ සමාගම්වල (දීර්ඝ කාලීන හා සාමාන්‍ය) අන්තර් ව්‍යාපාර අංශ අතර වත්කම් ඉවත් කර ඇත.*


*(අ) ප්‍රතිශ්ඨාපිත විගණන සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යා*

*සටහන:*

*1. අවශ්‍ය කරන ලද සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුලත් කර නොමැත.*

### රූප සටහන 1

*රක්ෂණ කර්මාන්තයේ මුළු වත්කම් සහ වත්කම්වල වර්ධන අනුපාතය*




*(අ) ප්‍රතිශ්ඨාපිත විගණන සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යා*

# සංඛ්‍යානමය සමාලෝචනය

**රක්ෂණ සමාගම්වල වත්කම් ව්‍යාප්තිය**

2014 දෙසැම්බර් 31 වන දිනට සහ 2013 දෙසැම්බර් 31 වන දිනට දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය කොටස් හිමියන්ට අයත් වත්කම් යටතේ රක්ෂණ සමාගම් වල වත්කම් ව්‍යාප්තිය 3 වන වගුවෙන් පැහැදිලි කර ඇත. රු. මිලියන 6,857 ක අන්තර් ව්‍යාපාර අංශ වත්කම් (2013: රු. මිලියන 7,221) ඉවත් කිරීමෙන් පසුව 2014 දෙසැම්බර් 31වන දිනට රක්ෂණ සමාගම්වල මුළු වත්කම් රු. මිලියන 406,827 ක් (2013: රු. මිලියන 357,465) විය.

පසුගිය වර්ෂයසේම, එස්එල්අයිසී සමාගම රක්ෂණ ව්‍යාපාරයේ වත්කම්වලින් රු. මිලියන 161,967 ක් (2013: රු. මිලියන 143,693) වටිනා වත්කම් හිමිකර ගනිමින් වැඩිම කොටස දැරූ අතර 2014 වසරේ දී රක්ෂණ සමාගම්වල මුළු වත්කම්වලින් 39.81% කට (2013: 40.20%) හිමිකම් කියන ලදී. 2014 වසරේ දී එස්එල්අයිසී සමාගම දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර වලින් රු. මිලියන 90,804 ක් (2013: රු. මිලියන 79,519) වටිනා වත්කම් දැරූ අතර සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය හා කොටස්හිමියන් රු. මිලියන 71,162 ක් වටිනා (2013: රු. මිලියන 64,174) වත්කම්වලට හිමිකම් කීවේය. එස්එල්අයිසී සමාගමේ රක්ෂණ ව්‍යාපාර පන්ති දෙකේම වත්කම් 2014 වසරේ දී ද්විත්ව අංක වර්ධනයක් අත් කර ගෙන ඇති බව නිරීක්ෂණය විය.

2014 දෙසැම්බර් 31 වන විට සෙලින්කෝ සමාගම මුළු වත්කම්වලින් 22.63%ක් (2013: 22.82%) හිමිකර ගනිමින් දෙවැනියට විශාලතම වත්කම් කොටසට හිමිකම් පෑ අතර වත්කම් 11.72% ක් (2013: 12.35%) හිමි වූ ඒඅයිඒ සමාගම තෙවන ස්ථානයේ ඇත. 2014 දෙසැම්බර් 31වන විට සෙලින්කෝ සමාගමට අයත් වත්කම් රු. මිලියන 92,078 ක් (2013: රු. මිලියන 81,574) වූ අතර ඒඅයිඒ සමාගම රු. මිලියන 47,666 ක් (2013: රු. මිලියන 44,158) වටිනා වත්කම් දැරීය. යූඒඑල් සමාගම සහ ජනශක්ති සමාගම මුළු වත්කම්වලින් 8.71% කට හා 4.95% කට පිලිවෙලින් හිමිකම් පෑ අතර 2014 දෙසැම්බර් 31වන විට රක්ෂණ කර්මාන්තයේ වත්කම් හිමිකාරත්වය අනුව හතරවන හා පස්වන ස්ථාන හිමිකර ගන්නා ලදී. 2014 දෙසැම්බර් 31 වන විට රක්ෂණ සමාගම්වල මුළු වත්කම්වලින් 87.82% ක් සමගම් පහක් වටා සංකේන්ද්‍රිය වී තිබූ අතර ඉතිරි 12.18% වත්කම් අනෙකුත් සමාගම් පහළොව විසින් හිමි කර ගන්නා ලදී.

# සංඛ්‍යානමය සමාලෝචනය

**වගුව 3**

***රක්ෂණ සමාගම් අනුව මුළු වත්කම් විශ්ලේෂණය***

| රක්ෂකයා | 2013 (අ) | | | | | 2014 (ආ) | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | දීර්ඝ කාලීන රක්ෂණය (රු. '000) | සාමාන්‍ය රක්ෂණය/ කොටස් හිමියන් (රු. '000) | අන්තර් ව්‍යාපාර අංශ ගනුදෙනු ඉවත් කිරීම (රු. '000) | එකතුව (රු. '000) | % | දීර්ඝ කාලීන රක්ෂණය (රු. '000)) | සාමාන්‍ය රක්ෂණය/ කොටස් හිමියන් (රු. '000) | අන්තර් ව්‍යාපාර අංශ ගනුදෙනු ඉවත් කිරීම (රු. '000) | එකතුව (රු. '000) | % |
| ඒඅයිඒ | 35,442,431 | 8,742,090 | 26,385 | 44,158,136 | 12.35 | 38,436,443 | 9,229,720 | - | 47,666,163 | 11.72 |
| ඒඅයිපී | - | 1,226,001 | - | 1,226,001 | 0.34 | - | 459,716 | - | 459,716 | 0.11 |
| අලියාන්ස් සාමාන්‍ය | - | 2,727,215 | - | 2,727,215 | 0.76 | - | 3,131,772 | - | 3,131,772 | 0.77 |
| අලියාන්ස් ජීවිත | 1,077,009 | - | - | 1,077,009 | 0.30 | 1,459,083 | - | - | 1,459,083 | 0.36 |
| අමානා තකාෆුල් | 1,006,855 | 1,686,462 | 44,253 | 2,649,064 | 0.74 | 1,399,828 | 1,693,869 | 105,638 | 2,988,059 | 0.73 |
| ආර්පිකෝ | 723,566 | - | - | 723,566 | 0.20 | 962,865 | - | - | 962,865 | 0.24 |
| ඒෂියන් ඇලායන්ස් | 4,418,928 | 2,921,100 | - | 7,340,028 | 2.05 | 6,735,510 | 3,476,151 | - | 10,211,661 | 2.51 |
| සෙලින්කෝ | 57,204,038 | 30,853,084 | 6,483,228 | 81,573,894 | 22.82 | 65,374,901 | 32,689,041 | 5,986,239 | 92,077,703 | 22.63 |
| කොන්ටිනෙන්ටල් | - | 1,415,146 | - | 1,415,146 | 0.40 | - | 2,028,177 | - | 2,028,177 | 0.50 |
| කෝපරේටිව් | 838,598 | 2,165,406 | 10,720 | 2,993,284 | 0.84 | 976,777 | 2,720,604 | 10,869 | 3,686,512 | 0.91 |
| එච්එන්බීඒ | 4,598,540 | 3,436,137 | - | 8,034,677 | 2.25 | 5,930,808 | 3,977,661 | - | 9,908,469 | 2.44 |
| ජනශක්ති | 7,553,509 | 10,692,654 | - | 18,246,163 | 5.10 | 8,159,309 | 11,995,381 | - | 20,154,690 | 4.95 |
| එල්අයිසී | 1,668,517 | - | - | 1,668,517 | 0.47 | 1,903,185 | - | - | 1,903,185 | 0.47 |
| එල්ඕඑල්සී | 291,199 | 2,044,502 | 6,398 | 2,329,304 | 0.65 | 1,042,182 | 2,671,810 | 20,755 | 3,693,237 | 0.91 |
| එම්බීඑස්එල් | 257,450 | 1,322,384 | - | 1,579,834 | 0.44 | 395,336 | 1,355,127 | - | 1,750,463 | 0.43 |
| ඔරියන්ට් | - | 925,027 | - | 925,027 | 0.26 | - | 1,019,481 | - | 1,019,481 | 0.25 |
| පීපල්ස් | - | 3,853,669 | - | 3,853,669 | 1.08 | - | 4,598,563 | - | 4,598,563 | 1.13 |
| සණස | 572,540 | 617,857 | - | 1,190,397 | 0.33 | 738,763 | 986,026 | - | 1,724,789 | 0.42 |
| එස්එල්අයිසී | 79,518,628 | 64,174,216 | - | 143,692,844 | 40.20 | 90,804,450 | 71,162,367 | - | 161,966,817 | 39.81 |
| යූඒඑල් | 21,103,511 | 9,607,354 | 649,778 | 30,061,087 | 8.41 | 25,530,258 | 10,638,421 | 733,048 | 35,435,631 | 8.71 |
| **එකතුව** | **216,275,318** | **148,410,305** | **7,220,762** | **357,464,861** | **100** | **249,849,697** | **163,833,886** | **6,856,549** | **406,827,033** | **100** |

*(අ) ප්‍රතිශ්ධාපිත විගණන සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යා*


*සටහන්:*

1. *අවශ්‍ය කරන ලද සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුලත් කර නොමැත.*
2. *අන්තර්-අංශ ශේෂවලට සංයුක්ත රක්ෂණ සමාගම්වල දීර්ඝ කාලීන සහ සාමාන්‍ය රක්ෂණ යන එක් එක් අංශයෙන් ලැබෙන ලැබිය යුතු ප්‍රමාණයන් ඇතුලත් වේ.*
3. *අලියාන්ස් ජීවිත, ආර්පිකෝ සහ එල්අයිසී යන සමාගම්වලට අයත් වත්කම් දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර යටතේ වාර්තා කර ඇත.*

# සංඛ්‍යානමය සමාලෝචනය

**රූප සටහන 2**

***2014 දෙසැම්බර් 31 දිනට සමාගම් මට්ටමින් වත්කම් සංකේන්ද්‍රගතවීම විශ්ලේෂණය***




## රක්ෂණ සමාගම්වල කොටස් හිමියන්ගේ අරමුදල්

රක්ෂණ සමාගම්වල කොටස් හිමියන්ගේ අරමුදල් 2013 දෙසැම්බර් මස 31වන විට වාර්තා කළ රු. මිලියන 94,950 හා සැසඳීමේ දී 2014 දෙසැම්බර් 31 වන විට රු. මිලියන 112,000 ක් විය. 2013 වසර හා සැසඳීමේ දී මෙය 17.96% ක කැපී පෙනෙන වර්ධනයකි.

4 වන වගුවෙන් නිරූපණය වන පරිදි 2014 දෙසැම්බර් 31 වන විට මුළු කොටස් හිමියන්ගේ අරමුදල් තුළ රු. මිලියන 22,547 ක් වූ ප්‍රකාශිත ප්‍රාග්ධනය සහ රු. මිලියන 89,453 ක් වූ සංචිත ද ඇතුළත් විය. 2013 වසරේදී මෙන්ම 2014 දෙසැම්බර් 31 වන විට එස්එල්අයිසී සමස්ත රක්ෂණ කර්මාන්තයේ කොටස් හිමියන්ගේ අරමුදල් වලින් 56.19% ක් දරමින් මුළු කොටස් හිමියන්ගේ අරමුදල් වලින් අඩකටත් වැඩි ප්‍රමාණයකට හිමිකම් පෑවේය. 2014 වසරේ දී සෙලින්කෝ සහ යූඒඑල් සමාගම් පිළිවෙලින් මුළු කොටස් හිමියන්ගේ අරමුදල් වලින් 15.83% කට සහ 5.54% කට හිමිකම් පාමින් දෙවැනි සහ තෙවැනි ස්ථාන අත් කර ගන්නා ලදී. ජනශක්ති සහ ඒඅයිඒ සමාගම් 2014 වසරේ දී හතරවැනි සහ පස්වැනි විශාලතම කොටස් හිමියන්ගේ අරමුදල් වටිනාකම් වාර්තා කළ අතර එය සමස්ත රක්ෂණ කර්මාන්තයේ කොටස් හිමියන්ගේ අරමුදලින් පිළිවෙලින් 4.65% ක හා 4.32% ක් විය. කොටස් හිමියන්ගේ අරමුදල්වලින් විශාලතම කොටස් දැරූ රක්ෂණ සමාගම් පහ 2014 වසරේ දී සියලුම රක්ෂණ සමාගම්වලට හිමි වූ සමස්ත කොටස් හිමියන්ගේ අරමුදල්වලින් 86.53% කට (2013: 87.18%) හිමිකම්පෑම විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණකි.

# සංඛ්‍යානමය සමාලෝචනය

**වගුව 4**

***රක්ෂණ සමාගම්වල කොටස් හිමියන්ගේ මුළු අරමුදල්***

| රක්ෂකයා | 2013 (අ) | | 2014 (ආ) | | | |
|---|---|---|---|---|---|---|
| | කොටස් හිමියන්ගේ මුළු අරමුදල් (රු. '000) | % | ප්‍රකාශිත ප්‍රාග්ධනය (රු. '000) | මුළු සංචිත (රු. '000) | කොටස් හිමියන්ගේ මුළු අරමුදල් (රු. '000) | % |
| ඒඅයිඒ | 4,538,450 | 4.78 | 300,000 | 4,535,259 | 4,835,259 | 4.32 |
| ඒඅයිජී | 277,458 | 0.29 | 659,265 | (410,086) | 249,179 | 0.22 |
| අලියාන්ස් සාමාන්‍ය | 875,510 | 0.92 | 500,000 | 402,085 | 902,085 | 0.81 |
| අලියාන්ස් ජීවිත | 261,958 | 0.27 | 592,624 | (365,889) | 226,734 | 0.20 |
| අමානා තකාෆුල් | 983,286 | 1.03 | 1,250,001 | (250,064) | 999,937 | 0.89 |
| ආර්පිකෝ | 496,908 | 0.52 | 675,565 | (63,389) | 612,176 | 0.55 |
| ඒෂියන් එලායන්ස් | 1,831,693 | 1.93 | 1,062,500 | 1,495,992 | 2,558,492 | 2.28 |
| සෙලින්කෝ | 15,922,159 | 16.77 | 1,324,822 | 16,408,998 | 17,733,820 | 15.83 |
| කොන්ටිනෙන්ටල් | 567,276 | 0.60 | 750,000 | 132,713 | 882,713 | 0.79 |
| කෝපරේටිව් | 899,249 | 0.95 | 1,003,066 | 364,018 | 1,367,084 | 1.22 |
| එච්එන්බීඒ | 2,113,612 | 2.23 | 1,171,875 | 1,234,482 | 2,406,356 | 2.15 |
| ජනශක්ති | 4,028,491 | 4.24 | 1,496,000 | 3,710,641 | 5,206,641 | 4.65 |
| එල්අයිසී | 632,071 | 0.67 | 500,000 | 214,417 | 714,417 | 0.64 |
| එල්ඕඑල්සී | 708,452 | 0.75 | 1,100,000 | (85,706) | 1,014,294 | 0.91 |
| එම්බීඑස්එල් | 339,399 | 0.36 | 1,080,022 | (617,244) | 462,778 | 0.41 |
| ඔරියන්ට් | 680,330 | 0.72 | 750,000 | (122,051) | 627,949 | 0.56 |
| පීපල්ස් | 1,084,881 | 1.14 | 600,000 | 809,322 | 1,409,322 | 1.26 |
| සණස | 416,711 | 0.44 | 592,635 | 54,357 | 646,992 | 0.58 |
| එස්එල්අයිසී | 53,175,185 | 56.00 | 6,000,000 | 56,933,533 | 62,933,533 | 56.19 |
| යූඒඑල් | 5,117,292 | 5.39 | 1,138,432 | 5,071,785 | 6,210,217 | 5.54 |
| **එකතුව** | **94,950,371** | **100** | **22,546,806** | **89,453,172** | **111,999,978** | **100** |

*(අ) ප්‍රතිශ්ධාපිත විගණන සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යා*

*සටහන:*

*1. අවශ්‍ය කරන ලද සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුලත් කර නොමැත.*

# සංඛ්‍යානමය සමාලෝචනය

**ප්‍රධාන මූල්‍ය අංශ අතර මුළු වත්කම් බෙදීයාම**

ආර්ථිකයේ ප්‍රධාන මූල්‍ය අංශ සතු මුළු වත්කම් 2013 දෙසැම්බර් 31 වන විට වාර්තා කළ රු. බිලියන 10,320.2 හා සැසඳීමේ දී 2014 දෙසැම්බර් 31 වන විට රු. බිලියන 12,041.2 ක් දක්වා වර්ධනය වූ අතර එය 16.68% ක වර්ධනයක් විය. 5 වන වගුවෙන් නිරූපණය වන ආකාරයට 2014 දෙසැම්බර් 31 වන විට බැංකු අංශය රු. බිලියන 8,436 ක් වටිනා වත්කම් ඇතිව මුළු වත්කම්වලින් 70.0% ක් වාර්තා කළේ මූල්‍ය අංශය තුළ එහි අධිකාරිය සලකුණු කරමිනි. ගිවිසුම්ගත ඉතිරි කිරීමේ ආයතන 2014 වසරේ දී මූල්‍ය අංශයේ මුළු වත්කම්වලින් 15.5% ක් වාර්තා කළේ රු. බිලියන 1,866.1 ක් (2013: රු. බිලියන 1,640.8) වටිනා වත්කම් වාර්තා කරමිනි. තැන්පතු භාර ගන්නා අනෙකුත් මූල්‍ය ආයතන හා විශේෂිත මූල්‍ය ආයතන 2014 වසරේ දෙසැම්බර් 31 දින වන විට පිළිවෙලින් රු. බිලියන 892 ක් හා රු. බිලියන 439.9 ක් වූ වත්කම් වටිනාකම් හිමිව සිටි අතර මූල්‍ය අංශයේ වත්කම් වටිනාකම් පිළිවෙලින් 7.4% ක් හා 3.7% ක් සඳහා හිමිකම් කීවේය. 2014 වසරේ දෙසැම්බර් 31 දින වන විට රක්ෂණ සමාගම් සතුව රු. බිලියන 406.8 ක් (2013: රු. බිලියන 357.5) වටිනා වත්කම් තිබුනු අතර මූල්‍ය අංශයේ වත්කම්වලින් 3.4% ක් සඳහා හිමිකම් කීවේය.

**වගුව 5**

*ප්‍රාග්ධන මූල්‍ය අංශ අතර මුළු වත්කම් බෙදීයාම*

| මූල්‍ය අංශ | වත්කම් බෙදීයාම | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2010 | | 2011 | | 2012 | | 2013 | | 2014 | |
| | රු. බිලියන | % | රු. බිලියන | % | රු. බිලියන | % | රු. බිලියන | % | රු. බිලියන | % |
| බැංකු අංශය | 4,527.3 | 68.9 | 5,375.6 | 69.7 | 6,377.0 | 70.3 | 7,187.5 | 69.6 | 8,436.4 | 70.0 |
| තැන්පතු භාර ගන්නා අනෙකුත් මූල්‍ය ආයතන | 295.0 | 4.5 | 427.1 | 5.5 | 621.2 | 6.9 | 756.4 | 7.3 | 892.0 | 7.4 |
| විශේෂිත මූල්‍ය ආයතන | 354.3 | 5.4 | 338.8 | 4.4 | 310.4 | 3.4 | 378.0 | 3.7 | 439.9 | 3.7 |
| ගිවිසුම්ගත ඉතිරිකිරීම් ආයතන | 1,178.7 | 17.9 | 1,305.4 | 16.9 | 1,445.6 | 15.9 | 1,640.8 | 15.9 | 1,866.1 | 15.5 |
| රක්ෂණ සමාගම් | 219.1 | 3.3 | 261.4 | 3.4 | 315.8 | 3.5 | 357.5(අ) | 3.5 | 406.8 (ආ) | 3.4 |
| **එකතුව** | **6,574.4** | **100** | **7,708.3** | **100** | **9,070.0** | **100** | **10,320.2** | **100** | **12,041.2** | **100.0** |

*මූලාශය: ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව - 2014 (රක්ෂණ සමාගම්වල වත්කම් රක්ෂණ සමාගම්වලින් ලැබූ දත්ත පාදකව ප්‍රතිශ්ඨාපිත කර ඇත.)*


*(අ) ප්‍රතිශ්ඨාපිත විගණන සංඛ්‍යාවන්*

*(ආ) තාවකාලික සංඛ්‍යාවන්*

# සංඛ්‍යානමය සමාලෝචනය

**රූප සටහන 3**

*2014 දෙසැම්බර් 31 වන විට ප්‍රධාන මූල්‍ය අංශ අතර මුළු වත්කම් බෙදීයාම*




**රක්ෂණ සමාගම්වල ශාඛා, සේවකයින් සහ නියෝජිතයින් පිළිබඳ විශ්ලේෂණය**

රට පුරා සිටින විවිධාකාර රක්ෂණ අවශ්‍යතා ඇති ගනුදෙනුකරුවන් වෙත ප්‍රවේශවීම සඳහා රක්ෂකයින් විසින් විවිධවූ බෙදාහැරීමේ නාලිකා යොදා ගනී. සෘජු අලෙවිකරණය, ශාඛා ජාල, තැරැව්කාර සමාගම් සහ නියෝජිතයින් මඟින් කෙරෙන බෙදාහැරීම රක්ෂකයින්ගේ සාම්ප්‍රදායක අලෙවිකරණ ව්‍යුහය තුළ ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරන අතර විදුලිසන්දේශණය හරහා ගනුදෙනුකරුවන්ට පිරි නමන සෘජු අලෙවිකරණහා සේවා ද ඔවුන්ගේ ව්‍යාපාර පුළුල් කිරීමේ දී කැපී පෙනෙන කාර්යභාරයක් ඉටු කරයි.

6 වැනි වගුවේ නිරූපණය කර ඇති පරිදි 2014 දෙසැම්බර් 31 වන විට රට තුළ රක්ෂණ සමාගම් විසින් ශාඛා 1,462 ක් මෙහෙය වූ අතර 2013 වසරේ දී මෙහෙය වූ ශාඛා 1,379 හා සැසඳීමේ දී මෙය 6.02% ක වර්ධනයකි. 2013 වසරේ දෙසැම්බර් 31 වන විට බස්නාහිර පළාතේ තිබූ ශාඛා 489 සමඟ සැසඳීමේ දී 2014 වසරේ දෙසැම්බර් 31 වන විට ශාඛා 487 ක් විය. රට පුරා ඇති මුළු ශාඛාවලින් තුනෙන් එකක්ම පාහේ බස්නාහිර පළාතේ පිහිටා ඇති අතර එමගින් බස්නාහිර පළාත තුළ ඇති රක්ෂණ ව්‍යාපාරයේ ඉහළ මට්ටමේ සංකේන්ද්‍රගතවීම නිරූපණය කරයි. දකුණු හා මධ්‍යම පළාත් පිළිවෙලින් ශාඛා 191 ක් සහ 159 ක් ඇතිව දෙවැනි සහ තෙවැනියට විශාලතම ශාඛා ජාලය ඇති පළාත් වූ අතර ශාඛා 76 ක් ඇති ඌව පළාත අඩුම ශාඛා ප්‍රමාණයක් ඇති පළාත විය.

2014 වසරේ දෙසැම්බර් 31 වන විට රක්ෂණ සමාගම් සාමූහිකව සේවකයින් 16,134 ක් (2013: 13,764) සේවයේ යොදවා ඇති අතර මෙයින් 10,780 ක පිරිසක් සමස්ත රක්ෂණ සමාගම්වල සේවකයින්ගෙන් 66.82% ක් (2013: 62.58%) නියෝජනය කරමින් බස්නාහිර පළාතේ ජීවත් වූහ. 2014 වසරේ දෙසැම්බර් 31 වන විට දකුණු හා මධ්‍යම පළාත් දෙවැනියට හා තෙවැනියට වැඩිම සේවකයින් සංඛ්‍යාවක් සහිත පළාත් බවට පත් වී ඇත්තේ පිළිවෙලින් සේවකයින් 1,137 ක් සහ 941 ක් ඇතිවය. සේවක සංඛ්‍යාව 400 ක් වූ උතුරු පළාත අඩුම සේවක සංඛ්‍යාව සහිත පළාත වූ අතර රක්ෂණ සමාගම්වල මුළු සේවක සංඛ්‍යාවෙන් 2.48% ක් එහි නියෝජනය විය.

2014 වසරේ දෙසැම්බර් 31 වන විට සියලුම රක්ෂණ සමාගම්වලට සම්බන්ධව සේවය කළ නියෝජිතයින්ගේ මුළු සංඛ්‍යාව 42,958 ක් වූ අතර 2013 වසරේ දෙසැම්බර් 31 වන විට සිටි 38,635 ක් වූ නියෝජිතයින් සංඛ්‍යාව හා සැසඳීමේ දී මෙය 11.19% ක වර්ධනයක් පෙන්නුම් කරයි. 2014 දෙසැම්බර් 31 දින වන විට බස්නාහිර පළාත තුළ සිටි රකෂණ නියෝජිතයින් සංඛ්‍යාව 16,578 වූ අතර එය වැඩිම නියෝජිතයින් සංඛ්‍යාවක් ස්ථානගත වී සිටි පළාත බවට පත්වූයේ මුළු නියෝජිතයින්ගේ 38.59% ක් නියෝජනය කරමින්ය. ඌව පළාත තුළ අඩුම නියෝජිතයින් සංඛ්‍යාවක් වාර්තා වූ අතර 2014 වසරේ දෙසැම්බර් 31 වන විට එම අගය 2,197 ක් වූයේ 2013 වසරේ දෙසැම්බර් 31 වන විට සිටි 2,294 ක් වූ එම සංඛ්‍යාවට වඩා 4.23% ක සුළු පහළයාමක් නිරූපණය කරමිනි. 6 වැනි වගුවෙන් නිරූපනය කරන වැදගත් කරුණ වන්නේ බස්නාහිර පළාත තුළ පැවති ශාඛා, සේවකයින් සහ නියොජිතයින්ගේ ඉහළ මට්ටමේ සංකේන්ද්‍රගත වීමය.

# සංඛ්‍යානමය සමාලෝචනය

2014 වසරේ දෙසැම්බර් 31 වන විට දිවයිනේ පළාත් නවය පුරා ශාඛා, සේවකයින් සහ නියෝජිතයින් බෙදීයාම 4 වැනි රූපසටහනෙන් පැහැදිලි කරයි.

**වගුව 6**

***2013 දෙසැම්බර් 31 සහ 2014 දෙසැම්බර් 31 දිනයන්ට ක්‍රියාත්මක වූ ශාඛා, සේවකයින් සහ නියෝජිතයින් සංඛ්‍යාව***


| පළාත | ශාඛා සංඛ්‍යාව | | සේවාදායකයින් සංඛ්‍යාව | | නියෝජිතයින් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|
| | 2013 | 2014 | 2013 | 2014 | 2013 | 2014 |
| මධ්‍යම පළාත | 126 | 159 | 1,031 | 941 | 3,820 | 4,370 |
| නැගෙනහිර පළාත | 86 | 104 | 404 | 506 | 1,773 | 2,310 |
| උතුරු මැද පළාත | 97 | 109 | 603 | 679 | 2,324 | 2,752 |
| වයඹ පළාත | 126 | 133 | 749 | 725 | 3,613 | 3,898 |
| උතුරු පළාත | 108 | 111 | 421 | 400 | 2,945 | 3,369 |
| සබරගමුව පළාත | 104 | 92 | 535 | 561 | 2,611 | 2,209 |
| දකුණු පළාත | 176 | 191 | 1,046 | 1,137 | 4,637 | 5,275 |
| ඌව පළාත | 67 | 76 | 362 | 405 | 2,294 | 2,197 |
| බස්නාහිර පළාත | 489 | 487 | 8,613 | 10,780 | 14,618 | 16,578 |
| **එකතුව** | **1,379** | **1,462** | **13,764** | **16,134** | **38,635** | **42,958** |

*සටහන:*

*1. අවශ්‍ය කරන ලද සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුලත් කර නොමැත.*

**රූප සටහන 4**

***2014 දෙසැම්බර් 31 දිනට ක්‍රියාත්මක වූ ශාඛා, සේවකයින් සහ නියෝජිතයින් සංඛ්‍යාව***




□ ශාඛා සංඛ්‍යාව ♦ සේවකයින් සංඛ්‍යාව
● රක්ෂණ නියෝජිතයින් සංඛ්‍යාව

# සංඛ්‍යානමය සමාලෝචනය


## රක්ෂණ සමාගම්වල බෙදා හැරීමේ නාලිකා

පසුගිය වසර හා සමානවම 2014 වසරේ දී ද නියෝජිතයින් තවදුරටත් දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරවල ගනුදෙනුකරුවන් වෙත ප්‍රවේශවීම සඳහා භාවිතා කළ ප්‍රධාන බෙදා හැරීමේ නාලිකාව විය. නියෝජිතයින් 2014 වසරේ උත්පාදිත දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයේ මුළු ද.ලි.වා.ආ. 91.80% ක් වූ අතර 2013 වසරේ ඔවුන්ගේ දායකත්වය මීට ආසන්න අගයක් වූ 91.12% ක් විය. 5 වැනි වගුවේ නිරූපණය කර ඇති පරිදි 2014 වසරේ දී බැංකු රක්ෂණය (bancassurance), සෘජු අලෙවිකරණය, අනෙකුත් බෙදාහැරීමේ නාලිකා සහ තැරැව්කරුවන් දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයේ සැලකිය යුතු ද.ලි.වා.ආ. ප්‍රමාණ උත්පාදනය නොකළ අතර පිළිවෙලින් 3.03% ක්, 2.99% ක් 1.71% ක් සහ 0.47% ක් සඳහා පමණක් හිමිකම් කියන ලදී.

සෘජු අලෙවිකරණය, නියෝජිතයින්, තැරැව්කරුවන් වැනි බෙදාහැරීමේ නාලිකා සහ වෙනත් බෙදාහැරීමේ උපක්‍රම වැනි බෙදාහැරීමේ නාලිකා දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයට වඩා සාමාන්‍ය රක්ෂණ ගනුදෙනුකරුවන් වෙත ප්‍රවේශවීමේ දී වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. 5 වැනි වගුවේ නිරූපණය කර ඇති පරිදි සෘජු අලෙවිකරණය සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ 34.70% ක ද.ලි.වා.ආ. උත්පාදනය කර ඇති අතර 2014 වසරේ දී නියෝජිතයින්, තැරැව්කරුවන්, අනෙකුත් බෙදාහැරීමේ නාලිකා සහ බැංකු රක්ෂණ (bancassurance) පිළිවෙලින් 27.82% ක්, 19.51% ක්, 15.15% ක් සහ 2.82% ක දායකත්වයක් දැක්වූයේය. 2013 වසර හා සැසඳීමේ දී තැරැව්කරුවන් සහ බැංකු රක්ෂණ (bancassurance) හරහා උත්පාදිත දළ-ලිඛිත වාරික ආදායම අඩු වුව ද සෘජු අලෙවිකරණය, නියෝජිතයින්, සහ අනෙකුත් බෙදාහැරීමේ නාලිකා හරහා උත්පාදනය කළ ද.ලි.වා.ආ. 2014 වසරේ දී වර්ධනය වී ඇති බව නිරීක්ෂණය වේ.

**රූප සටහන 5**

*රක්ෂණ සමාගම්වල බෙදා හැරීමේ නාලිකා*




| | දීර්ඝ කාලීන | සාමාන්‍ය | දීර්ඝ කාලීන | සාමාන්‍ය |
|---|---|---|---|---|
| | 2013 | | 2014 | |
| නියෝජිතයින් | 91.12 | 25.40 | 91.80 | 27.82 |
| තැරැව්කරුවන් | 0.46 | 21.68 | 0.47 | 19.51 |
| සෘජු | 3.33 | 33.90 | 2.99 | 34.70 |
| බැංකු රක්ෂණය | 2.34 | 4.21 | 3.03 | 2.82 |
| වෙනත් | 2.75 | 14.81 | 1.71 | 15.15 |

# සංඛ්‍යානමය සමාලෝචනය

## දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය

### දළ ලිඛිත වාරික ආදායම

7 වැනි වගුවේ නිරූපණය කර ඇති පරිදි 2014 වසරේ දී දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය රුපියල් මිලියන 44,610 (2013: රුපියල් මිලියන 41,676) දළ ලිඛිත වාරික ආදායමක් උත්පාදනය කර ඇත. 2013 වසරේ දී වාර්තා කළ 11.20% ක අගය හා සැසඳීමේ දී දීර්ඝ කාලීන රක්ෂණ වෙළඳපොළ 2014 වසරේ දී 7.04% ක මන්දගාමී වර්ධනයක් වාර්තා කර ඇත.

සෙලින්කෝ සමාගම 2014 වසරේ දී රු. මිලියන 12,003 ක (2013: 11,123) දළ ලිඛිත වාරික ආදායමක් උත්පාදනය කරමින් දීර්ඝ කාලීන රක්ෂණ වෙළඳපොළේ සිය ප්‍රමුඛස්ථානය අඛණ්ඩව පවත්වා ගෙන ඇති අතර සමස්ත දළ ලිඛිත වාරික ආදායමින් 26.91% ක පංගුවකට හිමිකම් පා ඇත. එස්එල්අයිසී සහ ඒඅයිඒ මීට පෙර වසර හා සමානවම 2014 වසර තුළ දී ද රු. මිලියන 8,121 ක (2013: රු. මිලියන 8,398), රු. මිලියන 7,267 ක (2013: රු. මිලියන 6,863) දළ ලිඛිත වාරික ආදායමක් සහ පිළිවෙලින් 18.20% ක හා 16.29% ක වෙළඳපොළ පංගු හිමිකර ගෙන වෙළඳපොළේ දෙවැනි සහ තෙවැනි ස්ථාන දිනා ගෙන ඇත. එස්එල්අයිසී වෙළඳපොළ දායකත්වය 2013 වසරේ දී වාර්තා කළ 20.15% හා සැසඳීමේ දී 2014 වසරේ දී 1.95% කින් පහළ බැස ඇත. යූඒඑල් සහ ඒෂියන් එලායන්ස් සමාගම් පිළිවෙලින් රු. මිලියන 5,945 ක් (2013: රු. මිලියන 5,515) සහ රු. මිලියන 3,048 ක් (2013: රු. මිලියන 2,520) වටිනා දළ ලිඛිත වාරික ආදායමක් උපයා ගෙන ඇති අතර 13.33% ක හා 6.83% ක වෙළඳපොළ පංගු අත්කර ගනිමින් දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර අංශයේ හතරවැනි සහ පස්වැනි විශාලතම දළ ලිඛිත වාරික ආදායමක් උපයන්නන් බවට පත් වී ඇත. ඉහළම දළ ලිඛිත වාරික ආදායම් දායකයින් පස්දෙනා 2014 වසරේ දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරික ආදායමෙන් 81.56% (2013: 82.59%) සඳහා සාමූහිකව හිමිකම් කියයි. 2013 වසර හා සැසඳීමේ දී 2014 වසරේ දී එල්ඕඑල්සී සමාගමේ 115.58% දළ ලිඛිත වාරික ආදායමේ කැපීපෙනෙන වර්ධනයක් දැකිය හැකි විය. දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරික ආදායම සහ සමාගම් අනුව වෙළඳපොළ පංගුව 6වන රූප සටහන මඟින් නිරූපණය කරයි.

**වගුව 7**

*සමාගම් මට්ටමින් දළ ලිඛිත වාරික ආදායම සහ වෙළඳපොළ පංගුව - දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය*

| රක්ෂකයා | 2010 | | 2011 | | 2012 | | 2013(අ) | | 2014(ආ) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වාරික ආදායම (රු. '000) | වෙළඳපොළ පංගුව (%) | වාරික ආදායම (රු. '000) | වෙළඳපොළ පංගුව (%) | වාරික ආදායම (රු. '000) | වෙළඳපොළ පංගුව (%) | වාරික ආදායම (රු. '000) | වෙළඳපොළ පංගුව (%) | වාරික ආදායම (රු. '000) | වෙළඳපොළ පංගුව (%) |
| ඒඅයිඒ | 7,783,925 | 24.99 | 7,846,447 | 22.32 | 6,495,863 | 17.33 | 6,863,047 | 16.47 | 7,266,574 | 16.29 |
| අලියාන්ස් ජීවිත | 204,814 | 0.66 | 351,299 | 1.00 | 532,142 | 1.42 | 828,790 | 1.99 | 838,326 | 1.88 |
| අමානා තකාෆුල් | 240,156 | 0.77 | 303,786 | 0.86 | 364,759 | 0.97 | 542,986 | 1.30 | 679,029 | 1.52 |
| ආර්පිකෝ | - | - | - | - | 101,900 | 0.27 | 206,494 | 0.50 | 299,040 | 0.67 |
| ඒෂියන් එලායන්ස් | 1,242,608 | 3.99 | 1,579,191 | 4.49 | 2,034,084 | 5.43 | 2,520,283 | 6.05 | 3,048,148 | 6.83 |
| සෙලින්කෝ | 8,786,120 | 28.21 | 9,815,943 | 27.91 | 10,829,470 | 28.91 | 11,122,906 | 26.69 | 12,002,524 | 26.91 |
| කෝපරේටිව් | 233,540 | 0.75 | 269,579 | 0.77 | 312,056 | 0.83 | 337,623 | 0.81 | 402,046 | 0.90 |
| එච්එන්බීඒ | 1,084,480 | 3.48 | 1,290,367 | 3.67 | 1,500,028 | 4.00 | 2,014,547 | 4.83 | 2,342,867 | 5.25 |
| ජනශක්ති | 1,685,409 | 5.42 | 1,871,986 | 5.32 | 2,025,075 | 5.40 | 2,193,662 | 5.26 | 2,170,419 | 4.87 |
| එල්අයිසී | 252,656 | 0.81 | 295,859 | 0.84 | 303,344 | 0.81 | 322,268 | 0.77 | 349,311 | 0.78 |
| එල්ඕඑල්සී | - | - | 51,427 | 0.15 | 106,238 | 0.28 | 274,798 | 0.67 | 592,422 | 1.33 |
| එම්බීඑස්එල් | 89,984 | 0.28 | 143,156 | 0.41 | 192,780 | 0.51 | 251,720 | 0.60 | 294,299 | 0.66 |
| සණස | 73,030 | 0.23 | 128,113 | 0.36 | 203,616 | 0.54 | 283,975 | 0.68 | 258,771 | 0.58 |
| එස්එල්අයිසී | 6,009,859 | 19.29 | 6,743,073 | 19.18 | 7,369,031 | 19.67 | 8,397,718 | 20.15 | 8,121,140 | 18.20 |
| යූඒඑල් | 3,465,505 | 11.12 | 4,471,627 | 12.72 | 5,106,323 | 13.63 | 5,515,063 | 13.23 | 5,945,499 | 13.33 |
| **එකතුව** | **31,152,086** | **100** | **35,161,853** | **100** | **37,476,709** | **100** | **41,675,880** | **100** | **44,610,416** | **100** |
| **වර්ධන අනුපාතය (%)** | **29.77** | | **12.87** | | **6.58** | | **11.20** | | **7.04** | |


*(අ) ප්‍රතිෂ්තාපිත විගණන සංඛ්‍යාවන්*

*(ආ) තාවකාලික සංඛ්‍යාවන්*

# සංඛ්‍යානමය සමාලෝචනය

**රූප සටහන 6**

***සමාගම් මට්ටමින් දළ ලිඛිත වාරික ආදායමේ වෙළඳපොළ පංගුව - 2014 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය***





**ඉහලම දල ලිඛිත වාරික ආදායමක් ජනනය කල ප්‍රමුඛතම සමාගම් පහේ සහ අනෙක් රක්ෂකයන්ගේ වෙළඳපොළ කොටස - දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය**

7 වන වගුවේ නිරූපණය වන පරිදි සෙලින්කෝ, එස්එල්අයිසී, ඒඅයිඒ, යූඒඑල් සහ ඒෂියන් එලායන්ස් සමාගම් වෙළඳපොළ තුළ ප්‍රමුඛතම ස්ථාන හිමිකර ගැනීමට සමත්විය.

කෙසේවුව ද අනෙකුත් ක්‍රියාකාරුවන් පහළොස් දෙනාගෙන් එල්ල වූ ඉහළ මට්ටමේ තරඟකාරීත්වය හේතුවෙන් මෙම ප්‍රමුඛ සමාගම් පහේ ද.ලි.වා.ආ. සමුච්චිත වෙළඳපොළ දායකත්වය 2013 දී තිබූ 82.59% සිට 2014 වර්ෂයේ දී 81.56% දක්වා අඩු වී ඇත. මෙම සමාගම් පහේ සහ අනෙක් රක්ෂකයන්ගේ වෙළඳපොළ දායකත්වය පිළිබඳ විශ්ලේෂණය 7 වන රූප සටහනෙන් නිරූපණය වේ.

**රූප සටහන 7**

***2010 සිට 2014 දක්වා වූ වර්ෂ සඳහා ප්‍රමුඛතම දායකත්වය සැපයූ සමාගම් පහේ සහ අනෙක් රක්ෂකයන්ගේ වෙළඳපොළ කොටස - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර***




| | සෙලින්කෝ | එල්අයිසී | ඒඅයිඒ | යූඒඑල් | ඒෂියන් එලායන්ස් | වෙනත් රක්ෂකයින් |
|---|---|---|---|---|---|---|
| 2010 | 28.21 | 19.29 | 24.99 | 11.12 | 3.99 | 12.39 |
| 2011 | 27.91 | 19.18 | 22.32 | 12.72 | 4.49 | 13.39 |
| 2012 | 28.90 | 19.66 | 17.33 | 13.63 | 5.43 | 15.05 |
| 2013(අ) | 26.69 | 20.15 | 16.47 | 13.23 | 6.05 | 17.41 |
| 2014(ආ) | 26.91 | 18.20 | 16.29 | 13.33 | 6.83 | 18.44 |

*(අ) ප්‍රතිෂ්තාපිත විගණන සංඛ්‍යාවන්*
*(ආ) තාවකාලික සංඛ්‍යාවන්*

# සංඛ්‍යානමය සමාලෝචනය


**රක්ෂණ සමාගම් දැරූ හිමිකම්පෑම් - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර**

පසුගිය වසර පහ තුළ දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයේ නියැලි රක්ෂණ සමාගම් විසින් දැරූ හිමිකම්පෑම් 8වන වගුව මඟින් නිරූපණය වේ. 2014 වර්ෂය සඳහා සමාගම් දැරූ මුළු දිගුකාලීන රක්ෂණ හිමිකම්පෑම් රුපියල් මිලියන 20,685 ක් (2013: රුපියල් මිලියන 18,310) වූ අතර 2013 වසර හා සැසඳීමේ දී 12.97% ක වර්ධනයක් නිරූපණය විය. කල්පිරුණු හිමිකම්පෑම් රුපියල් මිලියන 9,879 ක් (2013: රුපියල් මිලියන 9,840) වූ අතර එය මුළු හිමිකම්පෑම්වලින් 47.76% ක් විය.

2014 වසරේ දී ඒකක සබැඳි රක්ෂන ඔප්පුවල පවාරණයේ කැපී පෙනෙන වර්ධනයක් දක්නට ලැබුනු අතර ඒ අනුව 2013 වසරේ දී වාර්තා වූ රුපියල් මිලියන 5,678 හා සැසඳීමේ දී රුපියල් මිලියන 7,138 ක පවාරණ හිමිකම්පෑම් සිදු විය. මෙය 2014 වසරේ සිදු කළ මුළු හිමිකම්පෑම්වලින් 34.51% ක් නිරූපණය කළේය. මරණ හිමිකම්පෑම් රුපියල් මිලියන 1,522 ක් (2013: රුපියල් මිලියන 1,358) වූ අතර අත්තිකාරම් ගෙවීම්, මූල්‍ය ප්‍රසාද දීමනා සහ කල්නොපිරුණු ගෙවීම් ආදී වෙනත් හිමිකම්පෑම් රුපියල් මිලියන 2,129 ක් (2013: රුපියල් මිලියන 1,389) ක් විය.

**රූප සටහන 8**

***රක්ෂණ සමාගම් දැරූ හිමිකම්පෑම් - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර***




| | 2010 | 2011 | 2012 | 2013(අ) | 2014 (ආ) |
|---|---|---|---|---|---|
| අකර්මන්‍යතා ප්‍රතිලාභ | 63,296 | 31,183 | 77,717 | 45,457 | 17,097 |
| මරණ | 1,073,808 | 681,111 | 789,166 | 1,358,337 | 1,521,547 |
| පවාරණ | 2,243,555 | 2,225,506 | 2,823,924 | 5,677,638 | 7,138,254 |
| කල්පිරීමේ ප්‍රතිලාභ | 6,441,973 | 6,242,096 | 7,860,715 | 9,839,833 | 9,879,297 |
| වෙනත් | 1,792,890 | 1,367,512 | 1,920,859 | 1,388,698 | 2,129,140 |

*(අ) ප්‍රතිශ්ඨාපිත විගණන සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යාවන්*

# සංඛ්‍යානමය සමාලෝචනය

**රක්ෂණ හිමිකම්පෑම් සංඛ්‍යාව - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය**

2014 වසරේ දී දීර්ඝ කාලීන රක්ෂණ සමාගම් විසින් හිමිකම්පෑම් 252,065 ක් දරා ඇත. කල්පිරුණු හිමිකම්පෑම් මුළු හිමිකම්පෑම්වලින් 42.59% ක් විය. තවද අනෙකුත් හිමිකම්පෑම් සහ පවාරණ හිමිකම්පෑම් දීර්ඝ කාලීන රක්ෂණ හිමිකම්පෑම් මුළු සංඛ්‍යාවෙන් පිළිවෙලින් 33.66% ක් සහ 18.23% ක් විය. 2010 වසරේ සිට 2014 වසර දක්වා දිගුකාලීන රක්ෂණ හිමිකම්පෑම් සංඛ්‍යාව කාණ්ඩ අනුව 8 වන වගුවේ නිරූපණය වේ.

**වගුව 8**

***රක්ෂණ හිමිකම්පෑම් සංඛ්‍යාව - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය***

| | 2010 | 2011 | 2012 | 2013(අ) | 2014(ආ) |
|---|---|---|---|---|---|
| කල්පිරීමේ ප්‍රතිලාභ | 87,742 | 98,363 | 102,465 | 102,050 | 107,353 |
| මරණ | 5,063 | 4,328 | 4,358 | 5,284 | 5,795 |
| අකර්මන්‍යතා ප්‍රතිලාභ | 628 | 569 | 578 | 6,980 | 8,120 |
| පවාරණ | 25,771 | 25,661 | 24,631 | 41,964 | 45,962 |
| වෙනත් ප්‍රතිලාභ | 42,939 | 45,885 | 51,773 | 99,257 | 84,835 |
| **එකතුව** | **162,143** | **174,806** | **183,805** | **255,535** | **252,065** |

*(අ) ප්‍රතිශ්තාපිත විගණන සංඛ්‍යාවන්*
*(ආ) තාවකාලික සංඛ්‍යාවන්*

# සංඛ්‍යානමය සමාලෝචනය

## දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයේ වත්කම්

2014 දෙසැම්බර් 31 දිනට විවිධ වත්කම් කාණ්ඩ අතර දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයේ වත්කම් සංකේන්ද්‍රගතවීම 9 වන වගුව සහ 9 වන රූපසටහන මගින් දැක්වෙයි.

රු. මිලියන 249,850 ක් (2013: රු. මිලියන 216,275) වටිනා මුළු වත්කම්වලින් රු. මිලියන 111,600 ක් (2013: රු. මිලියන 93,539) රාජ්‍ය සුරැකුම්පත්වල අයෝජනය කර ඇත. මෙය දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරයේ සමස්ත වත්කම්වලින් 44.67% ක් (2013: 43.25%) වේ. වසර පුරාම රක්ෂකයින් විසින් පනතින් නියම කර ඇති පරිදි දීර්ඝ කාලීන රක්ෂණ අරමුදලින් 30% ක් රාජ්‍ය සුරැකුම්පත්වල අයෝජනය කිරීමේ අවම ව්‍යවස්ථාපිත ආයෝජන කිරීමේ අවශ්‍යතාවට අනුකූල වන බවට මණ්ඩලය සහතික කර ගන්නා ලදී. තව ද, රක්ෂණ සමාගම් විසින් දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර අරමුදලේ ශේෂ වත්කම් 2011 අංක 1 දරන නිර්ණය කිරීම්වලට අනුකූලව ආයෝජනය කිරීමට අවශ්‍ය වන අතර සමාලෝචිත වර්ෂය තුළ දී එම අවශ්‍යතාවට අනුකූලවීම ද මණ්ඩලය සහතික කර ගන්නා ලදී. 2014 වසරේ දී සංස්ථා ණය සාධනපත්‍රවල ආයෝජනය කිරීමේ නැඹුරුතාවක් අඛණ්ඩව සිදු විය. පසුගිය වසර හා සැසඳීමේ දී 2014 වසරේ දී සංස්ථා ණය ආයෝජනවල රු. මිලියන 40,478 ක් (2013: රු. මිලියන 32,944) දක්වා වැඩිවීමක් දක්නට ලැබුනි. මෙය මුළු වත්කම්වලින් 16.20% ක් (2013: 15.23%) නිරූපණය කළ අතර දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යපාරයේ දෙවැනි විශාලතම ආයෝජනය බවට පත් වූයේ තැන්පතු තෙවැනි ස්ථානය පත් කරමිනි.

තැන්පතු මත ආයෝජනය රු. මිලියන 38,032 ක් (2013: රු. මිලියන 40,806) වූ අතර මු මුළු වත්කම්වලින් 15.22% ක් (2013: 18.87%) හිමිකර ගත්තේය. ස්කන්ධ ආයෝජන රු. මිලියන 31,729 ක් (2013: රු. මිලියන 24,606) වූ අතර මුළු වත්කම්වලින් 12.70% ක් (2013: 11.38%) විය.

රාජ්‍ය සුරැකුම්පත්, සංස්ථා ණය සහ තැන්පතු යන ප්‍රධාන ආයෝජන කාණ්ඩ සියල්ල දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයේ සමස්ත වත්කම්වලින් 76.09% ක් (2013: 77.35%) වූ අතර ඉතිරි වත්කම් සාමාන්‍ය කොටස්, ඉඩම් හා ගොඩනැගිලි, ඒකක භාර ආදියේ යොදවා ඇත.

**වගුව 9**

*2013 සහ 2014 දෙසැම්බර් 31 දිනට වත්කම් සංකේන්ද්‍රගතවීම - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය*


| | 2013(අ) | | 2014(ආ) | |
|---|---|---|---|---|
| වත්කම් වර්ගය | රුපියල් '000 | % | රුපියල් '000 | % |
| රාජ්‍ය ණය සුරැකුම්පත් | 93,539,259 | 43.25 | 111,600,355 | 44.66 |
| ස්කන්ධ | 24,606,466 | 11.38 | 31,729,171 | 12.70 |
| සංස්ථා ණය | 32,943,830 | 15.23 | 40,478,128 | 16.20 |
| ඉඩම් හා ගොඩනැගිලි | 6,130,156 | 2.83 | 6,638,896 | 2.66 |
| තැන්පතු | 40,806,373 | 18.87 | 38,032,430 | 15.22 |
| ඒකක භාර | 2,302,039 | 1.06 | 2,220,486 | 0.89 |
| රත්රන්වල ආයෝජනය | 29,295 | 0.01 | - | - |
| දිගුකාලීන රක්ෂණ ඔප්පු මත ණය | 5,235,167 | 2.42 | 5,711,407 | 2.29 |
| වෙනත් වත්කම් | 9,202,854 | 4.26 | 11,288,496 | 4.52 |
| මුදල් හා මුදල් සමාන දෑ | 1,479,876 | 0.68 | 2,150,326 | 0.86 |
| **එකතුව** | **216,275,317** | **100** | **249,849,697** | **100** |

*(අ) ප්‍රතිෂ්තාපිත විගණන සංඛ්‍යාවන්*

*(ආ) තාවකාලික සංඛ්‍යාවන්*

**රූප සටහන 9**

*2014 දෙසැම්බර් 31 දිනට වත්කම් සංකේන්ද්‍රගතවීම - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය*



# සංඛ්‍යානමය සමාලෝචනය

**දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයේ ආයෝජන ආදායම**

10 වන වගුව මඟින් නිරූපණය වන පරිදි 2014 වසරේ දී දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයේ ආයෝජනවලින් උත්පාදිත මුළු ආයෝජන ආදායම රු. මිලියන 26,081ක් (2013: රු. මිලියන 21,492) විය. 2014 වසරේ දී දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයේ ආයෝජනවල සාමාන්‍ය ආයෝජන රු. මිලියන 221,918ක් (2013: රු. මිලියන 194,653) විය.

2014 වසරේ සාමාන්‍ය ආයෝජනවල විශාලතම පංගුව වූ රජයේ ණය සුරැකුම්පත්වල ආයෝජන රු. මිලියන 102,570ක් (2013: රු. මිලියන 95,843) වූ අතර 2013 වසරේ හා සැසඳීමේ දී අඩුවීමක් නිරූපණය කළ 11.17%ක (2013: 12.47%) ආයෝජන ඵලදාවේ අඩුවීමක් නිරූපණය කළේය. 2014 වසරේ දී ස්කන්ධවලින් උත්පාදිත ආයෝජන ආදායම රු. මිලියන 3,970 (2013: රු. මිලියන 888) වූ අතර 14.10%ක (2013: 3.48%) ආයෝජන ඵලදාවක් නිරූපණය කළේය. මෙයට රු. මිලියන 3,041ක (2013: ප්‍රාග්ධන අලාභය රු. මිලියන 129) ප්‍රාග්ධන ඉපැයුම් සහ රු. මිලියන 930ක (2013: රු. මිලියන 1,017) ලාභාංශ ආදායම ඇතුලත් වීමයි. සංස්ථා ණයවල ආයෝජන ආදායම 2014 වසරේ දී රු. මිලියන 4,601ක් (2013: රු. මිලියන 2,544) දක්වා වර්ධනය වු අතර 2013 වසරේ දී 11.01%ක ඵලදාව හා සැසඳීමේ දී 12.53%ක ආයෝජන ඵලදාවක් ලැබීය.

තැන්පතු රු. මිලියන 4,673ක (2013: රු. මිලියන 5,826) ආයෝජන ආදායමක් උත්පාදනය කළ අතර බැංකු තැන්පතුවලින් රු. මිලියන 4,448ක පොළී ආදායමක් සහ මූල්‍ය සමාගම්වලින් රු. මිලියන 224ක් (2013: රු. මිලියන 160) මෙයට ඇතුලත් වේ. තැන්පතුවල සාමාන්‍ය ආයෝජනයෙන් ලැබූ පොළී ආදායමෙන් 2013 වසරේ දී ඉපැයූ 16.05% හා සැසඳීමේ දී 2014 වසර තුළ දී රක්ෂණ සමාගම්වලට 11.85%ක ආයෝජන ඵලදාවක් උත්පාදනය කළ අතර 2014 වසර තුළ දී පොළී අනුපාතිකවල අඩුවීමක් නිරූපණය කරයි. ඒකක භාර සහ ඔප්පු ණය සඳහා 2014 වසර තුළ දී පිළිවෙලින් ඉහළ හා සාමාන්‍යය ආයෝජන ප්‍රතිලාභයන් ලබා ගන්නා ලද අතර එහි ආයෝජන ඵලදා අනුපාතයන් 23.74% (2013: 5.29%) සහ 8.14% (2013: 2.20%) විය.

**වගුව 10**

***සවිස්තරාත්මක සාමාන්‍ය ආයෝජනය සහ ආයෝජන ආදායම - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය***

| වර්ගීකරණය | 2013(අ) | | | 2014(ආ) | | |
|---|---|---|---|---|---|---|
| | ආයෝජන ආදායම (රු. '000) | සාමාන්‍ය ආයෝජනය (රු. '000) | ආයෝජන ප්‍රතිලාභ අනුපාතය (%) | ආයෝජන ආදායම (රු. '000) | සාමාන්‍ය ආයෝජනය (රු. '000) | ආයෝජන ප්‍රතිලාභ අනුපාතය (%) |
| **රජයේ ණය සුරැකුම්පත්** | 11,950,852 | 95,843,035 | 12.47 | 11,453,476 | 102,569,807 | 11.17 |
| - භාණ්ඩාගාර බැඳුම්කර | 9,606,186 | | | 10,256,814 | | |
| - භාණ්ඩාගාර බිල්පත් | 299,139 | | | 491,187 | | |
| - වෙනත් (රිපෝ) | 2,045,527 | | | 705,475 | | |
| **ස්කන්ධ** | 888,200 | 25,505,675 | 3.48 | 3,970,443 | 28,167,819 | 14.10 |
| - ප්‍රාග්ධන ලාභ/ පාඩු | (128,524) | | | 3,040,570 | | |
| - ලාභාංශ | 1,016,724 | | | 929,873 | | |
| **සංස්ථා ණය** | 2,544,302 | 23,114,748 | 11.01 | 4,601,233 | 36,710,979 | 12.53 |
| - ණයකර | 2,490,639 | | | 4,587,022 | | |
| - වෙළඳ පත්‍රිකා | 66,801 | | | 20,783 | | |
| - වත්කම් මඟින් සනාථ කරනු ලබන සුරැකුම්පත් | 11,324 | | | 6,206 | | |
| - වෙනත් සමාන මූල්‍ය උපකරණ | (24,462) | | | (12,779) | | |
| **ඉඩම් හා ගොඩනැගිලි** | 65,636 | 6,040,803 | 1.09 | 78,067 | 6,384,526 | 1.22 |
| **තැන්පතු** | 5,825,710 | 36,298,242 | 16.05 | 4,672,766 | 39,419,402 | 11.85 |
| - බැංකු | 5,666,128 | | | 4,448,475 | | |
| - මූල්‍ය ආයතන | 159,581 | | | 224,292 | | |
| **ඒකක භාර** | 103,025 | 1,945,956 | 5.29 | 536,872 | 2,261,263 | 23.74 |
| **රත්රන්** | (10,968) | 30,564 | (35.89) | (56) | 14,648 | (0.38) |
| **ජීවිත රක්ෂණ ඔප්පු මත ණය** | 108,932 | 4,957,036 | 2.20 | 445,761 | 5,473,287 | 8.14 |
| **වෙනත්** | 16,632 | 917,152 | 1.81 | 322,865 | 916,111 | 35.24 |
| **එකතුව** | **21,492,321** | **194,653,211** | **11.04** | **26,081,427** | **221,917,841** | **11.75** |

*(අ) ප්‍රතිෂ්තාපිත විගණන සංඛ්‍යාවන්*

*(ආ) තාවකාලික සංඛ්‍යාවන්*

*සටහන: අලියාන්ස් - ජීවිත, ආර්පිකෝ සහ එල්අයිසී හි කොටස් හිමියන්ට අයත් ආයෝජන ආදායම් හා සාමාන්‍ය ආයෝජන දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර යටතේ වාර්තා කර ඇත*


# සංඛ්‍යානමය සමාලෝචනය

### නිකුත් කරන ලද ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව හා බලපවත්නා ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව

2014 වසර අවසානය වන විට බලපවත්නා මුළු දීර්ඝ කාලීන රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 2,612,497 ක් විය. 2013 වසරේ දී තිබූ බලපවත්නා දීර්ඝකාලීන රක්ෂණ ඔප්පු 2,477,695 හා සැසඳීමේ දී 2014 වසරේ බලපවත්නා දීර්ඝකාලීන රක්ෂණ ඔප්පු 5.44% කින් ඉහළ ගොස් ඇත. 10වන රූපසටහනින් දක්වා ඇති පරිදි රක්ෂණ සමාගම් 545,721 ක නව දීර්ඝ කාලීන රක්ෂණ ඔප්පු සංඛ්‍යාවක් 2014 වසරේ දී නිකුත් කර ඇත. මීට පෙර වසර හා සමානව, බලපවත්නා ඔප්පු සංඛ්‍යාව රටේ සමස්ථ ජනගහනයෙන් 12.6% ක් පමණ විය. තවද බලපවත්නා දීර්ඝ කාලීන ඔප්පු ප්‍රමාණය රටේ ශ්‍රම බලකායෙන් ප්‍රතිශතයක් ලෙස ගත් කළ 2013 වසරේ දී වාර්තා වූ 28.1% ක් වූ අගයේ සිට 1.5% කින් සුළු වශයෙන් වැඩි වී ඇත.

**රූප සටහන 10**

*නිකුත් කරන ලද ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව හා බලපවත්නා ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව*




| | 2010 | 2011 | 2012 | 2013 (අ) | 2014 (ආ) |
|---|---|---|---|---|---|
| නිකුත් කරන ලද නව ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව | 516,139 | 526,023 | 514,516 | 546,292 | 545,721 |
| බලපවත්නා ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව | 2,214,976 | 2,355,449 | 2,438,340 | 2,477,695 | 2,612,497 |
| බලපවත්නා ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව මුළු ජනගහනයෙන් ප්‍රතිශතයක් ලෙස * | 10.7 | 11.3 | 12.0 | 12.1 | 12.6 |
| බලපවත්නා ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව මුළු ශ්‍රම බලකායෙන් ප්‍රතිශතයක් ලෙස * | 27.3 | 27.5 | 28.8 | 28.1 | 29.6 |

** මූලාශ්‍රය : මධ්‍ය වාර්ෂික ශ්‍රම බලකාය සහ ජනගහනය - ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

*(අ) ප්‍රතිශෝධිත විගණන සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යා*


# සංඛ්‍යානමය සමාලෝචනය

**රක්ෂණ ඔප්පු අවලංගුවීම - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය**

11 වැනි රූපසටහනෙන් දක්වන ආකාරයට 2014 වසරේ දී අවලංගු වූ සමස්ත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 2013 වසරේ දී වාර්තා කළ 366,506 ක ඔප්පු සංඛ්‍යාවේ සිට ඔප්පු 362,664 දක්වා අඩු වී ඇති අතර එමඟින් 1.05% ක සුළු අඩුවීමක් නිරූපණය කරයි. එබැවින් 2013 වසරේ දී වාර්තා කළ 14.79% ක අගය හා සැසඳීමේ දී අවලංගු වූ සමස්ත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව බලපවත්නා මුළු රක්ෂණ ඔප්පු සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 13.88% කින් අඩු වී ඇත. 2014 වසරේ දී අවලංගු වූ නව රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 103,500 ක් වූ අතර 2013 වසරේ දී වාර්තා කළ 107,906 හා සැසඳීමේ දී 4.08% කින් අඩුවීමක් පෙන්වයි. එබැවින් අවලංගු වූ නව රක්ෂණ ඔප්පු සංඛ්‍යාව, නිකුත් කළ නව ඔප්පුවල ප්‍රතිශතයක් ලෙස ගත් කළ 2013 වසරේ දී වාර්තා කළ 19.75% අගයේ සිට 2014 වසරේ දී 18.97%ක් දක්වා අඩු වී ඇත.

**රූප සටහන 11**

*2010 වසරේ සිට 2014 වසර දක්වා අවලංගු වූ ඔප්පු සංඛ්‍යාව සහ ඔප්පු අවලංගුවීමේ අනුපාතය - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය*




| | 2010 | 2011 | 2012 | 2013 (අ) | 2014 (ආ) |
|---|---|---|---|---|---|
| අවලංගු වූ නව රක්ෂණ ඔප්පු | 84,413 | 82,080 | 94,936 | 107,906 | 103,500 |
| අවලංගු වූ මුළු රක්ෂණ ඔප්පු | 432,707 | 371,196 | 332,707 | 366,506 | 362,664 |
| අවලංගු වූ නව රක්ෂණ ඔප්පු ප්‍රමාණය නිකුත් කරන ලද නව රක්ෂණ ඔප්පු ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස | 16.35 | 15.60 | 18.45 | 19.75 | 18.97 |
| අවලංගු වූ මුළු රක්ෂණ ඔප්පු ප්‍රමාණය බලපවත්නා මුළු රක්ෂණ ඔප්පු ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස | 19.54 | 15.76 | 13.64 | 14.79 | 13.88 |

*(අ) මණ්ඩලයට ඉදිරිපත් කරන ලද ජීව ගණක වාර්තාවලට අනුව*

*(ආ) තාවකාලික සංඛ්‍යා*

# සංඛ්‍යානමය සමාලෝචනය

### රක්ෂණ සමාගම්වල නුබුන්වත්භාවය - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය

රක්ෂණ සමාගම් මණ්ඩලය මඟින් නිකුත් කර ඇති රීති හා රෙගුලාසිවලට අනුව ගණනය කළ නුබුන්වත් ආන්තික අවශ්‍යතාවන් පිළිපැදීම අවශ්‍ය වේ. 2013 දෙසැම්බර් 31 සහ 2014 දෙසැම්බර් 31ට රක්ෂණ සමාගම්වල නුබුන්වත් අනුපාතය සහ ඔප්පු වගකීම් වටිනාකම් 11 වන වගුවෙන් නිරූපණය වේ. 2014 දෙසැම්බර් 31 වන විට එක් සමාගමකට පමණක් නුබුන්වත් අනුපාතය වන '1' අත්කර ගැනීමට නොහැකි වූ අතර මණ්ඩලය විසින් ඒ පිළිබඳ අවශ්‍ය පියවර ගෙන ඇත. 2013 දෙසැම්බර් 31 වන විට වාර්තා වූ රුපියල් මිලියන 132,493 ක් වූ ඔප්පු වගකීම් හා සැසඳීමේ දී 2014 වසරේ දී එම අගය රුපියල් මිලියන 147,938 ක් විය.

**වගුව 11**

*2013 සහ 2014 දෙසැම්බර් 31 දිනට සමාගම් අනුව නුබුන්වත්භාවය සහ රක්ෂණ ඔප්පුවල වගකීම් - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය*

| රක්ෂකයා | 2013 දෙසැම්බර් 31 දිනට (අ) | | 2014 දෙසැම්බර් 31 දිනට (ආ) | | | |
|---|---|---|---|---|---|---|
| | නුබුන්වත් අනුපාතය | ඔප්පු වගකීම් වටිනාකම (රුපියල් .000) | පවත්නා නුබුන්වත් අනුපාතය (රුපියල් .000) | අවශ්‍ය නුබුන්වත් ආන්තිකය (0.05% ඔප්පු වගකීම් වටිනාකම (රු. '000) | නුබුන්වත් අනුපාතය | ඔප්පු වගකීම් වටිනාකම (රුපියල් .000) |
| ඒඅයිඒ | 2.89 | 23,644,788 | 5,426,460 | 1,256,003 | 4.32 | 25,120,062 |
| අලියාන්ස් ජීවිත | 5.40 | 663,689 | 112,640 | 49,037 | 2.30 | 980,741 |
| අමානා තකාෆුල් | 2.02 | 538,568 | 30,463 | 27,781 | 1.10 | 555,610 |
| ආර්පිකෝ | 10.62 | 149,313 | 485,842 | 14,177 | 34.27 | 283,540 |
| ඒෂියන් එලායන්ස් | 2.48 | 3,697,969 | 771,570 | 245,669 | 3.14 | 4,913,375 |
| සෙලින්කෝ | 12.85 | 32,593,476 | 26,234,688 | 1,836,480 | 14.29 | 36,729,597 |
| කෝපරේටිව් | 3.23 | 676,575 | 41,913 | 39,912 | 1.05 | 798,243 |
| එච්එන්බීඒ | 2.04 | 4,033,316 | 576,093 | 252,009 | 2.29 | 5,040,184 |
| ජනශක්ති | 6.77 | 5,285,357 | 865,829 | 341,124 | 2.54 | 6,822,472 |
| එල්අයිසී | 10.62 | 919,426 | 708,104 | 56,556 | 12.52 | 1,131,121 |
| එල්ඕඑල්සී | (11.18) | 251,522 | 196,151 | 34,147 | 5.74 | 682,942 |
| එම්බීඑස්එල් | (0.40) | 218,559 | (36,451) | 18,381 | (1.98) | 367,615 |
| සණස | 1.03 | 537,990 | 220,261 | 34,138 | 6.45 | 682,753 |
| එස්එල්අයිසී | 11.48 | 43,227,530 | 31,529,776 | 2,268,016 | 13.90 | 45,360,319 |
| යූඒඑල් | 3.99 | 16,054,685 | 4,375,064 | 923,478 | 4.74 | 18,469,562 |
| **එකතුව/සමස්ත** | **8.43** | **132,492,764** | **71,538,404** | **7,396,907** | **9.67** | **147,938,137** |

*(අ) ප්‍රතිශ්ඨාපිත විගණන සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යා*

# සංඛ්‍යානමය සමාලෝචනය

## සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

### දළ ලිඛිත වාරික ආදායම

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ නියැලි රක්ෂණ සමාගම් උත්පාදනය කළ මුළු දළ ලිඛිත වාරික ආදායම 2013 වසරේ රු. මිලියන 53,311 හා සැසඳීමේ දී 2014 වසරේ දී රු. මිලියන 55,262 ක් වූ අතර 12 වැනි වගුවෙන් පෙන්නුම් කර ඇති පරිදි එය 3.66%කින් ඉහළ යාමකි. මුහුදු, විවිධ සහ මෝටර් රථ රක්ෂණවල දක්නට ලැබුනු මන්දගාමී වර්ධනය සහ ගිනි රක්ෂණ ව්‍යාපාරයේ වාර්තා කළ ඍණ වර්ධනය මෙම අඩු වර්ධන අනුපාතයට ප්‍රධාන වශයෙන් දායක විය. රක්ෂණ සමාගම් තම වෙළඳපොළ පංගුව සඳහා තරඟ කිරීම හේතුකොටගෙන සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය මිල තරඟකාරිත්වය මත රැඳී පැවතුනි.

2014 වසරේ දී සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට අදාළ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය වාරික ආදායම රුපියල් මිලියන 3,491 ක් (2013: රුපියල් මිලියන 2,957) වූ අතර ඒ අනුව වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය වාරික ආදායම ද ඇතුලත් වූ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරික ආදායම 2014 වසරේ දී රුපියල් මිලියන 58,753ක් (2013: රුපියල් මිලියන 56,267) විය.

පසුගිය වසර හා සමානවම, එස්එල්අයිසී සමාගම රු. මිලියන 12,114 ක් (2013: රු. මිලියන 12,550) වූ මුළු දළ ලිඛිත වාරික ආදායමෙන් 21.92% ක් (2013: 23.54 %) අත්කර ගනිමින් සාමාන්‍ය රක්ෂණ වෙළඳපොළේ විශාලතම වෙළඳපොළ පංගුව අයිතිකර ගෙන ඇත. කෙසේවුව ද, 2013 වසර හා සැසඳීමේ 2014 වර්ෂයේ දී එස්එල්අයිසී සමාගමේ වෙළඳපොළ පංගුව 1.62% ක අගයකින් සුළු වශයෙන් අඩු වී ඇත.

සෙලින්කෝ සමාගම 2014 වසරේ දී රුපියල් මිලියන 10,773 ක (2013: රුපියල් මිලියන 10,311) දළ ලිඛිත වාරික ආදායමක් වාර්තා කරමින් සහ 19.49% ක (2013: 19.34%) වෙළඳපොළ පංගුවක් ඇතිව සාමාන්‍ය රක්ෂණ වෙළඳපොළේ දෙවැනි ස්ථානය හිමිකර ගත් අතර 2013 වසර හා සැසඳීමේ දී දළ ලිඛිත වාරික ආදායමෙන් සුළු වැඩි වීමක් නිරූපණය කරයි.

2014 වසරේ දී ජනශක්ති සමාගම රු. මිලියන 6,492 ක (2013: රු. මිලියන 6,319) දළ ලිඛිත වාරික ආදායමක් උත්පාදනය කරමින් 11.75% ක (2013: 11.85%) තෙවැනියට විශාලතම වෙළඳපොළ පංගුවක් අත්කර ගත්තේය.

යූනියන් සහ පීපල්ස් සමාගම් පිළිවෙලින් 8.96% ක් (2013: 9.60%) සහ 5.95%ක් (2013: 5.79%) වූ හතරවන සහ පස්වන විශාලතම වෙළඳපොළ පංගුව හිමි කර ගැනීම සඳහා පිළිවෙලින් රු. මිලියන 4,951 ක් (2013: රු. මිලියන 5,117) සහ රු. මිලියන 3,286 ක් (2013: රු. මිලියන 3,085) වටිනා දළ ලිඛිත වාරික ආදායමක් උත්පාදනය කර ඇත. 2013 වසර හා සැසඳීමේ දී 2014 වසරේ දී යූනියන් සමාගමේ දළ ලිඛිත වාරික ආදායම අඩු වී තිබුන ද පීපල්ස් සමාගමේ දළ ලිඛිත වාරික ආදායම 2013 වසර හා සැසඳීමේ දී 2014 වසරේ දී වැඩි වී ඇත.

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ වෙළඳපොළ පංගුව අනුව සලකා බලන විට ඉහළම ස්ථාන පහට හිමිකම් පෑ රක්ෂණ සමාගම් පහ 2014 වසරේ දී සාමූහිකව මුළු කර්මාන්තයේ දළ ලිඛිත වාරික ආදායමෙන් 68.07% ක් (2013: 70.12%) හිමිකර ගත් අතර එකී සමාගම් අතර දළ ලිඛිත වාරික ආදායමේ සංකේන්ද්‍රණය සම්බන්ධයෙන් සුළු අඩු වීමක් පෙන්නුම් කරයි. 2013 වසර හා සැසඳීමේ දී සාමාන්‍ය රක්ෂණ වෙළඳපොළේ මධ්‍යම හා සුළු ක්‍රියාකාරීන්ට 2014 වසරේ දී සිය වෙළඳපොළ පංගුව වැඩි කර ගැනීමට හැකි වී ඇත.

12 වන රූපසටහන මඟින් සමාගම් අනුව 2014 වසරේ දී රක්ෂණ සමාගම් මඟින් අත්කර ගෙන සිටින සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරික ආදායමේ වෙළඳපොළ පංගුව පැහැදිලි කරයි.

# සංඛ්‍යානමය සමාලෝචනය

**වගුව 12**

***සමාගම්වල දළ ලිඛිත වාරික ආදායම සහ වෙළඳපොළ පංගුව - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය***

| රක්ෂකයා | 2010 | | 2011 | | 2012 | | 2013 (අ) | | 2014 (ආ) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වාරිකය (රු. '000) | වෙළඳපොළ පංගුව (%) | වාරිකය (රු. '000) | වෙළඳපොළ පංගුව (%) | වාරිකය (රු. '000) | වෙළඳපොළ පංගුව (%) | වාරිකය (රු. '000) | වෙළඳපොළ පංගුව (%) | වාරිකය (රු. '000) | වෙළඳපොළ පංගුව (%) |
| ඒඅයිඒ | 2,490,843 | 7.10 | 2,456,347 | 5.67 | 2,143,252 | 4.31 | 2,428,675 | 4.55 | 2,655,577 | 4.81 |
| ඒඅයිජී | 890,387 | 2.54 | 942,901 | 2.18 | 819,448 | 1.65 | 880,060 | 1.65 | 523,857 | 0.95 |
| අලියාන්ස් සාමාන්‍ය | 1,356,660 | 3.86 | 1,379,406 | 3.18 | 1,397,127 | 2.81 | 1,964,907 | 3.68 | 2,563,968 | 4.64 |
| අමානා තකාෆුල් | 908,756 | 2.59 | 916,754 | 2.12 | 1,125,838 | 2.27 | 1,432,135 | 2.69 | 1,297,651 | 2.35 |
| ඒෂියන් එලායන්ස් | 397,789 | 1.13 | 582,257 | 1.34 | 1,133,240 | 2.28 | 1,556,386 | 2.92 | 1,651,827 | 2.99 |
| සෙලින්කෝ | 8,724,292 | 24.85 | 9,558,942 | 22.06 | 10,434,917 | 21.00 | 10,311,479 | 19.34 | 10,772,849 | 19.49 |
| කොන්ටිනෙන්ටල් | 359,105 | 1.02 | 1,149,121 | 2.65 | 1,545,225 | 3.11 | 1,330,515 | 2.50 | 1,765,202 | 3.19 |
| කෝපරේටිව් | 644,814 | 1.84 | 922,859 | 2.13 | 1,135,011 | 2.28 | 1,272,941 | 2.39 | 1,346,018 | 2.43 |
| එච්එන්බීඒ | 1,255,190 | 3.58 | 1,623,830 | 3.75 | 1,635,306 | 3.29 | 1,767,361 | 3.32 | 2,213,061 | 4.00 |
| ජනශක්ති | 4,324,170 | 12.32 | 5,086,207 | 11.74 | 5,773,429 | 11.62 | 6,318,626 | 11.85 | 6,491,556 | 11.75 |
| එල්ඕඑල්සී | - | - | 364,735 | 0.84 | 1,295,133 | 2.61 | 1,485,521 | 2.79 | 1,843,393 | 3.34 |
| එම්බීඑස්එල් | 467,606 | 1.33 | 636,738 | 1.47 | 1,049,147 | 2.11 | 1,132,789 | 2.12 | 913,125 | 1.65 |
| ඔරියන්ට් | - | - | 1,749 | - | 308,547 | 0.62 | 355,001 | 0.66 | 491,127 | 0.89 |
| පීපල්ස් | 847,064 | 2.42 | 2,284,578 | 5.27 | 2,795,448 | 5.63 | 3,085,041 | 5.79 | 3,286,063 | 5.95 |
| සණස | 234,914 | 0.67 | 232,374 | 0.54 | 308,142 | 0.62 | 322,592 | 0.61 | 382,057 | 0.69 |
| එස්එල්අයිසී | 8,766,027 | 24.97 | 11,134,583 | 25.70 | 12,359,188 | 24.87 | 12,549,763 | 23.54 | 12,113,568 | 21.92 |
| යූඒඑල් | 3,433,830 | 9.78 | 4,055,443 | 9.36 | 4,436,052 | 8.93 | 5,116,966 | 9.60 | 4,950,741 | 8.96 |
| **එකතුව** | **35,101,447** | **100** | **43,328,824** | **100** | **49,694,450** | **100** | **53,310,758** | **100** | **55,261,639** | **100** |
| **වර්ධන අනුපාතය (%)** | **4.63** | | **23.44** | | **14.69** | | **7.28** | | **3.66** | |

*(අ) ප්‍රතිශ්ඨාපිත විගණන සංඛ්‍යා*

*(ආ) තාවකාලික සංඛ්‍යා*


*සටහන්:*

1. *2010 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා රක්ෂණ සමාගම්හි සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ද.ලි.වා. ආදායම ගණනය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය වාරික ආදායම සලකා බලා නොමැත.*
2. *අවශ්‍ය කරන ලද සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුලත් කර නොමැත.*

# සංඛ්‍යානමය සමාලෝචනය

**රූප සටහන 12**

*සමාගම් මට්ටමින් දළ ලිඛිත වාරික ආදායමේ වෙළඳපොළ පංගුව - 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය*




# සංඛ්‍යානමය සමාලෝචනය

**දළ ලිඛිත වාරික ආදායම ජනනය කිරීම අතින් ප්‍රමුඛතම සමාගම් පහේ සහ අනෙක් රක්ෂකයන්ගේ වෙළඳපොළ පංගුව - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

2010 වසරේ සිට 2014 වසර දක්වා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරික ආදායම් ජනනය කිරීම අතින් ප්‍රමුඛතම වෙළඳපොළ පංගු වාර්තා කරන ලද සමාගම් පහ සහ අනෙක් රක්ෂකයින් වාර්තා කළ වෙළඳපොළ පංගුව 13 වන රූප සටහනින් නිරූපණය වේ. එච්එන්බී සමාගම පෙර වසරයන් හා සමානවම සාමාන්‍ය රක්ෂණ වෙළඳපොළේ අංක එකේ ස්ථානයේ රැඳී සිටියේය. කෙසේවුව ද එච්එන්බී සමාගමේ වෙළඳපොළ පංගුව 2013 වසරේ දී වාර්තා කළ 23.54% සිට 2014 වසරේ දී 21.92% දක්වා පහළ බැස ඇති අතර 13 වන රූපසටහනේ දක්වා ඇති පරිදි එච්එන්බී සමාගමේ වෙළඳපොළ පංගුව 2011 වසරේ සිට ක්‍රම ක්‍රමයෙන් පහළ බැස ඇත. සෙලින්කෝ සමාගම 2014 වසරේ දී 19.49% ක වෙළඳපොළ පංගුවක් දිනා ගනිමින් සාමාන්‍ය රක්ෂණ වෙළඳපොළේ දෙවැනි ස්ථානය හිමිකර ගෙන සිටී. ජනශක්ති සමාගම වෙළඳපොළේ තෙවැනි ස්ථානය හිමි කර ගෙන ඇති අතර 2014 වසරේ දී 11.75% ක වෙළඳපොළ පංගුවක් අත්කර ගෙන ඇත. කෙසේවුව ද ජනශක්ති සමාගමේ වෙළඳපොළ පංගුව 2013 වසර හා සැසඳීමේ දී 2014 වසරේ දී පහළ බැස ඇත්තේ සුළු වශයෙනි. යූඒඑල් 2010 වසරේ සිට සාමාන්‍ය රක්ෂණ වෙළඳපොළේ හතරවැනි ස්ථානයේ රැඳී සිටින අතර 2014 වසරේ දී ඔවුන්ගේ වෙළඳපොළ පංගුව 8.96% ක් විය. පීපල්ස් සමාගම 2014 වසරේ දී 5.95% ක වෙළඳපොළ පංගුවක් හිමිකර ගත් අතර වෙළඳපොළේ පස්වැනි ස්ථානය අත්කර ගත්තේය. තව ද, පීපල්ස් සමාගමේ වෙළඳපොළ පංගුව පසුගිය වසර පහක කාලය තුළ ක්‍රම ක්‍රමයෙන් වර්ධනය වී ඇත. අනෙකුත් රක්ෂණ සමාගම්වල වෙළඳපොළ පංගුව ද පසුගිය වසර පහක කාලය තුළ වර්ධනය වී ඇති අතර දළ ලිඛිත වාරික ආදායම ජනනය කිරීම අතින් ප්‍රමුඛතම සමාගම් පහ හැරුණු කොට අනෙක් සමාගම් උත්පාදනය කරනු ලබන දළ ලිඛිත වාරික ආදායමේ වර්ධනයක් පෙන්නුම් කරයි.

**රූප සටහන 13**

*2010 වසරේ සිට 2014 වසර දක්වා ප්‍රමුඛතම සමාගම් පහේ සහ අනෙක් රක්ෂකයන්ගේ වෙළඳපොළ පංගුව - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය*




| | එච්එන්බී | සෙලින්කෝ | ජනශක්ති | යූඒඑල් | පීපල්ස් | වෙනත් රක්ෂකයින් |
|---|---|---|---|---|---|---|
| 2010 | 24.97 | 24.85 | 12.32 | 9.78 | 2.42 | 25.65 |
| 2011 | 25.70 | 22.06 | 11.74 | 9.36 | 5.27 | 25.87 |
| 2012 | 24.87 | 21.00 | 11.62 | 8.93 | 5.63 | 27.96 |
| 2013(අ) | 23.54 | 19.34 | 11.85 | 9.60 | 5.79 | 29.88 |
| 2014(ආ) | 21.92 | 19.49 | 11.75 | 8.96 | 5.95 | 31.93 |

*(අ) ප්‍රතිශ්ධාපිත විගණන සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යා*

# සංඛ්‍යානමය සමාලෝචනය

## දළ ලිඛිත වාරික ආදායම රක්ෂණ උප-වර්ග අනුව විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ප්‍රධාන උප-පන්තිවලින් උත්පාදිත දළ ලිඛිත වාරික ආදායම, ඒවායේ වර්ධන අනුපාත සහ 2010 සිට 2014 වසර දක්වා කාලපරිච්ඡේදය සඳහා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සමස්ත දළ ලිඛිත වාරික ආදායමේ ප්‍රතිශතය 13 වැනි වගුව සහ 14 වැනි රූපසටහනෙන් නිරූපණය කරයි.

ගිනි, මුහුදු, මෝටර් රථ සහ විවිධ රක්ෂණය සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ප්‍රධාන උප පන්තිවලට ඇතුලත් වේ.

13 වන වගුවෙන් නිරූපණය වන පරිදි 2014 වසරේ දී මෝටර් රථ රක්ෂණය රු. මිලියන 34,945 ක් (2013: රු. මිලියන 33,157) වූ දළ ලිඛිත වාරික ආදායමක් උත්පාදනය කරමින් සාමාන්‍ය රක්ෂණ වෙළඳපොළේ ආධිපත්‍ය දිනා ගෙන ඇති අතර එම අගය සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සමස්ත දළ ලිඛිත වාරික ආදායමෙන් 63.24% ක් නිරූපණය කළේය. මෝටර් රථ රක්ෂණය 2013 වසරට වඩා 2014 වසරේ දී 5.39% කින් වර්ධනය වී ඇත.

2014 වසරේ දී විවිධ රක්ෂණ ව්‍යාපාරය සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සමස්ත දළ ලිඛිත වාරික ආදායමෙන් 22.19%ක් (2013: 22.61%) හිමිකර ගෙන ඇත්තේ රු. මිලියන 12,262 ක් (2013: රු. මිලියන 12,054) වටිනා දළ ලිඛිත වාරික ආදායමක් අත්කර ගෙන වන අතර 2013 වසර හා සැසඳීමේ දී 1.73% ක සුළු වර්ධනයක් පෙන්නුම් කරයි. පෙර වසර හා සමානවම විවිධ රක්ෂණ ව්‍යාපාරය 2014 වසරේ දී සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දෙවැනියට විශාලතම උප-පන්තිය නියෝජනය කළේය.

ගිනි රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරික ආදායම 2014 වසරේ දී රු. මිලියන 6,242 ක් (2013: රු. මිලියන 6,304) වූ අතර සමස්ත දළ ලිඛිත වාරික ආදායමෙන් 11.29%ක් (2013: 11.82%) හිමිකර ගත්තේය. 2013 වසර හා සැසඳීමේ දී ගිනි රක්ෂණයෙන් උත්පාදිත දළ ලිඛිත වාරික ආදායම 2014 වසරේ දී පහළ බැස ඇති අතර 0.97% ක සෘණ වර්ධනයක් අත් කර ගෙන ඇත. 2014 වසරේ දී මුහුදු රක්ෂණය මඟින් රු. මිලියන 1,812ක (2013: රු. මිලියන 1,796) දළ ලිඛිත වාරික ආදායමක් උත්පාදන කර ඇති අතර 2014 වසරේ දී සමස්ත දළ ලිඛිත වාරික ආදායමෙන් 3.28% ක් (2013: 3.37%) හිමිකර ගෙන ඇත්තේ 2013 වසර හා සැසඳීමේ 0.87% කින් වර්ධනය වෙමිනි.

**වගුව 13**

*දළ ලිඛිත වාරික ආදායම රක්ෂණ උප-පන්ති අනුව විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය*

| උප පන්තිය | දළ ලිඛිත වාරිකය (රු. '000) | | | | |
|---|---|---|---|---|---|
| | 2010 | 2011 | 2012 | 2013 (අ) | 2014(ආ) |
| ගිනි | 5,012,443 | 5,376,094 | 5,422,346 | 6,303,579 | 6,242,137 |
| මුහුදු | 1,498,832 | 1,678,027 | 1,917,570 | 1,796,374 | 1,811,989 |
| රථවාහන | 20,948,782 | 27,141,119 | 31,637,508 | 33,157,131 | 34,945,370 |
| විවිධ | 7,641,390 | 9,133,584 | 10,717,026 | 12,053,673 | 12,262,143 |
| **එකතුව** | **35,101,447** | **43,328,824** | **49,694,450** | **53,310,758** | **55,261,639** |

| උප පන්තිය | වර්ධනය % | | | | |
|---|---|---|---|---|---|
| | 2010 | 2011 | 2012 | 2013 (අ) | 2014(ආ) |
| ගිනි | (28.90) | 7.25 | 0.86 | 16.25 | (0.97) |
| මුහුදු | 3.89 | 11.96 | 14.28 | (6.32) | 0.87 |
| රථවාහන | 17.05 | 29.56 | 16.57 | 4.80 | 5.39 |
| විවිධ | 6.75 | 19.53 | 17.34 | 12.47 | 1.73 |
| **එකතුව** | **4.63** | **23.44** | **14.69** | **7.28** | **3.66** |

| උප පන්තිය | ප්‍රතිශතාත්මක කොටස % | | | | |
|---|---|---|---|---|---|
| | 2010 | 2011 | 2012 | 2013 (අ) | 2014(ආ) |
| ගිනි | 14.28 | 12.41 | 10.91 | 11.82 | 11.29 |
| මුහුදු | 4.27 | 3.87 | 3.86 | 3.37 | 3.28 |
| රථවාහන | 59.68 | 62.64 | 63.66 | 62.20 | 63.24 |
| විවිධ | 21.77 | 21.08 | 21.57 | 22.61 | 22.19 |
| **එකතුව** | **100** | **100** | **100** | **100** | **100** |

*(අ) ප්‍රතිශ්ඨාපිත විගණන සංඛ්‍යා (ආ) තාවකාලික සංඛ්‍යා*


*සටහන්:*

1. *2010 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා රක්ෂණ සමාගම්වල සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ද.ලි.වා. ආදායම ගණනය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය වාරික ආදායම සලකා බලා නොමැත.*
2. *අවශ්‍ය කරන ලද සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුලත් කර නොමැත.*

# සංඛ්‍යානමය සමාලෝචනය

**රූප සටහන 14**

*දළ ලිඛිත වාරික ආදායම රක්ෂණ උප-පන්ති අනුව විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය*




| | | 2010 | 2011 | 2012 | 2013 (අ) | 2014 (ආ) |
|---|---|---|---|---|---|---|
| | ගිනි | 14.28 | 12.41 | 10.91 | 11.82 | 11.29 |
| | මුහුදු | 4.27 | 3.87 | 3.86 | 3.37 | 3.28 |
| | මෝටර් රථ | 59.68 | 62.64 | 63.66 | 62.20 | 63.24 |
| | විවිධ | 21.77 | 21.08 | 21.57 | 22.61 | 22.19 |
| | කර්මාන්ත වර්ධනය (සාමාන්‍ය රක්ෂණ) | 4.63 | 23.44 | 14.69 | 7.28 | 3.66 |

*(අ) ප්‍රතිශෝධිත විගණන සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යා*

*සටහන්:*

1. *2010 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා රක්ෂණ සමාගම්වල සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ද.ලි.වා. ආදායම ගණනය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය වාරික ආදායම සලකා බලා නොමැත.*

2. *අවශ්‍ය කරන ලද සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුලත් කර නොමැත.*

# සංඛ්‍යානමය සමාලෝචනය

**රක්ෂණ ව්‍යාපාරයේ විවිධ රක්ෂණ උප-පන්තියේ දළ ලිඛිත වාරික ආදායම කාණ්ඩ අනුව විශ්ලේෂණය**

2014 සහ 2013 වසරවල දී විවධ රක්ෂණ ව්‍යාපාර යටතේ කාණ්ඩ කරන ලද විවිධ රක්ෂණවලින් උත්පාදිත දළ ලිඛිත වාරික ආදායම 14වැනි වගුවෙන් දැක්වේ. වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය වාරික ආදායම සහ සම-රක්ෂණය හැරුණු කොට විවිධ රක්ෂණවලින් උත්පාදිත සමස්ත දළ ලිඛිත වාරික ආදායම 2014 වසරේ දී රු. මිලියන 12,262ක් (2013: රු. මිලියන 12,054) විය.

සෞඛ්‍ය හා ශල්‍යකර්ම, පුද්ගලික අනතුරු, ගුවන්යානා බඳ, අභිධානය, මාර්ගස්ථ මුදල් ආදිය විවිධ රක්ෂණ උප-පන්ති යටත් ගොනු කළ ප්‍රධාන රක්ෂණ ව්‍යාපාරයන් කාණ්ඩ වේ. සෞඛ්‍ය හා ශල්‍යකර්ම විවිධ රක්ෂණ ව්‍යාපාරය යටතේ ඉහළම දළ ලිඛිත වාරික ආදායමක් උත්පාදනය කළ කාණ්ඩය වූ අතර 2014 වසරේ දී එහි අගය රු. මිලියන 6,397ක් (2013: රු. මිලියන 5,875) වූ අතර වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය වාරික ආදායම සහ සම-රක්ෂණ වාරික ආදායම ඇතුළු සමස්ත දළ ලිඛිත වාරික ආදායමෙන් 50.26%ක් නිරූපණය කළේය. සෞඛ්‍ය හා ශල්‍යකර්ම කාණ්ඩය 2013 වසර හා සැසඳීමේ දී 2014 වසරේ දී 8.89% කින් වර්ධනය වී ඇති අතර එමඟින් සෞඛ්‍ය හා ශල්‍යකර්ම රක්ෂණ නිපැයුම සඳහා ඇති ඉහළයන ඉල්ලුම නිරූපණය කරයි. විවිධ රක්ෂණ ව්‍යාපාරයේ අනෙකුත් රක්ෂණ කාණ්ඩ සම්බන්ධයෙන් ගත් කළ ඒවා 2013 වසරේ දී උත්පාදිත රු. මිලියන 1,732ක් වටිනා දළ ලිඛිත වාරික ආදායම හා සැසඳීමේ දී 2014 වසරේ දී 19.63%ක වර්ධනයක් ඇතිව රු. මිලියන 2,072ක් දක්වා ඉහළ ගොස් ඇත.

**වගුව 14**

*2013 හා 2014 සඳහා රක්ෂණ ව්‍යාපාරයේ විවිධ රක්ෂණ උප-පන්තියේ දළ ලිඛිත වාරික ආදායම කාණ්ඩ අනුව විශ්ලේෂණය*

| | දළ ලිඛිත වාරික ආදායම (රුපියල් '000) | |
|---|---|---|
| කාණ්ඩය | 2013 (අ) | 2014 (ආ) |
| සෞඛ්‍ය හා ශල්‍යකර්ම | 5,875,382 | 6,397,496 |
| හිමිකම් අයිතිය | 293,292 | 390,491 |
| පුද්ගලික අනතුරු | 1,578,256 | 1,129,894 |
| කොන්ත්‍රාත්කරුගේ සියලු අවදානම් | 48,356 | 31,845 |
| වෘත්තීය හානිරක්ෂණය | 265,077 | 238,610 |
| වාරිකා රක්ෂණය | 232,543 | 343,227 |
| විශ්වාසතා ඇපය | 58,558 | 73,704 |
| සොර බිය | 320,750 | 260,629 |
| සේප්පුවේ ඇති මුදල් ඇතුළු මාර්ගස්ථ මුදල් | 377,805 | 384,720 |
| මාර්ගස්ථ භාණ්ඩ | 49,181 | 52,534 |
| නිෂ්පාදන වගකීම | 39,089 | 34,846 |
| මහජන වගකීම | 118,694 | 118,578 |
| බැංකුකරුවන්ගේ හානිරක්ෂණය | 329,112 | 276,473 |
| ගුවන්යානා බඳ | 632,891 | 558,862 |
| කම්කරු වන්දි | 374,455 | 365,790 |
| වෙනත් | 1,732,291 | 2,072,314 |
| **මුළු විවිධ රක්ෂණ දළ ලිඛිත වාරික ආදායම** | **12,325,736** | **12,730,014** |
| ජාතික රක්ෂණ භාර අරමුදල සඳහා වන වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය මුළු වාරික ආදායම | (252,055) | (298,984) |
| සහභාග-රක්ෂකයින්ගේ වාරික අදායම | (20,008) | (168,887) |
| **රක්ෂණ කර්මාන්තයේ (සමාගම්වල) ශුද්ධ වාරික ආදයම** | **12,053,673** | **12,262,143** |

*(අ) ප්‍රතිශ්ධාපිත විගණන සංඛ්‍යා ආ) තාවකාලික සංඛ්‍යා*

*සටහන්:*

1. *විවිධ රක්ෂණ උප-පන්ති රක්ෂණ ව්‍යාපාරයේ උප කාණ්ඩවල ඉහත දළ ලිඛිත වාරික ආදායම් සංඛ්‍යා සහභාග-රක්ෂණය, වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය මුළු වාරික ආදායම හැර ඉදිරිපත් කරනු ලැබීය.*
2. *අවශ්‍ය කරන ලද සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුලත් කර නොමැත.*

# සංඛ්‍යානමය සමාලෝචනය

**දළ ලිඛිත වාරික ආදායම, ප්‍රතිරක්ෂණ වාරික ආදායම සහ රක්ෂණකරුවන් විසින් රඳවා ගැනීම - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

2010 සිට 2014 වසර දක්වා රක්ෂණ සමාගම් උත්පාදනය කළ දළ ලිඛිත වාරික ආදායම, ප්‍රතිරක්ෂකයින්ට අත්හැර දැමූ වාරික ආදයම සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ප්‍රධාන පන්තිවල රඳවා ගැනීමේ මට්ටම් 15 වැනි වගුව සහ 15 වැනි රූපසටහනෙන් නිරූපණය වේ.

2014 වසරේ දී සාමාන්‍ය රක්ෂකයින් විසින් උත්පාදිත රු. මිලියන 55,262 ක (2013: රු. මිලියන 53,311) සමස්ත දළ ලිඛිත වාරික ආදායමෙන් රු. මිලියන 9,259ක් (2013: රු. මිලියන 9,387) ප්‍රතිරක්ෂකයින්ට අත්හැර දමා ඇති අතර මෙහි ප්‍රතිඵලය ලෙස සමස්ත රඳවා ගැනීමේ අනුපාතය 83.25% ක් (2013: 82.39%) වී ඇත.

පෙර වසරට සමානව, රථවාහන රක්ෂණ ව්‍යාපාරය 2014 වසරේ දී 98.28%ක අගයක් (2013: 97.39%) සමඟ ඉහළම රඳවා ගැනීමේ අනුපාතයක් වාර්තා කර ඇති අතර රක්ෂණ සමාගම් දරනු ලබන ඉහළ මට්ටමේ අවදානම නිරූපණය කරයි. රථවාහන සඳහා ප්‍රතිරක්ෂකයින්ට අත්හැරිය වාරික ආදායම 2014 වසරේ දී 30.44% කින් කැපී පෙනෙන ලෙස පහළ ගොස් ඇත්තේ 2013 වසරේ දී වාර්තා කළ රු. මිලියන 864 ක මුදල හා සැසඳීමේ දී රු. මිලියන 601 ක් අත්කර ගනිමිනි.

විවිධ රක්ෂණය 2014 වසරේ දී 79.36% ක් වූ (2013: 77.60%) දෙවැනියට ඉහළම රඳවා ගැනීමක් වාර්තා කර ඇති අතර 1.76% ක වර්ධනයක් පෙන්නුම් කළේය. විවිධ රක්ෂණය සඳහා ප්‍රතිරක්ෂකයින්ට අත්හළ වාරික ආදායම 2013 වසරේ දී වාර්තා කළ රු. මිලියන 2,700 සිට 2014 වසරේ දී රු. මිලියන 2,531 ක් දක්වා 6.28% කින් අඩු වී ඇති අතර මෙම තත්ත්වය රඳවා ගැනීමේ අනුපාතය අඩුවීමට දායක වී ඇත.

මුහුදු රක්ෂණයේ රඳවා ගැනීමේ අනුපාතය 2013 දී වාර්තා කළ 44.39% හා සැසඳීමේ දී 2014 වසරේ දී 40.64% දක්වා පහළ බැස ඇත. මුහුදු රක්ෂණය සම්බන්ධයෙන් ගත් කළ ප්‍රතිරක්ෂකයින්ට අත්හළ ප්‍රතිරක්ෂණ වාරික ආදායම 2013 වසරේ දී වාර්තා කළ රු. මිලියන 999 සිට 2014 වසරේ දී රු. මිලියන 1,076 ක් දක්වා 7.67% කින් වර්ධනය වී ඇති අතර එය රඳවා ගැනීමේ අනුපාතයේ පහළ බැසීමට දායක වී ඇත.

පෙර වසර හා සමානව ගිනි රක්ෂණය 2014 වසරේ දී අඩුම රඳවා ගැනීමේ අනුපාතය වාර්තා කර ඇති අතර එය 19.08% ක් වී ඇති අතර 2013 වසරේ දී රඳවා ගැනීමේ අනුපාතය වූ 23.48% හා සැසඳීමේ දී පහළ බැසීමක් පෙන්නුම් කර ඇත. රඳවා ගැනීමේ අනුපාතයේ පහළ බැසීමෙන් 2014 වසරේ දී ගිනි රක්ෂණය සඳහා ප්‍රතිරක්ෂණය සම්බන්ධයෙන් තැබූ ඉහළ මට්ටමේ විශ්වාසය කැපී පෙනේ.

# සංඛ්‍යානමය සමාලෝචනය

**වගුව 15**

***දළ ලිඛිත වාරික ආදායම, ප්‍රතිරක්ෂණ වාරික ආදායම සහ රක්ෂකයන් විසින් රඳවා ගනු ලැබීම - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය***

| උප පන්තිය | දළ ලිඛිත වාරිකය (රුපියල් '000) | | | | |
|---|---|---|---|---|---|
| | 2010 | 2011 | 2012 | 2013 (අ) | 2014 (ආ) |
| ගිනි | 5,012,443 | 5,376,094 | 5,422,347 | 6,303,579 | 6,242,137 |
| මුහුදු | 1,498,832 | 1,678,027 | 1,917,570 | 1,796,374 | 1,811,989 |
| රථවාහන | 20,948,782 | 27,141,119 | 31,637,508 | 33,157,131 | 34,945,370 |
| විවිධ | 7,641,390 | 9,133,584 | 10,717,025 | 12,053,673 | 12,262,143 |
| **මුළු දළ ලිඛිත වාරික ආදායම** | **35,101,447** | **43,328,824** | **49,694,450** | **53,310,758** | **55,261,639** |

| උප පන්තිය | ප්‍රතිරක්ෂණ වාරික ආදායම (රුපියල් '000) | | | | |
|---|---|---|---|---|---|
| | 2010 | 2011 | 2012 | 2013 (අ) | 2014 (ආ) |
| ගිනි | 4,233,236 | 4,090,136 | 4,140,877 | 4,823,731 | 5,051,044 |
| මුහුදු | 813,665 | 847,392 | 1,326,369 | 998,976 | 1,075,640 |
| රථවාහන | 316,594 | 387,211 | 478,478 | 864,394 | 601,306 |
| විවිධ | 2,020,031 | 2,302,942 | 2,752,627 | 2,700,309 | 2,530,557 |
| **මුළු ප්‍රතිරක්ෂණ වාරික ආදායම** | **7,383,526** | **7,627,681** | **8,698,351** | **9,387,410** | **9,258,546** |

| උප පන්තිය | රඳවා ගැනීම (රුපියල් '000) | | | | |
|---|---|---|---|---|---|
| | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
| ගිනි | 779,208 | 1,285,958 | 1,281,469 | 1,479,848 | 1,191,094 |
| මුහුදු | 685,167 | 830,635 | 591,202 | 797,399 | 736,349 |
| රථවාහන | 20,632,188 | 26,753,908 | 31,159,029 | 32,292,737 | 34,344,064 |
| විවිධ | 5,621,359 | 6,830,643 | 7,964,399 | 9,353,364 | 9,731,586 |
| **මුළු ශුද්ධ ලිඛිත වාරික ආදායම** | **27,717,922** | **35,701,143** | **40,996,099** | **43,923,348** | **46,003,093** |

| උප වර්ගය | රඳවා ගැනීම දළ ලිඛිත වාරික ආදායමෙන් ප්‍රතිශතයක් ලෙස (%) | | | | |
|---|---|---|---|---|---|
| | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
| ගිනි | 15.55 | 23.92 | 23.63 | 23.48 | 19.08 |
| මුහුදු | 45.71 | 49.50 | 30.83 | 44.39 | 40.64 |
| රථවාහන | 98.49 | 98.57 | 98.49 | 97.39 | 98.28 |
| විවිධ | 73.56 | 74.79 | 74.32 | 77.60 | 79.36 |
| **සමස්ත රඳවාගැනීමේ අනුපාතය** | **78.97** | **82.40** | **82.50** | **82.39** | **83.25** |

*(අ) ප්‍රතිශ්ඨාපිත විගණන සංඛ්‍යා*

*(ආ) තාවකාලික සංඛ්‍යා*

*සටහන්:*


*1. 2010 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා රක්ෂණ සමාගම්හි සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ද.ලි.වා. ආදායම ගණනය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය වාරික ආදායම සලකා බලා නොමැත.*

*2. අවශ්‍ය කරන ලද සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුලත් කර නොමැත.*

# සංඛ්‍යානමය සමාලෝචනය

**රූප සටහන 15**

***ප්‍රතිරක්ෂණ වාරිකය සහ රක්ෂකයන් විසින් රඳවා ගනු ලැබීම - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය***




(අ) ප්‍රතිශ්ඨාපිත විගණන සංඛ්‍යා
(ආ) තාවකාලික සංඛ්‍යා

# සංඛ්‍යානමය සමාලෝචනය

### ශුද්ධ ඉපැයූ වාරික ආදායම, දැරූ ශුද්ධ හිමිකම්පෑම්, ශුද්ධ හිමිකම්පෑම් අනුපාතිකය, ශුද්ධ වියදම් අනුපාතිකය සහ ශුද්ධ ඒකාබද්ධ අනුපාතිකය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

16 වැනි වගුවේ දක්වා ඇති පරිදි සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ප්‍රධාන උප-පන්තිවලින් උත්පාදිත ශුද්ධ ඉපැයූ වාරික ආදායම 2013 වසරේ දී උත්පාදිත රු. මිලියන 42,036 හා සසඳා බැලීමේ දී 2014 වසරේ දී 5.23% කින් වර්ධනය වෙමින් රු. මිලියන 44,233ක් දක්වා ඉහළ ගියේය. රථවාහන රක්ෂණ ව්‍යාපාරය 2014 වසරේ දී රු. මිලියන 33,031 ක් වූ ඉහළම ශුද්ධ ඉපැයූ වාරික ආදායමක් වාර්තා කළ අතර 74.68% ක ශුද්ධ ඉපැයූ වාරික ආදායමක් නිරූපණය කළේය.

2014 වසරේ දී දැරූ මුළු ශුද්ධ හිමිකම්පෑම් රු. මිලියන 28,935 ක් වූ අතර 2013 වසරේ දී වාර්තා කළ රු. මිලියන 25,570 හා සැසඳීමේ දී 13.16% ක වර්ධනයක් පෙන්නුම් කළේය. රථවාහන රක්ෂණ ව්‍යාපාරය 2014 වසරේ දී දැරූ මුළු ශුද්ධ හිමිකම්පෑම්වලින් 73.83% කට හිමිකම් පෑ අතර රු. මිලියන 21,363 ක (2013: රු. මිලියන 19,398) මුළු ශුද්ධ හිමිකම්පෑමක් වාර්තා කළේය.

ශුද්ධ ඉපැයූ වාරික ආදායමේ ප්‍රතිශතයක් ලෙස ශුද්ධ හිමිකම්පෑම් නිරූපණය කරනු ලබන ශුද්ධ හිමිකම්පෑම් අනුපාතිකය 2014 වසරේ දී ගිනි රක්ෂණය සම්බන්ධයෙන් ඉහළම අගයක් වාර්තා කළේය. 2013 වසරේ දී 57.64% ක් වූ ගිනි රක්ෂණ ව්‍යාපාරයේ ශුද්ධ හිමිකම්පෑම් අනුපාතිකය 2014 වසරේ දී 69.72% දක්වා වර්ධනය විය. ගිනි රක්ෂණ ව්‍යාපාරය සඳහා දැරූ ශුද්ධ හිමිකම්පෑම් 2013 වසරට සාපේක්ෂව පහළ බැස තිබුන ද ගිනි රක්ෂණ ව්‍යාපාරයේ ශුද්ධ ඉපැයූ වාරික ආදායම ඉහළ අනුපාතිකයකින් පහළ බැස ඇති අතර මෙහි ප්‍රතිඵලයක් ලෙස ඉහළ ශුද්ධ හිමිකම්පෑම් අනුපාතිකයක් ඇති වී තිබේ.

2014 වසරේ දී විවිධ රක්ෂණ ව්‍යාපාරය ද 69.40% ක ශුද්ධ හිමිකම්පෑම් අනුපාතිකයක් වාර්තා කර තිබෙන අතර එය 2013 වසරේ දී වාර්තා කළ ශුද්ධ හිමිකම්පෑම් 57-37 ප්‍රතිශතයට වඩා ඉහළ අගයකි. විවිධ රක්ෂණ ව්‍යාපාරයේ ශුද්ධ ඉපැයූ වාරික ආදායම 2013 වසරේ වාර්තා කළ රු. මිලියන 8,592 සිට 2014 වසරේ දී රු. මිලියන 9,470 ක් දක්වා 10.22% කින් වර්ධනය වී තිබුන ද විවිධ රක්ෂණ ව්‍යාපාරය සඳහා දැරූ ශුද්ධ හිමිකම්පෑම් 2014 වසරේ දී 33.33% කින් කැපී පෙනෙන ලෙස ඉහළ ගොස් ඇති අතර මෙහි ප්‍රතිඵලයක් ලෙස ඉහළ ශුද්ධ හිමිකම්පෑම් අනුපාතයක් ඇති වී තිබේ.

රථවාහන රක්ෂණ ව්‍යාපාරය 2014 වසරේ දී 64.68% ක ශුද්ධ හිමිකම්පෑම් අනුපාතයක් වාර්තා කර ඇති අතර 2013 වසරේ දී එකී අගය 62.11% ක වර්ධනයක් නිරූපණය කළේය. රථවාහන රක්ෂණ ව්‍යාපාරයේ ශුද්ධ ඉපැයූ වාරික ආදායම 5.76% කින් පමණක් වර්ධනය වුව ද ඒ සඳහා දැරූ ශුද්ධ හිමිකම්පෑම් 2014 වසරේ දී 10.13% කින් ඉහළ ගොස් ඇති අතර මෙහි ප්‍රතිඵලයක් ලෙස 2014 වසරේ දී රථවාහන රක්ෂණ ව්‍යාපාරය සම්බන්ධ ශුද්ධ හිමිකම්පෑම් අනුපාතය ඉහළ ගොස් ඇත.

මුහුදු රක්ෂණ ව්‍යාපාරයේ 2014 වසරේ දී දැරූ ශුද්ධ හිමිකම්පෑම් 34.70% කින් කැපී පෙනෙන ලෙස පහළ බැසීමේ ප්‍රතිඵලයක් ලෙස එම ව්‍යාපාරයේ ශුද්ධ හිමිකම්පෑම් අනුපාතය 2013 වසරේ දී වාර්තා කළ 53.71% සිට 2014 වසරේ දී 40.22% දක්වා විශාල ලෙස පහළ බැස ඇත.

16වන වගුවෙන් සහ 16වන රූපසටහනෙන් නිරූපණය කර ඇති පරිදි සාමාන්‍ය රක්ෂණ අංශය දැරූ ශුද්ධ වියදම 2014 වසරේ දී රු. මිලියන 19,569 ක් (2013: රු. මිලියන 17,360) වූ අතර 2014 වසරේ දී 12.72% කින් වර්ධනය වී ඇත. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සමස්ත ශුද්ධ වියදම් අනුපාතය ද 2013 වසරේ වාර්තා කළ 41.30% සිට 2014 වසරේ දී 44.24% ක් දක්වා වර්ධනය වී ඇත. ශුද්ධ ඒකාබද්ධ අනුපාතය මඟින් ශුද්ධ හිමිකම්පෑම් අනුපාතයේ එකතුව නිරූපණය කරන අතර ශුද්ධ වියදම් අනුපාතය 2013 වසරේ දී වාර්තා කළ 102.13% සිට 109.66% දක්වා වර්ධනය වී ඇත. 100%ක් ඉක්ම වූ ඒකාබද්ධ අනුපාතය මඟින් සාමාන්‍ය රක්ෂණ අංශය මඟින් දැරූ මුළු හිමිකම්පෑම් සහ වියදම්, ඉපැයූ වාරික ආදායමට වඩා ඉහළ බව නිරූපණය කරයි.

# සංඛ්‍යානමය සමාලෝචනය

**වගුව 16**

***ශුද්ධ ඉපැයූ වාරික ආදායම, දැරූ ශුද්ධ හිමිකම්පෑම්, ශුද්ධ හිමිකම්පෑම් අනුපාතිකය, ශුද්ධ වියදම් අනුපාතිකය සහ ශුද්ධ ඒකාබද්ධ අනුපාතිකය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය***

| පන්තිය | ශුද්ධ ඉපැයූ වාරික ආදායම (රුපියල් '000) | | | | |
|---|---|---|---|---|---|
| | 2010 | 2011 | 2012 | 2013(අ) | 2014(ආ) |
| ගිනි | 1,098,186 | 1,141,591 | 1,400,808 | 1,405,741 | 1,029,013 |
| මුහුදු | 674,476 | 802,677 | 537,073 | 805,682 | 702,595 |
| රථවාහන | 18,356,887 | 23,575,071 | 29,293,110 | 31,232,673 | 33,030,719 |
| විවිධ | 5,282,148 | 6,298,058 | 7,222,611 | 8,591,530 | 9,470,186 |
| **එකතුව** | **25,411,697** | **31,817,397** | **38,453,602** | **42,035,626** | **44,232,513** |

| පන්තිය | දැරූ ශුද්ධ හිමිකම්පෑම් (රුපියල් '000) | | | | |
|---|---|---|---|---|---|
| | 2010 | 2011 | 2012 | 2013(අ) | 2014(ආ) |
| ගිනි | 529,448 | 482,646 | 505,101 | 810,281 | 717,400 |
| මුහුදු | 216,143 | 232,189 | 321,077 | 432,748 | 282,585 |
| රථවාහන | 11,733,879 | 15,416,753 | 18,235,622 | 19,397,683 | 21,363,322 |
| විවිධ | 3,091,110 | 4,160,145 | 4,705,619 | 4,929,225 | 6,572,105 |
| **එකතුව** | **15,570,580** | **20,291,734** | **23,767,419** | **25,569,936** | **28,935,411** |

| පන්තිය | ශුද්ධ හිමිකම්පෑම් අනුපාතිකය (%) | | | | |
|---|---|---|---|---|---|
| | 2010 | 2011 | 2012 | 2013(අ) | 2014(ආ) |
| ගිනි | 48.21 | 42.28 | 36.06 | 57.64 | 69.72 |
| මුහුදු | 32.05 | 28.93 | 59.78 | 53.71 | 40.22 |
| රථවාහන | 63.92 | 65.39 | 62.25 | 62.11 | 64.68 |
| විවිධ | 58.52 | 66.05 | 65.15 | 57.37 | 69.40 |
| **එකතුව** | **61.27** | **63.78** | **61.81** | **60.83** | **65.42** |

| | 2010 | 2011 | 2012 | 2013(අ) | 2014(ආ) |
|---|---|---|---|---|---|
| ශුද්ධ වියදම් (රුපියල් '000) | 10,058,322 | 12,105,102 | 14,807,142 | 17,359,623 | 19,569,487 |
| **ශුද්ධ වියදම් අනුපාතිකය (%)** | **39.58** | **38.04** | **38.51** | **41.30** | **44.24** |

| | | | | | |
|---|---|---|---|---|---|
| **ශුද්ධ ඒකාබද්ධ අනුපාතිකය (%)** | **100.85** | **101.82** | **100.32** | **102.13** | **109.66** |

*(අ) ප්‍රතිශ්ඨාපිත විගණන සංඛ්‍යා*

*(ආ) තාවකාලික සංඛ්‍යා*

*සටහන්:*


*1. 2010 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා රක්ෂණ සමාගම්හි සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ද.ලි.වා. ආදායම ගණනය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය වාරික ආදායම සලකා බලා නොමැත.*

*2. අවශ්‍ය කරන ලද සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුලත් කර නොමැත.*

# සංඛ්‍යානමය සමාලෝචනය

**රූප සටහන 16**

***ශුද්ධ ඉපැයූ වාරික ආදායම, දැරූ ශුද්ධ හිමිකම්පෑම්, ශුද්ධ වියදම්, ශුද්ධ හිමිකම්පෑම් අනුපාතිකය සහ ශුද්ධ ඒකාබද්ධ අනුපාතිකය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය***




*(අ) ප්‍රතිශ්ඨාපිත විගණන සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යා*

# සංඛ්‍යානමය සමාලෝචනය

**දළ ලිඛිත වාරික ආදායම නියෝජනය කරන රක්ෂණ ඔප්පු සංඛ්‍යාව - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

2010 සිට 2014 වසර දක්වා දළ ලිඛිත වාරික ආදායම උත්පාදනයට දායක වූ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ විවිධ උප පන්තිවලට අයත් රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 17 වැනි වගුවෙන් නිරූපණය කෙරේ. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සියලුම උප පන්ති ආශ්‍රිත සාමාන්‍ය රක්ෂණ ඔප්පුවල මුළු සංඛ්‍යාව 2013 වසරේ දී වාර්තා කළ 4,327,860 සිට 2014 වසරේ දී 4,589,139 දක්වා ඉහළ ගොස් ඇත. 17 වැනි වගුවෙන් දක්වා ඇති ආකාරයට සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ මුළු ඔප්පු සංඛ්‍යාව පසුගිය වසර පහක කාලය තුළ ක්‍රමයෙන් වැඩි වර්ධනය වී ඇති අතර රථවාහන රක්ෂණ ව්‍යාපාරය සමස්ත ඔප්පුවලින් 87.31% ක් නියෝජනය කරමින් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ තනි උප පන්තයකින් නිකුත් කල වැඩිම ඔප්පු සංඛ්‍යාවකට හිමිකම් කියයි. රථවාහන රක්ෂණ ඔප්පුවල මුළු සංඛ්‍යාව 2014 වසරේ දී 4,006,740 ක් වූ අතර 2,229,170 ක තුන්වැනි පාර්ශ්ව රක්ෂණ ඔප්පු සහ 1,777,570 ක පූර්ණ රථවාහන රක්ෂණ ඔප්පුවලින් සැදුම්ලත් විය.

ගිනි, මුහුදු සහ විවිධ රක්ෂණ ව්‍යාපාරවල රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 2013 වසර හා සැසඳීමේ දී 2014 වසරේ දී වර්ධනය වී ඇත. කෙසේවුව ද, 2013 වසර හා සැසඳීමේ දී 2014 වසරේ දී කම්කරු වන්දි පිළිබඳ රක්ෂණ ඔප්පු සංඛ්‍යාවේ පහළ බැසීමක් පෙන්නුම් කර ඇත.

**වගුව 17**

***දළ ලිඛිත වාරික ආදායම නියෝජනය කරන රක්ෂණ ඔප්පු සංඛ්‍යාව- සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය***

| | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|
| ගිනි | 154,474 | 205,622 | 186,462 | 177,723 | 190,725 |
| මුහුදු | 138,201 | 169,610 | 154,411 | 158,836 | 179,173 |
| රථවාහන | | | | | |
| තුන්වැනි පාර්ශ්ව පමණක් | 1,929,875 | 2,074,303 | 1,997,502 | 2,126,037 | 2,229,170 |
| පූර්ණ රථවාහන රක්ෂණ | 952,113 | 1,223,534 | 1,474,742 | 1,667,752 | 1,777,570 |
| කම්කරු වන්දි පිළිබඳ රක්ෂණ | 14,606 | 17,172 | 17,415 | 18,717 | 16,252 |
| විවිධ | | | | | |
| සෞඛ්‍ය | 7,277 | 7,872 | 10,294 | 11,384 | 13,876 |
| සෞඛ්‍ය හැරුණු කොට | 163,374 | 204,646 | 198,197 | 167,411 | 182,373 |
| **එකතුව** | **3,359,920** | **3,902,759** | **4,039,023** | **4,327,860** | **4,589,139** |

# සංඛ්‍යානමය සමාලෝචනය

**සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සහ කොටස් හිමියන්ගේ වත්කම්**

2014 වසරේ දෙසැම්බර් 31 වන විට කොටස් හිමියන්ගේ වත්කම් ඇතුළු සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ මුළු වත්කම් රු. මිලියන 163,834 ක් වූ අතර 2013 වසරේ දෙසැම්බර් 31 වන විට රු. මිලියන 148,410 ක් වූ වත්කම් වටිනාකම හා සැසඳීමේ දී 10.39% ක වර්ධනයක් වාර්තා කළේය.

18 වැනි වගුවෙන් සහ 17 වැනි රූප සටහනින් නිරූපණය වන පරිදි 2014 වසරේ දෙසැම්බර් 31 වන විට ස්කන්ධ, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ මුළු වත්කම් සම්භාරයෙන් 28.81% ක් හිමිකර ගෙන ඇති අතර එහි අගය රු. මිලියන 47,194 ක් වී ඇත. පසුගිය වසරේ දී ස්කන්ධවල ආයෝජන හා සැසඳීමේ දී මෙය 34.94% ක ඉහළ යාමක් එනම් පසුගිය වසරේදී එම අගය රු. මිලියන 34,974 ක් වූ අතර මෙමගින් රක්ෂකයින් විසින් 2014 වසර තුළ දී කොටස් වෙළඳපොළේ ආයෝජනය කිරීමට දක්වන වැඩි කැමැත්ත නිරූපණය කරයි.

රජයේ සුරැකුම්පත්, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දෙවැනි විශාලතම වත්කම් කාණ්ඩය නියෝජනය කළ අතර 2014 වසරේ දෙසැම්බර් 31 වන විට මුළු වත්කම්වලින් 15.56%ක් හිමිකර ගත්තේය. රජයේ සුරැකුම්පත්වල ආයෝජන 2014 වසරේ දෙසැම්බර් 31 වන විට රු. මිලියන 25,496 ක් වූ අතර 2013 වසරේ දෙසැම්බර් 31 වන විට වාර්තා කළ රු. මිලියන 28,163 හා සැසඳීමේ දී 9.47% ක කැපී පෙනෙන පහළ යාමක් වාර්තා කිරීමට හේතුවූයේ 2014 වසරේ තවදුරටත් සිදු වූ පොළී අනුපාතිකවල පහළ බැසීමයි. පනතෙන් දක්වා ඇති ආකාරයට සමාගම් තාක්ෂණික සංචිතවල ආයෝජනවල අවම වශයෙන් 20% ක් හෝ රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කරන බවටත් ඉතිරි වත්කම් නිර්ණය කිරීම් අංක 1 (Determination 1) ප්‍රකාරව සිදු කරන බවටත් මණ්ඩලය විසින් වසර පුරාම වගබලා ගන්නා ලදී.

2014 වසරේ දෙසැම්බර් 31 වන විට වෙනත් වත්කම් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සහ කොටස් හිමියන්ගේ තෙවැනියට විශාලතම වත්කම් කාණ්ඩය වූ අතර එය මුළු වත්කම්වලින් 13.44%ක් නියෝජනය කරමින් 2014 වසරේ දෙසැම්බර් 31 වන විට රු. මිලියන 22,018 ක් වී ඇත්තේ 2013 වසරේ දෙසැම්බර් 31 වන විට වාර්තා කළ රු. මිලියන 21,110 ට වඩා සුළු වශයෙන් ඉහළ යමිනි.

2014 වසරේ දෙසැම්බර් 31 වන විට බැංකු සහ මූල්‍ය සමාගම්වල තැන්පතු මුළු වත්කම්වලින් 12.33% ක් නියෝජනය කළ අතර එහි අගය රු. මිලියන 20,200 ලෙස වාර්තා කළේය. එය 2013 වසර (2013: රු. මිලියන 18,956) හා සැසඳීමේ දී 6.56% ක වර්ධනයක් පෙන්නුම් කර ඇත.

ලැබිය යුතු වාරික ආදායම, ඉඩම් හා ගොඩනැගිලි සහ සංස්ථා ණය සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සහ කොටස් හිමියන්ගේ අනෙකුත් ප්‍රධාන වත්කම් කාණ්ඩ වූ අතර 2014 වසරේ දෙසැම්බර් 31 වන විට පිළිවෙලින් මුළු වත්කම්වලින් 8.32% ක්, 6.81% ක් සහ 4.62% ක් විය.

**වගුව 18**

*2013 සහ 2014 දෙසැම්බර් 31 දිනට සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සහ කොටස් හිමියන්ගේ වත්කම් සංකේන්ද්‍රගතවීම*

| | 2013(අ) | | 2014(ආ) | |
|---|---|---|---|---|
| වත්කම් වර්ගය | (රු. '000) | % | (රු. '000) | % |
| රජයේ ණය සුරැකුම්පත් | 28,162,948 | 18.98 | 25,495,519 | 15.56 |
| ස්කන්ධ | 34,974,481 | 23.57 | 47,193,839 | 28.81 |
| සංස්ථා ණය | 5,973,048 | 4.02 | 7,575,359 | 4.62 |
| ඉඩම් හා ගොඩනැගිලි | 11,078,105 | 7.46 | 11,151,304 | 6.81 |
| තැන්පතු | 18,955,900 | 12.77 | 20,200,288 | 12.33 |
| ඒකක භාර | 2,042,822 | 1.38 | 2,362,436 | 1.44 |
| රත්රන්වල ආයෝජන | 32,219 | 0.02 | 2,491 | 0.00 |
| ලැබිය යුතු ප්‍රතිරක්ෂණ | 6,734,352 | 4.54 | 6,651,289 | 4.06 |
| ඔප්පුහිමියන්ගෙන් හා අතරමැදියන්ගෙන් ලැබිය යුතු වාරික ආදායම | 12,824,613 | 8.64 | 13,625,956 | 8.32 |
| දේපළ පිරියත හා උපකරණ | 5,069,556 | 3.42 | 5,158,889 | 3.15 |
| වෙනත් වත්කම් | 21,110,092 | 14.22 | 22,018,427 | 13.44 |
| මුදල් හා මුදල් සමාන දෑ | 1,452,169 | 0.98 | 2,398,089 | 1.46 |
| **එකතුව** | **148,410,304** | **100** | **163,833,886** | **100** |

*(අ) ප්‍රතිශ්ධාපිත විගණන සංඛ්‍යා*

*(ආ) තාවකාලික සංඛ්‍යා*

*සටහන්:*


*1. අවශ්‍ය කරන ලද සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුලත් කර නොමැත.*

*2. අලියාන්ස් ජීවිත, ආර්පිකෝ සහ එල්අයිසී සමාගම්වල කොටස්හිමියන්ට අයත් වත්කම් දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය යටතේ වාර්තා කර ඇත.*

# සංඛ්‍යානමය සමාලෝචනය

**රූප සටහන 17**

*සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සහ කොටස් හිමියන්ගේ වත්කම් සංකේන්ද්‍රගතවීම - 2014 දෙසැම්බර් 31 දිනට*



# සංඛ්‍යානමය සමාලෝචනය

**සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ හා කොටස් හිමියන්ගේ ආයෝජන ආදායම**

19 වැනි වගුවෙන් 2013 සහ 2014 වසර සඳහා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සහ කොටස් හිමියන්ගේ විවිධ වත්කම් කාණ්ඩවල ආයෝජන ආදායම, සාමාන්‍ය ආයෝජන සහ ආයෝජන ඵලදා අනුපාතය දක්වයි.

2014 වසරේ දී සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සහ කොටස් හිමියන්ගේ සාමාන්‍ය ආයෝජන රු. මිලියන 108,981 ක් වූ අතර 2013 දෙසැම්බර් 31වන විට වාර්තා කළ රු. මිලියන 98,554 හා සැසඳීමේ දී එම අගය 10.58% කින් ඉහළ ගොස් ඇත. 2014 වසරේ දී ඉහත සඳහන් කළ ආයෝජනවලින් උත්පාදිත මුළු ආයෝජන ආදායම රු. මිලියන 8,211 ක් (2013: රු. මිලියන 7,502) වූ අතර මෙහි ප්‍රතිඵලයක් ලෙස 2013 වසරේ දී වාර්තා කළ 7.61% කට වඩා සුළු වශයෙන් අඩු 7.53% ක සමස්ත ආයෝජන ඵලදාවක් ලබා ගෙන ඇත.

ස්කන්ධවල සාමාන්‍ය ආයෝජනය 2014 වසරේ දී රු. මිලියන 41,084 ක් (2013: රු. මිලියන 34,385) වූ අතර සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සහ කොටස් හිමියන්ගේ විශාලතම අයෝජන කාණ්ඩය බවට තවදුරටත් රැඳී තිබුණේය. ස්කන්ධවලින් උත්පාදිත ආයෝජන ආදායම 2014 වසරේ දී රු. මිලියන 2,044 ක් (2013: රු. මිලියන 1,217) වූ අතර එයට රු. මිලියන 984 ක ප්‍රාග්ධන ඉපැයීම් සහ රු. මිලියන 1,060ක ලාභාංශ වටිනාකමක් ඇතුලත් විය. ස්කන්ධ ආයෝජන ඵලදාව 4.98% ක් වූ අතර එය 2013 වසරේ දී වාර්තා කළ 3.54% ක ආයෝජන ඵලදාවට වඩා ඉහළ අගයක් විය. 2014 වසර තුළ දී කොටස් වෙළඳපොළේ වාසිදායක තත්ත්වය රක්ෂකයින්ට ස්කන්ධවල සිය ආයෝජන වැඩි කිරීමට පෙළඹවීමක් ඇති කිරීම සඳහා විශේෂ හේතුවක් විය.

රජයේ සුරැකුම්පත්වල සාමාන්‍ය ආයෝජන 2014 වසරේ දී රු. මිලියන 26,829 ක් වූ අතර 2013 වසරේ දී වාර්තා කළ රු. මිලියන 28,883 ක් වටිනා සාමාන්‍ය ආයෝජන හා සැසඳීමේ දී 7.11% ක පහළ බැසීමක් වාර්තා කර ඇත. රජයේ සුරැකුම්පත්වලින් උත්පාදිත ආයෝජන ආදායම රු. මිලියන 2,520ක් වූ අතර 2013 වසරේ දී වාර්තා කළ රු. 2,942 ක හා සැසඳීමේ දී පහළ බැසීමක් නිරූපණය කළේය. රජයේ සුරැකුම්පත්වලින් උත්පාදනය කළ ආයෝජන ඵලදාව 2014 වසරේ දී 9.39% ක් වූ අතර 2013 වසරේ දී වාර්තා කළ 10.91% ක ආයෝජන ඵලදාව හා සැසඳීමේ දී පහළ බැසීමක් වාර්තා කළ අතර 2014 වසරේ දී තවදුරටත් සිදු වූ පොළී අනුපාතවල අඩුවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපෑවේය.

බැංකු සහ මූල්‍ය ආයතනවල තැන්පතුවල සාමාන්‍යය ආයෝජනය 2014 වසරේ දී රු. මිලියන 19,578 ක් වූ අතර 2013 වසරේ දී වාර්තා කළ රු. මිලියන 15,844 හා සැසඳීමේ දී 23.57% ක කැපීපෙනෙන වර්ධනයක් වාර්තා කළේය. තැන්පතුවලින් 2014 වසරේ දී රු. මිලියන 1,632 ක ආයෝජන ආදායමක් උත්පාදනය කළ අතර 2013 වසරේ දී වාර්තා කළ රු. මිලියන 2,005 සමඟ සැසඳීමේ දී 18.60% ක කැපී පෙනෙන පහළ යාමක් වාර්තා කළේය. 2014 වසරේ දී තැන්පතුවල ආයෝජන ආදායමට මෙහි බැංකු තැන්පතුවලින් ලැබූ රු. මිලියන 1,387 ක් (2013: රු. මිලියන 1,845) වටිනා පොළී ආදායම සහ මූල්‍ය සමාගම්වලින් ලැබූ රු. මිලියන 245ක් (2013: රු. මිලියන 160) වටිනා පොළිය ඇතුලත් වේ. 2014 වසරේ දී 2014 වසරේ දී තැන්පතුවල ආයෝජන ඵලදාව 8.34% ක් වූ අතර 2013 වසරේ දී උත්පාදිත 12.65% ක ආයෝජන ඵලදාව හා සැසඳිමේ දී 2014 වසරේ සිදු වූ පොළී අනුපාත අඩු වීමට සමගාමීව පහළ බැසීමක් වාර්තා කළේය.

තවද, 2014 වසරේ දී සංයුක්ත ණය, ඉඩම් සහ ගොඩනැගිලි, ඒකක භාර සහ වෙනත් ආයෝජනවලින් පිළිවෙලින් 13.37% ක, 0.07%, 14.39% ක සහ 56.78% ක ආයෝජන ඵලදා අනුපාත උත්පාදනය කළේය. කෙසේවුව ද, 2014 වසරේ දී සිදු වූ රත්තරන් මිල පහළ බැසීම හේතුවෙන් 2014 වසරේ දී රත්තරන්වල ආයෝජනවලින් 3.49%ක ඍණ ආයෝජනයක ඵලදාවක් උත්පාදන කළේය.

# සංඛ්‍යානමය සමාලෝචනය

**වගුව 19**

***සවිස්තරාත්මක ආයෝජන ආදායම සහ සාමාන්‍ය ආයෝජන - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය***

| වර්ගය | 2013(අ) | | | 2014(ආ) | | |
|---|---|---|---|---|---|---|
| | ආයෝජන ආදායම (රුපියල් '000) | සාමාන්‍ය ආයෝජන (රුපියල් '000) | ආයෝජන ඵලදා අනුපාතය (%) | ආයෝජන ආදායම (රුපියල් '000) | සාමාන්‍ය ආයෝජන (රුපියල් '000) | ආයෝජන ඵලදා අනුපාතය (%) |
| **රජයේ ණය සුරැකුම්පත්** | 2,941,718 | 28,882,731 | 10.19 | 2,520,496 | 26,829,233 | 9.39 |
| - භාණ්ඩාගාර බැඳුම්කර | 1,366,144 | | | 1,376,014 | | |
| - භාණ්ඩාගාර බිල්පත් | 594,456 | | | 411,388 | | |
| - වෙනත් (රිපෝ) | 981,118 | | | 733,094 | | |
| **ස්කන්ධ** | 1,217,438 | 34,385,010 | 3.54 | 2,044,132 | 41,084,160 | 4.98 |
| - ප්‍රාග්ධන ලාභ/ අලාභ | 212,760 | | | 984,076 | | |
| - ලාභාංශ | 1,004,678 | | | 1,060,056 | | |
| **සංස්ථා ණය** | 782,655 | 4,907,639 | 15.95 | 906,022 | 6,774,203 | 13.37 |
| - ණයකර | 625,407 | | | 881,250 | | |
| - වාණිජ පත්‍රිකා | 134,743 | | | 8,635 | | |
| - වත්කම් අනුබල සුරැකුම්පත් | 13,947 | | | 10,037 | | |
| - සමාන වෙනත් මූල්‍ය උපකරණ | 8,558 | | | 6,100 | | |
| **ඉඩම් හා ගොඩනැගිලි** | (27,858) | 11,489,134 | (0.24) | 8,234 | 11,114,705 | 0.07 |
| **තැන්පතු** | 2,004,679 | 15,844,275 | 12.65 | 1,631,835 | 19,578,094 | 8.34 |
| - බැංකු | 1,844,706 | | | 1,386,536 | | |
| - මූල්‍ය සමාගම් | 159,973 | | | 245,299 | | |
| **ඒකක භාර** | 146,843 | 1,631,623 | 9.00 | 317,022 | 2,202,629 | 14.39 |
| **රත්රන්** | (27,777) | 19,674 | (141.19) | (606) | 17,355 | (3.49) |
| **වෙනත්** | 464,084 | 1,393,775 | 33.30 | 783,824 | 1,380,517 | 56.78 |
| **එකතුව** | **7,501,782** | **98,553,861** | **7.61** | **8,210,959** | **108,980,896** | **7.53** |

*(අ) ප්‍රතිශ්ධාපිත විගණන සංඛ්‍යා*

*(ආ) තාවකාලික සංඛ්‍යා*

*සටහන:*

*1. අවශ්‍ය කරන ලද සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුලත් කර නොමැත.*

# සංඛ්‍යානමය සමාලෝචනය

**රක්ෂණ සමාගම්වල නුබුන්වත්භාවය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

20 වැනි වගුව මඟින් 2013 දෙසැම්බර් 31වැනි දිනට සහ 2014 දෙසැම්බර් 31 දිනට එක් එක් සාමාන්‍ය රක්ෂණ සමාගම් විසින් වාර්තා කළ නුබුන්වත් අනුපාතය සහ තාක්ෂණික සංචිත පැහැදිලි කරයි. සාමාන්‍ය රක්ෂකයින් විසින් වාර්තා කළ සාමාන්‍ය නුබුන්වත්භාව අනුපාතය 2014 වසරේ දෙසැම්බර් 31වන දිනට 2.39 ක් වූ අතර 2013 වසරේ දෙසැම්බර් 31 දිනට වාර්තා කළ 2.75 ක නුබුන්වත්භාව අනුපාතය හා සැසඳීමේ දී සුළු පහළ බැසීමක් නිරූපණය කළේය. සියලුම සාමාන්‍ය රක්ෂකයින්ගේ තාක්ෂණික සංචිත 2014 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 38,569 ක් වූ අතර 2013 දෙසැම්බර් 31 දිනට වාර්තා කළ රු. මිලියන 35,724 හා සැසඳීමේ දී 7.96% ක වර්ධනයක් වාර්තා කළේය. 2014 දෙසැම්බර් 31 දින වන විට සියලුම සාමාන්‍ය රක්ෂකයින් විසින් සම්පූර්ණ කළ යුතු අවම නුබුන්වත් අනුපාතිකය වන "එක"(1) සම්පූර්ණ කිරීමට හැකි වූ අතර මණ්ඩලය වසර පුරාම සියලුම රක්ෂණ සමාගම්වල නුබුන්වත්භාව පිළිබඳ තත්ත්වය සුපරීක්ෂා කළේය.

**වගුව 20**

*2013 සහ 2014 දෙසැම්බර් 31වන දිනට රක්ෂණ සමාගම්වල නුබුන්වත්බව සහ තාක්ෂණික සංචිත සමාගම් අනුව විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය*

| රක්ෂකයා | 2013 දෙසැම්බර් 31වන දිනට(අ) | | 2014 දෙසැම්බර් 31වන දිනට(ආ) | | | |
|---|---|---|---|---|---|---|
| | නුබුන්වත් අනුපාතය | තාක්ෂණික සංචිත (රු. 000) | පවත්නා නුබුන්වත් ආන්තිකය (රු. 000) | අවශ්‍ය නුබුන්වත් ආන්තිකය (රු. 000) | නුබුන්වත් අනුපාතය | තාක්ෂණික සංචිත (රු. 000) |
| ඒඅයිඒ | 4.01 | 1,702,296 | 1,371,314 | 437,609 | 3.13 | 1,833,987 |
| ඒඅයිජී | 2.04 | 403,207 | 180,118 | 50,000 | 3.60 | 61,982 |
| අලියාන්ස් සාමාන්‍ය | 2.25 | 1,010,087 | 455,046 | 305,505 | 1.49 | 1,280,203 |
| අමානා තකාෆුල් | 1.85 | 511,409 | 229,795 | 227,696 | 1.01 | 493,240 |
| ඒෂියන් එලායන්ස් | 2.21 | 781,103 | 481,199 | 280,828 | 1.71 | 999,641 |
| සෙලින්කෝ | 1.33 | 5,686,878 | 2,869,781 | 1,957,655 | 1.47 | 6,110,117 |
| කොන්ටිනෙන්ටල් | 1.75 | 611,398 | 610,977 | 246,789 | 2.48 | 767,911 |
| කෝපරේටිව් | 1.72 | 845,156 | 455,138 | 263,748 | 1.73 | 1,014,064 |
| එච්එන්බීඒ | 3.89 | 924,712 | 1,136,355 | 369,839 | 3.07 | 1,150,323 |
| ජනශක්ති | 1.67 | 4,103,078 | 1,940,852 | 1,135,015 | 1.71 | 4,327,793 |
| එල්ඕඑල්සී | 1.05 | 1,074,318 | 423,993 | 317,274 | 1.34 | 1,326,137 |
| එම්බීඑස්එල් | (0.39) | 627,183 | 177,596 | 160,016 | 1.11 | 546,459 |
| ඔරියන්ට් | 8.04 | 150,739 | 320,935 | 79,209 | 4.05 | 259,891 |
| පීපල්ස් | 1.51 | 2,238,159 | 1,008,830 | 629,334 | 1.60 | 2,581,583 |
| සණස | 1.28 | 131,248 | 78,556 | 50,000 | 1.57 | 181,426 |
| එස්එල්අයිසී | 4.93 | 11,881,612 | 9,881,897 | 2,806,388 | 3.52 | 12,481,712 |
| යූඒඑල් | 2.07 | 3,040,948 | 2,630,193 | 830,493 | 3.17 | 3,152,537 |
| **එකතුව** | **2.75** | **35,723,531** | **24,252,575** | **10,147,398** | **2.39** | **38,569,006** |

*(අ) ප්‍රතිශ්ධාපිත විගණන සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යා*

*සටහන:*
*අවශ්‍ය කරන ලද සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුලත් කර නොමැත.*

# සංඛ්‍යානමය සමාලෝචනය

**නව, අලුත් කළ සහ පවත්නා රක්ෂණ ඔප්පු පිළිබඳ විස්තර - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

2013 සහ 2014 වසර සඳහා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ විවිධ උප-පන්ති සඳහා වූ නව රක්ෂණ ඔප්පු, අලුත් කළ රක්ෂණ ඔප්පු සහ පවත්නා රක්ෂණ ඔප්පු 21 වැනි වගුවෙන් දක්වයි. 2014 වසරේ දී සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සියලුම උප-පන්තිවලට සම්බන්ධ මුළු රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 4,445,458 ක් (2013: 4,311,694) වූ අතර 2013 වසර හා සැසඳීමේ දී 3.10% කින් වර්ධනය වී ඇත. 2014 වසර තුළ නිකුත් කළ නව ඔප්පු සංඛ්‍යාව 1,966,945 ක් (2013: 1,844,386) වූ අතර 2014 වසර තුළ රක්ෂණ ඔප්පු 2,601,640 ක් (2013: 2,435,007) අලුත් කරන ලදී.

රථවාහන රක්ෂණය ඔප්පු 3,870,083 ක් (2013: 3,774,571) වාර්තා කරමින් 2014 වසර අවසානය වන විට ක්‍රියාත්මකව පැවති රක්ෂණ ඔප්පුවලින් වැඩිම සංඛ්‍යාව නියෝජනය කළ අතර එයට 2,225,766 ක තුන්වැනි පාර්ශ්ව රක්ෂණ ඔප්පු (2013: 2,273,047) සහ 1,644,317 ක විස්තීරණ ඔප්පු (2013: 1,501,524) ඇතුලත් විය. ක්‍රියාත්මකව පැවති රථවාහන රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 2013 වසරට වඩා 2014 වසරේ දී ඉහළ ගොස් ඇත්තේ 2.53% අගයකින් පමණි.

ක්‍රියාත්මකව පවතින ගිනි රක්ෂණ ඔප්පු 2013 වසරේ දී වාර්තා කළ ඔප්පු 196,386 සිට 2014 වසරේ දී ඔප්පු 181,907 ක් දක්වා අඩු වී ඇති අතර 7.37% ක පහළ බැසීමක් පෙන්නුම් කර ඇත. ක්‍රියාත්මකව පවතින මුහුදු රක්ෂණ ඔප්පු 2013 වසර අවසානය වන විට වාර්තා කළ 131,201 සිට 2014 වසරේ දී 157,371 ක් දක්වා ඉහළ ගොස් ඇත්තේ 19.95% කින් වර්ධනය පෙන්වමිනි. කම්කරු වන්දි ඇතුළු ක්‍රියාත්මක පවතින විවිධ රක්ෂණ ඔප්පු 2013 වසරේ දී වාර්තා කළ 209,536 හා සැසඳීමේ දී 2014 වසරේ දී ඔප්පු 236,097 ක් දක්වා 12.68% කින් ඉහළ ගොස් ඇත.

**වගුව 21**

*නව, අලුත් කළ සහ පවත්නා රක්ෂණ ඔප්පු පිළිබඳ විස්තර - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය*

| | 2013 | | | 2014 | | |
|---|---|---|---|---|---|---|
| උප පන්තිය | නව රක්ෂණ | අලුත් කළ ඔප්පු | වසර අවසානය වන විට ක්‍රියාත්මකව ඇති ඔප්පු | නව රක්ෂණ | අලුත් කළ ඔප්පු | වසර අවසානය වන විට ක්‍රියාත්මකව ඇති ඔප්පු |
| ගිනි | 64,841 | 128,805 | 196,386 | 69,219 | 120,431 | 181,907 |
| මුහුදු | 150,959 | 3,075 | 131,201 | 182,926 | 2,267 | 157,371 |
| රථ වාහන | | | | | | |
| තුන්වන පාර්ශ්ව පමණක් | 952,618 | 1,274,643 | 2,273,047 | 893,843 | 1,328,329 | 2,225,766 |
| විස්තීර්ණ | 543,594 | 952,399 | 1,501,524 | 684,961 | 1,072,141 | 1,644,317 |
| ඩබ්ලිව්සීඅයි (කම්කරු වන්දි) ඇතුළු විවිධ | 132,374 | 76,085 | 209,536 | 135,996 | 78,472 | 236,097 |
| **එකතුව** | **1,844,386** | **2,435,007** | **4,311,694** | **1,966,945** | **2,601,640** | **4,445,458** |

*සටහන:*
*අවශ්‍ය කරන ලද සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුලත් කර නොමැත.*

# සංඛ්‍යානමය සමාලෝචනය

## රක්ෂණ තැරැව්කාර සමාගම්

### රක්ෂණ තැරැව්කාර සමාගම්වල කාර්යසාධනය

2014 වසර තුළ දී රක්ෂණ තැරැව්කාර සමාගම් පනස් නවයක් වෙළඳපොල තුළ ක්‍රියාත්මක වූ අතර රු. මිලියන 14,716 ක් වූ දළ ලිඛිත වාරික ආදායමක් උත්පාදන කළේය. ඒ අනුව රක්ෂණ තැරැව්කාර සමාගම් හරහා උත්පාදිත මුළු දළ ලිඛිත වාරික ආදායම 2013 වසරේ දී උත්පාදිත රු. මිලියන 14,380 හා සැසඳීමේ දී 2.34% ක වර්ධනයක් වාර්තා කළේය. පිළිවෙලින් රු. මිලියන 158 ක් සහ රු. මිලියන 14,559 ක් වූ දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය හරහා උත්පාදිත වාරික ආදායම මෙම මුළු දළ ලිඛිත වාරික ආදායමට ඇතුලත් විය. රක්ෂණ තැරැව්කාර සමාගම් හරහා උත්පාදිත මුළු දළ ලිඛිත වාරික ආදායමෙන් 98.93% ක් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරික ආදායම නිරූපණය කළ අතර දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය නිරූපණය කළේ 1.07% ප්‍රමාණයක් පමණි.

පෙර වසර හා සමානවම 2014 වසරේ දී ද දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය කෙරෙහි රක්ෂණ තැරැව්කාර සමාගම්වල දායකත්වය එතරම් වැදගත් නොවූ අතර රක්ෂණ තැරැව්කාර සමාගම්වලින් උත්පාදනය කර ඇත්තේ දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයේ මුළු දළ ලිඛිත වාරික ආදායමෙන් 0.35% ක් (රු. මිලියන 44,610) පමණි. රක්ෂණ තැරැව්කාර සමාගම් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ මුළු දළ ලිඛිත වාරික ආදායමෙන් 24.78% ක් උත්පාදනය කර ඇති අතර (වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය වාරික ආදායම) එය රු. මිලියන 58,753 ක් විය.

2014 වසරේ දී රක්ෂණ තැරැව්කාර සමාගම් විසි තුනක් විසින් එක් එක් සමාගම රු. මිලියන 100 ඉක්මවන දළ ලිඛිත වාරික ආදායමක් ප්‍රසම්පාදනය කළ අතර මෙම රක්ෂණ තැරැව්කරුවන් සාමූහිකව රු. මිලියන 13,691 ක දළ ලිඛිත වාරික ආදායමක් උත්පාදනය කළේය. 22 වැනි වගුවෙන් නිරූපණය කර ඇති පරිදි ඉතිරි රක්ෂණ තැරැව්කාර සමාගම් තිස් හය රු. මිලියන 1,025 ක් උත්පාදනය කර ඇත.

18 වැනි රූපසටහන මඟින් දීර්ඝ කාලීන සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර සම්බන්ධයෙන් රක්ෂණ තැරැව්කාර සමාගම් උත්පාදනය කර ඇති දළ ලිඛිත වාරික ආදායම සහ 2005 සිට 2014 දක්වා කාලසීමාව තුළ මුළු දළ ලිඛිත වාරික ආදායම සඳහා ඒවායේ දායකත්වය දැක්වේ.

# සංඛ්‍යානමය සමාලෝචනය

**වගුව 22**


*රක්ෂණ තැරැව්කාර සමාගම් විසින් ජනනය කළ දළ ලිඛිත වාරික ආදායම - 2014*

| | | දළ ලිඛිත වාරික ආදායම | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය | | සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය | | එකතුව | |
| | රක්ෂණ තැරැව්කාර සමාගමේ නම | (රු. 000) | වෙළඳපොළ පංගුව (%) | (රු. 000) | වෙළඳපොළ පංගුව (%) | (රු. 000) | වෙළඳපොළ පංගුව (%) |
| 1 | ඒඩීඉසෙඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 5,478 | 3.48 | 391,752 | 2.69 | 397,230 | 2.70 |
| 2 | එයිට්කන් ස්පෙන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 790 | 0.50 | 435,621 | 2.99 | 436,411 | 2.97 |
| 3 | ඇල්ෆින්කෝ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | - | 0.00 | 714,829 | 4.91 | 714,829 | 4.86 |
| 4 | ඇසට්ලයින් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ් | - | 0.00 | 1,151,824 | 7.91 | 1,151,824 | 7.83 |
| 5 | සීඑෆ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 31 | 0.02 | 2,059,092 | 14.14 | 2,059,123 | 13.99 |
| 6 | කොලොම්බෝ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | - | 0.00 | 111,613 | 0.77 | 111,613 | 0.76 |
| 7 | කොමර්ෂල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 50,346 | 31.96 | 1,740,656 | 11.96 | 1,791,002 | 12.17 |
| 8 | ඩෙල්මේජ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 13,266 | 8.42 | 705,923 | 4.85 | 719,189 | 4.89 |
| 9 | ඉක්විටි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | - | 0.00 | 148,660 | 1.02 | 148,660 | 1.01 |
| 10 | එසාජි කර්මිජී ඇන්ඩ් කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ් | 15,020 | 9.54 | 341,773 | 2.35 | 356,793 | 2.42 |
| 11 | ෆින්ලේ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 19,857 | 12.61 | 1,357,651 | 9.33 | 1,377,508 | 9.36 |
| 12 | ග්ලෝබල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ඇන්ඩ් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 266 | 0.17 | 400,957 | 2.75 | 401,223 | 2.73 |
| 13 | ඉන්ඩස්ට්‍රියල් ඇන්ඩ් කොමර්ෂල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 1,915 | 1.22 | 271,704 | 1.87 | 273,619 | 1.86 |
| 14 | ලයිෆ් ඇන්ඩ් ජෙනරල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ් | 672 | 0.43 | 150,080 | 1.03 | 150,752 | 1.02 |
| 15 | නේෂන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ් | 7,440 | 4.72 | 1,234,267 | 8.48 | 1,241,707 | 8.44 |
| 16 | ප්ලැසිඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 85 | 0.05 | 106,923 | 0.73 | 107,008 | 0.73 |
| 17 | ප්‍රෝකෙයා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 1,173 | 0.74 | 193,315 | 1.33 | 194,487 | 1.32 |
| 18 | ප්‍රොටෙක්ෂන් ඇන්ඩ් ඇෂුවරන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 15 | 0.01 | 601,153 | 4.13 | 601,168 | 4.09 |
| 19 | රිලයන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 5,839 | 3.71 | 315,175 | 2.16 | 321,014 | 2.18 |
| 20 | සේනාරත්න ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 4,262 | 2.71 | 243,646 | 1.67 | 247,907 | 1.68 |
| 21 | සෙන්කඩගල ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | - | 0.00 | 616,294 | 4.23 | 616,294 | 4.19 |
| 22 | ස්ට්‍රැටජික් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 173 | 0.11 | 116,318 | 0.80 | 116,491 | 0.79 |
| 23 | සෙනිත් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 1,142 | 0.72 | 153,930 | 1.06 | 155,071 | 1.05 |
| | **උප-එකතුව** | **127,770** | **81.11** | **13,563,155** | **93.16** | **13,690,923** | **93.03** |
| | **වෙනත් රක්ෂණ තැරැව්කාර සමාගම් (36)** | **29,750** | **18.89** | **995,541** | **6.84** | **1,025,291** | **6.97** |
| | **මුළු එකතුව** | **157,520** | **100** | **14,558,696** | **100** | **14,716,215** | **100** |

# සංඛ්‍යානමය සමාලෝචනය

**රූප සටහන 18**

*2005 සිට 2014 දක්වා රක්ෂණ තැරැව්කාර සමාගම් හරහා ජනනය කළ දළ ලිඛිත වාරික ආදායම*




| | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| දීර්ඝ කාලීන රක්ෂණය ද.ලි.වා.ආ. (රු. මිලියන) | 103 | 144 | 158 | 195 | 188 | 243 | 296 | 195 | 191 | 158 |
| සාමාන්‍ය රක්ෂණය ද.ලි.වා.ආ. (රු. මිලියන) | 5,208 | 6,028 | 7,393 | 8,781 | 8,698 | 9,317 | 10,193 | 12,532 | 14,189 | 14,559 |
| මුළු ද.ලි.වා. ආදායමෙහි (%) ලෙස තැරැව්කරුවන්ගේ දායකත්වය | 14.27 | 14.34 | 14.55 | 15.43 | 15.44 | 14.43 | 13.36 | 14.60 | 15.14 | 14.74 |

**රක්ෂණ සමාගම් සඳහා කෙටි යෙදුම්**

| | | |
|---|---|---|
| ඒඅයිඒ | : | ඒඅයිඒ ඉන්ෂුවරන්ස් ලංකා පීඑල්සී (පෙර අවිවා එන්ඩීබී ඉන්ෂුවරන්ස් පීඑල්සී) |
| ඒඅයිජී | : | ඒඅයිජී ඉන්ෂුවරන්ස් ලිමිටඩ් (පෙර චාටිස් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්) |
| අලියාන්ස් - සාමාන්‍ය | : | අලියාන්ස් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් |
| අලියාන්ස් - ජීවිත | : | අලියාන්ස් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් |
| අමානා තකාෆුල් | : | අමානා තකාෆුල් පීඑල්සී |
| ආර්පිකෝ | : | ආර්පිකෝ ඉන්ෂුවරන්ස් ලිමිටඩ් |
| ඒෂියන් එලායන්ස් | : | ඒෂියන් එලායන්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී |
| සෙලින්කෝ තකාෆුල් | : | සෙලින්කෝ තකාෆුල් ලිමිටඩ් |
| සෙලින්කෝ | : | සෙලින්කෝ ඉන්ෂුවරන්ස් පීඑල්සී |
| කොන්ටිනෙන්ටල් | : | කොන්ටිනෙන්ටල් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් |
| කෝපරේටිව් | : | කෝපරේටිව් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් |
| එච්එන්බීඒ | : | එච්එන්බී ඇෂුවරන්ස් පීඑල්සී |
| ජනශක්ති | : | ජනශක්ති ඉන්ෂුවරන්ස් පීඑල්සී |
| එල්අයිසී | : | ලයිෆ් ඉන්ෂුවරන්ස් කෝපරේෂන් (ලංකා) ලිමිටඩ් |
| එල්ඕඑල්සී | : | එල්ඕඑල්සී ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් |
| එම්බීඑස්එල් | : | එම්බීඑස්එල් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් |
| එන්අයිසීඑල් | : | නැෂනල් ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් |
| එන්අයිටීඑෆ් | : | ජාතික රක්ෂණ භාර අරමුදල |
| ඔරියන්ට් | : | ඔරියන්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් |
| පීපල්ස් | : | පීපල්ස් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් |
| සණස | : | සීමාසහිත සණස රක්ෂණ සමාගම |
| එස්එල්අයිසී | : | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් |
| යූඒඑල් | : | යුනියන් ඇෂුවරන්ස් පීඑල්සී |

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

## අධීක්ෂණ සමලෝචනය

## රක්ෂණ සමාගම්

### 1. මණ්ඩලයට ඉදිරිපත් කරන ලද වාර්තා පිළිබඳ සමාලෝචනය

#### අ) වාර්ෂික ව්‍යාවස්ථානුකූල වාර්තා, විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ ජීවගණකඥ වාර්තා

පනතේ විධිවිධාන ප්‍රකාරව සියළුම රක්ෂකයින් විසින් ඔවුන්ගේ වාර්ෂික ව්‍යාවස්ථානුකූල වාර්තා සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන අදාළ මූල්‍ය වර්ෂය අවසන් වී හය මසක් ඇතුළත මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු වේ. තව ද දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරවල නියුක්තව සිටින රක්ෂණකයින් විසින් ජීවගණකඥ වාර්තාවක් සහ එහි සංක්ෂිප්තයක් ද වාර්ෂික ව්‍යාවස්ථානුකූල වාර්තාව සමඟ ඉදිරිපත් කළ යුතු වේ.

මණ්ඩලය විසින් මෙම වාර්තාවල නිරවද්‍යතාවය හා පනතේ අඩංගු නියමයන්ට හා රෙගුලාසිවලට ඇති අනුකූලතාවය හා එම වාර්තා නියමිත දිනට මණ්ඩලයට ඉදිරිපත් කිරීම ඉතා සමීප සමාලෝචනයකට ලක් කරන ලදී. තවද ජීවගණකඥ වාර්තාවක් සහ එහි සංක්ෂිප්ත සමාලෝචනය කිරීමට උපදේශන ජීවගණකඥයකුගේ සහාය ලබා ගන්නා ලදී. වාර්තා සමාලෝචනය කිරීමේ දී මණ්ඩලය විසින් අධීක්ෂණය කරන ලද ව්‍යාවස්ථානුකූල අවශ්‍යතාවලින් බැහැරවීම්, වෙනත් විෂමතාවන් හා දෝෂ නිවැරදි කිරීම සඳහා අදාළ රක්ෂකයන්ව දැනුවත් කරන ලදී. නිශ්චිත කාලසීමාවක් තුළ නිවැරදි පියවර ගැනීම පිණිස මණ්ඩලය විසින් අදාළ රක්ෂකයන්ට උපදෙස් ලබා දෙන ලදී. රක්ෂකයින් පනතේ විධිවිධාන සහ මණ්ඩලයේ රීති සහ රෙගුලාසි පිළිපදින බවට තහවුරු කිරීම පිණිස මණ්ඩලය විසින් පසු පියවර ගනු ලැබිණ. තවද අදාළ වාර්තා පරීක්ෂණය කිරීමේ දී හඳුනා ගත් ඇතැම් කරුණු ද මණ්ඩලය සිදු කරන ක්ෂේත්‍රගත පරීක්ෂණවල දී සැලකිල්ලට ගනු ලැබිණ.

#### ආ) කාර්තුමය වාර්තා

පනතේ විධිවිධාන ප්‍රකාරව සියලු රක්ෂකයින් විසින් එක් එක් කාර්තුව අවසන් වී දින 45ක් ඇතුළත තමන්ගේ කාර්තුමය වාර්තා මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු වේ. රක්ෂකයින් විසින් 2014 වසරේ සියලුම කාර්තු සඳහා ඉදිරිපත් කළ වාර්තා මණ්ඩලය විසින් සමාලෝචනය කර ඒවා පනත, වෙනත් රීති සහ රෙගුලාසිවලට අනුකූලවන බවට තහවුරු කර ගන්නා ලදී.

එක් එක් රක්ෂකයාගේ කාර්තුමය කාර්යසාධනය සමාලෝචනය කිරීම පිණිස මණ්ඩලය විසින් දීර්ඝ කාලීන සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර යන අංශ දෙක සඳහාම වාරික ආදායම, ප්‍රාරක්ෂණ ලාභය සහ ශුද්ධ ලාභය පාදක වාර්තා විශ්ලේෂණය කළේය. තවද, රක්ෂකයින්ගේ කාර්තුමය කාර්යසාධනය තක්සේරු කිරීමට සහ පසුගිය වසරේ අනුපාත සමඟ සැසඳීම සඳහා ලාභදායකත්වය, වියදම් සහ හිමිකම් පිළිබඳ විස්තීරණ අනුපාත විශ්ලේෂණයක් ද සිදු කරන ලදී.

වාර්තා සමාලෝචනය කිරීමේ දී මණ්ඩලය විසින් අධීක්ෂණය කරන ලද ව්‍යාවස්ථානුකූල අවශ්‍යතාවලින් බැහැරවීම්, වෙනත් විෂමතාවන් හා දෝෂ නිවැරදි කිරීම සඳහා අදාළ රක්ෂකයන්ව දැනුවත් කරන ලදී. නිශ්චිත කාලසීමාවක් තුළ නිවැරදි පියවර ගැනීම පිණිස මණ්ඩලය විසින් අදාළ රක්ෂකයන්ට උපදෙස් සපයන ලදී. රක්ෂකයින් පනතේ විධිවිධාන සහ මණ්ඩලයේ රීති සහ රෙගුලාසි පිළිපදින බවට තහවුරු කිරීම පිණිස මණ්ඩලය විසින් පසු පියවර ගනු ලැබිණ. තවද අදාළ වාර්තා පරීක්ෂණය කිරීමේ දී හඳුනා ගත් ඇතැම් කරුණු ද මණ්ඩලය සිදු කරන ක්ෂේත්‍රගත පරීක්ෂණවල දී සැලකිල්ලට ගනු ලැබිණ.

තවද, නුබුන්වත්භාවය, ද්‍රවශීලීත්වය සහ ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය ආදී රක්ෂකයින්ගේ වත්කම් හා වගකීම් තත්ත්වය සහ අනුපාත පරීක්ෂා කිරීමෙන් සෑම රක්ෂකයෙක්ගේම එක් එක් කාර්තුව සඳහා මූල්‍ය තත්ත්වය විමර්ශනය කරන ලදී. සමාලෝචනය කරන අතරතුර අධීක්ෂණය කළ පනත, රීති, රෙගුලාසි සහ විෂමතාවලට අනුකූල නොවීමේ අවස්ථා හා විෂමතා නිශ්චිත කාලසීමාවක් තුළ නිවැරදි කිරීම සඳහා නිවැරදි පියවර ගැනීම පිණිස මණ්ඩලය විසින් අදාළ රක්ෂකයන්ට උපදෙස් සපයන ලදී.

රක්ෂකයින් විසින් පනතේ විධිවිධාන, මණ්ඩලයේ රීති හා රෙගුලාසි සහ 2006 අංක 6 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ විධිවිධානවලට අනුකූලවීම සහතික කිරීම පිණිස කාර්තුමය වාර්තා සමඟ අනුකූලතා සහතික දෙකක් භාරදීමට අවශ්‍ය කරයි. තවද, රක්ෂකයින් විසින් ඔවුන්ගේ කාර්තුමය වාර්තාව සමඟ සියලුම කාර්තු හතර සඳහා වූ ප්‍රතිරක්ෂණ ක්‍රියාපටිපාටි පිළිබඳව විස්තර ද ඉදිරිපත් කළ යුතුය.

#### ඇ) මාසික වාර්තා

මණ්ඩලය විසින් නිකුත් කළ නියෝගවලට අනුව රක්ෂකයින් සයදෙනෙකු විසින් එක් එක් මාසය අවසන් වී දින 45ක් ඇතුළත තමන්ගේ මාසික වාර්තා මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු විය. මෙම සමාගම්වල මූල්‍ය

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

තත්ත්වය පනත, අනෙකුත් රීති හා රෙගුලාසිවලට අනුකූල වන බවට සහතික කර ගැනීම පිණිස මණ්ඩලය විසින් සමාගම් ඉදිරිපත් කළ මාසික වාර්තා සමාලෝචනය කරන ලදී. වාර්තාවලින් අධීක්ෂණය කළ අනුකූල නොවීම් සහ විෂමතා සම්බන්ධයෙන් නිශ්චිත කාලසීමාවක් තුළ සුදුසු පියවර ගැනීම පිණිස මණ්ඩලය විසින් අදාළ රක්ෂකයන්ට උපදෙස් ලබා දෙන ලදී.

### ඇ) අවදානම් තක්සේරු කිරීමේ සාරාංශය (RAS)

රක්ෂකයින් විසින් සෑම වසරකම මාර්තු 31 වැනි දින හෝ ඊට පෙර සිය අවදානම් තක්සේරු කිරීමේ සාරාංශය (RAS) මණ්ඩලයට යොමුකල යුතුයි. රක්ෂකයන්ගේ මෙහෙයුම්වල දළ විශ්ලේෂණයක් ලබා ගැනීම සඳහා ආයතනික හා හිමිකම් ව්‍යුහය, ව්‍යාපාර ආකෘතිය, ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය, අලෙවිකරණය හා බෙදාහැරීම, හිමිකම් පාලනය, අවදානම් කළමනාකරණය ආදිය පිළිබඳව අවදානම් තක්සේරු කිරීමේ සාරාංශයේ ඇති තොරතුරු මණ්ඩලය විසින් සමාලෝචනය කරනු ලැබිණ.

## 2. නුබුන්වත් ආන්තික හැකියාවේ සීමාව පිළිබඳ අනුකූලතාව අධීක්ෂණය කිරීම

නුබුන්වත් ආන්තික (සාමාන්‍ය සහ දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරවල රීතිවලට අනුව සියලුම රක්ෂකයන් විසින් සාමාන්‍ය හා දිගුකාලීන රක්ෂණ ව්‍යාපාර සඳහා අවම නුබුන්වත් ආන්තික පවත්වා ගෙන යා යුතුය. රක්ෂකයින් විසින් ඔවුන්ගේ මාසික/ කාර්තුමය/ වාර්ෂික වාර්තා සමඟ නුබුන්වත් ආන්තික අනුපාත ගණනය කිරීම් ඉදිරිපත් කළ යුතු වන අතර නුබුන්වත් ආන්තික රීතිවලට අනුකූලවීම තහවුරු කිරීම පිණිස මණ්ඩලය විසින් එම ගණනය කිරීම් සමාලෝචනය කරනු ලැබිණි. රක්ෂකයින් විසින් අවශ්‍ය කරන නුබුන්වත් ආන්තික අවශ්‍යතා සම්පූර්ණ කිරීමට අසමත් වී තිබෙන්නේ නම් සහ ගණනය කිරීම් නිවැරදි නොවන්නේ නම්, නියමිත කාලපරිච්ඡේදයක් ඇතුලත නුබුන්වත් ආන්තික රීතිවලට අනුකූලවීමට සහ ඒවා නිවැරදි කිරීමට නිවැරදි පියවර ගන්නා ලෙසට වහාම පියවර ගැනීමට මණ්ඩලය ඔවුන්ට උපදෙස් ලබා දෙන ලදී.

## 3. නිශ්චිත ආයෝජනවල අනුකූලතාව අධීක්ෂණය කිරීම

### අ) රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කිරීම

පනතේ 25 වන පරිච්ඡේදයට අනුව සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර සඳහා වූ තාක්ෂණික සංචිත වත්කම්වලින් 20% කට නොඅඩු ප්‍රමාණයක් සහ දිගුකාලීන රක්ෂණ ව්‍යාපාර සඳහා වූ දිගුකාලීන රක්ෂණ අරමුදල් වත්කම්වලින් 30% කට නොඅඩු ප්‍රමාණයක් රක්ෂකයින් විසින් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය ලෙස පවත්වා ගෙන යා යුතු වේ. පනතේ 25 වන පරිච්ඡේදයට අනුකූලවීම තහවුරු කිරීම සඳහා මණ්ඩලය විසින් මාසික/ කාර්තුමය/ වාර්ෂික පදනමක් මත රක්ෂකයින් විසින් රජයේ සුරැකුම්පත්වල සිදු කරන ආයෝජන සියුම්ව අධීක්ෂණයට ලක් කරන ලදී. මේ අනුව වාර්තා කළ සංඛ්‍යාවල නිරවද්‍යතාව තහවුරු කිරීම සඳහා සහ රාජ්‍ය සුරැකුම්පත්වල කළ ආයෝජනවල හිමිකාරත්වය සහතික කර ගැනීම පිණිස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන තැන්පතු පිළිබඳ ප්‍රකාශ මණ්ඩලය විසින් විමර්ශණයට ලක් කරනු ලැබිණ. සමාලෝචනයේ දී අධීක්ෂණය කරනු ලැබූ නියාමන අවශ්‍යතාවන්ගෙන් වෙනස්වීම් කිසිවක් ඇත්නම් නියමිත කාලසීමාවක් තුළ දී ඒවා නිවැරදි කරනු පිණිස අදාළ රක්ෂකයන්ට දැනුම් දෙනු ලැබිණ.

### ආ) නිර්ණයන් අනුව කෙරෙන වෙනත් ආයෝජන

2011 මාර්තු 01 වන දින දරන නිර්ණය කිරීම් අංක 1 සහ පසුකාලීන සංශෝධවලට අනුව සියලුම රක්ෂකයින් විසින් ඔවුන්ගේ තාක්ෂණික සංචිතයන්හි ශේෂව තිබෙන වත්කම් හා දිගුකාලීන රක්ෂණ අරමුදලෙහි ශේෂව තිබෙන වත්කම් ආයෝජනය කිරීම අවශ්‍ය වේ. ඒ අනුව නිර්ණය කිරීම් අංක 10 අනුකූලව පවතීදැයි තහවුරු කිරීම සඳහා තාක්ෂණික සංචිතයන්හි සහ දිගුකාලීන රක්ෂණ අරමුදලෙහි ආයෝජන විස්තර මණ්ඩලය විසින් සමාලෝචනය කරනු ලැබීය. අනුකූල නොවන අවස්ථාවන් මණ්ඩලය විසින් නියමිත කාලසීමාවක් තුළ දී ඒවා නිවැරදි කරනු පිණිස අදාළ රක්ෂකයන්ට දැනුම් දෙනු ලැබිණ.

## 4. අනෙකුත් මූල්‍ය විශ්ලේෂණය

වසර තුළ හසුරුවනු ලැබූ විමර්ශන කටයුතු/ පැමිණිලිවල කොටසක් ලෙස ඇතැම් රක්ෂකයින් පිළිබඳ වැඩිදුර මූල්‍ය ඇගයීම් මණ්ඩලය විසින් කර ගෙන යනු ලැබිණ. මණ්ඩලය ගනු ලබන තීරණවලට ආධාර පිණිස සැලකිල්ලට ගන්නා විශේෂ ක්ෂේත්‍ර සම්බන්ධ වැඩිදුර මූල්‍ය තොරතුරු එක්රැස්කර ඇගයීම් කටයුතු සිදු කරන ලදී.

## 5. ප්‍රතිරක්ෂණ ක්‍රියාපටිපාටි සමාලෝචනය

පනතේ 31 (1) සහ 50 (1) වගන්ති අනුව සියළුම රක්ෂණ සමාගම් විසින් සහතික කරන ලද ප්‍රතිරක්ෂණ ආවරණ සටහන්, ගිවිසුම් සහ ක්‍රියාපටිපාටි

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

මණ්ඩලය වෙත වාර්ෂිකව ඉදිරිපත් කළ යුතුය. මණ්ඩලය විසින් නියම කරනු ලැබූ තක්සේරු අවශ්‍යතා සම්පූර්ණ කරනු ලබන ප්‍රතිරක්ෂකයින්ගෙන් ප්‍රතිරක්ෂණ ආවරණ ලබාගෙන තිබේදැයි තහවුරු කිරීම සඳහා මණ්ඩලය විසින් එකී ලේඛණ සමාලෝචනය කරනු ලැබිණ. නියාමන අවශ්‍යතාවලින් බැහැරවීම් නිරීක්ෂණය කළ අවස්ථාවල දී නියමිත කාලසීමාවක් තුළ දී ඒවා නිවැරදි කරනු පිණිස අදාළ රක්ෂකයන්ට දැනුම් දෙන ලදී.

### 6. රක්ෂණ කර්මාන්තය අධීක්ෂණය සඳහා අවදානම් පාදක ප්‍රාග්ධන (RBC) ආකෘතිය

2009 වර්ෂය තුළ මණ්ඩලය ඒ වන විට තිබූ රීති පාදක ආකෘතිය වෙනුවට ලෝක බැංකුවේ සහ FIRST INITIATIVE ආයතනයේ සහය ඇතිව ශ්‍රී ලංකාවේ රක්ෂණ අංශය අධීක්ෂණය කිරීම සඳහා අවදානම් සංවේදී අවම ප්‍රාග්ධන (RBC) ආකෘතියක් ගොඩනැගීම ආරම්භ කරන ලදී.

අවදානම් පාදක ප්‍රාග්ධන (RBC) ව්‍යාපෘතියේ අදියර රාශියකින් සමන්විත වේ. සැලසුම් කළ පරිදි අද වන විට වැදගත් අවස්ථා රාශියක් අත්කර ගෙන ඇත. 2014 වසරේ දී (RBC) ව්‍යාපෘතිය අඛණ්ඩව ක්‍රියාත්මක විය. (RBC) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වූ අනිවාර්යය පැවරුම් සමාන්තර සමාලෝචනය 2014 වසරේ දී ආරම්භ කරන ලදී. ඒ අනුව 2014 වසරේ සියලුම කාර්තු සඳහා සියලුම සාමාන්‍ය සහ දීර්ඝකාලීන රකෂකයන් විසින් (රකෂණභාර අරමුදල හැර) මණ්ඩලය විසින් ලබා දෙන ලද සාමාන්‍ය ආකෘති පත්‍ර සමඟ ප්‍රශ්නාවලිය මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබිණ.

තවද 2014 වසරේ පළමු කාර්තුවේ ලද ප්‍රතිපල අනුව එහිදී හෙලිදරව් වූ අභියෝගතා පිළිබඳ රකෂණ ක්ෂේත්‍රය දැනුවත් කිරීම පිණිස මණ්ඩලය විසින් ලෝක බැංකුවේ ද සහය ඇතිව පුහුණු වැඩසටහන් පවත්වන ලැබීය.

2015 වසරේද අනිවාර්යය පැවරුම් සමාන්තර සමාලෝචනය පවත්වන ලබන අතර 2016 වසරේදී සියලුම රකෂකයන් විසින් අවදානම් පාදක ප්‍රාග්ධන රීතිවලට අනුකූල විය යුතුය.

### 7. ක්ෂේත්‍රගත විමර්ශන

2014 වසර තුළ දී මණ්ඩලය විසින් රක්ෂණ සමාගම්වල ක්ෂේත්‍රගත විමර්ෂණ හතක් පවත්වන ලදී. මෙම විමර්ෂණවල දී මණ්ඩලය විසින් රක්ෂකයන්ගේ මෙහෙයුම්, පද්ධති, ප්‍රතිපත්ති සහ පටිපාටීන් සමාලෝචනය කර පනතේ විධිවිධාන සහ අනෙක් රීති හා මණ්ඩලයේ රෙගුලාසි පිළිපැදීම අගයන ලදී. තවදුරටත් අදාළ රක්ෂණ සමාගම්වල මෙහෙයුම් පද්ධති, ප්‍රතිපත්ති සහ පටිපාටීන් පිළිබඳ තොරතුරු ලබා ගැනීම පිණිස රක්ෂකයන්ගේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, අභ්‍යන්තර/ බාහිර විගණකින් සහ පීවගණකඥයන් සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී. ක්ෂේත්‍රගත විමර්ෂණ අතරතුර දී කරන ලද නිරීක්ෂණ, වැඩිදියුණු කිරීම් සඳහා මණ්ඩලයේ නිර්දේශ සමඟ අදාළ රක්ෂකයින්ගේ ප්‍රතිචාර ලබා ගැනීම සඳහා ඔවුන් වෙත විමර්ශන වාර්තා යොමු කරනු ලදී . තවද, විමර්ෂණය අතරතුර දී අධික්ෂණය කළ උල්ලංඝනය කිරීම් සඳහා සුදුසු පියවර ගන්නා ලදී.

### 8. තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුවට ඉදිරිපත් කිරීම

කාර්තුමය වාර්තාවලින් එක්රැස් කර ගත් තොරතුරු මත පදනම්ව මණ්ඩලය විසින් රක්ෂණ කර්මාන්තයේ කාර්යසාධනය පිළිබඳ මූල්‍ය තොරතුරු කාර්තුමය පදනමකින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය පද්ධති ස්ථායීතා දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරනු ලැබීය. වාරික ආදායම, ලාභදායීත්වය, ද්‍රවශීලත්වය ආදී කාර්තුමය වාර්තාවලින් එක් රැස් කල විස්තර මත පදනම්ව රක්ෂණ කර්මාන්තයේ කාර්යසාධනය අගයනු ලැබීය.

### 9. සංයුක්ත රක්ෂකයින් වෙන් කිරීම

සංශෝධිත පනතේ 53 වැනි වගන්තිය අනුව සංයුක්ත රක්ෂණ සමාගම් විසින් 2015 වසරේ පෙබරවාරි මාසය වන විට සංයුක්ත රකෂණ ව්‍යාපාරයේ පන්ති සමාගම් දෙකකට වෙන් කිරීමට අවශ්‍ය වේ. 2014 වසරෙ තුළ දී සංයුක්ත සමාගම් දොළහක් සිය සංයුක්ත රක්ෂණ ව්‍යාපාරය වෙන් කිරීම සඳහා ඉදිරිපත් කළ යෝජනා සහ ඉල්ලුම්පත්‍ර මණ්ඩලය විසින් සමාලෝචනය කරන ලදී. මෙයට අමතරව, රක්ෂණ ව්‍යාපාරය මාරු කිරීමට දිස්ත්‍රික් අධිකරණයේ අනුමැතිය අවශ්‍ය වන බැවින් අදාළ රක්ෂකයින් සඳහා නිරීක්ෂණ දන්වන ලදී.

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

**10. අවදානම් පාදක අධීක්ෂණ (RBS) ව්‍යාපෘතිය**

ලෝක බැංකුවේ සහ FIRST INITIATIVE ආයතනයේ සහාය ඇතිව මණ්ඩලය විසින් මණ්ඩලයේ අධීක්ෂණ කාර්යය ශක්තිමත් කිරීමේ පරමාර්ථය ඇතිව 2013 වසරේ දී අවදානම් පාදක අධීක්ෂණ (RBS) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතිය 2015 වසරේ දී අවසන් කිරීමට බලාපොරොත්තු වේ. අවදානම් පාදක අධීක්ෂණ (RBS) ව්‍යාපෘතිය මඟින් අවදානම් පාදක අධීක්ෂණය, ප්‍රතිරක්ෂණය, ප්‍රතිරක්ෂකයින්, අලාභ ගලපන්නන්, ආයෝජන, ආයෝජන සබැඳි නිෂ්පාදන ආදී ක්ෂේත්‍ර සම්බන්ධව මණ්ඩලයේ අධීක්ෂණ හැකියාව වැඩිදියුණු කිරීමට අපේක්ෂිතය.

අවදානම් පාදක අධීක්ෂණ (RBS) ව්‍යාපෘතියෙන් ඉටු කර ගනු ලබන දේ පිළිබඳව ලෝක බැංකුවේ උපදේශකයින් සමඟ එකඟතාවලට එළැඹ සිටින අතර ව්‍යාපෘතිය අඛණ්ඩව ක්‍රියාත්මක වේ.

## රක්ෂණ තැරැව්කාර සමාගම්

**1. කාර්තුමය වාර්තා, මාසික වාර්තා, අන්තර්කාලීන මූල්‍ය ප්‍රකාශන සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය**

2010 පෙබරවාරි 25 දින අංක 1642/16 දරන ගැසට් නිවේදනය (පළමු උපලේඛණය) අනුව සියලු රක්ෂණ තැරැව්කරුවන් ඔවුන්ගේ කාර්තුමය වාර්තා සහ අන්තර්වාර මූල්‍ය ප්‍රකාශන එක් එක් කාර්තුව අවසන් වී දින 45ක් ඇතුලත මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය.

රක්ෂණ තැරැව්කාර සමාගම් බහුතරයක් සිය කාර්තුමය වාර්තා සහ අන්තර්වාර මූල්‍ය ප්‍රකාශන එකී නියමිත කාලසීමාව ඇතුලත මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී. රක්ෂණ තැරැව්කරුවන් ඉදිරිපත් කළ කාර්තුමය වාර්තා මණ්ඩලය විසින් සමාලෝචනය කරනු ලැබීය. වාර්තා සමාලෝචනය අතරතුර දී කිසියම් නියාමන අවශ්‍යතාවලින් බැහැරවීම් සහ විෂමතා නිරීක්ෂණය කළේ නම් මණ්ඩලය නියම කළ කාලසීමාවක් තුළ දී ඒවා නිවැරදි කරනු පිණිස අදාළ තැරැව්කරුවන්ට දැනුම් දෙනු ලැබීය.

මණ්ඩලය නිකුත් කළ නියෝගවලට අනුව රක්ෂණ තැරැව්කාර සමාගම් දෙකක් එක් එක් මාසයේ අවසාන දිනයේ සිට දින පහළොවක් ඇතුලත මාසික වාර්තා මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී

රක්ෂණ තැරැව්කාර සමාගම්වල විගණනය කළ මූල්‍ය ප්‍රකාශන මූල්‍ය වර්ෂය අවසානයේ සිට මාස හයක් ඇතුලත ඉදිරිපත් කළ යුතුය. එසේ ඉදිරිපත් කළ විගණන මූල්‍ය ප්‍රකාශන මණ්ඩලය විසින් සමාලෝචනය කරන ලදී. නියාමන අවශ්‍යතාවලින් බැහැරවීම් නිවැරදි කිරීම සඳහා ඒවා පිළිබඳව අදාළ තැරැව්කාර සමාගම්වලට දැනුම් දෙන ලදී.

**2. වාරික එකතු කිරීමේ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම**

පනතේ 89 වැනි පරිච්ඡේදයට අනුව රක්ෂකයන් වෙනුවෙන් රක්ෂණ වාරික එකතු කරනු ලබන රක්ෂණ තැරැව්කරුවන් එකතු කරනු ලබන රක්ෂණ වාරික දෙසතියක් ඇතුලත ඒ ඒ අදාළ රක්ෂකයන් වෙත ප්‍රේෂණය කළ යුතුය. මණ්ඩලය විසින් කාර්තුමය වාර්තා නිරීක්ෂණය කිරීම තුළදී සහ ක්ෂේත්‍රගත විමර්ශන අතරතුර දී රක්ෂණ තැරැව්කරුවන් විසින් පනතේ 89 වැනි වගන්තිය පිළිපැදීම සියුම්ව අධීක්ෂණය කරනු ලැබීය. එකී විධිවිධානවලට අනුකූල නොවන රක්ෂණ තැරැව්කරුවන්ට විරුද්ධව මණ්ඩලය අවශ්‍ය පියවර ගනු ලැබිණ.

**3. ක්ෂේත්‍රගත විමර්ශණ**

පනතට සහ මණ්ඩලයේ රීතී හා රෙගුලාසිවලට අනුකූලවන ආකාරයෙන් රක්ෂණ තැරැව්කාර ව්‍යාපාරය ක්‍රියාත්මක වන්නේ ද යන්න අධීක්ෂණය කිරීම සඳහා 2014 වසර තුළ දී මණ්ඩලය විසින් ක්ෂේත්‍රගත විමර්ශණ අටක් පවත්වන ලදී. ක්ෂේත්‍රගත විමර්ශණවල දී සිදු කළ නිරීක්ෂණ නිවැරදි කිරීමේ පියවර සඳහා නිර්දේශ සමඟ අදාළ රක්ෂණ තැරැව්කරුවන්ගේ අවධානයට යොමු කරනු ලබන අතර අවශ්‍ය අවස්ථාවල දී මණ්ඩලය විසින් නියාමන පියවර ගනු ලැබිණ.

**4. ලියාපදිංචිය අලුත් කිරීම**

2015 වසර සඳහා රක්ෂණ තැරැව්කරුවන්ගේ ලියාපදිංචිය අලුත් කිරීම සඳහා ඔවුන්ගෙන් ලැබූ ඉල්ලුම්පත්‍ර මණ්ඩලය විසින් සමාලෝචනය කරන ලදී. මණ්ඩලය විසින් රක්ෂණ තැරැව්කරුවන්ගේ ලියාපදිංචිය අලුත් කිරීමට පෙර ඔවුන්ගේ විගණනය කළ මූල්‍ය ප්‍රකාශන සහ කාර්තුමය වාර්තා විශ්ලේෂණය කරමින් රක්ෂණ තැරැව්කරුවන්ගේ මූල්‍ය තත්ත්වය අගයනු ලැබිණ.

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

## නියාමන සමාලෝචනය

### රක්ෂණ සමාගම් ලියාපදිංචි කිරීම

පනතේ 53වැනි වගන්තියට අනුකූලව රක්ෂණ සමාගම් ලෙස ලියාපදිංචි වීම සඳහා සහ බලපත්‍ර ලබා ගැනීම සඳහා මෙම වසර තුළ ඉල්ලුම්පත්‍ර 12ක් මණ්ඩලයට ලැබුනු අතර සමාගම් අටකට රක්ෂකයින් ලෙස ලියාපදිංචිය ප්‍රදානය කර ඇත.

කෙසේවුව ද, ලියාපදිංචි වූ නව සමාගම් 8න් 2015 ජනවාරි මාසයේ 1වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සමාගම් 7ක් වෙත බලපත්‍ර නිකුත් කළ අතර මණ්ඩලය විසින් බලපත්‍ර නිකුත් කිරීම පිණිස වූ ප්‍රාග්ධන අවශ්‍යතාවට අනුකූලවීම සඳහා එක් සමාග මකට නියම කර ඇත.

ඇමුණුම,: 2014 දෙසැම්බර් 31වන දිනට මණ්ඩලයේ ලියාපදිංචි වී සිටින සියළු රක්ෂණ සමාගම්වල නාම ලේඛනය හා ඔවුන්ට කටයුතු කර ගෙන යාමට අවසර ලබා දී ඇති රක්ෂණ ව්‍යාපාර පන්තිය/ පන්ති දැක්වේ.

### නව රක්ෂණ තැරැව්කාර සමාගම් ලියාපදිංචි කිරීම සහ රක්ෂණ තැරැව්කාර සමාගම්වල ලියාපදිංචිය අලුත් කිරීම

මණ්ඩලය විසින් 2012 වසරේ අප්‍රේල් මස 27වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි රක්ෂණ තැරැව්කරුවන් ලෙස ලියාපදිංචි වීම සඳහා නව ඉල්ලුම්පත්‍ර භාර ගැනීම තාවකාලිකව නතර කර ඇත. ඒ අනුව, මෙම වසර තුළ දී රක්ෂණ තැරැව්කරුවන් ලෙස ක්‍රියාකාරීම සඳහා නව ලියාපදිංචි කිරීම් ප්‍රදානය කර නොමැත.

2015 වසර සඳහා ලියාපදිංචිය අලුත් කිරීමේ අපේක්ෂාවෙන් රක්ෂණ තැරැව්කාර සමාගම් 58කින් ඉල්ලුම්පත්‍ර මණ්ඩලය වෙත ලැබී තිබෙන අතර එම සමාගම්, පනත යටතේ අවශ්‍ය නියමයන් සම්පූර්ණ කර ඇති බැවින් 2015 වසර සඳහා එම සියලුම සමාගම්වලට සිය ලියාපදිංචිය අලුත් කිරීම් ප්‍රදානය කර ඇත.

ඇමුණුම,: මණ්ඩලයේ ලියාපදිංචි වී සිටින සියළුම රක්ෂණ තැරැව්කාර සමාගම්වල නාම ලේඛනය, ඔවුන්ට කර ගෙන යාමට අවසර ලබා දී ඇති රක්ෂණ ව්‍යාපාර පන්තිය/ පන්ති සහ ලියාපදිංචි කාලපරිච්ඡේදය දැක්වේ.

### බලාත්මක කිරීමේ ක්‍රියාවලිය

### රක්ෂණ සමාගම්

### අත්හිටුවීම්

මණ්ඩලය විසින් වසර තුළ අත්හිටුවීම් පැණවූයේ නැත. කෙසේවුව ද, 2009 වසරේ දී සෙලින්කෝ තකාෆුල් ලිමිටඩ් සම්බන්ධයෙන් පණවන ලද අත්හිටුවීම අඛණ්ඩව ක්‍රියාත්මක වේ.

මණ්ඩලය සහ සෙලින්කෝ තකාෆුල් ලිමිටඩ් අතර ඇති කර ගත් අවබෝධතා ගිවිසුම අනුව, සෙලින්කෝ තකාෆුල් ලිමිටඩ් සතු වත්කම්, සමාගමේ සත්‍ය රක්ෂණ හිමිකම්පෑම් නිරවුල් කිරීමේ කාර්යය සඳහා ක්‍රියාවලියක් ආරම්භ කිරීම සඳහා සෙලින්කෝ තකාෆුල් ලිමිටඩ් හිමිකම්පාන්නන්ට සිය හිමිකම්පෑම් මණ්ඩලය වෙත ලිඛිතව ඉදිරිපත් කරන ලෙසට ඉල්ලා සිටිමින් පුවත්පත් දැන්වීම් පළ කරන ලදී. හිමිකම්පෑම්වල තත්ත්වය ඇගයීම වසර තුළ සිදු කරන ලදී. කෙසේ වුවද සෙලින්කෝ තකාෆුල් ලිමිටඩ් එරෙහිව අධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතින නඩුකරයන් තිබෙන බැවින් මෙම හිමිකම් පෑම් නිරවුල් කිරීම වහාම සිදු කළ නොහැකිය. තව ද, සෙලින්කෝ තකාෆුල් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලයේ දැනට සිටින්නේ එක් සක්‍රීය අධ්‍යක්ෂවරයෙක් පමණක් වන බැවින් මණ්ඩලය විසින් ගරු නීතිපතිවරයාගේ උපදෙස් ලබා ගැනීමට අපේක්ෂා කරයි.

### විධාන

පනතේ 57වැනි වගන්තිය අනුව නුඹුන්වත් ආන්තික රීති උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් මණ්ඩලය විසින් රක්ෂණ සමාගම් දෙකක් වෙත විධාන නිකුත් කර ඇති අතර මෙම සමාගම් විසින් කාර්තුමය වාර්තාවලට අමතරව, මාසික වාර්තා ද ඉදිරිපත් කල යුතුය.

පනතේ 57වැනි වගන්තිය අනුව යම් රක්ෂණකරුවකුගේ කටයුතු මහජන යහපතට හෝ රක්ෂණ ඔප්පු දරන්නන්ගේ යහපතට හානිවන පරිදි හෝ රක්ෂණකරුගේ යහපතට අගතිකර වන පරිදි පවත්වා ගෙන යනු ලබන බවට මණ්ඩලය සෑහීමට පත්වන අවස්ථාවක, ඒ රක්ෂණකරු වෙත විධාන නිකුත් කිරීමේ බලය මණ්ඩලය සතුව පවතී.

එසේ නිකුත් කළ විධාන රක්ෂකයින් විසින් පිළිපැද තිබෙන්නේ ද යන්න තීරණය කිරීම සඳහා එවැනි විධාන සම්බන්ධයෙන් මණ්ඩලය ඉතා සමීප හා අඛණ්ඩ අධීක්ෂණයක් ක්‍රියාත්මක කරයි.

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

### අවවාද කිරීම්

මණ්ඩලය විසින් මින් පෙර නිකුත් කල විධානයන් උල්ලංඝනය කරමින් එක් රක්ෂණ සමාගමක් විසින් මණ්ඩලයේ පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව පාලිත සමාගමක් සංස්ථාගත කිරීම හේතුවෙන් මණ්ඩලය විසින් එම රක්ෂණ සමාගමට අවවාද කරන ලදී.

එසේම මණ්ඩලයේ පූර්ව ලිඛිත අනුමැතිය නොමැතිව පාලිත සමාගමක් සංස්ථාගත කිරීම සඳහා නිකුත් කළ විධානය සහ රක්ෂණ ආවරණයේ ආරම්භක දිනයට මුළු වාරික ආදායම නොලැබ රක්ෂකයාගේ සමූහ ව්‍යාපාරයේ සිටින තැනැත්තන්ට රක්ෂණ ඔප්පු නිකුත් කිරීම තහනම් කළ විධානය යන මණ්ඩලය විසින් සමාග මට විරුද්ධව මීට පෙර නිකුත් කළ විධාන දෙක උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් මණ්ඩලය එම සමාගමට නැවත වරක් අවවාද කරන ලදී.

### රක්ෂණ තැරැව්කාර සමාගම්

### අත්හිටුවීම්

2010 පෙබරවාරි 25 දිනැති අංක 1642/16 දරන ගැසට්පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 07වන රීතිය සමඟ කියැවෙන පනතේ 86 (1) වගන්තිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් රක්ෂණ තැරැව්කාර සමාගමක් පිළිවෙලින් 2014 සැප්තැම්බර් මස 12වැනි දින සිට 2014 සැප්තැම්බර් මස 19වැනි දින දක්වා සහ 2014 ඔක්තෝබර් මස 20වැනි දින සිට 2014 නොවැම්බර් මස 24වැනි දින දක්වා අත්හිටුවන ලදී.

2010 පෙබරවාරි 25 දිනැති අංක 1642/16 දරන ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 07වන රීතිය සමඟ කියැවෙන පනතේ 86 (1) වගන්තිය මඟින්, වෙනත් කරුණු අතර දැක්වෙන්නේ සෑම රක්ෂණ තැරැව්කරුවෙකු විසින්ම රක්ෂණ තැරැව්කාර සමාගම් ප්‍රධාන නිලධාරියා සහ එම සමාගමේ අධ්‍යක්ෂවරයෙකු විසින් සහතික කරනු ලැබූ කාර්තුමය වාර්තාව එක් එක් කාර්තුව අවසානයේ දී, දින 45ක් ඇතුළත දී මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු බවය.

පනතේ 86 (2) වගන්තිය ප්‍රකාරව සෑම රක්ෂණ තැරැව්කරුවෙක්ම එහි ගිණුම්කරණ කාලපරිච්ඡේදය අවසානයේ මාස හයක් ඇතුලත ශේෂ පත්‍රයක්, ලාභ හා අලාභ ගිණුමක් සහ සුදුසුකම් ලත් විගණකවරයෙක් විසින් සහතික කළ එම ගිණුම් සඳහා වූ සටහනක් ඇතුලත් එහි විගණනය කළ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය.

### අවවාද කිරීම්

සමාගම් පනතේ 86 (1) වගන්තියට අනුකූලවීමට අපොහොසත්වීම හේතුවෙන් රක්ෂණ තැරැව්කාර සමාගම් 03 අවවාද කිරීම් නිකුත් කරන ලදී.

තවද, පනතේ 86 (2) වගන්තිය උල්ලංඝනය කිරීම හේතුවෙන් මණ්ඩලය විසින් රක්ෂණ තැරැව්කාර සමාගම් 08 අවවාද කිරීම් නිකුත් කරන ලදී.

ශ්‍රී ලංකා විදේශ රැකියා නියෝජිතායතනය සමඟ සංක්‍රමණික සේවකයින් සඳහා වූ රක්ෂණ යෝජනාක්‍රමයක් සම්බන්ධයෙන් පනතේ විධිවිධාන උල්ලංඝනය කිරීමක් සලකා බැලූ මණ්ඩලය එම රක්ෂණ තැරැව්කාර සමාගමට අවවාද කිරීම් සිදු කරන ලදී.

පනතේ 80 (2) (ආ) (II) ප්‍රකාරව කිසියම් රක්ෂණ තැරැව්කාර සමාගමක ආශ්‍රිත, පාලිත හෝ පාලක සමාගමක අධ්‍යක්ෂවරයා හෝ ප්‍රධාන විධායක නිලධාරියා රක්ෂකයාගේ අධ්‍යක්ෂවරයෙක් හෝ කොටස්හිමියෙක් හෝ සේවකයෙක් වන අවස්ථාවක දී එම සමාගම රක්ෂණ තැරැව්කාර සමාගමක් ලෙස ලියාපදිංචි කිරීමට හිමිකමක් නොමැත. කෙසේවුව ද, එක් රක්ෂණ තැරැව්කාර සමාගමක් පාලක සමාග මේ එක් අධ්‍යක්ෂවරයෙක් රක්ෂණ සමාගමක ද අධ්‍යක්ෂවරයෙක් වන බව 2013 වසර සඳහා ඔවුන්ගේ ලියාපදිංචිය අළුත් කිරීමේ ඉල්ලුම්පත්‍රයෙන් හෙළිදරව් කිරීමට අසමත් වී ඇත.

ඒ අනුව, මණ්ඩලය අසත්‍ය, නොමග යවන සුළු හෝ සාවද්‍ය තොරතුරු සැපයීම හෝ ලියාපදිංචිය අලුත් කිරීම සඳහා වන ඉල්ලුම්පත්‍රයේ අවශ්‍ය කරුණු හෙළිදරව් කිරීමට අපොහොසත්වීම සම්බන්ධයෙන් එකී රක්ෂණ තැරැව්කාර සමාගමට අවවාද කර ඇත.

### විධාන

වසර තුළ දී මණ්ඩලය මඟින් රක්ෂණ තැරැව්කාර සමාගම්වලට විධාන නිකුත් කර නොමැත.

### නියාමන/ උපදේශනාත්මක ක්‍රියාමාර්ග:

1. විදේශ ප්‍රතිරක්ෂණ සමාගමක් ශ්‍රී ලංකාවේ සම්බන්ධීකරණ කාර්යාලයක් පිහිටුවීම සඳහා මණ්ඩලයෙන් අනුමැතිය ඉල්ලා සිටියේය. මණ්ඩලය ශ්‍රී ලංකාවේ ප්‍රතිරක්ෂකයින් ලියාපදිංචි කිරීම සඳහා නියාමන රාමුවක් සකස් කිරීමේ ක්‍රියාවලියේ නිරත වන නිසා නියාමන රාමුවේ කටයුතු අවසන් කරන තෙක් අනුමැතිය ලබාදීම මණ්ඩලය විසින් කල් දමන ලදී.

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

2. විදේශ සමාගමක් මගින් ශ්‍රී ලංකාවේ සංවර්ධන ව්‍යාපෘතියක් ගොඩනැගීම වෙනුවෙන් විදේශ රක්ෂණ සමාගමකින් සියලුම අවදානම් රක්ෂණයක් (Erection All Risks insurance) සහ තුන්වැනි පාර්ශ්ව වගකීම් රක්ෂණ ඔප්පුවක් මිල දී ගැනීම සඳහා මණ්ඩලයෙන් අනුමැතිය ඉල්ලා සිටින ලදී. එකී ව්‍යාපෘතිය සඳහා විදේශ අධිකාරියකින් අරමුදල් සපයන ලද අතර ඔවුන් ශ්‍රී ලංකා ආණ්ඩුව සමඟ ඇති කර ගත් ගිවිසුමට අනුව කොන්ත්‍රාත්කරු වන එකී සමාගමට විදේශ රක්ෂණ සමාගමකින් එවැනි රක්ෂණ ඔප්පුවක් ලබා ගැනීමට නියම කරන ලදී. තව ද, එම සමාගමේ ව්‍යාපෘති කාර්යාලය ශ්‍රී ලංකාවේ පිහිටි එකකි. පනතේ 101 (1) වගන්තිය අනුව, තොරතුරු තහවුරු කිරීමෙන් පසු මණ්ඩලය විසින් එකී ඉල්ලීමට අනුමැතිය ප්‍රදානය කරන ලදී.

පනතේ 101 වැනි වගන්තිය අනුව ශ්‍රී ලංකාවේ කිසිදු තැනැත්තෙක් මණ්ඩලයේ පූර්ව ලිඛිත අනුමැතිය නොමැතිව ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් හැර පනත යටතේ ලියාපදිංචි නොකරන ලද රක්ෂකයෙක් සමඟ සෘජුව හෝ වක්‍රව රක්ෂණ ව්‍යාපාරයක් සිදු නොකළ යුතුය. තවද, මණ්ඩලය විසින් ඒ සඳහා ලිඛිත අනුමැතිය ප්‍රදානය කළ යුත්තේ රක්ෂණ කර්මාන්තය සහ ජාතික අභිවෘද්ධිය සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්තිය සැලකිල්ලට ගැනීමෙන් පසුව පමණි.

3. එක් රක්ෂණ සමාගමක් මණ්ඩලයේ අනුමැතිය ලබා නොගෙන ප්‍රධාන නිලධාරියෙක් පත් කරන ලද අතර අදාළ තැනැත්තා ප්‍රධාන නිලධාරියෙක් ලෙස කටයුතු කිරීමට නුසුදුසු වූ බැවින් පනතේ 94වැනි වගන්තිය ප්‍රකාරව සුදුසු තැනැත්තෙක් පත් කරන ලෙසට මණ්ඩලය විසින් අදාළ සමාගම දැනුවත් කරන ලදී. පනතේ 94වැනි වගන්තිය ප්‍රකාරව සෑම රක්ෂණ සමාගමක්ම මණ්ඩලය සාදන රීති අනුව සුදුසුකම් ඇති බවට මණ්ඩලය විසින් තීරණය කරනු ලබන තැනැත්තෙක් මණ්ඩලයේ අනුමැතිය ඇතිව ප්‍රධාන නිලධාරියෙක් ලෙස පත් කිරීමට අවශ්‍ය වේ. අදාළ තැනැත්තා විසින් එම සමාගමේ ප්‍රධාන නිලධරයා ලෙස සිය පත් කිරීම නැවත සලකා බලන ලෙසට මණ්ඩලයට අභියාචනයක් කරන ලද නමුත් මණ්ඩලය ඒ සඳහා එකඟ නොවීය.

4. ශ්‍රී ලාංකික විදේශීය සංක්‍රමණික සේවකයින් සඳහා වූ රක්ෂණ නිපැයුමක් සම්බන්ධයෙන් පනතේ විධිවිධාන උල්ලංඝනය කිරීම වෙනුවෙන් 2014 වසර සඳහා ලියාපදිංචිය අලුත් කිරීම සඳහා රක්ෂණ තැරැව්කරුවෙක් වෙත නිදහසට කරුණු දැනුම් දෙන ලෙසට මණ්ඩලය දැනුම්දීමක් නිකුත් කරන ලදී. තව ද, මණ්ඩලය විසින් ලියාපදිංචිය ඉක්මවීම සම්බන්ධයෙන් අදාළ සමාගමට දැනුම් දුන් අතර 2014 වසරේ ජනවාරි 1වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි එම සමාගමට තැරැව්කරුවෙක් ලෙස කටයුතු කිරීමෙන් වැළකී සිටින ලෙසට මණ්ඩලය විසින් දැනුම් දෙන ලදී. අදාළ තැරැව්කරු විසින් මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහ මණ්ඩලයට විරුද්ධව මණ්ඩලයේ තීරණය අභියෝගයට ලක් කරමින් 2014.01.09 වන දින රිට් ආඥාවක් සඳහා වූ අයැදුමක් ගොනු කර ඇත. තැරැව්කරු විසින් නිදහසට කරුණු ඉදිරිපත් කිරීම සඳහා වූ දැනුම්දීම සහ ලියාපදිංචිය ඉකුත්වීම පිළිබඳව දැනුම් දෙමින් මණ්ඩය විසින් නිකුත් කළ ලිපි නිෂ්ප්‍රභා කිරීම සඳහා සර්ෂියොරාරි රිට් ආඥාවක් සහ 2014 වසර සඳහා ඔවුන්ගේ ලියාපදිංචිය අලුත් කිරීමට මැන්ඩාමුස් රිට් ආඥාවක් අයැද සිටියේය. කෙසේවුව ද, අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ මණ්ඩලය වෙනුවෙන් විරෝධතා ගොනු කිරීමෙන් පසුව 2014 ඔක්තෝබර් 15වැනි දින තැරැව්කරු විසින් එකී අයැදුම ඉල්ලා අස් කර ගත්තේය.

5. ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව එක් රක්ෂණ සමාගමක් එහි පාලිත සමාගම් දෙකක් වෙනුවට පිහිටු වන ලද වෙනත් පාලිත සමාග මක් ලැයිස්තුගත කිරීම පිළිබඳ මණ්ඩලයේ අදහස් විමසන ලදී. එසේ විමසන ලද්දේ මණ්ඩලයේ පූර්ව ලිඛිත අනුමැතිය නොමැතිව එම රක්ෂකයාහට එවැනි පාලිත සමාගමක් හෝ වෙනත් කාණ්ඩය සමාගම් සංස්ථාගත කිරීම හෝ ශාඛා පිහිටුවීම වළක්වාලමින් මණ්ඩලය විසින් පනවන ලද විධානයක් සම්බන්ධයෙනි. මෙම කරුණ පිළිබඳව විමසා බැලීමෙන් අනතුරුව අදාළ සමාගම එම විධානයඋල්ලංඝනය නොකරන බැවින් මණ්ඩලය එම කරුණ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව වෙත විරෝධතාවක් නැති බව පළ කිරීමේ ලිපියක් නිකුත් කරන ලදී.

6. එක් රක්ෂණ සමාගමක් ශ්‍රී ලංකාවේ දී පිරිනමන එහි නිපැයුම් වැඩිදියුණු කිරීම සඳහා එම රක්ෂණ සමාගමට අගය එකතු කළ සේවා සැපයීමට හැකි රක්ෂණ තැරැව්කරුවන් යොදා ගැනීම සඳහා ඉල්ලීම් කළේය. සපයා ඇති ආදර්ශ ගිවිසුමට අනුව එවැනියොදා ගැනීමක ප්‍රධාන කාර්යය වන්නේ එම රක්ෂණ සමාගමේ රක්ෂණ නිපැයුම් ගනුදෙනුකරුවන්ට ප්‍රවර්ධනය කිරීම සඳහාය. එවැනි ඉල්ලීමක් පනතට අනුකූල නොවන බැවින් මණ්ඩලය විසින් එම ඉල්ලීමට අනුමැතිය ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කරන ලදී.

7. රක්ෂණ සමාගමක් ලෙස ලියාපදිංචිවීමට කැමැත්ත පළ කළ සමාග මක් පනතේ 96 වගන්තිය ප්‍රකාරව එහි නමට “ඇෂුවරන්ස්” යන වචනය සහිතව සමාගමක් සංස්ථාගත කර ගැනීමට අවසර දෙන ලෙසට මණ්ඩලයේ අවසරය ඉල්ලා සිටියේය. පනතේ 96වැනි වගන්තිය ප්‍රකාරව රක්ෂකයෙක්, තැරැව්කරුවෙක් හෝ රක්ෂකයෙක්ගේ හෝ තැරැව්කරුවෙක්ගේ රක්ෂණ නියෝජිතයෙක් නොවන වෙනත් තැනැත්තෙක්ට මණ්ඩලයේ ලිඛිත අනුමැතිය

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

නොමැතිව එම සමාගම ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාරයක් කර ගෙන යන බවට දැක්වීම සඳහා එහි නමේ, පදවි නාමයේ හෝ විස්තරයක කොටසක් ලෙස -ඉන්ෂුවරන්ස්" යන වචනය හෝ එහි කිසියම් ව්‍යුත්පන්නයක් හෝ කිසියම් භාෂාවක එයට සමාන වචනයක් භාවිතා කිරීමට නොහැක. අදාළ සමාගම ඉදිරිපත් කළ තොරතුරු මණ්ඩලය විසින් සලකා බලන ලද අතර රක්ෂකයෙක් ලෙස කටයුතු කිරීම සඳහා නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයැදුම්පත්‍රයක් මාස හයක් ඇතුලත ඉදිරිපත් කිරීමේ කොන්දේසියට යටත්ව සහ රක්ෂකයෙක් ලෙස කටයුතු කිරීම සඳහා වූ බලපත්‍රය ඔවුන්ට ප්‍රදානය නොකරන අවස්ථාවක දී එම සමාගම විසින් -ඇෂුවරන්ස්" යන වචනය ඉවත් කිරීමේ කොන්දේසියට යටත්ව ඒ සඳහා අනුමැතිය ප්‍රදානය කළේය.

8. සමාගමක් අනුබද්ධ සමාගම්, ශාඛා ආදිය පිහිටුවීමට පෙර මණ්ඩලයේ පූර්ව ලිඛිත අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය කරමින් මණ්ඩලය විසින් එක් රක්ෂණ සමාගමක් වෙත වර්ෂ 2009 දී විධානයක් නිකුත් කර ඇත. අනාගත ශාඛා පිහිටුවීම සම්බන්ධයෙන් එකී අවශ්‍යතා ඉවත් කිරීම සඳහා එකී රක්ෂණ සමාගම මණ්ඩලයේ අනුමැතිය ඉල්ලා සිටියේය. මණ්ඩලය අදාළ ඉල්ලීම සලකා බලා එම රක්ෂකයාහට නව ශාඛා පිහිටුවීමට හැකිවන පරිදි අදාළ විධානය සංශෝධනය කරන ලදී. පනතේ 57 (2) වගන්තිය ප්‍රකාරව නිකුත් කළ විධානයක් වෙනස් කිරීමට හෝ අවලංගු කිරීමට මණ්ඩලයට බලය ලබා දී ඇත.

9. පුණ්‍යාධාර සඳහා ගෙවීම් ඇතුළු කිසිදු පරිත්‍යාගයක්, ණයක්, පිටස්තර පුද්ගලයින්ට දෙන අත්තිකාරම් ප්‍රදානය කිරීමෙන් වැළකීම සඳහා නියෝග කරමින් මණ්ඩලය විසින් 2012 වසරේ දී එක් රක්ෂණ සමාගමකට විධානයක් නිකුත් කළේය. එකී රක්ෂණ සමාගම එම සමාගමේ ශුද්ධ ලාභයෙන් 5% ක් දක්වා පරිත්‍යාග සහ පුණ්‍යාධාර සම්බන්ධයෙන් ගෙවීම් කිරීමට හැකිවන පිණිස එම විධානය සංශෝධනය කරන ලෙස මණ්ඩලයෙන් ඉල්ලා සිටියේය. 2014 වසරේ දෙසැම්බර් 31වන විට එම සමාගමේ ආදායම් සංචිත ඍණාත්මක වූ බැවින් ද මණ්ඩලය මඟින් නියම කළ අවම ප්‍රාග්ධන අවශ්‍යතා ඉටු කර නොතිබුනු බැවින් මණ්ඩලය එකී ඉල්ලීමට එකඟ නොවීය.

10. රක්ෂණ සමාගම් දෙකක ණය ගෙවීමේ හැකියාවේ සීමාව අඩුවීම හේතුවෙන් 2014 මාර්තු මාසයේ සිට ආරම්භ වන පරිදි මාසික වාර්තා ඉදිරිපත් කරන ලෙසට මණ්ඩලය විසින් එම සමාගම්වලට විධාන නිකුත් කරන ලදී. මාස හයක කාල පරිච්ඡේදයක් සඳහා වාර්තා ඉදිරිපත් කිරීමෙන් පසුව එම රක්ෂණ සමාගම් විසින් අදාළ විධාන ඉවත් කරන ලෙසට ඉල්ලා සිටින ලදී. ඉදිරිපත් කරන ලද වාර්තාවලට අනුව සාමාන්‍ය සහ දීර්ඝ කාලීන යන රක්ෂණ ව්‍යාපාර දෙකම සඳහා ණය ගෙවීමේ හැකියාවේ අවම අනුපාතවලට අනුකූලව වන බැවින් සහ සමාගම් දෙකම අනෙකුත් ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලට අනුකූල වන බැවින් මණ්ඩලය එම ඉල්ලීම්වලට එකඟ විය.

11. ශ්‍රී ලංකා විදේශ රැකියා නියෝජිතායතනය සමඟ ඇති කර ගත් රක්ෂණ යෝජනාක්‍රම ආශ්‍රිත විෂමාචාර සම්බන්ධයෙන් ඒවායේ මූල්‍ය ප්‍රධානීන් ඉවත් කරන ලෙසට නියෝග කරමින් එක් රක්ෂණ සමාගමක් වෙත මණ්ඩලය විසින් විධානයක් නිකුත් කළේය. එම ඉවත් කිරීම නැවත සලකා බලන ලෙසට ඉල්ලා සිටිමින් අදාළ තැනැත්තා මණ්ඩලයට අභියාචනා කරන ලදී. කෙසේවුව ද, අදාළ තැනැත්තා නිත්‍යානුකූල නොවන තැරැව්කාර කොමිස් මුදල් ගෙවීම, ඉහත සඳහන් කළ රක්ෂණ යෝජනාක්‍රම සම්බන්ධයෙන් තුන්වැනි පාර්ශ්ව ගිවිසුමට අදාළ ගෙවීම් සහ එම සමාගම විසින් මණ්ඩලයට භාර දෙන වාර්තාවල සාවද්‍ය තොරතුරු සැපයීම සම්බන්ධයෙන් මණ්ඩලය ඔහුගේ අභියාචනය නොසලකා හැරියේය.

12. 2005 ඔක්තෝබර් මස අංක 1414/19 දරන අතිවිශේෂ ගැසට්පත්‍රයේ සඳහන් 4 (ii) රීතිය සමඟ කියවිය යුතු පනතේ 25 (3) දරන වගන්තිය ප්‍රකාරව රක්ෂණ සමාගමක් විසින් සිය සමාගමේ මාලදිවයිනේ පිහිටි පාලිත සමාග මට එහි වර්තමාන කොටස් නිකුතුවවැඩි කිරීම සඳහා රු. 15,684,000/-ක් ආයෝජනය කිරීම සඳහා මණ්ඩලයේ අනුමැතිය ඉල්ලා සිටියේය.

2005 ඔක්තෝබර් මස අංක 1414/19 දරන අතිවිශේෂ ගැසට්පත්‍රයේ සඳහන් 4 (ii) රීතිය අනුව කිසියම් තනි පුද්ගලයෙක් හෝ පුද්ගලයෙක් හෝ ඔවුන්ගේ සම්බන්ධිත පාර්ශ්වයක් සතුව ශ්‍රී ලංකාවෙන් බැහැරව තබා ගත හැකි වත්කම්වල වටිනාකම, කිසියම් වේලාවක දී ශ්‍රී ලංකාවෙන් බැහැරව තබා ගත හැකි බවට අවසර දී තිබෙන වත්කම්වල වටිනාකමින් 5% සීමාව නොඉක්මවිය යුතුය. එබැවින්, ඵලදායී තනි පාර්ශ්ව නිරාවරණය මුළු වත්කම්වලින් 1%කි.

අදාළ ආයෝජනය එකී රක්ෂකයාගේ මුළු වත්කම්වලින් 1%කට අඩු බැවින් මණ්ඩලය විසින් ඇතැම් කොන්දෙසිවලට යටත්ව ඒ සඳහා අනුමැතිය ප්‍රදානය කරන ලදී.

13. රක්ෂණ සමාගමක් ඔවුන්ගේ පාලක සමාගම මඟින් ගත් ආර්ථික තීරණයක් හේතුවෙන් ශ්‍රී ලංකාව තුළ ඔවුන්ගේ රක්ෂණ ව්‍යාපාර කටයුතු අවසන් කිරීම පිළිබඳව මණ්ඩලයට දැනුම් දී ඇත. සමාගම මෙම කරුණ සම්බන්ධයෙන් ස්ථානීය පරීක්ෂණයක් පවත්වා ඇති අතර ඔවුන්ට වැඩිදුර තොරතුරු භාර දෙන ලෙස දන්වා ඇත.

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

14. රක්ෂණ සමාගමක් ලෙස ලියාපදිංචිවීම සඳහා වන අයදුම්පත්‍රය පරිශීලනයට පහසු කිරීම සඳහාත් පනතේ සංශෝධනයන්ට අනුකූල වීම සඳහාත් මණ්ඩලය විසින් එය තවදුරටත් සංශෝධනය කරන ලදී. ලියාපදිංචිය ප්‍රදානය කිරීමට පෙර ඉල්ලුම්කරු සිය ඉල්ලුම්පත්‍රය ඉල්ලා අස් කර ගන්නේ නම් ලියාපදිංචි ගාස්තුවෙන් 50%ක් පමණක් ඉල්ලුම්කරු වෙත ආපසු දෙන බවට ද ඉල්ලුම්පත්‍රයේ සඳහන් කරයි.

15. පනතේ 102වැනි වගන්තිය මඟින් නියම කර ඇති පරිදි රක්ෂණ ව්‍යාපාරය පැවරීම සම්බන්ධයෙන් සංයුක්ත සමාගම් නවයක් වෙත මණ්ඩලයේ නිරීක්ෂණ ප්‍රදානය කර ඇත. පනතේ 102 වැනි වගන්තිය ප්‍රකාරව රක්ෂණ සමාගමක කිසියම් පැවරීමක් හෝ ඒකාබද්ධ කිරීමක් සම්බන්ධ සියලුම කටයුතු දිස්ත්‍රික් අධිකරණය මඟින් අනුමත කළ යුතු වන අතර එවැනි අනුමැතියක් සඳහා ඉල්ලුම් කිරීමේ දී එවැනි පැවරීමක් හෝ ඒකාබද්ධ කිරීමක් පිළිබඳ මණ්ඩලයේ නිරීක්ෂණවල පිටපතක් අධිකරණයේ සලකා බැලීම පිණිස අධිකරණයට ද යොමු කළ යුතුය.

16. සංශෝධිත පනතින් හඳුන්වා දුන් නව විධිවිධාන ප්‍රකාරව රක්ෂණ සමාගම්වල අධ්‍යක්ෂකවරු පත් කිරීම සඳහා මණ්ඩලය විසින් ඉල්ලුම්පත්‍ර රාශියකට අනුමැතිය ප්‍රදානය කර ඇත.

17. පනතේ විධිවිධාන අනුව ප්‍රධාන නිලධාරීන් පත් කිරීම සඳහා අනුමැතිය අපේක්ෂාවෙන් රක්ෂණ සමාගම් සහ රක්ෂණ තැරැව්කාර සමාගම් ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත්‍ර රාශියකට මණ්ඩලය විසින් අනුමැතිය ප්‍රදානය කරන ලදී.

18. ණය ගෙවීමේ හැකියාවේ සීමා පිළිබඳ රීති යටතේ රක්ෂණ සමාගම් දෙකකට තක්සේරුකරුවන් පත් කිරීම සඳහා මණ්ඩලය විසින් අනුමැතිය ප්‍රදානය කරන ලදී.

**නියාමන ප්‍රතිසංස්කරණ**

**රීති**

**රක්ෂණ නියෝජිතයින්ගේ (තනි පුද්ගලයින් හැරුණු කොට) සුදුසුකම් විශේෂයෙන් සඳහන් කිරීම සඳහා වූ 2014 අංක 1 දරන රීතිය:**

මණ්ඩලය 2014 වසරේ මැයි 10 වැනි දිනැති අංක 1861/45 දරන අතිවිශේෂ ගැසට්පත්‍රය මඟින් (තනි පුද්ගලයින් හැරුණු කොට) රක්ෂණ නියෝජිතයින්ගේ සුදුසුකම් පිළිබඳ රීති නිකුත් කරන ලදී. මෙම රීති මඟින් පනත යටතේ රක්ෂණ නියෝජිතයෙක් ලෙස කටයුතු කිරීම සඳහා (තනි පුද්ගලයින් හැරුණු කොට) කිසියම් තැනැත්තෙකුට අවශ්‍ය සුදුසුකම් හඳුන්වා දෙන ලදී.

රීතියට අනුව එවැනි පුද්ගලයෙක් රුපියල් මිලියන දහයකට නොඅඩු ප්‍රකාශිත ප්‍රාග්ධනයක් ඇති සහ රු. මිලියන දෙකයි දශම පහක ශුද්ධ ප්‍රාග්ධනයක් සෑම වේලාවකදීම පවත්වා ගෙන යනු ලබන සමාගම් පනත යටතේ ලියාපදිංචි වූ සමාගමක් හෝ මුදල් ව්‍යාපාර පනත යටතේ ලියාපදිංචි වූ මූල්‍ය සමාගමක් හෝ මූල්‍ය කල්බදු පනත යටතේ ලියාපදිංචි වූ මූල්‍ය කල්බදු ආයතනයක් හෝ සමූපකාර සමිති පනත යටතේ හෝ පළාත් සභා ප්‍රඥප්තියක් යටතේ ලියාපදිංචි වූ සහ රක්ෂණ නියෝජිතයෙක් ලෙස ක්‍රියාකිරීම සඳහා එහි අනු-නීතිවලින් විශේෂ යොමු කිරීමක් ලැබූ සහ සමූපකාර සමිති නීතිය හෝ පළාත් සභාවේ අදාළ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි වූ සමූපකාර සමිතියක් විය යුතුය.

රක්ෂණ කර්මාන්තයේ වෙනස්වන අවශ්‍යතාවන් ඉටු කිරීමට සහ පනතේ 78 වගන්තිය යටතේ අවශ්‍යතාවන් සම්පූර්ණ කිරීමට මෙම රීතිය හඳුන්වා දී ඇත.

**රක්ෂණ සමාගම්වල ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනය සංශෝධනය කිරීම සඳහා වූ රීති:**

2014 වසරේ පෙබරවාරි 06 වැනි දිනැති අංක 1848/25 දරන අතිවිශේෂ ගැසට්පත්‍රය මඟින් වෙන් කිරීමේ අවශ්‍යතාවය පිළිපැදීමට පසුව පිහිටවූ රක්ෂණ සමාගම් වලට එය රක්ෂකයෙක් ලෙස ලියාපදිංචි වන අවස්ථාවේ දී රු. මිලියන 100ක ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනයක් තිබිය යුතු බවටත් ඉන්පසුව 2015 පෙබරවාරි 7 වැනි දින වන විට හෝ ඊට පෙර එහි ප්‍රාග්ධනය රු. මිලියන 500ක් දක්වා ඉහළ නැංවිය යුතු බවටත් මණ්ඩලය විසින් අවසර දී ඇත.

අලුතින් පිහිටු වන ලද රක්ෂකයින් වෙත සහනයක් ප්‍රදානය කිරීම සඳහා මෙම තීරණය ගෙන ඇත.

**නිශ්චයන්**

**රක්ෂණ සමාගම්වල වාර්ෂික වාර්තා පිළිබඳ නිශ්චය**

**2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීමේ පනතේ 47 (1) සහ 56 වගන්ති - රක්ෂණ සමාගම්වල වාර්ෂික වාර්තා - 2014 මාර්තු 27 වැනි දින සංශෝධිත 2012 මාර්තු 30 දිනැති නිශ්චය අංක 14**

2012 මාර්තු 30 වැනි දින නිකුත් කළ 14 වැනි නිශ්චයට අනුකූලව රක්ෂණ සමාගම් ඒවායේ වාර්ෂික වාර්තා ආකෘති කීපයකින් ඉදිරිපත් කළ යුතුය. මේවා අතුරින් නුඹුන්වත්හාව සාමාන්‍ය රක්ෂණය සඳහා වූ ආකෘතිය සහ නිර්දේශිත ව්‍යවහාර පිළිබඳ ප්‍රකාශනය සඳහා වූ ආකෘතිය 2014 මාර්තු මස 27 වැනි දින සංශෝධනය කර ඇත. සාමාන්‍ය රක්ෂණ ජීවගණකඥ විසින් ලබා දිය යුතු සංචිත වාර්තා සහ

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

K-GI සහ K-GI2 යන පෝරමවල ඇති උපදෙස් ඇතුලත් කිරීම පිණිස නුබුන්වත්භාව සාමාන්‍ය රක්ෂණය සඳහා වූ ආකෘතිය සංශෝධනය කර ඇති අතර අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට (IFRS) අනුකූලවීම පිණිස නිර්දේශිත ව්‍යවහාර පිළිබඳ ප්‍රකාශනය සඳහා වූ ආකෘතිය සංශෝධනය කර ඇත.

**රක්ෂණ සමාගම්වල ජීවගණකඥ සාරාංශය පිළිබඳ නිශ්චය**

**2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීමේ පනතේ 48 (1) වගන්තිය - රක්ෂණ සමාගම්වල ජීවගණකඥ වාර්තා - 2014 මාර්තු 27 වැනි දින සංශෝධිත 2012 මාර්තු 30 දිනැති අංක 15 දරන නිශ්චය**

පනතේ 48 (1) වගන්තිය ප්‍රකාරව 2012 මාර්තු 30වැනි දින නිකුත් කළ අංක 15 දරන නිශ්චයට අනුව රක්ෂණ සමාගම් විසින් ඒවායේ ජීවගණකඥ වාර්තා ආකෘති කීපයකින් ඉදිරිපත් කිරීමට අවශ්‍ය වේ. ඔප්පු වගකීම් තක්සේරු කිරීම පිළිබඳව වැඩිදුර තොරතුරු ලබාගැනීම පිණිස ඒවා අතුරින් ජීවගණකඥ වාර්තාව සහ සාරාංශය 2014 මාර්තු 27 වැනි දින සංශෝධනය කරන ලදී.

පනතේ 47 (1) සහ 48 (1) වගන්ති අනුව පිළිවෙලින් වාර්ෂික වාර්තාවල සහ ජීවග ණකඥ වාර්තාවල ආකෘති ඉදිරිපත් කිරීම සඳහා මණ්ඩලයට අවසර දී ඇත.

**පනතේ 96අ වගන්තිය යටතේ නිකුත් කළ විධාන**

**2013 දෙසැම්බර් 31 දිනැති අංක 3 (iii) දරන විධානයට කළ සංශෝධනය - 2014 සැප්තැම්බර් 24 දිනැති අංක 3 (අ) දරන විධානය රක්ෂකයින්ගේ පොදු ප්‍රධාන නිලධාරියා සහ පොදු නිශ්චිත නිලධාරියා**

2013 දෙසැම්බර් 31 දිනැති අංක 3 (iii) දරන විධානයට අනුව, 2014 ජුනි 30 වන විට රක්ෂකයින් විසින් වෙනත් රක්ෂකයෙක් විසින් පත් කර නොමැති වෙනම ප්‍රධාන නිලධාරියෙක් සහ නිරූපිත නිලධාරියෙක් සමාගම වෙනුවෙන් පත් කිරීමට අවශ්‍ය වේ.

කෙසේවුව ද, දක්වා ඇති කාල සීමාව ඇතුලත සුදුසු තැනැත්තන් සොයා ගැනීමට ඇතැම් රක්ෂකයින් මුහුණ දුන් දුෂ්කරතා මණ්ඩලය විසින් නිරීක්ෂණය කළ පසු එසේ අනුකූලතා දැක්විය යුතු දිනය දීර්ඝ කිරීමට තිරණය කර ඇත. ඒ අනුව අනුකූලතා දිනය 2014 දෙසැම්බර් 31 වන තෙක් දීර්ඝ කිරීම සඳහා අංක 3 (අ) දරන සංශෝධිත විධානය 2014 සැප්තැම්බර් 24 දින නිකුත් කරන ලදී.

**2014 ජනවාරි මස 02 වැනි දිනැති අංක 4 දරන විධානය - පොදු යටිතලපහසුකම් භාවිතය**

මණ්ඩලය විසින් සංයුක්ත රක්ෂණ සමාගම්වල වෙන්කිරීමේ අවශ්‍යතාවට පසුව 2014 ජනවාරි මස 2 වැනි දිනැති අංක 4 දරන විධානය නිකුත් කර ඇත. මේ විධානය මගින් 'පොදු යටිතලපහසුකම් භාවිතය' සඳහා වූ මාර්ගෝපදේශ දක්වා ඇත.

දැනටමත් පවතින පොදු යටිතලපහසුකම් වෙනත් රක්ෂකයෙක් සමඟ භාවිතා කිරීමේ දී රක්ෂකයෙක් විසින් පිළිපැදිය යුතු අවශ්‍යතා ඉහත සඳහන් කළ විධානයෙන් දක්වයි.

**(තනි පුද්ගලයින් හැරුණු කොට) රක්ෂණ නියෝජිතයින්ගේ සේවා ලබා ගන්නා සියලුම රක්ෂකයින්ට සහ රක්ෂණ තැරැව්කරුවන්ට නිකුත් කළ 2014 නොවැම්බර් මස 18 වැනි දිනැති අංක 5 දරන විධානය**

මණ්ඩලය විසින් 2014 මැයි 10 දිනැති අංක 1861/45 දරන ගැසට්පත්‍රයේ පළ කළ 2014 අංක 01 දරන රීතිය යටතේ ලියාපදිංචි (තනි පුද්ගලයින් හැරුණු කොට) රක්ෂණ නියෝජිතයින්ගේ සේවා ලබා ගන්නා රක්ෂකයින් සහ රක්ෂණ තැරැව්කරුවන් වෙත අංක 5 දරන විධානය නිකුත් කර ඇත. එකී විධානයට අනුව (තනි පුද්ගලයින් හැරුණු කොට) රක්ෂණ නියෝජිතයින්ගේ සේවා ලබා ගන්නා රක්ෂකයින් සහ රක්ෂණ තැරැව්කරුවන් එකී රක්ෂණ නියෝජිතයින් සමඟ ලිඛිත නියෝජිතායතන ගිවිසුම්වලට එළැඹිය යුතු වන අතර එහි පාර්ශ්ව දෙකේම බැඳීම් පැහැදිලිව නිර්වචනය කර තිබිය යුතුය. එමෙන්ම ලිඛිත නියෝජිතායතන ගිවිසුම්වල ඇතුලත් කළ යුතු නිශ්චිත නියම හා කොන්දේසි කීපයක් ද විධානයෙන් දක්වයි.

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

**චක්‍රලේඛ**

**2014 ජුනි 10 දිනැති අංක 34 දරන චක්‍රලේඛය - රක්ෂණ නියෝජිතයින්ගේ රෙජිස්ටරය (තනි පුද්ගලයින් සඳහා නොවන)**

පනතේ 78 (1) වගන්තිය යටතේ අවශ්‍යතාවන් සලකා බැලීමෙන් අනතුරුව මණ්ඩලය විසින් සියලුම රක්ෂණ සමාගම් සහ රක්ෂණ තැරැව්කරුවන්, රක්ෂණ නියෝජිතයින් (තනි පුද්ගලයින් සඳහා නොවන) වෙනුවෙන් වෙනම රෙජිස්ටරයක් එක් චක්‍රලේඛයෙන් ඉදිරිපත් කර ඇති කෙටුම්පත් ආකෘතියට අනුකූලව පවත්වාගෙන යායුතු බවට නියම කරමින් අංක 34 දරන චක්‍රලේඛය නිකුත් කර ඇත.

**2014 ඔක්තෝබර් 17දිනැති අංක 35 දරන චක්‍රලේඛය - තක්සේරුකරුවන් සඳහා සුදුසුකම් නිර්ණායක - 2013 මාර්තු 14 දිනැති අංක 30 දරන චක්‍රලේඛයට සංශෝධනය**

මණ්ඩලය, කර්මාන්තයෙන් ලැබූ ඉල්ලීම සලකා බලමින් තක්සේරුකරුවන් සඳහා වූ සුදුසුකම් නිර්ණායකයට උපාධිධාරී සාමාජිකයින් ඇතුලත් කිරීම සඳහා 2013 මාර්තු 14 දිනැති අංක 30 දරන චක්‍රලේඛය සංශෝධනය කිරීමට අනුමැතිය ප්‍රදානය කර ඇත. එබැවින්, එකී අංක 30 දරන චක්‍රලේඛයේ අ ඡේදයට කළ සංශෝධනයට අනුව තක්සේරුකරු වෘත්තීයේ වසර 15ක පශ්චාත් සුදුසුකම්ලාභී අත්දැකීම් ඇති ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතනයේ උපාධිධාරී සාමාජිකයෙක් ද තක්සේරුකරුවෙක්ගේ සුදුසුකම් නිර්ණායකයට ඇතුලත් කර ඇත.

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

## විමර්ශන සමාලෝචනය

ඔප්පුහිමියන්ගේ සුභසිද්ධිය ආරක්ෂා කිරීමේ සමස්ත පරමාර්ථය යටතේ රක්ෂණ වන්දි හිමිකම්පාන්නන් විසින් මණ්ඩලය වෙත යොමුකරනු ලබන, රක්ෂණ වන්දි ගෙවීම් සම්බන්ධයෙන් හිමිකම්පාන්නන් හා රක්ෂකයන් අතර හටගන්නා ආරවුල් සම්බන්ධයෙන් විමර්ශනය කිරීමට සහ ඒවා නිරාකරණය කිරීමට මණ්ඩලයට බලතල ඇත. පනතේ 98 වෙනි වගන්තිය ප්‍රකාරව, මණ්ඩලය වෙත යොමු කළ රක්ෂණ වන්දි ගෙවීම සම්බන්ධ ආරවුලක් පිළිබඳව නියෝගයක් නිකුත් කිරීමට පෙර, අදාළ සියලු පාර්ශවයන්ට ඇහුම්කන් දීමේ අවස්ථාවක් දෙනු ලැබේ. එමෙන්ම, කිසියම් රක්ෂකයෙක්, තැරැව්කරුවෙක් හෝ නියෝජිතයෙක්ගේ විෂමාචාරයක් හෝ අක්‍රමිකතාවක් පිළිබඳ පැමිණිලිද මණ්ඩලය විසින් විමර්ශනය කරනු ලබයි.


මණ්ඩලය වෙත යොමු කළ පැමිණිල්ලක් සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කරනු ලබන විට, ඒ සම්බන්ධයෙන් තම ස්ථාවරය, අදාළ තොරතුරු සහ ලියකියවිලි මගින් තහවුරු කළ යුතු වේ. අවශ්‍ය පරිදි, තුන්වන පාර්ශවීය සහතික කර ගැනීම් සහ විද්වත් මත විමසීම්ද මණ්ඩලය සිදු කරයි.

### 2014 වසර තුළදී යොමු කළ සහ විමර්ශන අවසන් කළ පැමිණිලි

2014 වසර තුළදී මණ්ඩලය වෙත නව පැමිණිලි 284 ක් ලැබුණු අතර, වසර තුළදී මුළු පැමිණිලි 230 ක් සම්බන්ධ විමර්ශන අවසන්කරන ලදී. විමර්ශන අවසන් කරන ලද පැමිණිලි අතුරින්, මණ්ඩලය මැදිහත්වීම මත හිමිකම්පෑම් 38 ක් රක්ෂකයින් විසින් ගෙවීමට කටයුතු යොදන ලදී. මණ්ඩලයේ මැදිහත්වීම මත 2014 වසර තුළදී ගෙවන ලද හිමිකම්පෑම්වල මුළු වටිනාකම රු. මිලියන 33.6 ක් පමණ වේ (නිරවුල් කිරීමේ අගයන් වාර්තා වී තිබෙන පැමිණිලි 28 ක් සම්බන්ධයෙන් පමණි).

**රූපසටහන 1:**

***පසුගිය වසර පහ (5) තුළ මණ්ඩලයට ලැබුණු පැමිණිලි***





පසුගිය වසර පහ (5)ක කාලය තුළ මණ්ඩලය වෙත යොමු කෙරුනු මුළු පැමිණිලි සංඛ්‍යාව 1283 කි. 1 වැනි රූපසටහන අනුව, 2013 වසර හා සැසඳීමේදී 2014 වසරේ සුළු අඩුවීමක් දක්නට ලැබුනද, 2010 වසරේ සිට වාර්ෂිකව යොමු කළ පැමිණිලි සංඛ්‍යාවේ ක්‍රමානුකූල වර්ධනයක් තිබේ.

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය


**රූපසටහන 2:**

*2014 වසර තුළදී මණ්ඩලය වෙත ලැබුණු පැමිණිලි පිළිබඳ විශ්ලේෂණය - මාසිකව*




**රූපසටහන 3:**

*2014 වසරේදී යොමු කළ මුළු පැමිණිලි වර්ගීකරණය*




2014 වසර තුළ මාසිකව මණ්ඩලය වෙත ලැබුණු පැමිණිලි පිළිබඳ විස්තරයක් ඉහත 2 වැනි රූපසටහන මගින් දැක්වේ. ජනවාරි සහ මාර්තු මාසවල වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් (මසකට පැමිණිලි 34ක් බැගින්) ලැබී ඇති අතර අඩුම පැමිණිලි සංඛ්‍යාවක් (14 ක්) ලැබී ඇත්තේ දෙසැම්බර් මාසයේදීය. වසරේ අවසාන භාගය වන විට මාසිකව ලැබී ඇති පැමිණිලි ගණන අඩු වී ඇත.

2014 වසරේදී යොමුකළ මුළු පැමිණිලිවල වර්ගීකරණයක් 3 වැනි රූපසටහනෙන් දක්වා ඇත. ඒ අනුව, වසර තුළදී යොමු වූ මුළු පැමිණිලි වලින් 148 ක් (52%) ක් සහ 113 ක් (40%) පිළිවෙලින් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය සහ දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය සම්බන්ධයෙන් විය.

සාමාන්‍ය හෝ දීර්ඝ කාලීන ලෙස වර්ගීකරණය කල නොහැකි (උදා : නියෝජිතයන්ගේ සුදුසුකම් පිළිබඳ) පැමිණිලි 23 ක් (8%) ද වසර තුළ මණ්ඩලය වෙත යොමු විය.

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

### දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය පිළිබඳ පැමිණිලි

පහත 1 වැනි වගුවෙන් දක්වා ඇති විශ්ලේෂණය අනුව, රක්ෂකයින් විසින් (දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයක් සම්බන්ධයෙන්) හිමිකම් ගෙවීම ප්‍රතික්ෂේප කිරීම පැමිණිලි වැඩිම සංඛ්‍යාවක් ලැබී ඇති ගැටළුව වේ. ඔප්පුව ආරම්භයේ දී වැදගත් කරුණු හෙළිදරව් නොකිරීම, හිමිකම් ප්‍රතික්ෂේප වීම සඳහා බොහෝවිට හේතු වී තිබේ. අදාළ පැමිණිලි සම්බන්ධයෙන් විමර්ශනය කිරීමෙන් පසුව, එවැනි හෙළිදරව් නොකිරීම් චේතාන්විතව හෝ වංචාකාරී ලෙස සිදු කර නොමැති බවට හෙළිදරව් වූ අවස්ථාවල දී අදාළ හිමිකම්පාන්නන් හට සහායවීමට මණ්ඩලයට හැකි විය. තොරතුරු හෙළිදරව් නොකිරීමේ පදනම මත හිමිකම් ප්‍රතික්ෂේපවීම වැළැක්වීම පිණිස, (රක්ෂණ යෝජනාව සහ අය කරනු ලබන වාරික ආදායම පිළිගන්නේ ද යන්න තීරණය කිරීම සඳහා රක්ෂකයින්ට අවශ්‍ය කරන) වැදගත් සියලුම තොරතුරු යෝජනා අදියරේ දී හෙළිදරව් කිරීමේ වැදගත්කම පිළිබඳව දැනුවත්භාවය ප්‍රවර්ධනය කිරීමට මණ්ඩලය කටයුතු කරනු ඇත.

**වගුව 1**

***දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය පිළිබඳ පැමිණිලි: ගැටළුව අනුව***

| ගැටළුව | # | % |
|---|---|---|
| හිමිකම් ගෙවීම ප්‍රතික්ෂේප කිරීම | 29 | 25.66 |
| ඔප්පු අවලංගු කිරීම/පුනස්ථාපනය හෝ ගෙවූ මුදල් ආපසු ලබා ගැනීම | 24 | 21.24 |
| වාරික ගෙවීම හෝ අවභාවිතය | 24 | 21.24 |
| කල්පිරීමේ / පවාරණ වටිනාකම | 15 | 13.28 |
| තොරතුරු සැපයීම් | 12 | 10.62 |
| ගෙවූ හිමිකම ප්‍රමාණවත් නොවීම | 8 | 7.08 |
| වෙනත් | 1 | 0.88 |
| **එකතුව** | **113** | **100** |

(දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය සම්බන්ධයෙන්) යොමු කරනු ලැබූ පැමිණිලි වලින් 21% ක් පමණ ඔප්පු අවලංගු කිරීම හෝ පුනස්ථාපනය කිරීම සම්බන්ධ ඒවා විය. ඔප්පුවක් අවලංගු කළ හැකි කාලපරිච්ඡේදය පිළිබඳව නොදැන සිටීම සහ හදිසි මූල්‍ය අවශ්‍යතා හේතුවෙන් රක්ෂණ ඔප්පුව අවලංගු කර ගෙවූ වාරික මුදල් ආපසු ලබා ගැනීමට අවශ්‍ය වීම මෙම පැමිණිලි වලට හේතු විය. කෙසේවුවද, (රක්ෂණ ඔප්පුවේ නියමයන් හා කොන්දේසි අනුව) ගෙවූ වාරික ආපසු ලබාගැනීම සඳහා ඔප්පු හිමියන්හට අයිතිවාසිකමක් නොමැති අවස්ථාවල දී ඔවුන්ට උපකාර කිරීමට මණ්ඩලයට නොහැකි විය. ඔප්පුව අවලංගු කළ හැකි කාලපරිච්ඡේදය සහ පවාරණ වටිනාකම ලබා ගැනීම සඳහා සපුරාලිය යුතු අවශ්‍යතා පිළිබඳව නොදැනුවත්භාවය එවැනි ගැටළු සඳහා ප්‍රධාන හේතු වී ඇත.


වාරික ගෙවීමට අදාළ පැමිණිලි ද 21% ක් විය. වාරික ගෙවන ලද බව ලිඛිත සාක්ෂි මගින් ඔප්පු කළ හැකි වූ අවස්ථාවලදී මණ්ඩලයට අදාළ පැමිණිලිකරුවන්ට සහන සැලසීමට හැකි විය. කෙසේවුව ද, (රක්ෂකයාට සෘජුවම ගෙවීම් නොකරන අවස්ථාවල දී) වාරික ගෙවීම් සඳහා ලදුපත් නිකුත් නොකිරීම සහ නිකුත් කිරීමට ප්‍රමාදවීම සම්බන්ධයෙන් රක්ෂණ සමාගම් සමඟ සාකච්ඡා කළ අතර මේ වන විට ඒ සම්බන්ධයෙන් ගත හැකි විකල්ප ක්‍රියාමාර්ග සලකා බැලෙමින් පවතී. පැමිණිලි වලින් 13% ක් ඔප්පු කල්පිරීම හෝ පවාරණ වටිනාකම් ගණනය කිරීම සම්බන්ධයෙන් අපැහැදිලිවීම හෝ ප්‍රමාණවත් පැහැදිලි කිරීම් නොමැතිවීම පිළිබඳව විය. පූර්ව-අලෙවි ක්‍රියාවලියේ දී නොමඟයවන සුළු තොරතුරු සැපයීම හෝ තොරතුරු ලබා නොදීම සම්බන්ධයෙන් ඉදිරිපත් කළ පැමිණිලි 12 ක් මණ්ඩලයට ලැබුනි.

### සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය පිළිබඳ පැමිණිලි

රක්ෂණ ව්‍යාපාරය පදනම්ව සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය පිළිබඳ කරුණු විශ්ලේෂණය 4 වැනි රූපසටහනෙන් ඉදිරිපත් කර ඇත. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය සම්බන්ධයෙන් යොමු කළ පැමිණිලිවලින් බහුතරය එනම් පැමිණිලි 112ක් (75%) රථවාහන රක්ෂණ ආවරණ පිළිබඳව විය. එවැනි පැමිණිලි වසර තුළ මණ්ඩලයට ඉදිරිපත් කළ මුළු පැමිණිලි අතරින් 40%ක් පමණ විය. ගිනි සහ විවිධ කාණ්ඩ සම්බන්ධ පැමිණිලි වෙනවෙනම මුළු සංඛ්‍යාවෙන් 11% ක් පමණ විය. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය සම්බන්ධයෙන් යොමු කළ පැමිණිලි, ගැටළු අනුව විශ්ලේෂණය 2 වැනි වගුවේ පෙන්වා ඇත.

**රූපසටහන 4:**

***සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය පිළිබඳ පැමිණිලි: රක්ෂණ වර්ගය අනුව***



# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

**වගුව 2**

*සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය පිළිබඳව පැමිණිලි: ගැටළුව අනුව*

| ගැටළුව | # | % |
|---|---|---|
| හිමිකම් ගෙවීම ප්‍රතික්ෂේප කිරීම | 99 | 66.89 |
| ගෙවූ හිමිකම ප්‍රමාණවත් නොවීම | 20 | 13.51 |
| හිමිකම් ගෙවීම ප්‍රමාදවීම | 15 | 10.14 |
| වෙනත් | 14 | 9.46 |
| **එකතුව** | **148** | **100** |

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය සම්බන්ධයෙන් යොමු කළ පැමිණිලි සඳහා ප්‍රධාන හේතුව (67%) හිමිකම ගෙවීම ප්‍රතික්ෂේප කිරීම විය. රක්ෂකයින් ඉදිරිපත් කළ තොරතුරු අනුව, බැහැර කළ භාවිතය, රියැදුරු ආදේශ කිරීම සහ හිමිකම්පෑමේ ක්‍රියාවලියට අනුකූල නොවීම. හිමිකම් ප්‍රතික්ෂේපවීම සඳහා බොහෝ සේ බලපා ඇත. හිමිකම්පෑම් ගෙවීම එසේ ප්‍රමාදවීම සම්බන්ධයෙන් යොමු කළ පැමිණිලි (15ක්) අතුරින් බහුතරය මණ්ඩලයට යොමු කිරීමෙන් අනතුරුව නිරාකරණය කරනු ලැබීය.

හිමිකම් ප්‍රතික්ෂේප කිරීම සඳහා හේතු පිළිබඳව සහ රක්ෂකයින්ගේ තීරණය සම්බන්ධයෙන් සෑහීමකට පත් නොවන්නේ නම් ගත හැකි විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳව හිමිකම්පාන්නන්ව යම් අවස්ථාවන්හිදී නිසි ලෙස දැනුවත් කර නොමැති බව මණ්ඩලයට යොමු කළ පැමිණිලි මගින් පෙනී යයි. රක්ෂකයින් විසින් මේ සම්බන්ධයෙන් ගතයුතු පියවර, පාරිභෝගික පැමිණිලි නිරාකරණය සම්බන්ධයෙන් නිකුත් කිරීමට නියමිත මාර්ගෝපදේශයන්හි ඇතුලත් කෙරෙනු ඇත.

**වෙනත් කටයුතු**

- *රක්ෂණ නියෝජිතයන්ට අදාල කරුණු පිළිබඳ ඒකාබද්ධ කමිටුව*
  රක්ෂණ නියෝජිතයන්ට අදාල කරුණු විමසා බලා අවශ්‍ය පියවර ගැනීමට, මණ්ඩලයේ, ශ්‍රී ලංකා රක්ෂකයන්ගේ සංගමයේ, ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමයේ සහ ශ්‍රී ලංකා රක්ෂණ ආයතනයේ සාමාජිකත්වයෙන් ඒකාබද්ධ කමිටුවක් පත් කර ඇත. මණ්ඩලය විසින් කමිටුවේ රැස්වීම් සම්බන්ධීකරණය කරන ලදී. වසර තුළ දී 'නියෝජිතයන්ගේ සේවය අවසන් කිරීමේ සහ දුක්ගැනවිලි පිළිබඳ කටයුතු කිරීමේ ක්‍රමවේදය' සහ 'නියෝජිතයන් සඳහා අචාර ධර්ම පද්ධතිය' කෙටුම්පත් කිරීමට කමිටුවට හැකි විය. මීට අමතරව, 'නියෝජිතයන්ගේ තොරතුරු ඇතුලත් දත්ත ගබඩාවක් පවත්වාගෙන යාම' සහ 'වාරික මුදල් අයුතු ලෙස භාවිතා කිරීම' ආදී තවත් කරුණු ගණනාවක් කමිටුව මගින් සාකච්ඡා කොට ඒ සම්බන්ධයෙන් නිසි පියවර ගන්නා ලදී.

- *පැමිණිලි නිරාකරණය කිරීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම*
  මණ්ඩලය විසින් සකස් කරන ලද පැමිණිලි නිරාකරණය කිරීමේ ලිඛිත අභ්‍යන්තර ක්‍රමවේදය වසර තුළ දී ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදී. මණ්ඩලයට ලැබෙන පැමිණිලි නිරාකරණය කිරීම ස්ථායී සහ පාරදෘෂ්‍ය කිරීම එවැනි ක්‍රමවේදයක් සකස් කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ අරමුණ වී ඇත.

- *රක්ෂණ හර මූලධර්ම යොදා ගැනීම (ICP 19: ව්‍යාපාර පවත්වාගෙනයාම)*
  රක්ෂණ අධීක්ෂකයින්ගේ ජාත්‍යන්තර සංවිධානය (International Association of Insurance Supervisors - IAIS) මගින් සකස් කරන ලදී. රක්ෂණ හාර මූලධර්ම (Insurance Core Principles - ICP) මගින් රක්ෂණ අංශයේ නියාමනය හා අධීක්ෂණය සඳහා වූ ගෝලීය වශයෙන් පිළිගත් රාමුවක් සපයයි. ව්‍යාපාර පවත්වාගෙන යාම පිළිබඳ ICP 19 මූලධර්මය මගින් ගනුදෙනුකරුවන්ට සාධාරණ ලෙස සැලකීම පූර්ව-අලෙවි ක්‍රියාවලිය සහ ඔප්පුහිමියන්ට සේවා සැපයීම ආදිය ආවරණය වන ප්‍රතිඵල-ඉලක්ක කරගත් අවශ්‍යතා පනවා ඇත. ICP 19 මූලධර්මය ශ්‍රී ලාංකික රක්ෂණ කර්මාන්තයට අදාළ කර ගැනීමේ දී තිබෙන පරතරයන් හඳුනා ගැනීම සඳහා මණ්ඩලය විසින් අවශ්‍ය කටයුතු ආරම්භ කරන ලදී.

- *විමර්ශකයන්ගේ චර්යාව*
  සැක සහගත රක්ෂණ හිමිකම්පෑම් වලදී තම වගකීම තහවුරු කර ගැනීම සඳහා, අභ්‍යන්තර මෙන්ම ස්වාධීන විමර්ශකයන්ගේ සහය ඇතිව රක්ෂකයන් විසින් විමර්ශන පවත්වනු ලබයි. එසේ විමර්ශන පැවැත්වීමේ දී විමර්ශකයන් විසින් අනුමත කළ නොහැකි ඇතැම් චර්යාවන් අනුගමනය කරනු ලබන බව හඳුනාගෙන ඇත. උදා : අනන්‍යතාවය හෙළි නොකිරීම සහ ප්‍රකාශ ලබා දෙන්නන් බිය ගැන්වීම. රක්ෂණ සමාගම්වල අදහස්ද සැලකිල්ලට ගෙන විමර්ශකයන්ගේ මෙම හැසිරීම් නියාමනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු ආරම්භ කරන ලදී.

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

## වෙළඳපොළ සංවර්ධනය සහ බාහිර සබඳතා සමාලෝචනය

අධීක්ෂණය හා නියාමනය කිරීමට අමතරව රක්ෂණ කර්මාන්තය සංවර්ධනය කිරීම ද මණ්ඩලයේ විෂය පථයට අයත් වේ. කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා රක්ෂණය පිළිබඳ ජනතාවගේ දැනුවත්භාවය හා විශ්වාසය ප්‍රවර්ධනය කිරීම අවශ්‍ය වේ. දීර්ඝ කාලීන මෙන්ම සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයන්හි සාපේක්ෂ වශයෙන් ගත් කළ ඇති අඩු ව්‍යාප්ති මට්ටම්වලින්, රක්ෂණයේ වැදගත්කම සහ රක්ෂණ ආවරණයක් ලබා ගැනීමේ දී සැලකිලිමත්විය යුතු කරුණු පිළිබඳව මහජනතාවගේ දැනුවත්භාවය ප්‍රවර්ධනය කිරීමේ වැදගත්කම පෙන්නුම් කරයි. කර්මාන්තයේ ප්‍රධාන පාර්ශ්වකරුවන් වශයෙන්, වත්මන් සහ අනාගත ඔප්පු හිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිණිසත් රක්ෂණ ගිවිසුමකට එළැඹීමේ දී දැනුවත්භාවයෙන් යුතුව තීරණ ගැනීමට හැකි තත්ත්වයකට ගෙනඒම පිණිසත් ඔවුන්ව දැනුමෙන් බලගැන්වීම අවශ්‍ය වේ.

මණ්ඩලය විසින් මහජනතාව දැනුවත් කිරීමේ දී සෘජු මෙන්ම වක්‍ර සන්නිවේදන ක්‍රමවේදයන් උපයෝගී කර ගනී. සමාලෝචිත වසර තුළ දී උපයෝගී කර ගත් සන්නිවේදන ක්‍රමවේද සහ සිදු කරන ලද ක්‍රියාකාරකම්වල විස්තර පහතින් දැක්වේ.

### දැනුවත් කිරීමේ වැඩසටහන්

මහජනතාව සමඟ නිතර කටයුතු කරන ග්‍රාම නිලධාරීන් සහ ක්ෂේත්‍ර නිලධාරීන් වැනි ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්ත රාජ්‍ය නිලධාරීන්ගේ දැනුවත්භාවය වර්ධනය කිරීම හරහා මහජනතාව අතර දැනුවත්භාවය ප්‍රවර්ධනය කිරීම පිණිස (අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමඟ සහයෝගීතාව ඇතිව) මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. සහභාගීවූවන් විසින් ඉදිරිපත් කළ රක්ෂණය හා සම්බන්ධ විවිධ ගැටළු ද මෙම වැඩසටහන් වලදී සාකච්ඡා කරන ලදී. සමාලෝචිත කාලපරිච්ඡේදයේ දී බස්නාහිර, සබරගමුව, මධ්‍යම, ඌව, දකුණ, වයඹ සහ උතුරු මැද යන පළාත්වලින් තෝරා ගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල දී මණ්ඩලය විසින් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

කොළඹ සහ මහනුවර යන දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලදී දැනුවත් කිරීමේ වැඩසටහන් දෙකක් (2) ද, තිඹිරිගස්යාය, පුත්තලම, ගම්පහ, හිගුරක්ගොඩ, රඹුක්කන, බද්දේගම, රත්නපුරය සහ සියඹලාණ්ඩුව යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලද දැනුවත් කිරීමේ වැඩසටහන් අටක් (8) ද පවත්වන ලදී. 2014 වසර තුළ දී පැවැත් වූ වැඩසටහන් සඳහා ආසන්න වශයෙන් ග්‍රාම නිලධාරී කොට්ඨාස 456 ක් ආවරණය කරන ලද අතර නිලධාරීන් 1,100ක් පමණ සහභාගී වී ඇත.





### ප්‍රදර්ශනවලට සහභාගීවීම

අඛණ්ඩව අටවැනි වරටත් 2014 පෙබරවාරි 21 වැනි දින සිට මාර්තු 01 වැනි දින දක්වා කුලියාපිටියේ වයඹ විශ්වවිද්‍යාල පරිශ්‍රයේ පැවති "දැයට කිරුළ" ජාතික ප්‍රදර්ශනයට මණ්ඩලය සහභාගී විය. ප්‍රදර්ශන කුටිය ආසන්න වශයෙන් 3,000ක පමණ පිරිසක් ආකර්ශණය කර ගත් අතර එයින් බහුතරය පාසැල් හා විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් විය. ප්‍රදර්ශනයට සහභාගීවීම මගින් මණ්ඩලයේ නිලධාරීන් හමුවී රක්ෂණය

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

ආශ්‍රිත තොරතුරු හා පැහැදිලිකර ගැනීම් ලබා ගැනීමට මහජනතාවට අවස්ථාවක් උදා විය. මණ්ඩලයේ කාර්යභාරය, රක්ෂණ කර්මාන්තයේ ව්‍යුහය හා නෛතික/ නියාමන රාමුව පිළිබඳව ප්‍රදර්ශන කුටියට පිවිසි සියලුම දෙනාව දැනුවත් කරන ලදී.




**විද්‍යුත් මාධ්‍ය හරහා දැනුවත් කිරීම**

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව මගින් 2014 අගෝස්තු මස 13 වැනි දින විකාශනය කළ "ව්‍යාපාරික ලෝකය" රූපවාහිනී පුවත් වැඩසටහනට මණ්ඩලය සහභාගී විය. මුදල් හා පරිපාලන අධ්‍යක්ෂ මෙහි දී මණ්ඩලය නියෝජනය කළ අතර "මණ්ඩලයේ කාර්ය භාරය හා රක්ෂණය පිළිබඳ වැදගත් තොරතුරු" පිළිබඳව ප්‍රේක්ෂකයින් දැනුවත් කරන ලදී.

**මුද්‍රිත මාධ්‍ය හරහා දැනුවත් කිරීම**

සමාලෝචිත වසර ඇතුලත මණ්ඩලය විසින් පහත දැක්වෙන ලිපි, පුවත්පත් දැන්වීම් සහ පුවත්පත් නිවේදන ප්‍රකාශයට පත් කළේය.

**පුවත්පත් නිවේදන**

- ''2013 වසරේ දී රක්ෂණ කර්මාන්තයේ කාර්යසාධනය" පිළිබඳ පුවත්පත් නිවේදනය - 2014 ජුනි මාසයේ දී පළ කරන ලදී.
- ''2014 වසරේ පළමු අර්ධය ඇතුලත රක්ෂණ කර්මාන්තයේ කාර්යසාධනය" පිළිබඳ පුවත්පත් නිවේදනය - 2014 දෙසැම්බර් මාසයේ දී පළ කරන ලදී.
- මණ්ඩලය විසින් සංවිධානය කළ ''ක්ෂුද්‍ර රක්ෂණ වැඩමුළුව" පිළිබඳ පුවත්පත් නිවේදනය - 2014 මැයි මස පළ කරන ලදී.

**පුවත්පත් දැන්වීම්**

- සියළුම ලියාපදිංචි රක්ෂණ සමාගම් සහ රක්ෂණ තැරැව්කාර සමාගම් පිළිබඳව දැනුවත් කරමින් "සුපරීක්ෂාකාරීව කටයුතු කළහොත් පසුතැවීමට සිදුනොවේ" යන මාතෘකාව යටතේ 2014 මාර්තු මාසයේ දී භාෂා තුනෙන්ම පුවත්පත් දැන්වීමක් පළ කරන ලදී.

**පුවත්පත් ලිපි**

- ''ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර රක්ෂණය: කොයිබට ද?" යන්න මැයින් ලිපියක් - 2014 ජූලි මස පළ කරන ලදී.

**ප්‍රකාශන**

මණ්ඩලය විසින් මුද්‍රණය කරන ලද පහත දැක්වෙන ප්‍රකාශන ප්‍රධාන වශයෙන් දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනයේ දී සහ දැනුවත් කිරීමේ වැඩසටහන්වල දී බෙදා හරින ලදී.

**පෝස්ටර**

රක්ෂණය පිළිබඳ අධ්‍යාපනික කරුණු ඇතුලත් භාෂා තුනෙන්ම වූ පෝස්ටර මුද්‍රණය කර මණ්ඩලය විසින් පැවැත් වූ දැනුවත් කිරීමේ වැඩසටහන්වල දී බෙදා හරින ලදී. සාමාන්‍ය ජනතාවගේ දැනුවත්භාවය පිණිස එම ග්‍රාම නිලධාරී කාර්යාලවල ප්‍රදර්ශනය කිරීම පිණිස ද බෙදා හරින ලදී.

**අත්පත්‍රිකා**

වසර තුළ දී පහත දැක්වෙන මාතෘකා යටතේ අත්පත්‍රිකා මුද්‍රණය කර බෙදාහරිනු ලැබීය:

- "රක්ෂණය - ඔබ දන්නේ ද?"
- "සැලකිය යුතු කරුණු"
- "රක්ෂණ යෝජනා පත්‍ර"
- "රක්ෂණ සමාගම්වල ලැයිස්තුව"
- "රක්ෂණයේ වැදගත්කම"
- "ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය"

ඉහත ප්‍රකාශන මණ්ඩලයේ නිල වෙබ් අඩවිය වන www.ibsl.gov.lk ඔස්සේ කියවීමටත් බාගත කර ගැනීමටත් හැකියාව ඇත.

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

**අනෙකුත් කටයුතු**

- *රක්ෂණ නිෂ්පාදිතයන්ගේ අඩුපාඩු විශ්ලේෂණය*
  රක්ෂකයින් නිකුත් කළ තෝරා ගත් සෞඛ්‍ය රක්ෂණ ඔප්පු මණ්ඩලය විසින් පරීක්ෂා කළ අතර ඒවායේ සිදුකළ යුතු වැඩිදියුණු කිරීම් හඳුනා ගන්නා ලදී.

- *ක්ෂුද්‍ර-රක්ෂණය පිළිබඳ වැඩමුළුව*
  ජාත්‍යන්තරය හා සැසඳීමේ දී රක්ෂණ කර්මාන්තයේ පවත්නා අඩු ව්‍යාප්ති මට්ටම සැලකිල්ලට ගනිමින් රක්ෂණයට ප්‍රවේශ වීම සඳහා පහසුකම් සැලසීම පිණිස, මණ්ඩලය විසින් 2014 මැයි මාසයේ දී "ශ්‍රී ලංකාව තුළ ක්ෂුද්‍ර රක්ෂණය ප්‍රවර්ධනය කිරීම" යන තේමාව යටතේ ක්ෂුද්‍ර රක්ෂණය පිළිබඳ වැඩමුළුවක් සංවිධානය කරන ලදී.



- *මහජන තොරතුරු විමසීම්*
  සමාලෝචිත වර්ෂය තුළ දී මණ්ඩලය රක්ෂණය පිළිබඳව ජනතාවගෙන්, ඔප්පු හිමියන්ගෙන් සහ අනෙකුත් උනන්දුවක් දක්වන පාර්ශව වලින් ඉදිරිපත් වූ විවිධ විමසීම් සඳහා ප්‍රතිචාර දක්වන ලදී.

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

## පරිපාලනමය සමාලෝචනය

### මානව සම්පත්

ඕනෑම සංවිධානයක සාර්ථකත්වය විශාල වශයෙන්ම රැඳී තිබෙන්නේ එහි ක්‍රියාකාරීත්වයට හවුල් වන්නා වූ පුද්ගලයින්ගේ විශේෂඥ ඥානය මතය. මණ්ඩලයේ සාර්ථක උපක්‍රමවල කශේරුව (කොඳුනාරටිය) වන්නේ අපගේ මානව සම්පත් බැවි අප විශ්වාස කරන්නේ එබැවිනි.

ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය සියළුම රක්ෂණ සහතික දරන්නන්ගේ සහ අනාගත රක්ෂණ සහතික දරන්නන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ අරමුණින් ක්‍රියාත්මක විය යුතුය යන අභිප්‍රාය සාක්ෂාත් කර ගැනීම උදෙසා අවශ්‍ය යුතුකම් සහ කාර්යභාරය හඳුනා ගැනීම තුළින් මණ්ඩලය සිය සංවිධාන ව්‍යුහය ස්ථාපනය කර ඇත.

අපේක්ෂිත වෘත්තීකයින් නිසි කලට බඳවා ගැනීම තුළින් මානව සම්පත් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය පියවර මේ වසර තුළදී මණ්ඩලය විසින් ගන්නා ලදී. මෙම පියවර සාක්ෂාත් කර ගැනීම උදෙසා සමාලෝචිත වසර තුළ දී එක් අධ්‍යක්ෂවරයෙක්, විධායක නිලධාරීන් දෙදෙනෙක් ස්ථිර කාර්ය මණ්ඩලයට බඳවා ගන්නා ලදී. 2014 දෙසැම්බර් 31 වන දිනට කාර්ය මණ්ඩලය හතලිස් එකක් විය.

කාර්ය මණ්ඩලයේ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් පහත වගුවෙන් දැක්වේ.

| නිළධාරීන් සංඛ්‍යාව | අධ්‍යාපනික / වෘත්තීය සුදුසුකම් | | | | | |
|---|---|---|---|---|---|---|
| | පශ්චාත් උපාධිය ප්‍රථම උපාධිය හා වෘත්තීය සුදුසුකම් | පශ්චාත් උපාධිය හා වෘත්තීය සුදුසුකම් | පශ්චාත් උපාධිය හා ප්‍රථම උපාධිය | ප්‍රථම උපාධිය හා වෘත්තීය සුදුසුකම් | ප්‍රථම උපාධිය | වෘත්තීය සුදුසුකම් |
| 41 | 03 | 02 | 02 | 11 | 08 | 04 |

### පුහුණු කිරීම්

ආයතනික අරමුණු සහ කාර්යසාධනය වර්ධනය කර ගැනීම උදෙසා දැනුම සහ වෘත්තීයමය නිපුණතාවන් ලබා ගැනීමට සේවක මණ්ඩලයට සහායවීමේ අරමුණින් පුහුණු සහ සංවර්ධන ප්‍රතිපත්තීන් වෙත අවධානය යොමු කරන ලදී. සේවක මණ්ඩලයේ හැකියාවන් ශක්තිමත් කිරීම උදෙසා දේශීය මෙන්ම විදේශීය පුහුණු අවස්ථාවන් ඔවුන් වෙත ලබා දෙන ලදී.

| වර්ගය | 2013 (රුපියල්) | 2014 (රුපියල්) |
|---|---|---|
| දේශීය පුහුණු | 1,535,494/- | 2,204,709/- |
| විදේශීය පුහුණු | 6,287,452/- | 7,701,049/- |

### කාර්ය මණ්ඩල සුභසාධනය

කාර්ය මණ්ඩලයේ අභිප්‍රේරණය සහ ධෛර්යය වර්ධනය කිරීම සඳහා ඔවුන්ගේ සුභසාධනය වැදගත් සාධකයකි. එබැවින් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් නේවාසික සහ බාහිර වෛද්‍ය පහසුකම්, හදිසි අනතුරු රක්ෂණාවරණ, වාහන ණය, ආපදා ණය හා උත්සව අත්තිකාරම් වැනි සිත්ගන්නා සුළු සුභසාධනයන් ලබා දෙන ලදී. තව ද, කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ පවුල්වල අයගේ සබැඳියාවන් වර්ධනය කිරීම උදෙසා නේවාසික පුහුණු වැඩසහනක් සහ වාර්ෂික සුහද හමුව පවත්වන ලදී.

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය


## මූල්‍ය සමාලෝචනය

### රක්‍ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල (PPF)

රක්‍ෂණ පනතේ නියමයන්ට අනුව රක්‍ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල වෙනුවෙන් එකතුවන මුදලින් (සෙස්) නියම කොට ඇති කටයුතු සඳහා ක්ෂණිකව යොදවන්නට අවශ්‍ය නොවන මුදල් විචක්ෂණ ලෙස උපරිම ප්‍රතිලාභ ලැබෙන අන්දමින් ආයෝජනය කල යුතුය. මෙම වසර තුළ දී ද මණ්ඩලය විසින් එම මුදල් ඒ ආකාරයට ආයෝජනය කර ඇති අතර 1 වැනි රූපසටහනෙන් සෙස් බදු ආදායම සහ ඉපැයූ ආයෝජන ආදායම දක්වයි.

**රූපසටහන 1**

*2010-2014 කාලපරිච්ඡේදය සඳහා සෙස් බදු ආදායම සහ ආයෝජන ආදායම*





| | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|
| සෙස් ආදායම (රු. මිලියන) | 145 | 217 | 237 | 246 | 274 |
| ආයෝජන ආදායම (රු. මිලියන) | 76 | 80 | 136 | 236 | 158 |

ඉහත ප්‍රස්ථාරය මඟින් පසුගිය වසර පහ තුළ සෙස් බදු ආදායමේ වර්ධනය පෙන්නුම් කරයි. පොළී අනුපාතිකවල පහළ බැසීම හේතුවෙන් ආයෝජන ආදායම 2013 වසරේ සිට 2014 දක්වා කැපී පෙනෙන ලෙස අඩු වීමක් පෙන්නුම් කර ඇත.

රක්‍ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ වටිනාකම පසුගිය වසර පහ තුළ වර්ධනය වී ඇති අන්දම 2 වැනි රූපසටහන මඟින් පෙන්නුම් කරයි.

**රූපසටහන 2**

*2010 - 2014 කාලපරිච්ඡේදය සඳහා රක්‍ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ අගය*





| | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|
| රක්‍ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ වටිනාකම (රු. මිලියන) | 1,012 | 1,276 | 1,622 | 1,778 | 2,185 |

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

2014 දෙසැම්බර් 31 වැනි දිනට රක්‍ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ වත්කම් සංයුතිය පහත දක්වා ඇත.

**රූපසටහන 3**

***2014 දෙසැම්බර් 31වැනි දිනට රක්‍ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ වත්කම් සංයුතිය***




## මණ්ඩලයේ ආදායම


මණ්ඩලයේ සමස්ථ ආදායම ජනනය වන්නේ පහත දැක්වෙන ප්‍රභවයන්ගෙනි:

- රක්ෂකයින් සහ රක්ෂණ තැරැව්කාර සමාගම් ලියාපදිංචිය සඳහා අයකරන ලියාපදිංචි කිරීමේ ගාස්තු
- රක්ෂණ සමාගම්වලින් අය කරන වාර්ෂික ගාස්තු
- වාර්ෂිකව ලියාපදිංචිය අළුත් කිරීම සඳහා රක්ෂණ තැරැව්කාර සමාගම් වලින් අය කරන ගාස්තු
- අතිරික්ත අරමුදල් ආයෝජනයෙන් ලැබෙන පොලී ආදායම

2010 සිට 2014 දක්වා කාලපරිච්ඡේදය සඳහා මණ්ඩලයේ සමස්ත ආදායම බෙදී ඇති ආකාරය 4 වැනි රූපසටහන මඟින් දැක් වේ.

**රූපසටහන 4**

***2010 සිට 2014 දක්වා කාලපරිච්ඡේදය සඳහා මණ්ඩලයේ ආදායම***




| | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|
| වාර්ෂික ගාස්තු (රු. මිලි) | 29 | 35 | 61 | 70 | 73 |
| ලියාපදිංචි හා ලියාපදිංචිය අලුත් කිරීමේ ගාස්තු (රු. මිලි) | 2 | 3 | 5 | 4 | 4 |
| වෙනත් ආදායම් (රු. මිලි) | 3 | 1 | 2 | 1 | 2 |
| ප්‍රදාන හඳුනා ගැනීම් (රු. මිලි) | 8 | 6 | 7 | 5 | 4 |
| මුළු ආදායම් (රු. මිලි) | 42 | 44 | 75 | 80 | 83 |

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය


**මණ්ඩලයේ වියදම්**

මණ්ඩලයේ මුළු වියදම් 2010 වසරේ සිට 2014 වසර දක්වා වැඩි වී ඇත. පනතේ විධිවිධානයන්ට අනුකූලව ආදායම සහ වියදම අතර හිඟය රක්‍ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙන් පියවාගෙන ඇත.

2010 සිට 2014 කාලපරිච්ඡේදය දක්වා මණ්ඩලයේ සමස්ථ වියදම 5 වන රූපසටහනෙන් දැක්වේ.

**රූපසටහන 5**

*2010 සිට 2014 කාලපරිච්ඡේදය තුල මණ්ඩලයේ සමස්ථ වියදම*




| | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|
| මුළු වියදම (රු. මිලියන) | 71 | 74 | 94 | 105 | 107 |



# මූල්‍ය තොරතුරු

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය 94
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය 95
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 96
රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 97
ගිණුම්කරණ ප්‍රතිපත්ති 98
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 100

# මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| | සටහන් | 2014 | 2013 | 2012 |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | | රුපියල් | රුපියල් | රුපියල් |
| **වත්කම්** | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| දේපල පිරියත සහ උපකරණ | 1 | 13,501,813 | 9,941,815 | 13,165,749 |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල - කුළී සහ විද්‍යුත් තැන්පතු | 2 | 14,759,880 | 11,088,660 | 11,088,660 |
| **ජංගම වත්කම්** | | | | |
| භාණ්ඩ තොග | 3 | 274,845 | 413,051 | 391,138 |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල - මූල්‍ය වත්කම් හා වෙනත් | 2 | 2,170,032,222 | 1,766,611,670 | 1,610,930,804 |
| අනෙකුත් ජංගම වත්කම් | 4 | 24,740,264 | 15,135,397 | 13,513,443 |
| මුදල් හා මුදල් හා සමාන දෑ | 5 | 38,313 | 658,301 | 1,530,608 |
| **මුළු වත්කම්** | | 2,223,347,337 | 1,803,848,894 | 1,650,620,402 |
| **සංචිත හා වගකීම්** | | | | |
| **සංචිත** | | | | |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල | 6 | 2,184,792,102 | 1,777,700,330 | 1,622,019,464 |
| ප්‍රත්‍යාගණන සංචිතය | | 7,389,652 | - | - |
| **වගකීම්** | | | | |
| **ජංගම නොවන වගකීම්** | | | | |
| ප්‍රදාන | 7 | 6,480,560 | 9,941,815 | 13,165,749 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | 8 | 3,871,767 | 3,345,318 | 1,889,445 |
| | | 10,352,327 | 13,287,133 | 15,055,194 |
| **ජංගම වගකීම්** | | | | |
| ලද අත්තිකාරම් | | 11,726,535 | 4,862,417 | 4,727,599 |
| අනෙකුත් ජංගම වගකීම් | 9 | 9,086,721 | 7,999,014 | 8,818,145 |
| | | 20,813,256 | 12,861,431 | 13,545,744 |
| **මුළු සංචිත හා වගකීම්** | | 2,223,347,337 | 1,803,848,894 | 1,650,620,402 |

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම රක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් වෙත පැවරේ.
ඉහත මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය පිටු අංක 98 සිට 107 දක්වා ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් සමඟ සංයෝජිතව කියවිය යුතු වේ.

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය සහ ඒ වෙනුවෙන්,

**ඉන්ද්‍රාණි සුගතදාස**
සභාපතිනිය

**පුෂ්පා වෙල්ලප්පිලි**
සාමාජිකා

කොළඹ, ශ්‍රී ලංකාව
2015 ජූලි 08

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සටහන් | 2014<br>රුපියල් | 2013<br>රුපියල් |
|---|---|---|---|
| **ආදායම** | | | |
| අයභාරය | 10 | 77,586,076 | 74,278,594 |
| ප්‍රදාන හඳුනා ගැනීම් | 7 | 4,398,353 | 4,526,970 |
| පොලී ආදායම | | 1,359,409 | 1,235,056 |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙන් මාරු කිරීම් | 6 | 23,900,848 | 25,090,847 |
| වෙනත් ආදායම් | 11 | 151,722 | 167,242 |
| **මුළු ආදායම** | | 107,396,408 | 105,298,709 |
| **වියදම්** | | | |
| කාර්ය මණ්ඩල පිරිවැය | 12 | (59,006,400) | (58,804,541) |
| වෘත්තීය ගාස්තු | 13 | (2,181,575) | (2,178,627) |
| මෙහෙයුම් වියදම් | 14 | (45,858,876) | (44,000,612) |
| මූල්‍ය සහ අනෙකුත් | 15 | (186,428) | (166,722) |
| **මුළු වියදම්** | | (107,233,279) | (105,150,502) |
| බදුවලට පෙර ශුද්ධ අතිරික්තය (ඌණතාවය) | | 163,129 | 148,207 |
| බදු | | (163,129) | (148,207) |
| බදුවලට පසු ශුද්ධ අතිරික්තය (ඌණතාවය) | | - | - |
| **වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය** | | - | - |

පිටු අංක 98 සිට 107 දක්වා ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සටහන් | 2014<br>රුපියල් | 2013<br>රුපියල් | 2012<br>රුපියල් |
|---|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ලැබූ මුදල් ප්‍රවාහ** | | | | |
| කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ වැඩිවීම්/(අඩුවීම්) | | - | - | - |
| ක්ෂය සඳහා ගැලපීම් | | 4,696,716 | 4,526,970 | 6,582,865 |
| විශ්‍රාම ප්‍රතිලාභ සඳහා ප්‍රතිපාදන | | 679,287 | 1,698,014 | 55,536 |
| දේපල, පිරියත හා උපකරණ විකුණුම් අලාභය | | 73,035 | - | 79,761 |
| විශ්‍රාම ප්‍රතිලාභ සඳහා ගෙවීම | | (152,839) | (242,141) | - |
| ප්‍රත්‍යාගණන වියදම් | | (6,000) | - | - |
| ප්‍රදාන හඳුනා ගැනීම | | (4,398,353) | (4,526,970) | (6,662,626) |
| ආදායම් බදු | | 163,129 | 148,207 | 238,212 |
| පොලී ආදායම | | (1,359,409) | (1,235,056) | (1,932,677) |
| කාරක ප්‍රාග්ධනය වෙනස්වීම්වලට පෙර ශුද්ධ වැඩිවීම | | (304,433) | 369,024 | (1,638,928) |
| කාරක ප්‍රාග්ධනය වෙනස්වීම | | | | |
| තොගවල (වැඩිවීම) / අඩුවීම | | 138,207 | (21,914) | (208,007) |
| ලැබිය යුතු දෑවල (වැඩිවීම) / අඩුවීම | | (9,634,790) | (1,643,609) | (2,656,106) |
| අත්තිකාරම් ලැබීම්වල වැඩිවීම / (අඩුවීම) | | 6,864,118 | 134,817 | 457,580 |
| ණය හිමියන් සහ උපචිතයන්හි වැඩිවීම / (අඩුවීම) | | 1,087,707 | (819,130) | 3,655,659 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා භාවිත කරන ලද මුදල් ප්‍රවාහය | | (1,544,758) | (2,349,836) | 1,249,126 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය | | (1,849,192) | (1,980,812) | (389,802) |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලැබූ/(ක්‍රියාකාරකම් සඳහා යෙදූ) මුදල් ප්‍රවාහය** | | | | |
| පොලී ආදායම | | 1,226,203 | 1,108,505 | 1,735,251 |
| දේපල, පිරියත හා උපකරණ විකිණීමෙන් ලද මුදල් | | 3,000 | - | - |
| දේපල, පිරියත සහ උපකරණ මිලට ගැනීම | | (937,098) | (1,303,036) | (7,459,488) |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරන ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | 292,106 | (194,531) | (5,724,237) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ලැබූ මුදල් ප්‍රවාහය** | | | | |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලින් ප්‍රාග්ධන මාරු කිරීම් | | 937,098 | 1,303,036 | 7,459,488 |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | 937,098 | 1,303,036 | 7,459,488 |
| මුදල් සහ මුදල් හා සමාන දෑවල ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | (619,988) | (872,307) | 1,345,449 |
| වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ | | 658,301 | 1,530,608 | 185,159 |
| වර්ෂය අවසානයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ | | 38,313 | 658,301 | 1,530,608 |
| අතැති සහ බැංකුවේ ඇති මුදල් | 5 | 38,313 | 658,301 | 1,530,608 |

පිටු අංක 98 සිට 107 දක්වා ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

# රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සටහන් | 2014<br>රුපියල් | 2013<br>රුපියල් | 2012<br>රුපියල් |
|---|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය** | | | | |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ ශුද්ධ වර්ධනය | | 407,091,773 | 155,680,866 | 345,634,597 |
| කාරක ප්‍රාග්ධන වෙනස්වීමට පෙර ශුද්ධ වැඩිවීම | | 407,091,773 | 155,680,866 | 345,634,597 |
| කාරක ප්‍රාග්ධනය වෙනස්වීම | | | | |
| ලැබිය යුතු සෙස් බදුවල (වැඩිවීම) / අඩුවීම | | (15,500,000) | (1,000,000) | (10,000,000) |
| කුළී තැන්පතුවල (වැඩිවීම) / අඩුවීම | | (3,671,220) | - | (2,360,070) |
| අරමුදල් කලමණාකරණ ගිණුමේ ශේෂය (වැඩිවීම) / අඩුවීම | | (4,210,677) | (2,476,670) | - |
| සෙස් අරමුදලින් මාරු කළ යුතු අරමුදල්හි වැඩිවීම / (අඩුවීම) | | 9,487,946 | 1,193,883 | 702,733 |
| | | (13,893,951) | (2,282,787) | (11,657,337) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | 393,197,821 | 153,398,078 | 333,977,260 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලැබූ (ක්‍රියාකාරකම් සඳහා යෙදූ) මුදල් ප්‍රවාහය** | | | | |
| රජයේ සුරැකුම්පත්වල ආයෝජනය | | (288,557,589) | 468,339,300 | 201,062,723 |
| ස්ථාවර තැන්පතුවල ආයෝජනය | | (104,640,232) | (621,109,278) | (534,696,542) |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරන ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | (393,197,821) | (152,769,978) | (333,633,818) |
| මුදල් සහ මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම (අඩුවීම) | | - | 628,101 | 343,442 |
| වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ | | 1,000,000 | 371,899 | 28,457 |
| වර්ෂය අවසානයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ | | 1,000,000 | 1,000,000 | 371,899 |
| බැංකුවේ ඇති මුදල් | 2 | 1,000,000 | 1,000,000 | 371,899 |

පිටු අංක 98 සිට 107 දක්වා ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 1. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 1.1 සකස් කිරීමේ පදනම

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පදනම මත සකස් කර ඇති අතර ඒවා ඉදිරිපත් කිරීමේ දී අගයන් ආසන්නම ශ්‍රී ලංකා රුපියලට දක්වා ඇත.

යථායෝග්‍ය පරිදි ගිණුම්කරණ ප්‍රතිපත්ති ඉදිරියේ දැක්වෙන සටහන් මගින් අනාවරණය කර ඇත.

### 1.2 අනුකූලතාව පිළිබඳ ප්‍රකාශනය

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරනු ලැබ ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සකස් කර ඇති අතර, එම මූල්‍ය ප්‍රකාශන එම ගිණුම්කරණ ප්‍රමිතීන් හා අනුකූලතාවය දක්වනු ලැබේ.

### 1.3 වාර්තා කරන දිනයෙන් පසු හටගන්නා සිදුවීම්

වාර්තා කරන දිනයෙන් පසු හටගන්නා සියළුම ප්‍රමාණාත්මක සිද්ධීන් මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ කාර්යයේ දී සැලකිල්ලට ගෙන අවශ්‍ය ගැලපීම් හෝ අනාවරණයන් කර ඇත.

### 1.4 සංසන්දනාත්මක සංඛ්‍යාවන්

ප්‍රවර්ථන වර්ෂයේ ඉදිරිපත් කිරීම හා අනුකූල විය යුතු ආකාරයට පෙර වර්ෂවල සංසන්දනාත්මක සංඛ්‍යා ගැලපීම් කර ඇත.

### 1.5 බදුකරණය

ආදායම් බදු සඳහා ප්‍රතිපාදන 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතෙහි ප්‍රතිපාදනයන් හා අනුකූලව ගණනය කර ඇත.

පොලී හා ලාභාංශ ආදායම හැර මණ්ඩලයේ අනෙකුත් ආදායම් මේ වන විට ආදායම් බදුවලින් නිදහස් කර ඇත.

### 1.6 විදේශ ව්‍යවහාර මුදල් පරිවර්තනය

සියළුම විදේශීය මුදලින් සිදු වූ ගනුදෙනු ඒවා සිදු වූ අවස්ථාවේ දී පැවැති විනිමය අනුපාතිකයන් පාදකව, වාර්තා කරන මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් අගයට පරිවර්තනය කර ඇත.

## 2. වත්කම් සහ අගය කිරීමේ පදනම

### 2.1 දේපල, පිරියත හා උපකරණ

**ස්වසන්තක අයිතිය සහිත දේපල, පිරියත හා උපකරණ**

දේපල, පිරියත හා උපකරණ ඒවායේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩු කළ අගයට නිරූපණය කර ඇත. දේපල, පිරියත හා උපකරණවල පිරිවැයට ඇතුළත් වන්නේ, අත්පත් කර ගැනීමේ පිරිවැය සමඟ එම වත්කම් අපේක්ෂිත භාවිත තත්ත්වයට ගෙන ඒම සඳහා දරන ලද අනෙකුත් වියදම්වල එකතුවයි.

**ක්ෂය**

වත්කම්වල ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය පුරා පහත අනුපාත පාදකව සරල මාර්ග ක්‍රමයට ක්ෂය ගණනය කරනු ලැබේ.

| | වාර්ෂික (%) |
|---|---|
| මෝටර් වාහන | 25 |
| ලී බඩු, වැඩිදුම් සහ සවි කිරීම් | 12.5 |
| කාර්යාල හා විද්‍යුත් දත්ත සැකසුම් උපකරණ | 25 |
| පුහුණු උපකරණ | 25 |

ක්ෂය ප්‍රතිපාදන එම වත්කම් මිල දී ගත් දින සිට කරනු ලැබේ. ක්ෂය ප්‍රතිපාදනය වත්කම භාවිතයෙන් ඉවත් කරන තෙක් කරනු ලැබේ.

### 2.2 මූල්‍ය වත්කම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 39 (LKAS 39) අනුව මූල්‍ය වත්කම් ලාභය හෝ පාඩුව මත සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම්, ණය හා ලැබිය යුතු වත්කම්, කල්පිරෙන තෙක් තබා ගන්නා ආයෝජන හා අලෙවිය සඳහා ඇති මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

#### 2.2.1 කල් පිරෙන තෙක් තබා ගන්නා ආයෝජන

කල් පිරෙන තෙක් ලඟ තබා ගැනීමේ අපේක්ෂාවක් හා එසේ කිරීමේ හැකියාවක් පවතින ස්ථිර හෝ නිශ්චය කල හැකි ගෙවීම් හා ස්ථාවර කල්පිරීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්, කල්පිරෙන තෙක් තබා ගන්නා ආයොජන ලෙස වර්ගීකරණය

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

කෙරේ. මූලික හඳුනාගැනීමෙන් පසු මෙකී ආයෝජන ක්‍රමක්ෂය පිරිවැය ක්‍රමයට සඵල පොලී අනුපාතිකය පදනම් කර ගෙන අගය කරනු ලැබේ. සඵල පොලී අනුපාතය පදනම් කරගෙන කරනු ලබන ක්‍රමක්ෂය කිරීම් ආයෝජන ආදායමේ ඇතුළත් වේ.

**2.3 තොග**

තොග ඒවායේ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්වලින් අඩු අගයට දක්වා ඇත. තොගවල පිරිවැය නිශ්චය කිරීමේ දී ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීමේ ක්‍රමය (ප්‍ර.ලැ.ප්‍ර.නි) ඒ සඳහා පාදක කරගෙන ඇත.

**2.4 ලැබිය යුතු දෑ**

ලැබිය යුතු දෑ නිරූපණය කර ඇත්තේ, ඇස්තමේන්තුගත උපලබ්ධි අගයටයි.

**2.5 මුදල් සහ මුදල් හා සමාන දෑ**

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කිරීමේ පරමාර්ථය සඳහා මුදල් හා මුදල් හා සමාන දෑවලින් නියෝජනය වන්නේ බැංකුවේ මුදල් සහ අතැති මුදල්ය.

**3. බැරකම් සහ ප්‍රතිපාදන**

**3.1 විශ්‍රාම ප්‍රතිලාභ**

**3.1.1 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂික**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 19 - ''සේවක ප්‍රතිලාභ'' හා අනුකූලව යෝජිත ඒකක බැර ක්‍රමය පදනම් කරගෙන සේවක පාරිතෝෂිකය ප්‍රථම සේවා වර්ෂයේ සිට සම්පූර්ණ ප්‍රතිපාදනය කෙරෙන ආකාරයට ගිණුම් ගත කර ඇත.

කෙසේ වෙතත් 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත හා අනුකූලව ගෙවීම් පිළිබඳව වගකීම ඇති වන්නේ වර්ෂ 5 ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කරන ලද්දේ නම් පමණි.

**3.1.2 නිශ්චිත සහභාග සැලසුම් - සේ.අ.අ. සහ සේ.නි.භා.අ.**

නිශ්චිත ව්‍යවස්ථාවන් සහ නියාමන හා අනුකූලව මණ්ඩලයේ සියළුම සේවකයන් සේවක අර්ථසාධක අරමුදලට දායකවීමට සහ සේවක භාරකාර අරමුදලට දායකවීමට සුදුසුකම් ලබති. මණ්ඩලය සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට සේවකයන්ගේ දළ පාරිශ්‍රමිකය මත පිළිවෙළින් 12% ක සහ 3% ක මුදලක් දායක කරයි.

**3.2 බැරකම්**

බැරකම් අතරින් වාර්තා කරන දිනයෙන් පසු වර්ෂයක් තුළ දී හෝ ඉල්ලුම් කළවිටක දී ගෙවිය යුතු වන දෑ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම බැරකම් සේ වර්ගීකරණය කර ඇත. වාර්තා කරන දිනයෙන් පසු වර්ෂයකින් ඔබ්බට ගෙවිය යුතු සියළුම ගෙවීම් ජංගම නොවන බැරකම් ගණයට ඇතුළත් කර ඇත.

මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී සියළුම දන්නා බැරකම් ඒවායේ පිරිවැයට ඇතුළත් කර ඇත.

**3.3 ප්‍රදාන**

රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙන් මාරු කරනු ලබන ප්‍රාග්ධන වියදම් සහ ක්ෂුද්‍ර රක්ෂණ ව්‍යාපෘතියෙන් ලැබුනු සියළුම වත්කම් ප්‍රදාන සේ හඳුනා ගන්නා අතර එම වත්කම්වල ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය තුළ දී ඒවා හඳුනා ගනු ලැබේ.

**4. ආදායම් සහ වියදම්**

**4.1 ආදායම් හඳුනා ගැනීම**

ආදායම් උපචිත පදනම මත හඳුනාගෙන ඇත.

**4.2 වියදම් හඳුනා ගැනීම**

මණ්ඩලය පවත්වාගෙන යෑමේ දී දරනු ලබන සියළුම වියදම් වියදමට වැඩි ආදායම ගණනය කිරීමේ කාර්යය සඳහා ආදායමට එරෙහිව ලියාහරිනු ලැබේ.

**4.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කර ඇත්තේ වක්‍ර ක්‍රමය මතයි.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**1 දේපළ පිරියත හා උපකරණ**

| | මෝටර් වාහන රුපියල් | ලී බඩු, වැද්දුම් හා සවිකිරීම් රුපියල් | කාර්යාල උපකරණ විද්‍යුත් දත්ත සැකසුම් සහ වෙනත් රුපියල් | පුහුණු උපකරණ රුපියල් | එකතුව රුපියල් |
|---|---|---|---|---|---|
| **පිරිවැය** | | | | | |
| 2014 ජනවාරි 01 දිනට ශේෂය | 16,317,321 | 13,003,206 | 20,510,591 | 141,450 | 49,972,568 |
| එකතු කිරීම් | - | 1,398 | 935,700 | - | 937,098 |
| බැහැර කිරීම් | - | (515,418) | (59,500) | - | (574,918) |
| ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන ගැලපීම | (6,317,321) | - | - | - | (6,317,321) |
| 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය | 10,000,000 | 12,489,186 | 21,386,791 | 141,450 | 44,017,427 |
| **සමුච්චිත ක්ෂය** | | | | | |
| 2014 ජනවාරි 01 දිනට ශේෂය | 12,597,363 | 8,916,748 | 18,375,192 | 141,450 | 40,030,753 |
| වර්ෂය සඳහා අය කිරීම් | 2,009,383 | 1,513,842 | 1,173,491 | - | 4,696,716 |
| බැහැර කිරීම් | - | (439,382) | (59,500) | - | (498,882) |
| ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන ගැලපීම | (13,712,973) | - | - | - | (13,712,973) |
| 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය | 893,773 | 9,991,208 | 19,489,183 | 141,450 | 30,515,614 |
| **ලියා අඩු කළ අගය 2014 දෙසැම්බර් 31 දිනට** | 9,106,227 | 2,497,978 | 1,897,609 | - | 13,501,813 |
| **ලියා අඩු කළ අගය 2013 දෙසැම්බර් 31 දිනට** | 3,719,958 | 4,086,458 | 2,135,399 | - | 9,941,815 |
| **ලියා අඩු කළ අගය 2012 දෙසැම්බර් 31 දිනට** | 5,430,977 | 5,190,060 | 2,544,712 | - | 13,165,749 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| දෙසැම්බර් 31 දිනට | 2014 රුපියල් | 2013 රුපියල් | 2012 රුපියල් |
|---|---|---|---|
| **2 රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල - ආයෝජන සහ අනෙකුත්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| කුළී සහ විද්‍යුත් තැන්පතු | 14,759,880 | 11,088,660 | 11,088,660 |
| **ජංගම වත්කම්** | | | |
| **කල් පිරෙන තෙක් තබා ගත යුතු ආයෝජන** | | | |
| ප්‍රති මිලදී ගැනීම් | 584,463,086 | 552,060,730 | 958,381,103 |
| භාණ්ඩාගාර බිල්පත් | 256,155,233 | - | 62,018,927 |
| ස්ථාවර තැන්පතුවල ආයෝජන | 1,260,446,052 | 1,155,805,820 | 534,696,542 |
| | 2,101,064,371 | 1,707,866,550 | 1,555,096,572 |
| **අනෙකුත් ජංගම වත්කම්** | | | |
| ලැබිය යුතු සෙස් බදු | 76,500,000 | 61,000,000 | 60,000,000 |
| අරමුදල් කළමණාකරණ ගිණුමේ ශේෂය | 6,687,347 | 2,476,670 | - |
| බැංකුවේ ඇති ශේෂය | 1,000,000 | 1,000,000 | 371,899 |
| | 84,187,347 | 64,476,670 | 60,371,899 |
| අඩු කළා | | | |
| රක්ෂණ ඔප්පුහිමියන්ගේ ආරක්ෂණ අරමුදලින් මාරු කළ යුතු අගය | 15,219,496 | 5,731,550 | 4,537,667 |
| | 2,170,032,222 | 1,766,611,670 | 1,610,930,804 |
| මුළු වත්කම් | 2,184,792,102 | 1,777,700,330 | 1,622,019,464 |
| **3 භාණ්ඩ තොග** | | | |
| මුද්‍රණ, ලිපිද්‍රව්‍ය හා පරිගණක උපාංග | 261,005 | 367,631 | 303,083 |
| මුද්දර | 13,840 | 45,420 | 88,055 |
| | 274,845 | 413,051 | 391,138 |
| **4 අනෙකුත් ජංගම වත්කම්** | | | |
| තැන්පතු | 185,481 | 178,594 | 172,122 |
| වෙනත් ලැබිය යුතු දෑ | 274,334 | 167,233 | 114,597 |
| ලැබිය යුතු රඳවා ගැනීමේ බදු | 1,082,063 | 1,111,985 | 1,049,296 |
| එකතු කළ අගය මත බදු පාලන ගිණුම | 1,239,629 | 668,820 | 502,748 |
| සේවක ණය * | 4,911,857 | 3,682,040 | 3,923,116 |
| අත්තිකාම් සහ පෙර ගෙවීම් | 1,441,005 | 1,988,800 | 3,038,082 |
| ආර්ථික සේවා ගාස්තු | - | - | 90,815 |
| ස්ථාවර වත්කම් මිලට ගැනීම සඳහා අත්තිකාරම් | - | 445,000 | 85,000 |
| අරමුදල් කළමණාකරණ ගිණුමේ ශේෂය | 386,400 | 1,161,375 | - |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙන් මාරු කළ යුතු අගය | 15,219,496 | 5,731,550 | 4,537,667 |
| | 24,740,264 | 15,135,397 | 13,513,443 |
| * කාර්යය මණ්ඩලය සඳහා ප්‍රදානය කළ ණය | | | |
| ජනවාරි 1 දිනට ශේෂය | 3,682,040 | 3,923,116 | 3,668,481 |
| වර්ෂය තුළ දී ප්‍රදානය කළ ණය | 4,151,000 | 2,157,000 | 2,942,391 |
| | 7,833,040 | 6,080,116 | 6,610,872 |
| වර්ෂය තුළ දී ණය ආපසු ගෙවීම් | (2,921,183) | (2,398,076) | (2,687,756) |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | 4,911,857 | 3,682,040 | 3,923,116 |

| දෙසැම්බර් 31 දිනට | 2014 රුපියල් | 2013 රුපියල් | 2012 රුපියල් |
|---|---|---|---|
| **5 මුදල් සහ මුදල් හා සමාන දෑ** | | | |
| බැංකුවේ ඇති මුදල් | | | |
| ලංකා බැංකුව | 38,313 | 658,301 | 1,530,608 |
| | 38,313 | 658,301 | 1,530,608 |
| **6 රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල** | | | |
| ආරම්භක ශේෂය | 1,777,700,330 | 1,622,019,464 | 1,276,384,867 |
| වර්ෂය තුළදී ලද සෙස් බදු | 273,912,607 | 245,743,034 | 236,534,917 |
| භාණ්ඩාගාර බිල්පත් ආයෝජනය මත පොලී | 15,155,232 | 665,374 | 47,865,987 |
| ප්‍රති මිල දී ගැනීම් සහ ඉල්ලුම් ගිණුම් මත පොලී | 38,138,752 | 58,473,214 | 87,316,447 |
| ස්ථාවර තැන්පතු මත පොලී | 104,682,472 | 177,119,438 | 696,541 |
| අරමුදල් කළමණාකරණ ගිණුමේ ශේෂය මත පොලිය | 57,070 | 92,109 | - |
| | 2,209,646,463 | 2,104,112,633 | 1,648,798,759 |
| අඩු කළා: | | | |
| මෙහෙයුම් වියදම් සඳහා මාරු කිරීම් | 23,900,848 | 25,090,847 | 19,295,177 |
| ප්‍රාග්ධන වියදම් සඳහා මාරු කිරීම් | 937,098 | 1,303,036 | 7,459,488 |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙන් මුළු මාරු කිරීම් | 24,837,946 | 26,393,883 | 26,754,665 |
| ඒකාබද්ධ අරමුදලට කළ දායකයන් | - | 300,000,000 | - |
| බැංකු ගාස්තු | 16,415 | 18,420 | 24,630 |
| | 24,854,361 | 326,412,303 | 26,779,295 |
| අවසාන ශේෂය | 2,184,792,102 | 1,777,700,330 | 1,622,019,464 |
| **7 ප්‍රදාන** | | | |
| වසර ආරම්භයේ දී ශේෂය | 9,941,815 | 13,165,749 | 12,368,887 |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙන් ප්‍රාග්ධන වියදම් | 937,098 | 1,303,036 | 7,459,488 |
| අඩු කළා වර්ෂය තුළ දී ක්‍රමක්ෂය කිරීම් | (4,398,353) | (4,526,970) | (6,662,626) |
| වසර අවසානයේ දී ශේෂය | 6,480,560 | 9,941,815 | 13,165,749 |

**සටහන - ප්‍රදාන හඳුනා ගැනීම**

ශ්‍රී.ල.ගි.ප්‍ර. 20 හා අනුකූලව ප්‍රදානයන් ගිණුම් ගත කර ඇති අතර ආදායම් ප්‍රකාශයේ පහත අනුපාත යටතේ හඳුනාගෙන ඇත.

| | |
|---|---|
| මෝටර් රථ වාහන | 25% |
| කාර්යාල උපකරණ - වෙනත් සහ වි.ද.සැ. | 25% |
| ලී බඩු වෑද්දුම් සහ සවි කිරීම් | 12.5% |
| පුහුණු උපකරණ | 25% |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| | දෙසැම්බර් 31 දිනට | 2014 රුපියල් | 2013 රුපියල් | 2012 රුපියල් |
|---|---|---|---|---|
| 8 | **විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්** | | | |
| | වසර ආරම්භයේ දී ශේෂය | 3,345,318 | 1,889,445 | 1,833,909 |
| | වසර තුළ ප්‍රතිපාදන | 679,287 | 1,698,014 | 55,536 |
| | අඩුකළා - වසර තුළ සිදු කරන ලද ගෙවීම් | (152,839) | (242,141) | - |
| | වසර අවසානයේ ශේෂය | 3,871,767 | 3,345,318 | 1,889,445 |
| 9 | **අනෙකුත් ජංගම වගකීම්** | | | |
| | උපචිත වියදම් | 8,224,664 | 6,992,531 | 8,077,508 |
| | සේවක අර්ථසාධක අරමුදල් සඳහා කළ යුතු ගෙවීම් | 568,981 | 571,676 | 489,052 |
| | සේවක භාරකාර අරමුදල් සඳහා කළ යුතු ගෙවීම් | 85,348 | 85,752 | 73,359 |
| | උපයන විට හා රඳවා ගැනීමේ බදු සඳහා කළ යුතු ගෙවීම් | 194,954 | 246,239 | 84,130 |
| | වෙනත් | 12,775 | 102,816 | 94,096 |
| | | 9,086,721 | 7,999,014 | 8,818,145 |

| | දෙසැම්බර් 31 දිනට | 2014 | 2013 |
|---|---|---|---|
| 10 | **අයභාරය** | | |
| | රක්ෂණ සමාගම්වලින් වාර්ෂික ගාස්තු | 73,440,757 | 70,079,988 |
| | ලියාපදංචි කිරීමේ සහ අළුත් කිරීමේ ගාස්ත | 4,145,319 | 4,198,606 |
| | | 77,586,076 | 74,278,593 |
| 11 | **වෙනත් ආදායම්** | | |
| | මෝටර් වාහන ණය මත පොලී | 28,862 | 29,751 |
| | ආපදා ණය මත පොලී | 103,325 | 94,025 |
| | වෙනත් ආදායම් | 19,535 | 43,467 |
| | | 151,722 | 167,242 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| දෙසැම්බර් 31 දිනට | 2014 | 2013 |
|---|---|---|
| | රුපියල් | රුපියල් |
| **12 කාර්ය මණ්ඩල වියදම** | | |
| කාර්ය මණ්ඩල වැටුප් | 31,045,384 | 31,019,437 |
| සේ.අ.අ. 12% | 3,833,446 | 3,830,332 |
| සේ.භා.අ. 3% | 958,362 | 957,584 |
| සභාපතිනියගේ වියදම් - දීමනා | 900,000 | 900,000 |
| සභාපතිනියගේ ඉන්ධන වියදම් | 347,220 | 348,840 |
| අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් ගාස්තු | 413,500 | 480,000 |
| වේතන - කොන්ත්‍රාත් සේවක | - | 32,500 |
| අතිකාල | 123,941 | 127,215 |
| කාර්ය මණ්ඩල වෛද්‍ය වියදම් | 1,545,903 | 1,363,224 |
| කාර්ය මණ්ඩල වෛද්‍ය රක්ෂණය | 655,636 | 560,059 |
| ගිනි හා පුද්ගල රක්ෂණය | 450,411 | 421,334 |
| කාර්ය මණ්ඩල සුබසාධන | 1,345,887 | 1,369,462 |
| කාර්ය මණ්ඩල පුහුණු - දේශීය | 2,204,709 | 1,535,494 |
| විදේශ ගමන් - අධ්‍යක්ෂක මණ්ඩල | 1,837,727 | 1,184,546 |
| විදේශ පුහුණු - කාර්ය මණ්ඩල | 5,863,322 | 5,102,907 |
| කාර්ය සාධනය පදනම් කරගත් දිරි දීමනා | 1,754,948 | 1,951,246 |
| ප්‍රචාරණය - බඳවා ගැනීම් | 324,945 | 70,495 |
| අධ්‍යක්ෂක දුරකථන | 166,410 | 164,635 |
| නිවාඩු දීමනා | 764,260 | 599,941 |
| අධ්‍යක්ෂකවරුන්ගේ වාහන දීමනා | 2,925,000 | 3,876,986 |
| අධ්‍යක්ෂකවරුන්ගේ ඉන්ධන දීමනා | 866,101 | 1,210,291 |
| සේවක පාරිතෝෂික | 679,287 | 1,698,014 |
| | 59,006,400 | 58,804,541 |
| **13 වෘත්තීමය ගාස්තු** | | |
| උපදේශක සේවා ගාස්තු | 2,181,575 | 2,178,627 |
| | 2,181,575 | 2,178,627 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| දෙසැම්බර් 31 දිනට | 2014<br>රුපියල් | 2013<br>රුපියල් |
|---|---|---|
| **14 මෙහෙයුම් වියදම්** | | |
| කාර්යාල කුලී | **23,976,701** | 22,167,658 |
| රථ ගාල් කිරීමේ ගාස්තු | **332,185** | 365,825 |
| දුරකථන හා අන්තර්ජාල වියදම් | **1,633,011** | 1,603,557 |
| විදුලිය | **1,356,878** | 1,226,881 |
| කාර්යාල නඩත්තු කිරීම් | **459,213** | 442,421 |
| මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | **2,871,798** | 2,482,807 |
| මහජන දැනුවත් කිරීම් | **1,836,159** | 4,399,327 |
| සංග්‍රහ වියදම් | **248,237** | 213,539 |
| ගමන් වියදම් - දේශීය | **81,919** | 56,158 |
| කාර්යාල උපකරණ නඩත්තු වි.ද.සැ හා වෙනත් | **1,088,963** | 1,413,830 |
| සාමාජිකත්වය - IAIS | **2,487,748** | 2,091,794 |
| සාමාජිකත්වය - IIAP | **33,125** | (30,000) |
| ප්‍රචාරණය - වෙනත් | **109,200** | 96,419 |
| රැස්වීම් ගාස්තු | **953,295** | 309,846 |
| පුවත්පත් හා පුස්තකාල පොත් | **139,820** | 214,007 |
| තැපැල් හා පණිවිඩ ගාස්තු | **1,039,937** | 226,448 |
| විගණන ගාස්තු - විගණකාධිපති | **470,000** | 370,055 |
| ක්ෂය | **4,696,716** | 4,526,970 |
| පොදු වියදම් | **104,244** | 104,959 |
| නීති වියදම් | **166,861** | 280,530 |
| විමර්ශන වියදම් | **4,572** | 10,560 |
| අධීක්ෂණ වියදම් | **383,293** | 129,350 |
| වාහන නඩත්තු | **157,174** | 159,587 |
| වාහන රක්ෂණ | **309,245** | 261,217 |
| වාහන ඉන්ධන වියදම් | **270,829** | 308,155 |
| ජාතිය ගොඩනැගීමේ බදු | **574,717** | 568,712 |
| වත්කම් ඉවත් කිරීමේ අලාභය | **73,035** | - |
| | **45,858,876** | 44,000,612 |
| **15 මූල්‍ය හා වෙනත් වියදම්** | | |
| බැංකු ගාස්තු | **186,428** | 166,422 |
| අධිභාර හා දඩ | **-** | 300 |
| | **186,428** | 166,722 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

### 16. බදුකරණය

2014 දෙසැම්බර් 31 දිනට බදුකරණය සඳහා ප්‍රතිපාදන ගණනය කර ඇත්තේ 2006 අංක 10 දරණ ආදායම් පනතේ විධිවිධාන වලට අනුකූලවයි.

#### 16.1 රජයේ සුරැකුම්පත් පිළිබඳ ද්විතීය වෙළඳපල ගනුදෙනු වෙනුවෙන් රඳවාගත් බදු සඳහා ලැබෙන නාමික බැර

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ අංක 137 වන වගන්තිය ප්‍රකාරව මණ්ඩලය රජයේ සුරැකුම්පත් පිළිබඳ ද්විතීය වෙළඳපොළ ගනුදෙනු මත උයන පොලී ආදායම අදාළ තක්සේරු වර්ෂය සඳහා වන ව්‍යවස්ථාපිත ආදායමේ කොටසක් සේ සලකන අතර එම පොලිය වෙනුවෙන් නාමික බදු බැර සඳහා හිමිකාරත්වය ලැබේ.

ඒ අනුව රජයේ සුරැකුම්පත් පිළිබඳ ද්විතීය වෙළඳපොළ ගනුදෙනුවලින් මණ්ඩලය විසින් උපයන ලද ශුද්ධ ආදායම දළ ආදායම බවට පරිවර්තනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් නාමික බදු බැර වටිනාකම රුපියල් 122,380/17 ක් 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇත.

රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල විසින් රජයේ සුරැකුම්පත් පිළිබඳ ද්විතීය වෙළඳපොළ ගනුදෙනු මත කරනු ලැබූ ආයෝජනයන්ගෙන් උපයන ලද පොලී ආදායම ගිණුම්ගත කර හඳුනාගෙන ඇත්තේ ශුද්ධ අගයටය.

### 17. ප්‍රාග්ධන බැඳියාව

2014 දෙසැම්බර් 31 දිනට කිසිදු ප්‍රාග්ධන බැඳියාවකට එළැඹ නොමැත.

### 18. අසම්භාව්‍ය බැරකම්

2014 දෙසැම්බර් 31 දිනට කිසිදු අසම්භාව්‍ය බැරකමක් නොමැත.

### 19. වාර්තා කරන දිනෙන් පසු හටගත් සිදුවීම්

මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කළ යුතු හෝ අනාවරණය කිරීම අවශ්‍ය වන කිසිදු සිද්ධියක් වාර්තා කරන දිනට පසු සිදු වී නොමැත.

### 20. සම්බන්ධිත පාර්ශව අනාවරණ

ඉන්ද්‍රාණි සුගතදාස මහත්මිය (සභාපතිනිය), බී. ඩී. ඩබ්. ඒ. සිල්වා මහතා, එස්. ආර්. ආටිගල මහතා, ඩී. එන්. ආර්. සිරිවර්ධන මහතා (නිල බලයෙන් පත්වූ සාමාජිකයන්) නලින් ආටිගල මහතා, සමන්ත කුමාරසිංහ මහතා 2014 වර්ෂය මුළුල්ලේම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සාමාජිකාවන් ලෙස ක්‍රියා කළහ.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

සමාලෝචිත වර්ෂය තුළ දී මණ්ඩලයේ සාමාජික සාමාජිකාවන්ගේ සංස්ථාපිත සම්බන්ධතාවය පහත වගුවෙන් නිරූපණය කෙරේ.

| සාමාජිකයාගේ නම | සම්බන්ධිත ආයතනයේ නම | සම්බන්ධතාව |
|---|---|---|
| ඉන්ද්‍රාණි සුගතදාස මහත්මිය | කළුබොවිටියාන තේ කම්හල් සමාගම<br>එන් ඩී බී බැංකුව | අධ්‍යක්ෂිකා<br>අධ්‍යක්ෂිකා |
| ඩී.ඩී.ඩබ්.ඒ. සිල්වා මහතා | ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය<br>ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය<br>අපි වෙනුවෙන් අපි කළමණාකරණ මණ්ඩලය<br>ශ්‍රී ලංකා සුරැකුම්කුපත් හා විනිමය කොමිෂන් සභාව<br>ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය<br>වෙස්ට් කෝස්ට් පවර් පුද්. සමාගම | සභාපති<br>සභාපති<br>මණ්ඩල සාමාජික<br>කොමිෂන් සාමාජික<br>සාමාජික<br>මණ්ඩල සාමාජික |
| එස්.ආර්. ආටිගල මහතා | උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය<br>ජාතික ඉතිරිකිරීමේ බැංකුව<br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | සාමාජික<br>අධ්‍යක්ෂක<br>සාමාජික |
| ඩී.එන්.ආර්. සිරිවර්ධන මහතා | ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව<br>ශ්‍රී ලංකා ගණකාධිකරණ හා විගණන ප්‍රමිත අධීක්ෂණ මණ්ඩලය<br>ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරුවන්ගේ ආයතනය | කොමිෂන් සාමාජික<br>නිල බලයෙන් පත්වූ සාමාජික<br>නිල බලයෙන් පත්වූ සාමාජික |
| නලින් ආටිගල මහතා | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව<br>ශ්‍රී ලංකා ගණකාධිකරණ හා විගණන ප්‍රමිත අධීක්ෂණ මණ්ඩලය | කොමිෂන් සාමාජික<br>මණ්ඩල සාමාජික (2014 ජුනි තෙක්) |
| සමන්ත කුමාරසිංහ මහතා | නේචර්ස් බියුටි ක්‍රියේෂන්ස් ලිමිටඩ්<br>මල්ටිකෙම් ඉන්ටනැෂනල් ලිමිටඩ්<br>මල්ටිකෙම් එක්ස්පෝට්ස් (පුද්) සමාගම<br>ඉකෝ ප්‍රොටෙක්ට් ඉන්ජිනියරින් (පුද්) සමාගම<br>ලංකා බයෝ ෆර්ටිලයිසස්(පුද්) සමාගම | සභාපති / කළමණාකාර අධ්‍යක්‍ෂ<br>සභාපති / කළමණාකාර අධ්‍යක්‍ෂ<br>සභාපති / කළමණාකාර අධ්‍යක්‍ෂ<br>සභාපති / කළමණාකාර අධ්‍යක්‍ෂ<br>සභාපති / කළමණාකාර අධ්‍යක්‍ෂ |

වෙළඳපොළ වටිනාකම් මත සිදු කරන ලද සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු මත සිදු කල ගනුදෙනු හැර උක්ත ආයතන සමඟ සමාලෝචිත වර්ෂය තුළ දී වෙනත් කිසිදු ගනුදෙනුවක් සිදු කර නොමැත.

# විගණකාධිපති වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No. } එෆ්ආර්(2)/අයි/අයිබීඑස්එල්/1/14 ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2015 සැප්තැම්බර් 11 දින

සභාපති,
ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය

**ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 2000 අංක 43 දරන ශ්‍රී ලංකා රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 8 (3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයෙන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත 2015 ජූනි 30 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙද ඉදිරිපත් කිරීස සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට :ෂීෂ 1000 - 1810* අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැළසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

# විගණකාධිපති වාර්තාව

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

### 2 මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

මණ්ඩලය ආදායම් හඳුනා ගැනීම උපචිත පදනම මත සිදු කළද සමාලෝචිත වර්ෂය අවසාන වන විට හඳුනාගෙන ඉන්වොයිස් කර තිබූ ඉකුත් වර්ෂ 3 ට අදාල ජාතික රක්ෂණ භාර අරමුදලින් ලැබිය යුතු එකතුව රු.5,897,549 ක් වූ වාර්ෂික ගාස්තු හා 2011 හා 2012 වර්ෂ වෙනුවෙන් වූ එකතුව රු.32,249,024 ක සෙස් බදු ආදායම මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබුණි. 2014 වර්ෂය සඳහා අරමුදලින් ලැබිය යුතු වාර්ෂික ගාස්තු හා 2013 හා 2014 වර්ෂ වෙනුවෙන් ලැබිය යුතු සෙස් බද්ද හඳුනාගෙන නොතිබුණු අතර ඒ වෙනුවෙන් ඇස්තමෙන්තුගත මුදලක් හෝ ගිණුම්ගත කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

විගණන ගාස්තු ගෙවීම වෙනුවෙන් බැරකමක් ඇති වී නොතිබියදී 2010 සිට 2012 වර්ෂය දක්වා ගෙවිය යුතු අභ්‍යන්තර විගණන ගාස්තු වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල සාවද්‍ය ලෙස රු.1,035,000 ක් දක්වා තිබුණි.

### 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත | |
| (i) 79 හා 82 (1) ඡේද | තැරැව්කරුවකු වශයෙන් ලියාපදිංචි කිරීමේ සහතිකයක් නොමැතිව රක්ෂණ තැරැව්කරුවකුගේ ව්‍යාපාරය කරගෙන යාම තහනම් වන අතර එසේ ඉල්ලුම් කර ඇති විටක හා ඊට අදාල අවශ්‍යතාවයන් පිළිබඳ මණ්ඩලය සෑහීමකට පත්වන අවස්ථාවක මණ්ඩලය විසින් එම ඉල්ලුම්කරු, රක්ෂණ තැරැව්කරුවකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබිය යුතු වුවද, මණ්ඩලයේ සභාපතිවරයා විසින් මහජනයා වෙත කරන ලද දැන්වීමක් අනුව 2012 අප්‍රේල් 27 දින සිට නැවත දන්වන තුරු එවැනි ලියාපදිංචි සඳහා අයදුම්පත් භාර ගැනීම නවතා දමා තිබුණි. කෙසේ වුවද මේ සම්බන්ධයෙන් මණ්ඩලයේ සභාපති විසින් විගණනයට දන්වා තිබුණේ පනතේ 5 (ඖ) වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ අරමුණු හා වගකීම් සපුරාලීමේදී අවශ්‍යවන වෙනත් ඕනෑම ක්‍රියාවක් කිරීමට හැකි බලය මණ්ඩලය සතු බවයි. |
| (ii) 103 (1) වගන්තිය | රක්ෂණ ඔප්පු දරන්නන්ගේ ආරක්ෂක අරමුදලක් පිහිටුවා ඒ සඳහා පනතේ 7 වන වගන්තිය යටතේ පනවා අය කරනු ලබන සෙස් බද්දෙන් උපචිත වන මුදල් බැර කරනු ලැබිය යුතු වූ අතර පනත ප්‍රකාරව, එම අරමුදලේ මුදල් යෙදවිය යුතු කාර්යයන් වලට පටහැනිව මණ්ඩලයේ මුළු වියදම් පියවීමට ප්‍රමාණවත් තරම් ආදායම් උපයා නොමැති සෑම අවස්ථාවකදීම මණ්ඩලයේ ඌනතාවය පියවීමට එම අරමුදල උපයෝගී කරගෙන තිබුණි. ඊට අමතරව, එම කාර්යයන්වලට පටහැනිව 2013 වර්ෂයේදී දී රු. 300,000,000 ක් මෙම අරමුදලින් ඒකාබද්ධ අරමුදලටද මාරු කර තිබුණි. |
| (ආ) 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාරය චක්‍රලේඛය | |
| (i) 6.5.1 ඡේදය | සමාලෝචිත වර්ෂයට අදාල මණ්ඩලයේ වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් මූල්‍ය ප්‍රකාශන සමඟ විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) 8.3.4 ඡේදය | දුරකථන ගාස්තු අනුමත සීමා ඉක්මවා තිබේදැයි තහවුරු කර ගැනීමේදී එක් එක් නිලධාරියාගේ කාර්යාල හා නිවාස දුරකථන සඳහා ගෙවනු ලබන ඇමතුම් ගාස්තු සියල්ලේ එකතුව ලබාගත යුතු වුවද, නිළධාරීන් 6 දෙනෙකු සඳහා වෙන් කර තිබූ රාජකාරී දුරකථන භාවිතා නොකොට පොදු දුරකථන හරහා ඇමතුම් ලබා ගැනීම හේතුවෙන් පොදු දුරකථන වියදම රු.1,633,011ක් ලෙස ඉහල අගයක් ගෙන තිබුණි. |
| (ii) 9.14.1 ඡේදය | පරිපාලන අත්පොත සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙතින් අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

### 2.4 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය විසින් විධිමත් අනුමැතියකින් තොරව නිලධාරීන් 82 දෙනෙකුට රු 50,000 ක් බැගින් උත්සව අත්තිකාරම් ලබා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් එකතුව රු.1,065,000 ක ශේෂයක් පැවතියද, ආයතන සංග්‍රහයට සිදු කළ සංශෝධන අනුව උත්සව අත්තිකාරම් ලෙස ලබාදිය හැකි උපරිම මුදල රු.5,000 කට පමණක් සීමා වී තිබුණි.

(ආ) විධිමත් අනුමැතියකින් තාරව මූලික වැටුප රු. 25,000 ට අඩු නිලධාරීන් 5 දෙනෙකු සඳහා ආපදා ණය ලෙස රු. 250,000 ක් බැගින් ගෙවා තිබුණි.

(ඇ) 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව අමාත්‍ය මණ්ඩලය, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හෝ භාණ්ඩාගාරය විසින් නිශ්චිතවම අනුමත කරන ලද ප්‍රතිලාභ පමණක් තම පාලක මණ්ඩලවල අනුමැතිය ඇතිව සිය සේවකයින්ට ගෙවීමට සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවලට හැකි බවත් එවැනි අධිකාර බලයක් නොමැතිව සිදු කරන අතිරේක දීමනා, දිරි දීමනා ගෙවීම් සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගත යුතු බවත් දක්වා තිබුණ ද, භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ 2009 දෙසැම්බර් 29 දිනැති අංක MF/2/4/1BSL/GEN දරන ලිපිය මගින් දන්වා තිබුණු පරිදි මණ්ඩලය විසින් දිරිදීමනා යෝජනා ක්‍රමයක් සකස් කර ඒ සඳහා අනුමැතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. කෙසේ වුවද මණ්ඩලය 2009 සිට 2012 දක්වා ප්‍රසාද දීමනා ද 2013 හා 2014 වර්ෂවල දිරිදීමනා ලෙස පිළිවෙලින් රු.1,951,246 ක් හා රු.1,754,948 ක්ද ගෙවා තිබුණි.

### 3 මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිපල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.163,129 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.148,207 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.14,922 ක හෙවත් සියයට 10 ක වැඩිවීමක් දක්නට ලැබුණි. මේ සඳහා වියදම රු. 2,082,977 කින් වැඩිවීමට සාපේක්ෂව ආදායම රු.2,097,699 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 3.2 විශ්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට වූ ජංගම වත්කම්වල වටිනාකම රු. 2,195,085,644 ක් වූ අතර එයින් සියයට 99 ක් හෙවත් රු. 2,170,032,222 ක් 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 103 වන වගන්තිය ප්‍රකාරව පිහිටු වූ රක්ෂණ ඔප්පු දරන්නන්ගේ ආරක්ෂණ අරමුදලෙහි ආයෝජනයන් නියෝජනය විය. ඒ අනුව ජංගම වත්කම් අනුපාතය 105:1 ලෙස ඉහලට මට්ටමක පැවතුණි.

### 4 මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධන

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රක්ෂණ සහතික දරන්නන්ගේ සහ අනාගත රක්ෂණ සහතික දරන්නන්ගේ සම්බන්ධතා ආරක්ෂා කිරීම අරමුණු කර ගනිමින් රක්ෂිතයෙකු විසින් ඉදිරිපත් කරනු ලබන රක්ෂණ හිමිකම් ගෙවීමක් සම්බන්ධ ආරවුලකදී එය විමර්ශනය කිරීමේ ව්‍යවස්ථාපිත බලතල මණ්ඩලය සතු වූ අතර සමාලෝචිත වර්ෂය තුළ මෙසේ මණ්ඩලය වෙත ලද පැමිණිලි සංඛ්‍යාව 284 කි. ඉන් පැමිණිලි 157 ක් සහ 2013 වර්ෂයේ සිදු කරන ලද පැමිණිලි 11 ක් සම්බන්ධයෙන් විගණිත දිනය වූ 2015 අප්‍රේල් 07 දින වන විටත් විමර්ශන කටයුතු අවසන් කර නොතිබුණු අතරම විමර්ශනය අවසන් කිරීමට මාස 03 සිට මාස 10 දක්වා ප්‍රමාද වූ අවස්ථා 75 ක් විය.

(ආ) රක්ෂණ ඔප්පු හිමියන් ආරක්ෂා කිරීමේ හා මහජනතාව දැනුවත් කිරීම තුලින් රක්ෂණය පිලිබඳව විශ්වාසය වර්ධනය කිරීමේ අරමුණින් වෙළඳ පොළ සංවර්ධන හා බාහිර සම්බන්ධතා ඒකකය පිහිටුවා තිබුණු අතර මෙම ඒකකය මගින් සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ කාර්යයන් සඳහා රු. 10,100,000 ක් ප්‍රතිපාදනය කර තිබුණි. එම කාර්යයන්වල ප්‍රගතිය පහත පරිදි විය.

(i) රාජ්‍ය නියෝජිතයන්ගේ රක්ෂණය පිළිබඳ දැනුම වර්ධනය කිරීමේ අරමුණින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල දැනුවත් කිරීමේ වැඩසටහන් 10 ක් පවත්වා තිබුණ ද, ඉන් කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පවත්වන ලද වැඩසටහන සඳහා සහභාගී වී තිබුණේ පුද්ගලයින් දහතුන් දෙනෙකු පමණක් විය.

(ii) සමාලෝචිත වර්ෂය තුල තෝරාගත් මහජනයා රැස්වන ස්ථාන සඳහා ඉදිරිපත් කිරීම් 3 ක් පැවැත්වීමට සැලැසුම් කර තිබුණ ද එම කාර්යය නිම කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

(iii) ප්‍රදර්ශන සඳහා සහභාගී වීම සහ ප්‍රධාන මාර්ගවල සිදු කරනු ලබන වීදි ප්‍රචාරණ කටයුතු සඳහා සහභාගී වීමට සැලසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුල දී දැයට කිරුල ප්‍රදර්ශනය සඳහා පමණක් මණ්ඩලය සහභාගී වී තිබුණි.

(iv) විද්‍යුත් මාධ්‍ය වැඩසටහන් යටතේ රු. 2,500,000 ක ඇස්තමේන්තුවක් මත ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ ලේඛනගත මාධ්‍ය ව්‍යාපාරය වර්ෂය තුළ ක්‍රියාත්මක කළ බවට සාක්ෂි ඉදිරිපත් නොවුණි.

(v) රක්ෂණ කර්මාන්තයේ හා ඔප්පු හිමියන්ගේ යහපත උදෙසා රක්ෂණ ඔප්පු වැඩි දියුණු කිරීමේ අදහසින් සමාගම් වල රක්ෂණ නිපැයුම් සමාලෝචනයට ලක් කිරීම යටතේ සමාලෝචිත වර්ෂය තුල රක්ෂණ සමාගම් 6 ක් විසින් හඳුන්වා දී ඇති රක්ෂණ ඔප්පු 7 ක් සමාලෝචනයට භාජනය කර තිබුණි. ඊට අදාලව රක්ෂණ ඔප්පුවල පවතින දුර්වලතා සහ ඒ සඳහා යෝජිත නිර්දේශ ඇතුලත් වාර්තාවක් පිලියෙල කර මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත 2014 නොවැම්බර් 19 දින ඉදිරිපත් කර තිබුණද එම වාර්තාවෙන් පෙන්වා දී ඇති අඩුපාඩු පිළිබඳව අදාල රක්ෂණ සමාගම් දැනුවත් කිරීමට විගණිත දිනය වූ 2015 අප්‍රේල් 08 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) 2009 වර්ෂයේ දී මණ්ඩලය විසින් පෞද්ගලික රක්ෂණ ආයතනයක් වෙත අත්හිටුවීමක් පනවා තිබුණු අතර අංක්ˆකඃ;ඎ*191රැ09 දරන මූලික අයිතිවාසිකම් නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය ලබාදුන් නියෝග ප්‍රකාර, එම සමාගම වෙත ඉදිරිපත් කරනු ලබන අව්‍යාජ රක්ෂණ හිමිකම් පෑම් ක්‍රමවත්ව බේරුම් කිරීම සඳහා එකී සමාගමේ වත්කම් බැහැර කිරීම සඳහා මණ්ඩලය, සමාගම සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹී තිබුණි. ඒ අනුව, හිමිකම් ඉල්ලුම්කරුවන්ට ඔවුන්ගේ හිමිකම් ඉල්ලීම් මණ්ඩලය වෙත ලිඛිතව ඉදිරිපත් කරන ලෙසට පුවත්පත් නිවේදනයක් මගින් දැනුම් දී තිබුණු අතර එසේ ලද අව්‍යාජ හිමිකම් පෑම් 142 කින් කිසිදු හිමිකම් ඉල්ලීමක් සඳහා ගෙවීම් කර අවසන් කර නොතිබුණි.

## 4.2 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අනුමත තනතුරු සංඛ්‍යාව 43 ක් වුවද, තථ්‍ය සංඛ්‍යාව 41 ක් වීමෙන් පුරප්පාඩු 03 ක් හා අතිරික්ත 01 ක් පැවතුණි. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති තනතුරු සංඛ්‍යාව ඉක්මවා කාර්යාල සහායක තනතුරක් සඳහා බඳවා ගැනීම් සිදු කර තිබුණද, ඒ සඳහා ලබාගත් අනුමැතිය විගණනයට ඉදිරිපත් නොවීය.

(ආ) ස්ථිර තනතුරක් වන අධ්‍යක්ෂ සුපරීක්ෂණ තනතුර සඳහා 2011 දෙසැම්බර් 26 දින කොන්ත්‍රාත් පදනම මත අධ්‍යක්ෂවරයෙකු පත් කර තිබුණ අතරම ස්ථිරව නිලධාරියෙකු බඳවා ගැනීමට මණ්ඩලය ක්‍රියා කර නොතිබුණි.

(ඇ) 2007 නොවැම්බර් 26 දින සිට පුරප්පාඩුව පවතින සහකාර අධ්‍යක්ෂ තනතුරු දෙක සඳහා සුදුසුකම් සහිත නිලධාරීන් බඳවා ගැනීමට විගණිත දිනය වූ 2015 මැයි 20 දින දක්වාත් මණ්ඩලය කටයුතු කර නොතිබුණි.

(ඈ) එක් එක් තනතුරට අදාල බඳවා ගැනීම් පරිපාටි සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

# විගණකාධිපති වාර්තාව

### 4.3 ආර්ථික නොවූ ගනුදෙනු

මණ්ඩලය විසින් තම කාර්යාලය අවම පිරිවැයකින් පවත්වා ගැනීමට කටයුතු නොකොට ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ වර්ග අඩියකට රු. 214 බැගින් අඩි 8,741 ක ප්‍රමාණයක් සඳහා සමාලෝචිත වර්ෂයේ දී එකතුව රු. 23,862,930 ක විශාල පිරිවැයක් හා රථ ගාල් කිරීමේ ගාස්තු ලෙස රු. 383,160 ක් ගෙවා තිබුණි. ඒ හේතුවෙන් වාර්ෂිකව, ආදායම ඉක්මවූ වියදම පියවා ගැනීමට රක්ෂණ ඔප්පු දරන්නන්ගේ ආරක්ෂක අරමුදලින්ද මුදල් ලබා ගැනීමට මණ්ඩලය ක්‍රියා කර තිබුණි.

### 5 ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත ආදායම් හා වියදම්, තත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී සියයට 3 සිට සියයට 100 දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

### 5.2 නොවිසඳී ඇති විගණන ජේද

2014 අප්‍රේල් 08 දින පැවති රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ ගිණුම් කාරක සභාව විසින් ලබාදුන් නියෝග ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂනය විය.

(අ) 2010 වර්ෂයේදී මණ්ඩලය විසින් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව එහි නිලධාරීන් 17 දෙනෙකු වෙත වැටුප් වර්ධක දෙක බැගින් ගෙවා තිබීම හා 2012 ජූලි මාසයේ සිට මණ්ඩලය විසින් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව එහි සියලුම නිලධාරීන්ගේ වැටුප් සියයට 25 කින් වැඩි කිරීම සම්බන්ධව වර්තමාන කළමනාකාරිත්වය භාණ්ඩාගාරය වෙත ලිඛිතව දැනුම් දී ඒ සම්බන්ධයෙන් ඔවුන්ගෙන් උපදෙස් ලබාගත යුතු බවට නියෝග කර තිබුනද ඊට සම්බන්ධව තොරතුරු ඇතුළත් ලිපියක් මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර ඇති බව පමණක් විගණනයට දන්වා තිබුණි.

(ආ) භාණ්ඩාගාර අනුමැතියකින් තොරව රු. 513,713 ක් වැය කරමින් මණ්ඩලයේ නිලධාරීන් 33 දෙනෙකු හා ඔවුන්ගේ පවුල් වල සාමාජිකයින් සඳහා රක්ෂණාවරණයක් ලබා ගැනීම සම්බන්ධයෙන් විධිමත් පරිදි කටයුතු කරන ලෙස මණ්ඩලයට නියෝගකර තිබුණ ද, මේ සම්බන්ධයෙන් භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 6 පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) කාර්ය මණ්ඩල පරිපාලනය
(ඇ) සේවක ණය



ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති(වැඩබලන)

# විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම

| | විගණකාධිපති වාර්තාව | ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම |
|---|---|---|
| **2.2** | **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම** | |
| **2.2.1** | **ගිණුම්කරණ ප්‍රතිපත්ති** | |
| | මණ්ඩලය ආදායම් හඳුනා ගැනීම උපචිත පදනම මත සිදු කළද සමාලෝචිත වර්ෂය අවසාන වනවිට හඳුනාගෙන ඉන්වොයිස් කර තිබූ ඉකුත් වර්ෂ 30 අදාල ජාතික රක්ෂණ භාර අරමුදලින් ලැබිය යුතු එකතුව රු.5,897,549 ක් වූ වාර්ෂික ගාස්තු හා 2011 හා 2012 වර්ෂ වෙනුවෙන් වූ එකතුව රු.32,249,024/-ක සෙස් බදු ආදායම මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබුණි. 2014 වර්ෂය සඳහා අරමුදලින් ලැබිය යුතු වාර්ෂික ගාස්තු හා 2013 හා 2014 වර්ෂ වෙනුවෙන් ලැබිය යුතු සෙස් බද්ද හඳුනාගෙන නොතිබුණු අතර ඒ වෙනුවෙන් ඇස්තමේන්තුගත මුදලක් හෝ ගිණුම්ගත කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් කිහිපවරක් ජාතික රක්ෂණ භාර අරමුදල හා මණ්ඩලය අතර ලිපි හුවමාරුවීම් හා සාකච්ඡා පැවතියද, අදාළ හිඟ මුදල් මණ්ඩලය වෙත ගෙවීම සමබන්ධයෙන් නිශ්චිත තීරණයක් ඔවුන් මණ්ඩලය වෙත ලිඛිතව යොමුකර නොමැති බැවින් එකී මුදල් ලැබීම සම්බන්ධයෙන් අවිනිශ්චිතතාවයක් පවතී.<br>එවැනි තත්ත්වයක් යටතේ ජංගම වත්කමක්ද සමඟ මෙවන් ඉහළ ආදායමක් මණ්ඩලයේ ගිණුම් වල හඳුනාගැනීම විචක්ෂණ සංකල්පයට අනුකූල නොවන බව අපගේ හැඟීමයි. තවද, ජාතික රක්ෂණ භාර අරමුදලෙහි 2012 හා 2013 වර්ෂයන් සඳහා විගණිත මූල්‍ය ප්‍රකාශන මණ්ඩලය වෙත ලැබුණේ 2015 ජූලි 02වන දින බැවින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන විට අදාළ අගයන් නිශ්චය කිරීමේ හැකියාවක් නොපැවතුණි. |
| **2.2.2** | **ගිණුම්කරණ අඩුපාඩු** | |
| | විගණන ගාස්තු ගෙවීම වෙනුවෙන් බැරකමක් ඇති වී නොතිබියදී 2010 සිට 2012 වර්ෂය දක්වා ගෙවිය යුතු අභ්‍යන්තර විගණන ගාස්තු වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල සාවද්‍ය ලෙස රු.1,035,000 ක් දක්වා තිබුණි. | අදාළ වෙන් කිරීම මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත්තේ මණ්ඩලයේ අභ්‍යන්තර විගණන කටයුතු භාරව සිටින මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට අදාළ ගෙවීම් කිරීමේ අපේක්ෂාවෙන් වන බැවින් එය සාවද්‍ය වෙන් කිරීමක් නොවේ. තවද, 2013, 2014 වර්ෂ සඳහා කිසිදු වෙන් කිරීමක් සිදුකර නොමැති අතර කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව 2011, 2012 වසර සඳහා කිසිදු ගෙවීමක් අපේක්ෂා නොකරන බව අපගේ ලිපියට ප්‍රතිචාර වශයෙන් 2015.05.11 දින ලිඛිතව දන්වා ඇති බැවින් අදාළ වෙන් කිරීම කපා හරින ලදී. |
| **2.3** | **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම** | |
| (අ)<br>(i) | 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත<br>79 හා 82 (1) ඡේද<br>තැරැව්කරුවෙකු වශයෙන් ලියාපදිංචි කිරීමේ සහතිකයක් නොමැතිව රක්ෂණ තැරැව්කරුවකුගේ ව්‍යාපාරය කරගෙන යාම තහනම් වන අතර එසේ ඉල්ලුම්කර ඇති විටක හා ඊට අදාල අවශ්‍යතාවයන් පිළිබඳ මණ්ඩලය සෑහීමකට පත්වන අවස්ථාවක මණ්ඩලය විසින් එම ඉල්ලුම්කරු, රක්ෂණ තැරැව්කරුවෙකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබිය යුතු වූවද, මණ්ඩලයේ සභාපතිවරයා විසින් මහජනයා වෙත කරන ලද දැන්වීමක් අනුව 2012 අප්‍රේල් 27 දින සිට නැවත දන්වන තුරු එවැනි ලියාපදිංචි සඳහා අයදුම්පත් භාර ගැනීම නවතා දමා තිබුණි. කෙසේ වූවද, මේ සම්බන්ධයෙන් මණ්ඩලයේ සභාපති විසින් විගණනයට දන්වා තිබුණේ පනතේ 5 (ඌ) වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ අරමුණු හා වගකීම් සපුරාලීමේදී අවශ්‍යවන වෙනත් ඕනෑම ක්‍රියාවක් කිරීමට හැකි බලය මණ්ඩලය සතු බවයි. | රක්ෂණ තැරැව්කරුවකු වශයෙන් ලියාපදිංචි වීමට අපේක්ෂා කරන සමාගම් විසින් රක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍ර සංඛ්‍යාව වර්ෂ 2011- 2012 අතර කාල සීමාවේදී අති විශාල වශයෙන් ඉහළ ගිය අතර එම සංඛ්‍යාව රක්ෂණ සමාගම් සංඛ්‍යාව මෙන් දෙගුණයටත් වඩා වැඩි බව මණ්ඩලය විසින් නිරීක්ෂණය කරන ලදී. තවද තැරැව්කාර සමාගම් ලියාපදිංචි කර ඒ මගින් නොයෙකුත් අක්‍රමිකතා සිදුවන බවද තවදුරටත් නිරීක්ෂණය කරන ලදී.<br>2012 මාර්තු මස 27 දින පැවැත්වූ රක්ෂණ කර්මාන්ත කරුවන්ගේ (රක්ෂණ තැරැව්කාර සමාගම් සහ රක්ෂණ සමාගම්) රැස්වීමේදී මේ පිළිබඳව සාකච්ඡා වූ අතර එහිදී එම සමාගම් විසින්ම යෝජනා කරන ලද්දේ ලියාපදිංචිය සඳහා නව අයදුම් පත්‍ර භාර ගැනීම මණ්ඩලය විසින් තාවකාලිකව අත්හිටවිය යුතු බවයි.<br>එකී යෝජනාව රක්ෂණ මණ්ඩලයේ 114 වන රැස්වීමේදී අනුමත කරන ලදී. ඒ අනුව, 2012 මාර්තු 27 දින සිට තාවකාලික අත්හිටුවීම ක්‍රියාත්මක වන බව පුවත්පත් දැන්වීම් මාර්ගයෙන් මණ්ඩලය විසින් මහජනතාව දැනුවත් කර ඇත.<br>රක්ෂණ මණ්ඩලයේ අරමුණු හා වගකීම් සපුරාලීමේදී මණ්ඩලයට අවශ්‍ය වන ආකාරයෙන් බලතල ක්‍රියාත්මක කිරීමට, කාර්ය හා කර්තව්‍ය ඉටුකිරීමට අවශ්‍ය වන වෙනත් ඕනෑම ක්‍රියාවක් කිරීමට හැකි බලය මණ්ඩලය සතු බව රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 5 (ඌ) වගන්තියෙහි දක්වා ඇත. |

# විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම

| | විගණකාධිපති වාර්තාව | ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම |
|---|---|---|
| **2.3** | **නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම** | |
| (ii) | 103 (1) වගන්තිය<br>රක්ෂණ ඔප්පු දරන්නන්ගේ ආරක්ෂක අරමුදලක් පිහිටුවා ඒ සඳහා පනතේ 7 වන වගන්තිය යටතේ පනවා අය කරනු ලබන සෙස් බද්දෙන් උපචිත වන මුදල් බැර කරනු ලැබිය යුතු වූ අතර පනත ප්‍රකාරව, එම අරමුදලේ මුදල් යෙදවිය යුතු කාර්යයන් වලට පටහැනිව මණ්ඩලයේ මුළු වියදම් පියවීමට ප්‍රමාණවත් තරම් ආදායම් උපයා නොමැති සෑම අවස්ථාවකදීම මණ්ඩලයේ ඌණතාවය පියවීමට එම අරමුදල උපයෝගී කරගෙන තිබුණි. ඊට අමතරව, එම කාර්යයන්වලට පටහැනිව 2013 වර්ෂයේදී රු.300,000,000 ක් මෙම අරමුදලින් ඒකාබද්ධ අරමුදලට ද මාරු කර තිබුණි. | අප විසින් මණ්ඩලයේ වියදම් දැරීම සඳහා භාණ්ඩාගාරයෙන් අරමුදල් ලබා නොගන්නා අතර සියලු වියදම් දරනුයේ රක්ෂණ සමාගම් ලියාපදිංචි වීමේ ගාස්තු සහ වාර්ෂික ගාස්තු වලින් ලැබෙන ආදායමෙනි. නමුත් වාර්ෂික ඌණතාවය (Deficit of the Year) පියවා ගැනීමට ප්‍රමාණවත් වන මුදලක් පමණක් ඔප්පුහිමියන්ගේ ආරක්ෂණ අරමුදලින් ලබා ගනී. එහි ප්‍රතිඵලයක් වශයෙන් මණ්ඩලයේ සමුච්චිත අරමුදලෙහි ශේෂයක් නොපවතින බව පසුගිය වසර කිහිපයක වාර්ෂික ගිණුම් නිරීක්ෂණය කිරීම තුළින් පැහැදිලි වනු ඇත.<br>රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීමේ පරමාර්ථයෙන් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය පිහිටුවා ඇති බැවින් එහි කාර්යයන් ඉටු කිරීමේදී දැරීමට සිදුවන නමුත් සිය ආදායමින් පියවා ගත නොහැකි වූ වියදම් රක්ෂණ ඔප්පු දරන්නන්ගේ ආරක්ෂණ අරමුදලින් ලබා ගැනීම පනතේ කාර්යයන්ට පටහැණි වන්නේ කෙසේද යන්න ගැටළු සහගතය.<br>තවද, 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 103 (2) වගන්තිය සමඟ කියවිය යුතු 2005 රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ අංක 1412 /30 රීති අංක 10 අනුව මණ්ඩලයට සිය අභිමතාර්ථයන් වෙනුවෙන් දැරීමට සිදුවන වියදම් රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලින් ලබාගැනීමේ හැකියාව පවතී.<br>2013 වසරේදී රු. මිලියන 300ක් ඒකාබද්ධ අරමුදලට බැර කරන ලද්දේ, 1971 අංක 38 දරන මුදල් පනතේ ප්‍රතිපාදනයන්ට අනුව මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය විසින් රු. මිලියන 500ක් ලබා දෙන ලෙස කළ ඉල්ලීමකට අනුවය. එම ඉල්ලීම අනුව එම අවස්ථාවේදී රු. මිලියන 300ක් වත් නිදහස් නොකළේ නම් භාණ්ඩාගාරය විසින් අපගෙන් නිදහසට කරුණු විමසනු ඇත.<br>මේ සම්බන්ධ වැඩිමනත් තොරතුරු භාණ්ඩාගාර ලේකම්තුමාගෙන් ලබාගැනීම මැනවි. |
| (ආ) | 2003 ජූනි 02 දිනැති අංක PED/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| (i) | 6.5.1 ඡේදය<br>සමාලෝචිත වර්ෂයට අදාළ මණ්ඩලයේ වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් මූල්‍ය ප්‍රකාශන සමඟ විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් මූල්‍ය ප්‍රකාශ සමඟ ඉදිරිපත් කිරීමක් මණ්ඩලය මේ දක්වා සිදුකර නොමැති අතර රක්ෂණ සමාගම් වලට අදාළ තොරතුරු දින 60ක් තුළ ලබාගත නොහැකි බැවින් කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීම ප්‍රායෝගික නොවේ. |
| (ii) | 8.3.4 ඡේදය<br>දුරකථන ගාස්තු අනුමත සීමා ඉක්මවා තිබේදැයි තහවුරු කර ගැනීමේදී එක් එක් නිලධාරියාගේ කාර්යාල හා නිවාස දුරකථන සඳහා ගෙවනු ලබන ඇමතුම් ගාස්තු සියල්ලේ එකතුව ලබා ගතයුතු වුවද, නිලධාරීන් 6 දෙනෙකු සඳහා වෙන්කර තිබූ රාජකාරී දුරකථන භාවිතා නොකොට පොදු දුරකථන හරහා ඇමතුම් ලබා ගැනීම හේතුවෙන් පොදු දුරකථන වියදම රු.1,633,011 ක් ලෙස ඉහළ අගයක් ගෙන තිබුණි. | ඇමතුම් ලබා ගැනීමේදී හැකි සෑම විටම රාජකාරී සෘජු දුරකථන අංකය භාවිතයෙන් ඇමතුම් ලබා ගන්නා ලෙස අදාල අධ්‍යක්ෂකවරුන් දැනුවත් කර ඇති අතර අදාළ සෘජු දුරකථන ලබා දී ඇත්තේ ලැබෙන ඇමතුම් වලදී භාවිතා කිරීම සඳහායි. ඇමතුම් ලබා ගැනීමේදී ඔවුන්ට ලබා දී ඇති ජංගම දුරකථන භාවිතය බොහෝවිට සිදුවේ. එකී භාවිතයද අදාළ උපරිම සීමා තුළ පවතී. මෙකී සෘජු දුරකථන 6 වෙනුවෙන් වර්ෂය තුළ දරන ලද මුදල රු.119,450/16 පමණක් වේ. රු. 1,633,011 ක් යනු ආයතනයේ පොදු දුරකථන, සෘජු දුරකථන අංක හා ෆැක්ස් අංක යනාදී සියලු දුරකථන සඳහා වර්ෂය වෙනුවෙන්ම ගෙවන ලද මුදලයි. |
| (iii) | 9.14.1 ඡේදය<br>පරිපාලන අත්පොත සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙතින් අනුමැතිය ලබාගෙන නොතිබුණි. | 2014.12.02 දින නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්තුමා සහ අමාත්‍යාංශ නිලධාරීන් සමඟ පැවති සාකච්ඡාවේදී උපදෙස් ලද පරිදි පරිපාලන අත්පොතෙහි අන්තර්ගත මූල්‍ය අගයන් ඉවත්කර අදාළ අත්පොත නැවත සකස් කිරීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. හැකි ඉක්මණින් ඒ සඳහා අදාළ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ඇත. |

# විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම

| | විගණකාධිපති වාර්තාව | ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම |
|---|---|---|
| **2.4** | **ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙනු** | |
| (අ) | මණ්ඩලය විසින් විධිමත් අනුමැතියකින් තොරව නිලධාරීන් 82කට රු.50,000ක් බැගින් උත්සව අත්තිකාරම් ලබා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් එකතුව රු. 1,065,000/- ක ශේෂයක් පැවතියද, ආයතන සංග්‍රහයට සිදුකළ සංශෝධන අනුව උත්සව අත්තිකාරම් ලෙස ලබාදිය හැකි උපරිම මුදල රු. 5,000 කට පමණක් සීමා වී තිබුණි. | රු.50,000/-ක් උත්සව අත්තිකාරම් ගෙවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය තිබෙන අතර එය පරිපාලන අත්පොතෙහි අංගයක්ද වේ. කෙසේ වුවද, 2014.12.02 දින භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් මුදල් අමාත්‍යාංශයේ, පරිපාලන අත්පොත සහ උත්සව අත්තිකාරම් සම්බන්ධයෙන් පැවති සාකච්ඡාවේදී එකී ගෙවීම 2009 වසරේ සිට කරගෙන යන බැවින් ඒ සම්බන්ධයෙන් විරෝධතාවයක් පල නොකළ අතර, පරිපාලන අත්පොත භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් දුන් උපදෙස් පදනම් කරගෙන සංශෝධනය කර අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලෙසට දැනුම් දී ඇත. ඒ අනුව අදාල වෙනස්කම් / සංශෝධන පරිපාලන අත්පොතට ඇතුළත් කිරීමේ කටයුතු මේ වන විටත් ක්‍රියාත්මක අතර එය නිම වීමෙන් පසු මුදල් අමාත්‍යාංශයේ අනුමැතියට යොමු කිරීමට කටයුතු සම්පාදනය කරනු ඇත. තවද නිලධාරීන් 32කට පමණක් 2014 වසරේ දී අදාළ උත්සව අත්තිකාරම් ලබා දී ඇති බැවින් මණ්ඩලයේ මුළු සේවක සංඛ්‍යාව වන 41 ද ඉක්මවා 82කට අදාල පහසුකම් සපයා ඇති බව පැවසීම සාවද්‍ය බව කරුණාවෙන් සලකන්න. |
| (ආ) | විධිමත් අනුමැතියකින් තොරව මූලික වැටුප රු.25,000 ට අඩු නිලධාරීන් 5 දෙනෙකු සඳහා ආපදා ණය ලෙස රු.250,000 ක් බැගින් ගෙවා තිබුණි. | ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ආපදා ණය ගෙවීම සඳහා අදාළ කරගනුයේ එහි පරිපාලන අත්පොතයි. එහි සඳහන් පරිදි මණ්ඩලයේ සියලුම සේවකයින් හට රු.250,000/-ක උපරිම ආපදා ණය මුදල ගෙවනු ලැබේ. කෙසේ වුවද, ආපදා ණය මුදල නිදහස් කිරීමේදී වැටුපෙන් මුළු අඩුකිරීම් 60% සීමාව නොඉක්මවීමට කටයුතු කෙරේ. මෙම ගෙවීම ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය පිහිටවූ දින සිටම ගෙවනු ලැබේ. |
| (ඇ) | 1994 ජූනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව අමාත්‍ය මණ්ඩලය, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හෝ භාණ්ඩාගාරය විසින් නිශ්චිතවම අනුමත කරන ලද ප්‍රතිලාභ පමණක් තම පාලක මණ්ඩලවල අනුමැතිය ඇතිව සිය සේවකයින්ට ගෙවීමට සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල වලට හැකි බවත් එවැනි අධිකාර බලයක් නොමැතිව සිදුකරන අතිරේක දීමනා, දිරි දීමනා ගෙවීම් සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගත යුතු බවත් දක්වා තිබුණද, භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ 2009 දෙසැම්බර් 29 දිනැති අංක MF/2/4/IBSL/GEN දරන ලිපිය මගින් දන්වා තිබුණු පරිදි මණ්ඩලය විසින් දිරි දීමනා යෝජනා ක්‍රමයක් සකස් කර ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. කෙසේ වුවද මණ්ඩලය 2009 සිට 2012 දක්වා ප්‍රසාද දීමනා ද 2013 සහ 2014 වර්ෂවල දිරි දීමනා ලෙස පිළිවෙලින් රු.1,951,246 ක් හා රු.1,754,948 ක්ද ගෙවා තිබුණි. | මණ්ඩලය විසින් සකස් කරන ලද කාර්ය සාධනය මත පදනම් වූ දිරි දීමනා යෝජනා ක්‍රමය 2014.11.04 දින මුදල් අමාත්‍යාංශය වෙත යවා ඇත.<br>තවද, අදාළ ගෙවීම් කර ඇත්තේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත බව දන්වනු කැමැත්තෙමු. |
| **3.** | **මූල්‍ය සමාලෝචනය** | |
| **3.1** | **මූල්‍ය ප්‍රතිඵල** | |
| | ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.163,129 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.148,207 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.14,922 ක හෙවත් සියයට 10 ක වැඩිවීමක් දක්නට ලැබුණි. මේ සඳහා වියදම රු.2,082,977 කින් වැඩිවීමට සාපේක්ෂව ආදායම රු. 2,097,699 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. | |

# විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම

| | විගණකාධිපති වාර්තාව | ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම |
|---|---|---|
| **3.2** | **විශ්‍රාභාත්මක මූල්‍ය සමාලෝචනය** | |
| | මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට වූ ජංගම වත්කම් වල වටිනාකම රු.2,195,085,644 ක් වූ අතර එයින් සියයට 99ක් හෙවත් රු.2,170,032,222 ක් 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 103 වන වගන්තිය ප්‍රකාරව පිහිටවූ රක්ෂණ ඔප්පු දරන්නන්ගේ ආරක්ෂණ අරමුදලෙහි ආයෝජනයන් නියෝජනය විය. ඒ අනුව ජංගම වත්කම් අනුපාතය 105:1 ලෙස ඉහළ මට්ටමක පැවතුණි. | |
| **4.** | **මෙහෙයුම් සමාලෝචනය** | |
| **4.1** | **කාර්ය සාධනය** | |
| (අ) | රක්ෂණ සහතික දරන්නන්ගේ සහ අනාගත රක්ෂණ සහතික දරන්නන්ගේ සම්බන්ධතා ආරක්ෂා කිරීම අරමුණු කර ගනිමින් රක්ෂිතයෙකු විසින් ඉදිරිපත් කරනු ලබන රක්ෂණ හිමිකම් ගෙවීමක් සම්බන්ධ ආරවුලකදී එය විමර්ශනය කිරීමේ ව්‍යවස්ථාපිත බලතල මණ්ඩලය සතු වූ අතර සමාලෝචිත 2014 වර්ෂය තුළ මෙසේ මණ්ඩලය වෙත ලද පැමිණිලි සංඛ්‍යාව 284කි. ඉන් පැමිණිලි 157ක් සහ 2013 වර්ෂයේ සිදු කරන ලද පැමිණිලි 11 ක් සම්බන්ධයෙන් විගණිත වූ දිනය 2015 අප්‍රේල් 07 වන විටත් විමර්ශන කටයුතු අවසන් කර නොතිබුණු අතරම විමර්ශනය අවසන් කිරීමට මාස 03 සිට මාස 10 දක්වා ප්‍රමාද වූ අවස්ථා 75ක් විය. | 2014 වර්ෂයේ මාර්තු මස සිට අගෝස්තු මස අවසානය දක්වාම අධ්‍යක්ෂ විමර්ශන තනතුර පුරප්පාඩුව පැවති අතර කලක සිට පුරප්පාඩුව පැවති විධායක තනතුරටද බඳවා ගැනීම් සිදු කරන ලද්දේ දෙසැම්බර් (2014) මස දී ය. එබැවින්, මානව සම්පත් හිඟ වීම හේතුවෙන් අදාළ කාලය තුළ දී පැමිණිලි විමර්ශනය කිරීමේදී සමස්ථයක් වශයෙන් ගත් කළ ප්‍රමාදයක් සිදුව ඇත.<br><br>විමර්ශන කටයුතු අවසන් නොවී තිබූ 2013 වර්ෂයට අදාළ පැමිණිලි 11 සම්බන්ධව වත්මන් තත්ත්වය පහත පරිදි වේ.<br><br>● පැමිණිලි 4ක් - රක්ෂණ නියෝජිතයන්ගේ සුදුසුකම් සම්බන්ධයෙන් වන අතර අදාළ විභාග ප්‍රතිඵල ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙතින් තහවුරු කර ගැනීමේදී ප්‍රමාදයක් සිදුව ඇත. කෙසේ වෙතත් 2015.04.27 වන දින දුරකථනයෙන් කරන ලද විමසීමේ දී තවත් මසක පමණ කාලයක් ඒ සඳහා ගතවනු ඇති බව අප වෙත දැනුම් දෙනු ලැබීය.<br><br>● පැමිණිලි 4ක් - බොහෝ වාර ගණනක් පැමිණිලි පාර්ශවය වෙතින් මෙන්ම රක්ෂණ සමාගම වෙතින්ද ලිඛිතව වැඩිදුර විස්තර - පැහැදිලි කිරීම් - තොරතුරු හා ලියකියවිලි ලබා ගැනීමට සිදුව ඇත. එමෙන්ම එසේ ලැබෙන තොරතුරු සමාලෝචනය කිරීම සඳහා සහ අවශ්‍ය උපදෙස් ලබා ගැනීමටද සැලකිය යුතු කාලයක් ගතව ඇත. කෙසේ වෙතත්, නොපමාව මේ සම්බන්ධ විමර්ශන කටයුතු අවසන් කිරීමට හැකි සෑම උත්සාහයක්ම ගනු ඇත.<br><br>● පැමිණිලි 1ක් - අනතුරක් ඇසින් දුටු සාක්ෂි කරුවකුගේ ලිඛිත තහවුරු කිරීමක් අපේක්ෂාවෙන් සිටී. ත්‍රිකුණාමලය නාවික හමුදා කඳවුරේ සේවයේ නියුතු මෙම සාක්ෂිකරු නිවාඩුවට නිවසට පැමිණි වහාම අදාළ තොරතුරු අප වෙත එවන බවට දැනුම් දී ඇත.<br><br>● පැමිණිලි 1ක් - විමර්ශන කටයුතු අවසන් කර ඇති අතර මණ්ඩලයේ අනුමැතිය සඳහා යොමු කෙරෙනු ඇත.<br><br>● පැමිණිලි 1ක් - රතුපස්වලදී ඇති වූ සිද්ධියෙන් අදාළ සමාගමට සිදු වූ අලාභහානි සම්බන්ධයෙන් වේ. රක්ෂණ මණ්ඩලයේ උපදෙස් මත සිදුව ඇති අලාභය තහවුරු කිරීම සඳහා 2014 වර්ෂයේ අප්‍රේල් මස දී ස්වාධීන අලාභ තක්සේරු කරුවෙකු පත් කෙරුණු අතර අදාළ වාර්තා ලබා දීමට වසරකට ආසන්න කාලයක් ගතවිය. 2015 මාර්තු මසදී තත්ත්වය සමාලෝචනය කරන ලද අතර නීතිපති දෙපාර්තමේන්තුවෙන් මතය විමසීමෙන් පසුව අදාළ හිමිකම ගෙවීම සම්බන්ධයෙන් තීරණය කිරීමට ජාතික රක්ෂණ භාර අරමුදල එකඟ වී ඇත. |

# විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම

| | විගණකාධිපති වාර්තාව | ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම |
|---|---|---|
| | | රක්ෂණ හිමිකම් සහ ඔප්පු සම්බන්ධයෙන් විවිධාකාරයේ පැමිණිලි රක්ෂණ මණ්ඩලය වෙත යොමු කෙරේ. ඒ එක් එක් පැමිණිල්ලේ ස්වභාවය අනුව ඒවා විමර්ශනය කිරීම සඳහා ගතවන කාලයද වෙනස් වේ. උදාහරණයක් ලෙස හිමිකමක් ගෙවීම ප්‍රමාදවීම හෝ රක්ෂණ ඔප්පුවේ පිටපතක් නොලැබීම ආදී පැමිණිලි ඉතාම කෙටි කලකදී විමර්ශනය කොට අවසන් කිරීමට හැකි වනු ඇති අතර, රක්ෂණ හිමිකමක් ගෙවීම ප්‍රතික්ෂේප කිරීම හෝ රක්ෂණ නියෝජිතයෙකු විසින් අසත්‍ය තොරතුරු සැපයීම මගින් ඔප්පුහිමියකු නොමග යැවීම වැනි පැමිණිලි විමර්ශනය සඳහා ගතවිය හැකි නිශ්චිත කාලයක් ප්‍රකාශ කළ නොහැක. බොහෝ විට විභාග දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පොලීසිය, විශේෂඥ වෛද්‍යවරුන් ආදී තුන්වන පාර්ශවයන් වෙතින් තොරතුරු හෝ පැහැදිලි කිරීම් ලබා ගැනීමේදී නිශ්චිත කාල සීමාවක් තුළ ඒවා ලබාදෙන ලෙස නියෝග කිරීමට රක්ෂණ මණ්ඩලයට හැකියාවක් නොමැති අතර ප්‍රතිචාර ලබා ගැනීම සඳහා දුරකථනය මගින් හා ලිඛිතව සිහි කැඳවීමට ද සිදුවේ.<br><br>විමර්ශනය කෙරෙන සියලු පැමිණිලිවල තත්වය දෙසතියකට වරක් අදාළ අංශයේ රැස්වීමක් පවත්වා සමාලෝචනය කෙරෙන අතර එමගින් කිසිදු පැමිණිල්ලක් විමර්ශනය කිරීම අනිසි ලෙසකින් හෝ අතපසුවීමකින් ප්‍රමාද නොකෙරෙන බවට වග බලා ගැනේ.<br><br>එබැවින්, යම් පැමිණිල්ලකට අදාල වන තත්ත්වය විමසා බැලීමෙන් තොරව පැමිණිල්ල යොමු කළ දින සිට කාලය ගණනය කිරීමෙන් විමර්ශනයන් ප්‍රමාද වී ඇති බවට නිගමනය කිරීම සාධාරණ නොවන බව අපගේ අදහසයි. |
| 4. | **මෙහෙයුම් සමාලෝචනය** | |
| 4.1 | **කාර්ය සාධනය** | |
| (ආ) | රක්ෂණ ඔප්පු හිමියන් ආරක්ෂා කිරීමේ හා මහජනතාව දැනුවත් කිරීම තුළින් රක්ෂණය පිළිබඳව විශ්වාසය වර්ධනය කිරීමේ අරමුණින් වෙළඳපොල සංවර්ධන හා බාහිර සම්බන්ධතා ඒකකය පිහිටුවා තිබුණු අතර මෙම ඒකකය මගින් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ කාර්යයන් සඳහා රු.10,100,000 ක් ප්‍රතිපාදනය කර තිබුණි. එම කාර්යයන්වල ප්‍රගතිය පහත පරිදි විය. | |
| (i) | රාජ්‍ය නියෝජිතයන්ගේ රක්ෂණය පිළිබඳ දැනුම වර්ධනය කිරීමේ අරමුණින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල දැනුවත් කිරීමේ වැඩසටහන් 10ක් පවත්වා තිබුණද, ඉන් කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පවත්වන ලද වැඩ සටහන සඳහා සහභාගී වී තිබුණේ පුද්ගලයින් දහතුන් දෙනෙකු පමණක් විය. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් පවත්වනු ලබන මෙකී වැඩ සටහන දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලටද ගෙන යාමට අදහස් කළේ දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ රැස්වීමට සහභාගී වන ප්‍රාදේශීය ලේකම්වරුන්ව විශේෂයෙන්ම දැනුවත් කිරීම සඳහාය. එම රැස්වීමට වෙනත් නිලධාරීන් සහභාගී නොවේ.<br><br>එසේ වුවද, අදාල අපේක්ෂිත පාර්ශවයන් වෙත නිසි ආකාරයෙන් සන්නිවේදනය කිරීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම එතරම් සාර්ථක ක්‍රමවේදයක් නොවන බව වැටහී ගිය හෙයින් ඉන් අනතුරුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමෙන්ම පැවැත්වීමට තීරණය කරන ලදී. |
| (ii) | සමාලෝචිත වර්ෂය තුළ තෝරාගත් මහජනයා රැස්වන ස්ථාන සඳහා ඉදිරිපත් කිරීම් 3ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණද, එම කාර්ය නිම කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. | වාණිජ මණ්ඩලයේ ශාඛා කාර්යාලවල, ව්‍යාපාරික ප්‍රජාව වෙනුවෙන් වැඩ සටහන් 3ක් පැවැත්වීමට සැලසුම් කර තිබූ අතර ඒ සඳහා අවස්ථාවක් ලබාදෙන ලෙස ඉල්ලමින් ශාඛා කාර්යාල 6ක් වෙත ලිපි යවා ඇත. නමුත් ඒ සඳහා වාණිජ මණ්ඩල වෙතින් නිසි ප්‍රතිචාරයක් නොලැබීම හේතුවෙන් සැලසුම් කර තිබූ පරිදි එම ඉදිරිපත් කිරීම් කළ නොහැකි විය. |
| (iii) | ප්‍රදර්ශන සඳහා සහභාගී වීම සහ ප්‍රධාන මාර්ගවල සිදු කරනු ලබන වීදි ප්‍රචාරණ කටයුතු සඳහා සහභාගී වීමට සැලසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුළදී දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා පමණක් මණ්ඩලය සහභාගී වී තිබුණි. | වීදි ප්‍රචාරණ (Road show) කටයුතු සඳහා හෝ ප්‍රදර්ශන සඳහා සහභාගි වීමට ආරාධනා/ඉල්ලීම් ලැබිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළ ඒ සඳහා කිසිදු ආරාධනාවක් හෝ ඉල්ලීමක් ලැබී නොමැත. |

# විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම

| | විගණකාධිපති වාර්තාව | ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම |
|---|---|---|
| **4.** | **මෙහෙයුම් සමාලෝචනය** | |
| **4.1** | **කාර්ය සාධනය** | |
| (iv) | විද්‍යුත් මාධ්‍ය වැඩසටහන් යටතේ රු.2,500,000ක ඇස්තමේන්තුවක් මත ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ ලේඛණගත මාධ්‍ය ව්‍යාපාරය වර්ෂය තුළ ක්‍රියාත්මක කළ බවට සාක්ෂි ඉදිරිපත් නොවුණි. . | Documentary Campaign යනු යම් මාතෘකාවක් යටතේ වාර්තාමය වැඩ සටහනක් නිෂ්පාදනය කොට එය යම් තෝරාගත් විද්‍යුත් මාධ්‍යක් හරහා විකාශනය කිරීමයි. ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයෙන් වාර්තා වැඩ සටහනක් නිෂ්පාදනය කිරීම සඳහා අධික මුදලක්, කාලයක් හා ශ්‍රමයක් වැය වේ. තවද, එම වාර්තාමය වැඩ සටහන නැවත නැවතත් භාවිතා කළයුතු වන පරිදි නිෂ්පාදනය කළ යුතු වේ.<br>නමුත්, ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ නම ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ලෙස වෙනස් කිරීම සඳහා මුදල් අමාත්‍යාංශය වෙත අවශ්‍ය කෙටුම්පත් භාරදී ඇති බැවින් එවන් වාතාවරණයකදී මණ්ඩලයේ වත්මන් නම භාවිතා කර වාර්තාමය වැඩසටහන් නිෂ්පාදන කිරීම ඥාණාන්විත නොවන බව අපගේ හැඟීමයි. එබැවින්, සැලසුම් කළ පරිදි වාර්තාමය වැඩ සටහන සමාලෝචිත වසර තුළ දී නිෂ්පාදනය නොකෙරුණි. |
| (v) | රක්ෂණ කර්මාන්තයේ හා ඔප්පු හිමියන්ගේ යහපත උදෙසා රක්ෂණ ඔප්පු වැඩි දියුණු කිරීමේ අදහසින් සමාගම්වල රක්ෂණ නිපැයුම් සමාලෝචනයට ලක් කිරීම යටතේ සමාලෝචිත වර්ෂය තුළ රක්ෂණ සමාගම් 6ක් විසින් හඳුන්වා දී ඇති රක්ෂණ ඔප්පු 7ක් සමාලෝචනයට භාජනය කර තිබුණි. ඊට අදාළව රක්ෂණ ඔප්පුවල පවතින දුර්වලතා සහ ඒ සඳහා යෝජිත නිර්දේශ ඇතුළත් වාර්තාවක් පිළියෙල කර මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත 2014 නොවැම්බර් 19 දින ඉදිරිපත් කර තිබුණද එම වාර්තාවෙන් පෙන්වා දී ඇති අඩුපාඩු පිළිබඳව අදාළ රක්ෂණ සමාගම් දැනුවත් කිරීමට විගණිත දිනය වූ 2015 අප්‍රේල් 08 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | වෙළඳපොල සංවර්ධන හා බාහිර සම්බන්ධතා අංශයේ ක්‍රියාකාරී සැලැස්ම - 2014 අනුව, සෞඛ්‍ය රක්ෂණ ඔප්පුවල පවතින දුර්වලතා හා ඒ සඳහා යෝජිත නිර්දේශ ඇතුළත් වාර්තාව මණ්ඩලයේ සාමාජිකයන්ගේ අනුමැතිය පිණිස ඉදිරිපත් කළ යුතු වේ. එම වාර්තාව මණ්ඩල සාමාජිකයන්ගේ අනුමැතියට ඉදිරිපත් කිරීමට ප්‍රථම, අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂවරුන්ගේ හා සහකාර අධ්‍යක්ෂවරුන්ගේ අදහස් හා යෝජනා විමසීමට යොමු කරන ලදී. එම යෝජනා හා අදහස් අනුව වාර්තාව තවදුරටත් වැඩි දියුණු කොට, ඒ සඳහා ගතයුතු පියවර සම්බන්ධයෙන් මණ්ඩල සාමාජිකයින්ගේ අනුමැතිය සඳහා යොමු කිරීමට බලාපොරොත්තු වේ. තවද, එකී යෝජනා රක්ෂණ කර්මාන්තයට බලපාන ඒවා බැවින් එකී යෝජනා ක්‍රියාත්මක කිරීමට පෙර රක්ෂණ කර්මාන්තයේ නියැලී සිටින සමාගම්වල අදහස් විමසීමක්ද කළ යුතු වේ. |
| **4.1** | **කාර්ය සාධනය** | |
| (ඇ) | 2009 වර්ෂයේ දී මණ්ඩලය විසින් පෞද්ගලික රක්ෂණ ආයතනයක් වෙත අත්හිටුවීමක් පනවා තිබුණු අතර අංක SC(FR) 191/09 දරන මූලික අයිතිවාසිකම් නඩුවේ දී ශ්‍රේෂ්ඨාධිකරණය ලබාදුන් නියෝග ප්‍රකාර, එම සමාගම වෙත ඉදිරිපත් කරනු ලබන අව්‍යාජ රක්ෂණ හිමිකම් පෑම් ක්‍රමවත්ව බේරුම්කිරීම සඳහා එකී සමාගමේ වත්කම් බැහැර කිරීම සඳහා මණ්ඩලය, සමාගම සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹී තිබුණි. ඒ අනුව, හිමිකම් ඉල්ලුම්කරුවන්ට ඔවුන්ගේ හිමිකම් ඉල්ලීම මණ්ඩලය වෙත ලිඛිතව ඉදිරිපත් කරන ලෙසට පුවත්පත් නිවේදනයක් මගින් දැනුම් දී තිබුණු අතර එසේ ලද අව්‍යාජ හිමිකම් පෑම් 142 කින් කිසිදු හිමිකම් ඉල්ලීමක් සඳහා ගෙවීම් කර අවසන් කර නොතිබුණි. | අදාළ සමාගම අත්හිටුවන ලද අවස්ථාවේදී පවත්වාගෙන යන ලද ලිපිගොනු 142ක් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය වෙත භාර දී ඇත. ඒ අතරින් ලිපිගොනු 10ක් පවතින නඩු වන අතර ඉතිරි ලිපිගොනු 132 හිමිකම් ලිපිගොනු විය.<br>(SC(FR) 191/09 දරන නඩුවේ ශ්‍රෙෂ්ඨාධිකරණ නියෝගය ප්‍රකාර ඉහත ලිපිගොනු 132 අතරින් අව්‍යාජ හිමිකම් හඳුනාගැනීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් මෙතෙක් නිරාකරණය නොවූ හිමිකම් ඉල්ලීම් කැඳවමින් පුවත්පත් නිවේදනයක් පල කරන ලදී. එම පුවත්පත් නිවේදනයට තම හිමිකම් ඉදිරිපත් කරමින් පිළිතුරු 3ක් පමණක් ලැබුණි.<br>නමුත් අදාළ පුවත්පත් නිවේදනය සියලුම හිමිකම් ඉල්ලුම්කරුවන්ගේ අවධානයට යොමුවනු පිණිස ඉහත කී ලිපිගොනු 142 සඳහා ලිපි යැවීමට ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය තීරණය කරන ලදී.<br>නඩු ලිපිගොනු<br>පවතින නඩු 10 අතරින් 3ක අදාළ සමාගම පාර්ශවයක් නොවේ. පවතින නඩු අවසාන වන තෙක් ඒ සඳහා හිමිකම් නිරවුල් කිරීමට ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයට හැකියාවක් නොමැත.<br>හිමිකම් ලිපිගොනු<br>හිමිකම් ලිපිගොනු 132 අතරින් "ගෙවා නිම කිරීමේ ලදුපත් " (Discharge Receipt) අදාළ හිමිකම් ඉල්ලුම්කරු විසින් අත්සන් යොදා අමුණා ඇති ලිපිගොනු 65ක් වූ අතර ඒ සඳහා ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය ලිපි නොයවන ලදී. |

# විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම

| | විගණකාධිපති වාර්තාව | ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම |
|---|---|---|
| (ඇ) | | ඉතිරි ලිපිගොනු 67 සඳහා ලිපි යවන අතර ඒවායේ පිළිතුරු ස්වභාවය පහත පරිදි වේ.<br>● හරවා එවූ ලිපි - 06<br>● පිළිතුරු නොමැත - 55<br>● පිළිතුරු ලද ලිපි - 06<br>තවද, එම පිළිතුරු 6 අතරින් එක් හිමිකම් ඉල්ලුම්කරුවෙකු පවතින හිමිකම් නොමැති බව තහවුරු කරන ලදී.<br>ඒ අනුව හිමිකම් ඉල්ලීම් 5ක් සහ පුවත්පත් නිවේදනයට ලද පිළිතුරු 3ත් ඇතුළුව මෙතෙක් නිරාකරණය නොවූ හිමිකම් 8ක් හඳුනාගන්නා ලදී.<br>ඉහත විස්තර කළ පරිදි හඳුනාගත් නිරාකරණය නොවූ හිමිකම් 8 අතරින් අව්‍යාජ හිමිකම් මොනවාද යන්න සහ නිරවුල් කළයුතු හිමිකම් අගය කුමක්ද යන්න තහවුරු කරගත යුතුව ඇත.<br>ඒ සඳහා ලිපිගොනුවල ප්‍රමාණවත් තොරතුරු නොමැති නිසා ඒ පිළිබඳ තවදුරටත් අදාළ හිමිකම් ඉල්ලුම්කරුවන්ගෙන් තොරතුරු කැඳවා ඇත. තවද, පවතින නඩු අවසාන වන තෙක් අදාළ නිරවුල් කිරීම අවසාන කළ නොහැක.<br>ඉහත විස්තර කළ පරිදි අදාළ හිමිකම් ඉල්ලුම්කරුවන්ගෙන් තොරතුරු ලබාගෙන අව්‍යාජ හිමිකම් මොනවාද යන්න තහවුරු කරගන්නා තෙක් කිසිදු වන්දි හිමිකම්පෑමක් සිදුකළ නොහැක.<br>තවද, අදාළ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල ඝණපූරණය 2ක් වුවද, මේ වන විට එම සමාගමේ ක්‍රියාකාරී අධ්‍යක්ෂවරුන් 2ක් නොමැතිවීම නිසා නව අධ්‍යක්ෂවරයෙකු ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ අනුමැතිය සහිතව පත්කරගන්නා ලෙසට අප විසින් අදාළ සමාගමට දන්වා ඇති නමුත්, මේ වන තෙක් එලෙස කටයුතු කිරීමට ඔවුන් අපොහොසත් වී ඇත. වත්කම් බෙහැර කිරීම සඳහා උසාවි නියෝගයක් ලබා ගැනීම හෝ වෙනත් යම් ක්‍රියා මාර්ගයක් ගැනීමට ප්‍රථම ඉහත විස්තර කළ ගැටළු විසඳාගත යුතු අතර ඒ සඳහා යම් කාලයක් ගතවනු ඇත. |
| **4.2** | **කාර්ය මණ්ඩල පරිපාලනය** | |
| (අ) | 2014 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අනුමත තනතුරු සංඛ්‍යාව 43ක් වුවද, තථ්‍ය සංඛ්‍යාව 41ක් වීමෙන් පුරප්පාඩු 03ක් හා අතිරික්ත 01ක් පැවතුණි. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති තනතුරු සංඛ්‍යාව ඉක්මවා කාර්යාල සහායක තනතුරක් සඳහා බඳවා ගැනීම් සිදුකර තිබුණද, ඒ සඳහා ලබාගත් අනුමැතිය විගණනයට ඉදිරිපත් නොවීය. | මුළු ආයතනයටම දැනට සිටිනුයේ එක් කාර්යාල කාර්ය සහායකයකු පමණි. කාර්යාල සහායක තනතුරක් ඇති කිරීම සඳහා පැවති හදිසි අවශ්‍යතාවය මත මණ්ඩලයේ වසර 3ක පමණ කාලයක් කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදුණු අයෙකු අදාළ බඳවා ගැනීමේ පරිපාටිය අනුගමනය කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන පත්කර ගන්නා ලදී. මේ සඳහා අමාත්‍යාංශ අනුමැතිය ලබාගැනීමට අවශ්‍ය කටයුතු යොදා ඇත. |
| (ආ) | ස්ථිර තනතුරක් වන අධ්‍යක්ෂ සුපරීක්ෂණ තනතුර සඳහා 2011 දෙසැම්බර් 26 දින කොන්ත්‍රාත් පදනම මත අධ්‍යක්ෂවරයෙකු පත්කර තිබුණු අතරම ස්ථිරව නිලධාරියෙකු බඳවා ගැනීමට ද මණ්ඩලය ක්‍රියා කර නොතිබුණි. | අදාළ තනතුර සඳහා පුවත්පත් දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණ පැවැත්වූවද, ඉහළ සුදුසුකම් හා බොහෝ පළපුරුද්ද ඇති නිලධාරීන් ඉතා ඉහළ වැටුප් ඉල්ලන ලදී. සුදුසුකම් ලත් අය අතුරින් අප යෝජනා කළ වැටුපට මෙම තනතුර බාර ගැනීමට එකඟ වූයේ රාමනායක මහතා පමණි.<br>ඔහු ස්ථිර පදනම මත බඳවා ගැනීමට අවශ්‍ය වුවද, බඳවා ගැනීමේ පරිපාටියෙහි සඳහන් උපරිම වයස (අවු.50) ඉක්මවා තිබූ බැවින් මූලිකවම වසර දෙකක කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා ලද අතර අංශය විසින් මෑතකදී ක්‍රියාත්මක කරන ලද RBC හා RBS වැඩ කටයුතු අවසන් කරන තුරු ඔහු සේවයේ රඳවා තබා ගැනීම අත්‍යාවශ්‍ය වේ. |

# විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම

| | විගණකාධිපති වාර්තාව | ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම |
|---|---|---|
| **4.2** | **කාර්ය මණ්ඩල පරිපාලනය - පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.** | |
| (ඇ) | 2007 නොවැම්බර් 26 දින සිට පුරප්පාඩුව පවතින සහකාර අධ්‍යක්ෂ තනතුරු දෙක සඳහා සුදුසුකම් සහිත නිලධාරීන් බඳවා ගැනීමට විගණිත දිනය වූ 2015 මැයි 20 දින දක්වාත් මණ්ඩලය කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩුව පවතින සහකාර අධ්‍යක්ෂ තනතුරු දෙකෙන් එකක් අධීක්ෂණ අංශය සඳහා වෘත්තීය ජීවගණකවරයෙකු බඳවා ගැනීමේ අපේක්ෂාවෙන් පැවතියද, දැනට මණ්ඩලයේ පවතින වැටුපට එවන් වෘත්තිකයෙකු බඳවා ගැනීමේ අපහසුතාවයක් පවතී.<br>අනෙක් සහකාර අධ්‍යක්ෂ තනතුර වෙළඳපොළ සංවර්ධන සහ බාහිර සම්බන්ධතා ඒකකය සඳහා වෙන්කර ඇති අතර එම තනතුර පිරවීම සඳහා අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණ පැවැත්වුවද සුදුසු පුද්ගලයෙකු තෝරා ගත නොහැකි විය.<br>හුදෙක් පුරප්පාඩු පිරවීමේ පරමාර්ථයෙන් නොගැළපෙන අයදුම්කරුවෙකු පත් කිරීමෙන් ආයතනයට මහත් අවාසියක් සිදුවිය හැකි බව අපගේ මතයයි. |
| (ඈ) | එක් එක් තනතුරට අදාළ බඳවා ගැනීම් පරිපාටි සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මණ්ඩලයේ අනුමත නිලධාරීන් බඳවා ගැනීමේ පරිපාටිය පරිපාලන අත්පොතට ඇතුළත් කර ඇති අතර එය අදාළ අනුමැතිය සඳහා මුදල් අමාත්‍යාංශ ලේකම් වෙත යොමුකර ඇත. බඳවා ගැනීම් සිදුකර ඇත්තේ අනුමත සේවක සංඛ්‍යාව සඳහා මුදල් අමාත්‍යාංශ අනුමැතිය ලබා ගැනීමෙන් පසුවයි. |
| **4.3** | **ආර්ථික නොවූ ගණුදෙනු** | |
| | මණ්ඩලය විසින් තම කාර්යාලය අවම පිරිවැයකින් පවත්වා ගැනීමට කටයුතු නොකොට ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ වර්ග අඩියට රු. 214/ බැගින් අඩි 8,741 ක ප්‍රමාණයක් සඳහා සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.23,862,930 ක විශාල පිරිවැයක් හා රඨ ගාල් කිරීමේ ගාස්තු ලෙස රු.383,160ක් ගෙවා තිබුණි. ඒ හේතුවෙන් වාර්ෂිකව, ආදායම ඉක්මවූ වියදම පියවා ගැනීමට රක්ෂණ ඔප්පු දරන්නන්ගේ ආරක්ෂක අරමුදලින්ද මුදල් ලබා ගැනීමට මණ්ඩලය ක්‍රියාකර තිබුණි. | මෙම කරුණ මණ්ඩලයේ අවධානයට මීට පෙර වතාවන් කිහිපයක යොමු වී ඇති අතර ඒ සඳහා පිළිතුරුද යොමුකර ඇත. ආයතනය ස්ථාපිත කිරීමට විකල්ප ස්ථානයක් සෙවීම කෙරෙහි අවධානය යොමු කළද, නියාමන ආයතනයක් පවත්වා ගෙන යාමට සුදුසු පරිසරයකින් සමන්විත ස්ථානයක් වර්තමාන පිරිවැයට වඩා අඩු මුදලකට සොයා ගැනීමට දරන ලද සියලු උත්සහයන් ව්‍යර්ථ විය. අමාත්‍යාංශය හෝ මැදිහත් වී, මේ සම්බන්ධයෙන් සුදුසු පියවරක් ගන්නේ නම් අපද කෘතඥ වෙමු.<br>ඔබ විසින් මේ සම්බන්ධයෙන් 2010 සහ 2011 වර්ෂවල විගණන වාර්තාවල සඳහන් කලද අපගේ පැහැදිලි කිරීම් පිළිගෙන 2012 සහ 2013 වර්ෂවල අවසන් විගණන වාර්තාවෙන් මෙකී කරුණ ඉවත් කරන ලදී. තවද, ඉහත වර්ෂවලට අදාලව පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා වාර්තා සටහන්වල (minutes) කාර්යාල කුලී ගෙවීම් පිළිබඳ කිසිදු සඳහනක් කර නොමැති බවද දන්වනු කැමැත්තෙමු.<br>රඨගාල් කිරීමේ ගාස්තු සම්බන්ධයෙන් අපහට ප්‍රායෝගික විකල්පයක් නොමැති අතර එයද අනිවාර්යයෙන් ගෙවීමට සිදුවන වියදමක් බව කාරුණිකව දන්වමු. |
| **5.** | **ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය** | |
| **5.1** | **අයවැය ලේඛණමය පාලනය** | |
| | අයවැය ලේඛනගත ආදායම් හා වියදම්, තත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී සියයට 3 සිට සියයට 100 දක්වා පරාසයක විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. | ඉදිරියේදී විචලනයන් හැකිතාක් අවම කර ගනිමින් අයවැය ලේඛණය පිළියෙල කිරීමට හැකි සෑම උත්සාහයක්ම දරනු ලැබේ. |
| **5.2** | **නොවිසඳී ඇති විගණන ජේද** | |
| | 2014 අප්‍රේල් 08 දින පැවති රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ ගිණුම් කාරක සභාව විසින් ලබාදුන් නියෝග ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | |

# විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම

| | **විගණකාධිපති වාර්තාව** | **ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම** |
|---|---|---|
| (අ) | 2010 වර්ෂයේදී මණ්ඩලය විසින් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව එහි නිලධාරීන් 17 දෙනෙකු වෙත වැටුප් වර්ධක දෙක බැගින් ගෙවා තිබීම හා 2012 ජූලි මාසයේ සිට මණ්ඩලය විසින් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව එහි සියලුම නිලධාරීන්ගේ වැටුප් සියයට 25කින් වැඩි කිරීම සම්බන්ධව වර්තමාන කළමනාකාරීත්වය භාණ්ඩාගාරය වෙත ලිඛිතව දැනුම් දී ඒ සම්බන්ධයෙන් ඔවුන්ගෙන් උපදෙස් ලබාගතයුතු බවට නියෝග කර තිබුණද, ඊට සම්බන්ධව තොරතුරු ඇතුළත් ලිපියක් මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර ඇති බව පමණක් විගණනයට දන්වා තිබුණි. | 2010 වසරේදී මණ්ඩලයේ නිලධාරීන්ට වැටුප් වර්ධක එකකට වඩා වැඩි ප්‍රමාණයක් දීම සම්බන්ධව තොරතුරු දන්වා අදාළ ලිපිය මහා භාණ්ඩාගාරය වෙත දැනටමත් ඉදිරිපත් කර ඇත. ඊට අමතරව මේ සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයට ක්‍රම වේදයක් සකසන ලෙසද සභාව විසින් නියෝග කර ඇත.<br>මීට පෙරද කිහිපවතාවක් ප්‍රකාශ කර ඇති පරිදි 2012 වසරේදී මණ්ඩලය සියලු නිලධාරීන්ට 25%ක වැටුප් වර්ධනයක් ලබා දී ඇත්තේ භාණ්ඩාගාරයේ නිසි අනුමැතිය සහිතවය. මේ සම්බන්ධයෙන් පොදු ව්‍යාපාර කාරක සභාව විසින් කිසිදු නියෝගයක් පනවා නොමැති බවද දන්වනු කැමැත්තෙමි. |
| (ආ) | භාණ්ඩාගාර අනුමැතියකින් තොරව රු.513,713 ක් වැය කරමින් මණ්ඩලයේ නිලධාරීන් 33 දෙනෙකු හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් සඳහා රක්ෂණාවරණයක් ලබා ගැනීම සම්බන්ධයෙන් විධිමත් පරිදි කටයුතු කරන ලෙස මණ්ඩලයට නියෝග කර තිබුණද, මේ සම්බන්ධයෙන් භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2014.04.08 දින පැවති රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ කාරක සභා වාරයේදී ඇතුළත් වූ කරුණු පිළිබඳව වර්තමාන තත්වය පැහැදිලි කර අමාත්‍යාංශය වෙත යවන ලද ලිපියේ සඳහන් පරිදි අධ්‍යක්ෂ මණ්ඩලයේ නිසි අනුමැතිය මත අදාළ රක්ෂණාවරණයන් මණ්ඩලය විසින් සිය නිලධාරීන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සඳහා ලබාගෙන ඇත.<br>මෙය දීමනාවක් හෝ වැටුප් සංශෝධනයක් හෝ නොවන බැවින් එවන් කරුණක් පිළිබඳව තීරණය කිරීමේ අධිකාරි බලය මණ්ඩලය සතු බව අපගේ විශ්වාසයයි. |
| **6.** | **පද්ධති හා පාලනයන්** | |
| | විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.<br><br>(අ) ගිණුම්කරණය<br>(ආ) කාර්ය මණ්ඩල පරිපාලනය<br>(ඇ) සේවක ණය පරිපාලනය | අප විසින් නිවැරදි කළ යුතු ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් ඔබගේ උපදෙස් සැලකිල්ලට ගෙන විශේෂ අවධානය යොමු කරනු ලැබේ. |

# පරිශිෂ්ඨය I

2014 දෙසැම්බර් 31 දිනට 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීමේ පනත යටතේ ලියාපදිංචි වී ඇති රක්ෂණ සමාගම්

| අංකය | රක්ෂණ සමාගම | ව්‍යාපාර කටයුතු වර්ගය |
|---|---|---|
| 1 | ඒඅයිඒ ඉන්ෂුවරන්ස් ලංකා පීඑල්සී | දිගුකාලීන රක්ෂණය |
| | | සාමාන්‍ය රක්ෂණය |
| 2 | ඒඅයිජී ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 3 | ඇලියොන්ස් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 4 | ඇලියොන්ස් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය |
| 5 | අමානා තකාෆුල් පීඑල්සී | දිගුකාලීන රක්ෂණය |
| | | සාමාන්‍ය රක්ෂණය |
| 6 | ආර්පිකෝ ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය |
| 7 | ඒෂියන් එලායන්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී | දිගුකාලීන රක්ෂණය |
| | | සාමාන්‍ය රක්ෂණය |
| 8 | සෙලින්කෝ ඉන්ෂුවරන්ස් පීඑල්සී | දිගුකාලීන රක්ෂණය |
| | | සාමාන්‍ය රක්ෂණය |
| 9 | කොන්ටිනෙන්ටල් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 10 | කෝපරේටිව් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය |
| | | සාමාන්‍ය රක්ෂණය |
| 11 | එච්එන්බී ඇෂුවරන්ස් පීඑල්සී | දිගුකාලීන රක්ෂණය |
| | | සාමාන්‍ය රක්ෂණය |
| 12 | ජනශක්ති ඉන්ෂුවරන්ස් පීඑල්සී | දිගුකාලීන රක්ෂණය |
| | | සාමාන්‍ය රක්ෂණය |
| 13 | ලයිෆ් ඉන්ෂුවරන්ස් කෝපරේෂන් (ලංකා) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය |
| 14 | එල්ඕඑල්සී ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය |
| | | සාමාන්‍ය රක්ෂණය |
| 15 | එම්බීඑස්එල් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය |
| | | සාමාන්‍ය රක්ෂණය |
| 16 | ජාතික රක්ෂණ භාර අරමුදල | සාමාන්‍ය රක්ෂණය |
| 17 | ඔරියන්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 18 | පීපල්ස් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 19 | සීමාසහිත සණස රක්ෂණ සමාගම | දිගුකාලීන රක්ෂණය |
| | | සාමාන්‍ය රක්ෂණය |
| 20 | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය |
| | | සාමාන්‍ය රක්ෂණය |
| 21 | යූනියන් ඇෂුවරන්ස් පීඑල්සී | දිගුකාලීන රක්ෂණය |
| | | සාමාන්‍ය රක්ෂණය |

# පරිශිෂ්ඨය II

2014 දෙසැම්බර් 31 දිනට 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීමේ පනත යටතේ ලියාපදිංචි වී ඇති රක්ෂණ තැරැව්කාර සමාගම්

| අංකය | රක්ෂණ තැරැව්කරු | ව්‍යාපාර කටයුතු වර්ගය |
|---|---|---|
| 1 | ඒඑම්ඩබ්ලිව් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 2 | ඒඩීඉසෙඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 3 | එයිට්කන් ස්පෙන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 4 | ඇල්ෆින්කෝ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 5 | ඇලියෝන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 6 | ඇක්විලයින් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 7 | ඇසට්අයි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 8 | ඇසට්ලයින් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ් | සාමාන්‍ය |
| 9 | බ්‍රිලියන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 10 | සියෙක්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ් | සාමාන්‍ය |
| 11 | සීලාන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 12 | සිනර්ජි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 13 | සීඑෆ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 14 | කලම්බුරේ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 15 | කොමර්ෂල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 16 | දයාසරණ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 17 | ඩෙල්මේජ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 18 | ඊඒජී - ආර්එම්එස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 19 | ඉක්විටි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 20 | එසාජි කරිම්ජි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 21 | ෆින්ලේ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 22 | ෆෝසයිට් ඉන්ෂුවරන්ස් ඇන්ඩ් රීඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 23 | ජෝර්ජ් ස්ටුව(ර්)ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 24 | ග්ලෝබල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ඇන්ඩ් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 25 | ග්‍රෑන්ඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 26 | ගාඩියන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 27 | ඉන්ඩස්ට්‍රියල් ඇන්ඩ් කොමර්ෂල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 28 | ජේ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ඇන්ඩ් කන්සල්ටන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 29 | ජේඑෆ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 30 | කැලණි යුනි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |

# පරිශිෂ්ඨය II

| අංකය | රක්ෂණ තැරැව්කරු | ව්‍යාපාර කටයුතු වර්ගය |
|---|---|---|
| 31 | එල්එම් ඇන්ඩ් ඩී ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ඇන්ඩ් කන්සල්ටන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 32 | ලක් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 33 | ලයිෆ් ඇන්ඩ් ජෙනරල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 34 | මැක්වුඩ්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 35 | මැක්ස්වෙල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 36 | මර්කන්ටයිල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 37 | නේෂන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 38 | ප්ලැසිඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 39 | ප්‍රෝකෙයා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 40 | ප්‍රොටෙක්ෂන් ඇන්ඩ් ඇෂුවරන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 41 | ප්‍රොටෙක්ෂන් ඇන්ඩ් අට්මෝස්ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 42 | රෙඩිමෝ ස්විස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 43 | රියලයන්ස් ඒවීජී ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 44 | රියලයන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 45 | රින්කුන් ලංකා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 46 | රෝපා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 47 | සැම්සන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 48 | සේනාරත්න ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 49 | සෙංකඩගල ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 50 | සදර්න් මර්චන්ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 51 | ස්ටැටර්ජික් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 52 | ට්‍රස්ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 53 | යූඑන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 54 | යුනයිටඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 55 | වෙරාසිටි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 56 | වික්ටර් එමානුවෙල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 57 | වොලන්කා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 58 | සෙනිත් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |

# පාරිභාෂික ශබ්ද මාලාව

**සමුච්චිත වීම**

එක් සමාගමක් සමඟ පවතින සැලකිය යුතු රක්ෂිත හෝ ප්‍රාරක්ෂිත අවදානම් සංඛ්‍යාවක් පාඩු ලබන සිදුවීමක් නිසා එක්වර පීඩාකාරී බවට පත්වන තත්ත්වයකි.

**අත්කර ගැනීමේ වියදම්**

අබිනව රක්ෂණ ගිවිසුම් අත්කර ගැනීම සහ දැනටමත් පවත්නා රක්ෂණ ගිවිසුම් අළුත්කිරීම (උදා ඃ- කොමිස් මුදල්) යන අවස්ථාවලදි වෙනස්වීම්වලට ලක්වන සහ එයට මූලික වශයෙන් සම්බන්ධතාවක් දක්වන සියළු වියදම්.

**ජීවගණකශූ**

රක්ෂණය, ආයෝජනය මූල්‍ය කළමනාකරණය සහ ප්‍රජා විද්‍යාව ආශ්‍රිත ගැටළුවලට සම්භාවිතා සහ සංඛ්‍යානමය සිද්ධාන්ත යොදා ගන්නා විශේෂඥයෙකි.

**පරිපාලන වියදම්**

දේපල, පිරියත හා උපකරණ සඳහා ක්ෂය ප්‍රතිපාදන සහ සේවක පිරිවැය සහිතව වාරික එකතු කිරීමේ දී ආයෝජන කළම්බ පරිපාලනයේ දී ජනනය වන පරිපාලන ස්වභාවයේ වියදම්.

**ආවේශ්‍යතා දැක්විය හැකි වත්කම්**

රක්ෂකයාගේ ව්‍යවස්ථාපිත නුබුන්වත්භාවය නිශ්චය කිරීමේ දී ඇතුළත් කරනු ලබන වත්කම්, මෙවැනි වත්කම් 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත නියාමන පනතෙහි නිශ්චිතව දක්වා තිබේ.

**වාර්ෂිකය**

යම් කිසි නිශ්චිත කාලසීමාවක් සඳහා වාර්ෂිකලාභියාගේ ආයු කාලය මුළුල්ලේ හෝ වාරමය වශයෙන් ආදායම් ප්‍රතිලාභ ගෙවන ජීවිත රක්ෂණයකි. විලම්භිත හා ක්ෂණිකව ක්‍රියාත්මක වන යනුවෙන් වන මූලික වශයෙන් වර්ග දෙකකට අයත් වාර්ෂික පවතියි. ගෙවීම් සිදුකිරීම යම්කිසි අනාගත කාලයකදී ආරම්භ වන්නේනම් එය විලම්භිත වාර්ෂිකය නම්වේ. ගිවිසුම ආරම්භ වන අවස්ථාවේදීම අදාල ගෙවීම් සිදුකිරීම අරඹන්නේනම් එය ක්ෂණික වාරිකය නම්වේ.

**ප්‍රතිලාභිය**

ඔප්පු හිමියාගේ මරණයක දී රක්ෂිත මුදල් සහ අනෙකුත් ප්‍රතිලාභ ලැබිය යුතු ආදායකයා ලෙස ඔප්පු හිමියා විසින් නම් කරනු ලබන පුද්ගලයා.

**ප්‍රතිරක්ෂිතයා**

ප්‍රතිරක්ෂණ සමාගමක සේවාදායකයෙක්. (ප්‍රාථමික රක්ෂණ සමාගම)

**හිමිකම් පෑම**

දේපල විනාශ වීම හෝ හානි වීම සහ ඒ ආශ්‍රිත මරණය හෝ තුවාල සිදුවීම, ආරෝග්‍යශාලා හෝ වෛද්‍ය බිල්පත් දැරීම. රක්ෂිතයාගේ මරණය හෝ ආබාධිතවීම, උපපාදන ඔප්පුවක් කල් පිරීම, විශ්‍රාමික වයසට පත්වීම යනා දී ආකාරවලට රක්ෂණයට බඳුන් වූ කාරණය සිදුවීම හේතු කරගෙන හෝ ඔප්පුවක් පවාරණය කිරීමේ දී රක්ෂණ ගිවිසුම පරිදි ගෙවිය යුතු මුදල.

**දරන ලද හිමිකම් පෑම**

වර්ෂය ආරම්භයේ දි සහ වර්ෂය අවසානයේ දී හිඟ තබා ඇති හිමිකම්පෑම් සඳහා වූ ප්‍රතිපාදන වෙනුවෙන් අවශ්‍ය අවස්ථාවල දී ගැලපීම් කළ පසු ගිණුම් වර්ෂයක් තුළ හිමිකම් පෑම සඳහා අවශය කටයුතු කිරීමට දරන වියදම සහිතව ගෙවන ලද මුළු හිමිකම් පෑම් වටිනාකම.

**දරන ලද නමුත් වාර්තා නොකරන ලද හිමිකම් පෑම්**

දේපල, වගකීම් සහ මූල්‍ය යන රක්ෂණ පිළිබඳව සිදුවී ඇති නමුත් රක්ෂකයා වෙත තවමත් වාර්තා කරනු ලැබ නැති අලාභ ආවරණය කිරීම සඳහා දැරීමට සිදුවනු ඇතැයි අපේක්ෂිත පිරිවැය නිරූපණය කරමින් වර්ෂය අවසානයේ දී ඇති කරනු ලබන සංචිතයකි.

**හිඟ සිටි හිමිකම් පෑම් සංචිතය සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු**

සිදු වූ නමුත් වාර්තා කරනු ලැබ නොතිබූ හිමිකම් සහ ඒවා පිළිබඳව කටයුතු කිරීමේ දී දරන්නට සිදුවන පිරිවැය සහිතව ශේෂ පත්‍ර දිනය වන විට වී ඇති සිද්ධි වෙනුවෙන් ඒවා ආවරණය කිරීමට දැරිය යුතු ඇස්තමේන්තුගත පිරිවැයෙන් එවැනි හිමිකම් පෑම් සඳහා මේ වන විටත් ගෙවා ඇති මුදල අඩු කළ පසු ලැබෙන අගය.

**සහභාග රක්ෂණය**

නිශ්චිත වාර මුදල් එකඟ වුණු අනුපාතයක් මත ගෙවීමේ පදනම මත අවදානම් ආවරණය සඳහා රක්ෂකයන් දෙදෙනකු හෝ කිහිප දෙනෙකු රක්ෂිතයා සමඟ ඇති කර ගන්නා තනි ගිවිසුමක්.

**කොමිස්**

රක්ෂකයාගේ නිෂ්පාදනයක් විකිණීම හෝ සේවාකරණය වෙනුවෙන් තැරැව්කරුවකුට හෝ රක්ෂණ නියෝජිතයකුට කරන ගෙවීමක්.

**විලම්භිත අත්කර ගැනීමේ පිරිවැය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු**

වාර්ෂික පදනමට ගිණුම්කරණයේ දී එක් ගිණුම් වර්ෂයක සිට ඊළඟ ගිණුම් වර්ෂයට ගෙන යා යුතු, අවදානම හා සම්බන්ධ ගිවිසුම්වල කල් ඉකුත් නොවූ කාලය සඳහා අදාළ වන අත්පත් කර ගැනීමේ පිරිවැය.

**ඉපැයූ වාරික**

ගිණුම් කාලපරිච්ඡේදයක ආරම්භයේ දී සහ අවසානයේ දී නොඉපැයූ වාරික ප්‍රතිපාදන වෙනුවෙන් සැලසුම් කළ ලිඛිත වාරික මුදල්.

**සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු**

ගිනි, මුහුදු, උවදුරු, මෝටර් වාහන හෝ මිශ්‍ර රක්ෂණ ව්‍යාපාර කටයුතු එකක් හෝ කිහිපයක් තනිව හෝ බද්දට පවත්වාගෙන යාම, ගිණුම් කාලපරිච්ඡේදයක් තුළ දී සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු සම්බන්ධව ලද මුළු වාරික හෝ ලැබිය යුතු මුළු වාරික ප්‍රතිරක්ෂණ කටයුතු සඳහා ලැබිය යුතු වාරික ද සහිත අගය

**දළ වාරිකය**

වට්ටම්, ආපසු ගෙවීම් හා ප්‍රතිදාන අඩුකිරීමෙන් පසුව එහෙත් ඉඩ දෙන ලද ප්‍රතිරක්ෂණ සඳහා රක්ෂණකරුවකු විසින් ගෙවන ලද හෝ ගෙවිය යුතු වාරික කිසිවක් අඩුකිරීමට පෙර වූ වාරිකය.

**රක්ෂණ අවදානම**

රක්ෂණයට බඳුන් වූ සිද්ධිය වීම, හිමිකම් පෑම්වල වටිනාකම හෝ හිමිකම්

# පාරිභාෂික ශබ්ද මාලාව

ගෙවීම් සිදුවන කාලය පිළිබඳව පවතින අවිනිශ්චිතතා.

**රක්ෂකයා**

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ පොදු සමාගමක් ලෙස සංස්ථාපිත කර ඇති සහ 2000 අංක 143 දරන රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබ ඇති සමාගමකි.

**දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාර කටයුතු**

මරණයක හෝ මනුෂ්‍ය ජීවිතයට බලපාන යම් අවිනිශ්චිත සිද්ධියක් වූ විට මුදල් ගෙවීම සඳහා සහතික කැරෙන ගිවිසුම ද ඇතුළුව මනුෂ්‍ය ජීවිතය පිළිබඳ රක්ෂණ ගිවිසුම්වලට සහ මනුෂ්‍ය ජීවිතය මත රඳා සිටිමින් යම් කාල පරිච්ඡේදයක් සඳහා වාරික ගෙවීමට යටත් ගිවිසුම්වලට එළැඹීමේ හෝ එවැනි ගිවිසුම් පවත්වාගෙන යාමේ ව්‍යාපාරයකි.

**කල්පිරීම**

දීර්ඝකාලීන රක්ෂණ ඔප්පුවක් යටතේ එහි වගන්ති ප්‍රකාරව කාලය අවසන් වීමෙන් රක්ෂිත මුදල් ගෙවිය යුතු අවස්ථාව

**ශුද්ධ හිමිකම් පෑම් අනුපාතය හෝ ශුද්ධ අලාභ අනුපාතය**

රක්ෂකයන් විසින් ශුද්ධ ආදායම් (අදාළ ප්‍රතිරක්ෂණයෙන් අඩු කළ පසු) සම්බන්ධ ශුද්ධ අලාභ වියදම් නිරූපණය කිරීමට උපයෝගී කර ගනු ලබන සූත්‍රයකි.

$$\frac{\text{දරන ලද ශුද්ධ හිමිකම් පෑම්}}{\text{ඉපැයූ ශුද්ධ වාරික ආදායම}} \times 100$$

**ශුද්ධ ඒකාබද්ධ අනුපාතය - ජීවිත නොවන**

ශුද්ධ අලාභ අනුපාතය සමඟ ශුද්ධ වියදම් අනුපාතය සම්බන්ධ කර රක්ෂකයාගේ මෙහෙයුම්වල ලාභදායීත්වය මෙයින් නිරූපණය වෙයි. මෙම ඒකාබද්ධ අනුපාතය ගණනය කිරීමේ දී ආයෝජන අදායම් සැලකිල්ලට නොගැනෙයි.

$$\frac{\text{දරන ලද ශුද්ධ හිමිකම් පෑම් x 100}}{\text{ඉපැයූ ශුද්ධ වාරික ආදායම}} \qquad \frac{\text{වියදම් x 100}}{\text{ඉපැයූ ශුද්ධ වාරික ආදායම්}}$$

**ශුද්ධ ඉපැයූ වාරික - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු**

ප්‍රතිරක්ෂණ වාරික සහ නොඉපැයූ වාරිකවල වැඩිවීම සහ අඩුවීම සඳහා ගළපන ලද දළ ලිඛිත වාරික ආදායම

**ශුද්ධ වියදම් අනුපාතය - ජීවිත නොවන**

ආදායම් අත්පත් කර ගැනීමේ සහ පරිපාලන වියදම් (උදා ඃ- කොමිස්, බදු, සේවක පරිවැය, අලෙවිකරණ සහ මෙහෙයුම් වියදම්) අදාළ කර ගැනීම සඳහා රක්ෂණ සමාගම් විසින් යොදා ගනු ලබන සූත්‍රයකි.

**සහභාගීත්වය රහිතව ඔප්පුව - ජීවිත රක්ෂණ ව්‍යාපාර කටයුතු**

ජීවිත රක්ෂණ ව්‍යාපාරය කටයුතුවල දී ඔප්පු හිමියාට අදාළ ජීවිත රක්ෂණ අරමුදලේ අතිරික්තයට හිමිකම ලැබීමට ගිවිසුම්මය අයිතියක් නොමැති රක්ෂණ ඔප්පු.

**ඔප්පුව**

රක්ෂණ ගිවිසුමක නියම හා කොන්දේසි ඇතුළත් කර ඇති ලියැවිල්ලකි.

**ඔප්පු හිමියා**

රක්ෂණකරු සමඟ අදාළ ගිවිසුමට පැමිණ අදාළ රක්ෂණ ඔප්පුවේ තත්කාලීන නෛතික හිමිකරුවන තැනැත්තා.

**ඔප්පු ණය**

ජීවිත රක්ෂණ ඔප්පුවක පවාරන අගය ඇපයට තබමින් ඔප්පු හිමියකු විසින් රක්ෂකයාගෙන් ගනු ලබන ණය මුදලකි. මෙම ණය මුදල සාමාන්‍යයෙන් ඔප්පුවේ වර්තමාන පවාරන වටිනාකමේ ප්‍රතිශතයක් සඳහා සීමාවන අතර එවැනි ණය මුදල් සඳහා පොලී අය කරනු ලැබේ.

**ප්‍රාථමික රක්ෂකයා**

රක්ෂණ වාරිකයක් වෙනුවෙන් අවදානම් බාර ගනු ලබන්නා වූ ද රක්ෂණ ඔප්පු හිමියා සමඟ සෘජු ගිවිසුම්ගත සම්බන්ධතාවක් පවත්වාගනු ලබන්නා වූ ද රක්ෂණ සමාගම් (තනි පුද්ගලයන්, ආයතන හෝ සංවිධාන)

**මෙහෙයුම් ලාභය**

ආයෝජන ආදායම, ශුද්ධ ප්‍රාග්ධන ලාභ සහ වෙනත් ආදායම් සැලකිල්ලට ගත් පසු සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවලින් උපයා ගන්නා ලද ලාභය

**ප්‍රතිරක්ෂණය**

එක් පාර්ශ්වයක් (ප්‍රතිරක්ෂකයා) විසින් කිසියම් ප්‍රතිෂ්ඨාවක් සමඟ අනෙකුත් පාර්ශ්වයක් (ප්‍රතිරක්ෂිතයා - ප්‍රාථමික රක්ෂණකරු එළැඹුණු රක්ෂණ ඔප්පුවක හෝ ඔප්පුවල වගකීම්වලින් කොටසක් හෝ මුළුමණින්ම හානිපුරණය කිරීමට ඇති කර ගනු ලබන එකඟතාවකි.

**ප්‍රතිරක්ෂණ කොමිස්**

ප්‍රතිරක්ෂකයාට ගෙවූ හෝ ගෙවිය යුතු වාරිකවලට අදාළව ලැබුණු හෝ ලැබිය යුතු කොමිස් මුදල්

**භාරගනු ලබන ප්‍රතිරක්ෂණ**

ප්‍රතිරක්ෂණ ගිවිසුමක් යටතේ අවදානම් භාර ගැනීම

**භාර දෙනු ලබන ප්‍රතිරක්ෂණ**

ප්‍රතිරක්ෂණ ගිවිසුමක් යටතේ අවදානම් ස්ථානගත කිරීම

**ප්‍රතිරක්ෂණ ලාභ කොමිස්**

ප්‍රතිරක්ෂිත ගිවිසුමක් යටතේ ප්‍රතිරක්ෂිතයා විසින් උපයන ලද ලාභය (ප්‍රතිරක්ෂණ ගිවිසුමෙහි නිර්වචනය කරනු ලැබ ඇති පරිදි) පාදක කරගෙන ප්‍රතිරක්ෂකයකුගෙන් ප්‍රාථමික රක්ෂිතයා ලද හෝ ලැබිය යුතු කොමිස් මුදල්.

**රඳවා ගැනීම**

භාරගනු ලැබ අවදානමින් රක්ෂණකරු / ප්‍රතිරක්ෂණකරු විසින් ප්‍රතිරක්ෂණය කරනු නොලබන / පවරනු නොලබන කොටස හෙවත් ස්වකීය ගිණුම වෙනුවෙන් රඳවාගත් ආදායම.

# පාරිභාෂික ශබ්ද මාලාව

**නුබුන්වත් ආන්තිකය - ජීවිත**

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත පනතෙහි වගන්ති අංක 26 ප්‍රකාරව පනවා ඇති, 2002 නුබුන්වත් ආන්තිකය (දිගුකාලීන රක්ෂණය) පිළිබඳ රීතියෙන් නිර්වචනය කරනු ලැබ ඇති පරිදි දිගුකාලීන රක්ෂණ ව්‍යාපාර කටයුතුවල යෙදෙන රක්ෂකයකු විසින් පවත්වාගෙන යනු ලැබීමට අවශ්‍ය වත්කම්වල අගය සහ බැරකම්වල අගය යන සංඛ්‍යා දෙකෙහි වෙනස.

**නුබුන්වත් ආන්තිකය - ජීවිත නොවන (සාමාන්‍ය රක්ෂණය)**

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත පනතෙහි වගන්ති අංක 26 ප්‍රකාරව පනවා ඇති, 2004 නුබුන්වත් ආන්තිකය (සාමාන්‍ය රක්ෂණය) පිළිබඳව රීතියෙන් නිර්වචනය කර ඇති පරිදි සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවල යෙදෙන රක්ෂකයකු විසින් පවත්වාගෙන යාමට අවශ්‍ය කෙරෙන වත්කම්වල අගය සහ බැරකම්වල අගය සහ සංඛ්‍යාවන් දෙකෙහි වෙනස.

**පවාරණ අගය**

ජීවිත රක්ෂණයක් සම්බන්ධව එම රක්ෂණ ඔප්පුව කල්පිරීමට පෙර ඔප්පු හිමියකු ජීවිත රක්ෂණය අත්හිටුවීමේ දී රක්ෂකයා විසින් ඔප්පු හිමියාට ගෙවනු ලැබිය යුතු මුදල පවාරණ අගයක් ඇතිවීම සඳහා අවම වශයෙන් වසර 3ක් වත් අඛණ්ඩව එම ජීවිත රක්ෂණ ඔප්පුව ක්‍රියාත්මකව පැවතිය යුතුය.

**ප්‍රාරක්ෂණ ලාභය**

ආයෝජන ආදායම සහ අනෙකුත් ආදායම් සැලකිල්ලට නොගෙන සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර ගනුදෙනු මඟින් උත්පාදනය කර ගනු ලබන තාක්ෂණික ලාභය.

**නොඉපැයූ වාරිකය**

ගෙවීමට නියමිත ඇතැයි ගිණුම්වලට මේ වන විටත් ඇතුළත් කරනු ලැබ ඇති නමුත් ශේෂ පත්‍රයේ දිනයෙන් අනතුරුව එළැඹෙන යම් අවදානම් කාල සීමාවකට අදාළ වාරික මුදල්වල කොටසක් මෙයින් නියෝජනය වෙයි.

**නොඉපැයූ වාරික සංචිතය**

දැනටමත් ක්‍රියාත්මකව පවතින රක්ෂණ ඔප්පු යටතේ අනාගතයේ දී උද්ගත විය හැකි හිමිකම් පෑම් සඳහා ප්‍රතිපාදනය කිරීම අරභයා සාමාන්‍ය රක්ෂණකරු විසින් පවත්වාගෙන යනු ලබන අරමුදලකි.

**කල් ඉකුත් නොවූ ආදායම් සංචිතය**

ශේෂ පත්‍ර දිනට පෙර ගිවිසුම් හමාර කළ නමුත් ශේෂ පත්‍ර දිනයෙන් පසුව ඇති විය හැකි හිමිකම් පෑම්, වන්දි සහ වියදම් සඳහා ඇස්තමේන්තු කළ අගයෙන් මේ දක්වා නොඉපැයූ වාරික වශයෙන් (කිසියම් විලම්භිත අත්පත් කර ගැනීමේ පිරිවැයක් ඇත්නම් එය අඩු කළ පසු) ප්‍රතිපාදනය කරන ලද අගය ඉක්මන ප්‍රමාණය

# සටහන්

# පොදු තොරතුරු

## කාර්යාල ලිපිනය
11 වන මහල, නැගෙනහිර කුළුණ
ලෝක වෙළඳ මධ්‍යස්ථානය
කොළඹ 01
ශ්‍රී ලංකාව
දුරකථන : +94 11 2396184-9
ෆැක්ස් : +94 11 2396190
විද්‍යුත් ලිපිනය : info@ibsl.gov.lk
වෙබ් අඩවිය : www.ibsl.gov.lk

## නෛතික ස්වභාවය
2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතෙහි වගන්ති ප්‍රකාරව ශ්‍රී ලංකාව තුළ ස්ථාපනය කරනු ලැබ ඇති ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වන අතර එය 2001 පෙබරවාරි 23 දින රජයේ ගැසට් නිවේදන අංක 1172/27 මගින් බලය දී ඇති පරිදි 2001 මාර්තු 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙහෙයුම් කටයුතු අරඹන ලදී.

## මණ්ඩලයේ අරමුණ සහ වගකීම්
ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාර අවංකව, වෘත්තීයමය වශයෙන් හා විචක්ෂණශීලීභාවයෙන් පවත්වාගෙන යාම තුළින් ඔප්පු හිමියන්ගේ සහ අනාගත ඔප්පු හිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම තහවුරු කිරීම.

## ගිණුම් වර්ෂය
දෙසැම්බර් 31 දක්වා

## විගණකවරු
විගණකාධිපති

## බැංකුකරුවන්
ලංකා බැංකුව

## විගණන කමිටුව
එස්. ආර්. ආටිගල මහතා - සභාපති
සමන්ත කුමාරසිංහ මහතා
නලින් ආටිගල මහතා

Designed & Printed by Ceylon Printers PLC

IBSL
INSURANCE
BOARD OF SRI LANKA

**ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය | වාර්ෂික වාර්තාව 2014**

11 වන මහල, නැගෙනහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන : +94 11 2396184-9 | ෆැක්ස් : +94 11 2396190 |
**විද්‍යුත් ලිපිනය : info@ibsl.gov.lk | වෙබ් අඩවිය : www.ibsl.gov.lk**